

සරලාව්‍යාඛ්‍යා සහිත

# වෘත්තරත්නාකරය



විද්‍යෝදය පිරිවෙණෙහි ආචාර්ය්‍ය

**වැලිවිටියේ සොරත**

ස්වාමිපාදයන්වහන්සේ විසින් ලියනලද

**සරලාව්‍යාඛ්‍යා**

සහිත

**ශ්‍රීකේදාරභට්ටප්‍රණීත**

# වෘත්තරත්නාකරය.

---

විද්‍යෝදය පරිවෙණාධිපති

**කහවේ ශ්‍රී සුමඞ්ගල රත්නසාරාභිධාන**

සඞ්ඝනායක මාහිමියන්වහන්සේ

වි සි න්

පිළිගන්නාලදී.

---

**වෛද්‍යාචාර්ය්‍ය සී. ඒ. ගේවාවිතාරණ මැතිතුමන්**

වි සි න්

මහාබෝධි යන්ත්‍රාලයෙහි

මුද්‍රාපිතයි.

---

ශ්‍රී. බු. ව. 2470.

ක්‍රි. ව. 1926.

# සංඥාපනය.

**ඡන්දශ්ශාස්ත්‍රය.**

ලොවුතුරුබවට පැමිණි බුදුරජානන්වහන්සේ ද දහම් දෙසනසේක් ගාථාබන්ධරුචිකයන්ගේ දැනතරුවබොධය පිණිස ඒ ඒ දහම්කඳු ගාථා බන්ධයට නඟති. මාතෘක්‍රොධයෙහි අඩමින් සිටින ළදරුතෙමේ ද මවගේ නැළවුම් ගී හඬ අසා සැනසේ. මෘගතෙමේ ව්‍යාධයාගේ ගීතිධ්වනිය අසා වශී වූයේ ජීවිතවිනාශයට ද පැමිණේ. මේ අයුරෙන් බලන කල ලෙව්හි බොහෝ දෙනා තාලානුකූල මිහිරිනදට වෙසෙසින් රිසි කරණබව පැණේ. වෘත්තානුකූල සේ ශබ්දසමූදායය යෙදූකල අර්ථරසයෙන් පරිබාහිර වූ වාක්‍යය ද ශ්‍රැතිසුඛසාධනයෙහි අසමර්ථ නොවන බව දිනපතා පසක් වේ. ශාස්ත්‍රසංස්කාරයෙන් තොර වූ ව්‍යාධශබ්දයෙන් වනමෘගයා මත්වනකල ශාස්ත්‍රානුකූලව යෙදූ අර්ථමාධුර්‍ය්‍යයෙන් ද යුක්තවූ වාඞ්මාලාව සහෘදයහෘදයානන්දවර්ධන යෙහි සමර්ථය යනු කියයුතු ම නො වේ. යථොක්තවාඞ්මධුරත්ව සාධනයෙහි ඉවහල් වනුයේ ඡන්දශ්ශාස්ත්‍රයයි. 'ඡන්දස' යනු අක්ෂර නියමයයි. වෘත්තයෝ ඡන්දස්හුගේ අවයවයෝයි. ඡන්දශ්ශාස්ත්‍රයාගේ සමුද්භූතිය කෙසේ වී දැයි පරීක්ෂණය කළයුතු වේ. මිනිස් නුවණින් නිපදවූ දෙය මහබඹහුගේ හෝ මෙහෙසුරුහුගේ නැතහොත් අන්දෙවියෙකුගේ නැත්නම් සරසවියගේ මුවගැබ තුළ බහා දක්ම බොහෝ බමුණන්ගේ සිරිතකි කවිසවයානුරූප සේ ගන්නාකල එහි යම් කිසි සත්‍යයක් විද්‍යාමාන වුවත්, ඒ සත්‍යය දෙවහක්තිතෙජසින් ප්‍රච්ඡන්න ව තිබෙන බව පෙණේ. එකී සිරිත අනුව කෙදාරභට්ටයෝ ද "ඡන්දොඥතමිදං පුරා ත්‍රිනයනාත්" යනාදීන් තිනෙත්හු සඳස් සතරෙහි ප්‍රභවය කොට දක්වූහ. තාලානුකූල ශබ්දයට ලෝවැස්සෝ රිසි කෙරෙත් නම්, තාලොපදෙශකවඡන්දස ද ලෝවැසියා විසින් ම නිපදවා ගැණීම නෛසර්ගික ය. ශාස්ත්‍රයක් වශයෙන් නොවූවත් ලෝවැසියා විසින් ම ඡන්දස නිපදවාගත් බව දෙවහක්තියට වහල් නො ව සිතන්නෙකුට වැටහේ. ලෝවැසියන් අතර මධුරගානයෙහි උපයොගිව පැවැති ඡන්දස ශාස්ත්‍රයක් වශයෙන් සම්පාදනය කළෝ පිඞ්ගලනාගයෝයයි බොහෝ දෙනාගේ පිළිගැණීමයි. ඒ බව—

"ජො විවිහමත්තසාඅරපාරං පත්තොවි විමලමඉහෙලං,
පඪමං භාසතරණ්ඩො නාඔ සො පිඞ්ගලො ජයඉ"

යන්නෙන් ද වැටහේ. දැනට පවත්නා පුරාතනච්ඡන්දෝග්‍රන්ථය පිඞ්ගලනාගයන් විසින් කරණලදබව සත්‍යය. එහෙත් පිඞ්ගල යන්ට පෙර ඡන්දඃප්‍රණෙතෘන් සිටිබව පිඞ්ගලච්ඡන්දඃසූත්‍ර යෙන් ම ස්ඵුට වේ කාශ්‍යප, සෛතව, මාණ්ඩව්‍ය යනාදීහු පිඞ්ගලසූත්‍රයන්හි දක්වන ලදහ.

**වාල්මීකි.** ඡන්දෝනිබද්ධ අතිපුරාණකාව්‍යය රාමායණයයි. රාමායණ කර්තෘ වාල්මීකි ය. හෙතෙමේ ඡන්දඃ ප්‍රණෙතෘ යයි "යොගීන්ද්‍රශ්ඡන්දසාං ස්‍රෂ්ටා රාමායණමහාකවිඃ" යනුවෙන් දක්වනලදී. පද්‍යබන්ධනොපෙතප්‍රථමකාව්‍යය රාමායණය වුවොත් වාල්මීකිහු ඡන්දසෙහි ආදිකර්තෘ වශයෙන් පිළිගැන්ම අනුචිත නො වේ. පෙර සරසවිය හිමවත් පව්වෙහි පුතෙකු ලබන අටියෙන් තපස් රකිණකල මහබඹහු විසින් මවා දෙනලද කාව්‍යපුරුෂතෙමේ ඡන්දෝරොමයෙන් උපලක්ෂිත වූයේ

"යදෙතද්වාඞ්මයං විශ්වමර්ථමූර්ත්‍යා විවර්තතෙ,
සො'සි කාව්‍යපුමානම්බ පාදෞ වන්දෙය තාවකෞ"

යනුවෙන් සරසවියගේ පා වැන්දේ යයි කවීන් විසින් පුරුදු බසින් වර්ණනලද කාව්‍යය ද ඡන්දස සමග ම පහළ වූ බව නිශ්චිත ය. එහෙයින් වාල්මීකි තෙමේ ඡන්දස්හි ආදිකර්තෘ ය යනු අප්‍රතික්ෂ්‍ය නො වේ.

**පිඞ්ගලනාග.** වාල්මීකිහු ඡන්දස්හි ආදි කර්තෘ වුවත් ඡන්දශ්ශාස්ත්‍ර ග්‍රන්ථයක් නො කෙළේය. කාශ්‍යපාදීන්ගේ ද ඡන්දෝග්‍රන්ථයක් දක්නට නැත. පිඞ්ගලච්ඡන්දස්සූත්‍ර ග්‍රන්ථප්‍රණෙතෘවූ පිඞ්ගලනාග තෙමේ 'පිඞ්ගලමුනි' යන නාම යෙන් ද කිසිතැනෙක්හි සඳහන් වේ. 'පතඤ්ජලි' යනු ද මෙතෙමේ ම යයි මතාන්තරයක් පවතී. පිඞ්ගලතෙමේ උරග යෙකැයි ඇතැම්හු කියත්. ඒ වනාහි මහාභ්‍රාන්තියකි. 'නාග' නාමයෙන් ප්‍රසිද්ධවූ මනුෂ්‍යවර්ගයෙහි වූවෙක් ය යනු නිරවද්‍ය පක්ෂය වේ. පිඞ්ගලගේ ජන්මභූමිය මේ සිරිලක්දිව යයි කියන්නෝ ද සිටිත්.

**ඡන්දස්සූත්‍රං.**

පිඞ්ගලතෙමේ වෛදික ලෞකික යන වශයෙන් ඡන්දස බෙද සවග්‍රන්ථය රචනාකොළේය. ඒ විවිධච්ඡන්දසුන්ගේ ප්‍රාරම්භය ෂඩක්ෂරගායත්‍රීච්ඡන්දස ය. උක්තා-අත්‍යුක්තා-මධ්‍යා-ප්‍රතිෂ්ඨා-සුප්‍රතිෂ්ඨා යන ඡන්දස් පස ඔහු නො දැක්වූහ. "ගායත්‍රී ඡන්දසො මුඛං"යි තිලෝඇදුරු බුදුරජාණන්වහන්සේ ද වදාළෝ ය. එහෙත් පිඞ්ගලයෝ ප්‍රස්තාර කථනයට බැස එකාක්ෂරයෙහි පටන් ප්‍රස්තාර දැක්වූහ. එහෙයින් ඉන් මෑත සිටියෝ එකාක්ෂරච්ඡන්දසෙහි පටන් ලක්ෂණ බන්ධනයෙහි යෙදුනාහ. මාත්‍රාගුරුලඝුනියමය වෘත්ත ලක්ෂණය නමුදු කාව්‍යගුණාද්‍යපෙක්ෂාවෙන් වෘත්තලක්ෂණයෙන් භින්නාවූ ද යතිය සූත්‍රයන්හි ඇතුළත් කළහ. ලෞකිකච්ඡන්දස ද මාත්‍රා වර්ණ වශයෙන් විවිධ කළහ.

**පරිවාරග්‍රන්ථ හා වෘත්තරත්නාකරය.**

කවිසයුරෙන් එතරවනු කැමැතියනට මහනැවකැයි ලකරගත්කරුවන් විසින් පසස්නාලද, ශ්‍රුතිසුඛසාධනයෙහි අතිශය සහායවූ ඡන්දස්සූත්‍රයන් පිළිබඳව නොයෙක් ආචාර්‍ය්‍යවරයෝ පිරිවරගත් සැපයූහ. ශ්‍රීමත් කෙදාරභට්ටයෝ ලක්ෂ්‍යලක්ෂණාත්මක සූත්‍රයන්ගෙන් සමුපශෝභිත 'වෘත්තරත්නාකර' නම් ග්‍රන්ථය නිබන්ධනය කළහ. මේ ආචාර්‍ය්‍යවරයෝ කවර කලෙක දඹදිව හෙබවූ දැයි කීමට සාධක දුර්ලභය. එහි ප්‍රථම පරිච්ඡේදයෙහි ඡන්දසට උපයෝගිවූ පාරිභාෂිකශබ්දයන් හැඳින්වූහ. ද්විතීයාදිපරිච්ඡේදයන්හි මාත්‍රාවෘත්තවර්ණවෘත්තාදිය දැක්වූහ. ෂෂ්ඨපරිච්ඡේදයෙහි ප්‍රස්තාරාදිෂට්ප්‍රත්‍යය දක්වනලදී. මෙහි ප්‍රමාණය අකුරු සාරදහස් තුන්සිය දෙපණසකැයි කියනලද නමුදු අපට දක්නට ලැබුනු ඝ්සි ම පිටපතක මේ සංඛ්‍යාව පිරිසිදුව නො වීය. මෙසේ නිබද්ධවූ මේ වෘත්තරත්නාකරය ම ඡන්දශ්ශාස්ත්‍රපර්ථන පාර්ථනයෙහි නියුක්ත සුධීන්විසින් සරලත්වයෙන් සමාදෘතය. මෙහි පිඞ්ගල සූත්‍රයට වඩා බොහෝ වෙනස් කම් දක්නා ලැබේ. සමහරතන්හි පිඞ්ගලමතය කෙදාරභට්ටයෝ නො පිළිගත්හ. 'ගාථා'සම්බන්ධයෙන් ආචාර්‍ය්‍යමත දෙක විසදෘශ ය. ඒ පිළිබඳ ලියූ පරිකථාබැලීමෙන් විස්තර දතහැක. නාට්‍යග්‍රන්ථයන්හි පැණෙන 'නාන්දි' නම සැහැලි පිළිබඳ ලක්ෂණ මේ පොත් දෙක්හි ම දක්නට නො ලැබේ. අපගේ කෘතියෙහි ඒ පිළිබඳ මඳකරුණක් දැක්වූමු. විස්තර **සඞ්ගීතරත්නාකර**, **සාහිත්‍යදර්පණා**දියෙන් දතහැක. වෘත්තරත්නාකරය පිළිබඳව ද ව්‍යාඛ්‍යාන මුඛයෙන් බොහෝ ග්‍රන්ථ රචනාකළ බව පැණේ. ලක්දිව්හි ද ග්‍රන්ථ දෙකක් නිපදවා තිබේ.

**සිංහලව්‍යාඛ්‍යාව.** ලක්දිව බුද්ධිමතෙකු විසින් නිපදවන ලද ජිඥාසුජනයෙහි බොහෝ ප්‍රයෝජනවත් ග්‍රන්ථයකි. දිවඞ්ගතවූ විද්‍යෝදය විද්‍යාලයාධීශ්වර ත්‍රිපිටක වාගීශ්වර ශ්‍රී ඥානේශ්වරනායක මාහිමියන්වහන්සේගේ සංස්කරණයකින් යුක්තව මෙය මීට අවුරුදු එකුන්සාළිසකට පෙර ප්‍රකාශයට පැමිණියේය. මෑත ඇතිවූ ඇතැම්කෘතිවලට මේ ග්‍රන්ථය ඉවහල්වූ නමුත් ඒ බවක් නො කිහ.

**වෘත්තරත්නාකරපඤ්චිකාව.** මේ වනාහි ශ්‍රීරාහුල සඞ්ඝරාජ මාහිමියන්ගේ කාලයෙහි බෞද්ධාගමචක්‍රවර්ත්ති ශ්‍රීරාමචන්ද්‍රකවි භාරතී නම් ගෞඩදේශියබ්‍රාහ්මණපණ්ඩිතවරයෙකු විසින් සකුබසින් නිපදවන ලද්දකි. රත්නත්‍රයාදිවර්ණනාවශයෙන් නම් එය සම්භාව්‍ය ග්‍රන්ථයකි.

**වුත්තෝදය.** මේවනාහි වෘත්තරත්නාකරයාගේ ම මාගධපරිවර්තනයකි. මෙහි පෙළබසට ගැළපෙන විරිත් පමණක් උදුරා දක්වනලදී. වුත්තෝදයට ද ව්‍යාඛ්‍යාවක් අප විසින් සම්පාදනය කරණු ලැබේ.|යථාකාලයෙහි එය ශිෂ්‍යයන්ගේ අතට පැමිණෙනවා ඇත. ඒතාක් වුත්තෝදය ඉගෙණගන්නන්හට ද වෘත්තරත්නාකරසරලාව්‍යාඛ්‍යාව හිතවැඩ සලසා යයි සිතමු. වුත්තෝදය ඉගෙණගන්නන්විසින් මෙහි ප්‍රථමපරිච්ඡේදයෙහි ලියනලද පරිකථා අවශ්‍යයෙන් කියවිය යුතුයි. සෙසු විරිත් ආදිය පිළිබඳ විස්තර කතරස්ථානයන්හි තිබේ දැයි මෙහි යොදනලද පටුනෙන් හා අනුක්‍රමණිකාවෙන් ද දැන විස්තර උගතයුතු. අශුද්ධවෘත්තරත්නාකරයන් හා සංසන්දනය කිරීමෙන් වුත්තෝදයෙහි සමහර තැන් අශුද්ධත්වයට පමුණුවා තිබෙනබව සිතිය යුතු.

**අන්‍යටීකා හා සරලාව්‍යාඛ්‍යාව.** වෘත්තරත්නාකරයට තවත් ව්‍යාඛ්‍යාවෝ ද විද්‍යමාන වෙත්. ඔවුනතුරෙන් නාරායණභට්ට නම් පණ්ඩිතවරයෙකු විසින් සම්පාදනය කරණ ලද සංස්කෘතටීකාව ශ්‍රේෂ්ඨතර වේ. අපගේ පුරාතන සිංහලව්‍යාඛ්‍යාව ද සම්භාව්‍ය වේ. එකී ග්‍රන්ථයන්ගෙන් ලක්වැසිශිෂ්‍යයන්ගේ ජිඥාසුජනය නො සැලසෙන බව සැලකූ අපවිසින් ඒ ටීකාග්‍රන්ථයන් ආශ්‍රය කොට මේ සරලාව්‍යාඛ්‍යාව සම්පාදනය කරණලදී. නාරායණභට්ටටීකාවත් පිඞ්ගලච්ඡන්දස් සූත්‍රවෘත්තියත් මේ කෘතියෙහි දී ගුරුතන්හි තබනලද බවත් පුරාණසිංහලසන්නයෙන් ද යුක්තස්ථානයන්හි කරුණුපමණක්

නො ච වාක්‍යයන් ද ඇතුළත්කර ගත්බවත් ඒ ග්‍රන්ථකර්තෘවරයන්ට ගෞරව කරමින් මෙහි සඳහන්කරමු. සමහරතැන් මඳක් වෙනස් කර පුරාතනව්‍යාඛ්‍යානය ම අපගේ කෘතියක් ලෙස ප්‍රකාශ කිරීම අපට අනභිමත විය. මේ ව්‍යාඛ්‍යාවෙහි ශිෂ්‍යයන්හට සුබොධවූ අත්‍යාවශ්‍යක නොවනකරුණු නො ලීවෙමු. සියලු වෘත්තයන්හි ගණවිභාගවින්‍යාස ශිෂ්‍යයන් හට අපහසු නො වේ. උදාහරණය ලක්ෂණප්‍රකාශක සූත්‍රයෙහි ම පැණෙනහෙයින් අවශ්‍යයෙන් කියයුතු දෑය තිබිය දී ම බැහැරින් උදාහරණ දැක්වීම ද නිරර්ථකය. බාහිරඋදාහරණ ඵලදායක වනුයේ පිඞ්ගලච්ඡන්දස වැනි කෙවලලක්ෂණප්‍රකාශකග්‍රන්ථ විෂයයෙහි ය. වෘත්තයන් පිළිබඳ විශෙෂව්‍යවස්ථා හා රසානුගුණ භාවය ද වෘත්තස්වරූප නොවනහෙයින් මෙහි නො දැක්වූමු. විස්තරාර්ථීන් විසින් ග්‍රන්ථාන්තරයෙන් ඔහු දතයුත්තාහ. මුම්බාපුරියෙහි මුද්‍රිත සාහිත්‍යදර්පණ ෂෂ්ඨපරිච්ඡෙදයෙහි හතවෘත්තදෙෂය පිළිබඳව ලියනලද ටිප්පණියෙන් පහසුවෙන් දතහැක.

මෙහි කීපපලක් අපගේ අනවධානත්වයෙන් හා සමහර මුද්‍රණාක්ෂරයන්ගේ නොපැහැදිලිකම නිසා ද වැරදී තිබෙන නමුත් අර්ථාවබොධයට හානියක් නොවන හෙයින් ශුද්ධිපත්‍රයක් නො යොදනලදී.

ශුද්ධිපත්‍රපරීක්ෂණය කරදීම් ආදියෙන් විද්‍යොදය පිරිවෙණෙහි උපප්‍රධානාචාර්‍ය්‍ය **බද්දේගම පියරතනාභිධාන** ස්ථවිරස්වාමීන්ද්‍රයන්වහන්සේ මේ කෘතියෙහි අතිශය පිහිට වූ බව ගෞරව පූර්වකව පවසමු. මෙහි අවසානයෙහි පැණෙන කර්තෘසන්දර්ශනාත්මකශ්ලොකපඞ්ක්තිය ද උන්වහන්සේගේ කෘතියකි. අපවිසින් ද කියයුතු දෙය ඇතුළත් නාරායණභට්ටයන්ගේ කෘතියකින් මෙය අවසන් කරමු.

"ග්‍රන්ථේ'ස්මින් ගුණගණවත්ත්වමුච්‍යතෙ චෙත්
ස්වං කාර්‍ය්‍යං ගුණගණවත්තා මන්‍යතෙ කඃ,
තත්සන්තඃ! ශිරසි කෘතාඤ්ජලිස්තු යාචෙ
ශොධ්‍යං තත් සදසදිහොදිතං මයා යත්."

**වැලිවිටියේ සොරත.**

ශ්‍රී: බු: ව: 2470 / ක්‍රි: ව: 1926 ඔක්තෝබර් මස 25 දින

විද්‍යොදය පිරිවෙණේ දී ය.

# පටුන.


| | |
|---|---|
| **I ප්‍රථමාධ්‍යාය.** | **1—27** |
| ඡන්දෝවිභාග ... ... ... | 4 |
| ගණවිභාග ... ... ... ... | 6 |
| ගුරුලඝුලක්ෂණ ... ... ... | 10 |
| භූතසංඛ්‍යා... ... ... ... | 16 |
| යතිලක්ෂණ... ... ... ... | 16 |
| **II ද්විතීයාධ්‍යාය.** | **28—66** |
| ආර්යාප්‍රකරණය ... ... ... | 28 |
| ආර්යාභෙදනෂ්ටොද්දිෂ්ට ... ... | 30 |
| ගීතිප්‍රකරණය ... ... ... | 42 |
| වෛතාලීයප්‍රකරණය ... ... ... | 46 |
| වක්ත්‍රප්‍රකරණය ... ... ... | 52 |
| මාත්‍රාසමප්‍රකරණය ... ... ... | 56 |
| වෘත්තයන්හි ගුරුආදිය දැනගැනීමේ උපාය ... | 61 |
| විපාත්ප්‍රකරණය ... ... ... | 63 |
| **III තෘතීයාධ්‍යාය.** (සවිසිසඳස්) | **66-100** |
| උපජාතිප්‍රස්තාරය ... ... ... | 76 |
| දණ්ඩක ... ... ... ... | 98 |
| **IV චතුර්ථාධ්‍යාය** (අර්ධසම) | **101-106** |
| **V පඤ්චමාධ්‍යාය** (විෂමවෘත්ත) | **105-116** |
| පාදචතුරූර්ධ්වප්‍රකරණය ... ... | 105 |
| ,, ප්‍රස්තාරය ... ... | 106 |
| උද්ගතාප්‍රකරණය ... ... ... | 111 |
| උපස්ථිතප්‍රචුපිතප්‍රකරණය ... ... | 113 |
| ගාථාලක්ෂණ ... ... ... | 116 |
| **VI ෂෂ්ඨපරිච්ඡේදය.** | **117-139** |
| සම-අර්ධසම-විෂම-ආර්යා-මාත්‍රාප්‍රස්තාර | 119 |
| ,, ,, ,, නෂ්ටප්‍රත්‍යය | 124 |
| ,, ,, ,, උද්දිෂ්ටප්‍රත්‍යය | 128 |
| ,, ,, ,, ලගක්‍රියා ,, | 130 |
| ,, ,, ,, සංඛ්‍යාන ,, | 137 |
| ,, ,, ,, අධ්වයොග ,, | 138 |
| අනුක්‍රමණිකාව | 142-147 |

## සරලා ව්‍යාඛ්‍යා

### සහිත

# වෘත්තරත්නාකරය.

1. සුඛසන්තානසිද්ධ්‍යර්ථං නත්වා බ්‍රහ්මාච්‍යුතාර්චිතම්,
ගෞරීවිනායකොපෙතං ශඞ්කරං ලොකශඞ්කරම්.

2. [1]වෙදාර්ථශෛවශාස්ත්‍රඥඃ [2]පව්‍යෙකො'භූද්විජොත්තමඃ,
තස්‍ය පුත්‍රො'ස්ති කෙදාරඃ ශිවපාදාර්චනෙ රතඃ.

---

ලභතෙ යමුපාස්‍යෛව ශඞ්කරාඛ්‍යඃ ශිවො'පි ශම්,
යථාර්ථශඞ්කරං නත්වා බුද්ධං තං විඝ්නශාන්තයෙ.
වෘත්තරත්නාකරස්‍යා'යං සරලාඛ්‍යා සවභාෂයා,
ව්‍යාඛ්‍යා ප්‍රණීයතෙ ඡන්දො ජිඥාසූනාං සුබුද්ධයෙ.

ශ්‍රීමදාචාර්‍ය්‍යකෙදාරභට්ටයෝ ඡන්දශ්ශාස්ත්‍රවිෂයකවෘත්තරත්නාකරාඛ්‍යග්‍රන්ථකරණයෙහි යෙදෙනුවෝ නිර්විඝ්නපරිසමාප්ත්‍යාද්‍යර්ථයන් සඳහා සෙවෂ්ටදෙවතාප්‍රණාමය කොට ග්‍රන්ථකර්තෘඅභිධානාදිය කථනය කටැයි ව "සුඛසන්තානසිද්ධ්‍යර්ථං" යනාදි පද්‍යත්‍රය කීහු.

1. **බ්‍රහ්ම+අච්‍යුත+අර්චිතම්**= මහබඹහු හා විෂ්ණුහු විසින් පුදන ලද; **ලොකශඞ්කරම්**= තුදුස් ලොවට හෝ භූරාදිලොක සතට සෙත කරන්නාවූ; **ගෞරීවිනායක+උපෙතම්**= ගිරිදූව (උමාව) හා ගණදෙවිගෙන් ද යුක්තවූ; **ශඞ්කරම්**=ඊශ්වරයා; **සුඛසන්තාන සිද්ධි+අර්ථම්**=(ප්‍රණාමජනිතකුශලබලයෙන් වන්නාවූ) සුව පරපුර සිදු වනු පිණිස; **නත්වා**= වැඳ; ('තෙන ක්‍රියතෙ'යනු හා සම්බන්ධයි.)

2. **වෙද+අර්ථශෛවශාස්ත්‍රඥඃ**=(ඍගාදි) වෙදයන්ගේ අර්ථ හා (රුද්‍රයාමලාදි) ශිවසම්බන්ධි ශාස්ත්‍ර දන්නාවූ; **පව්‍යකඃ**=පව්‍යක නම් වූ; **ද්විජ+උත්තමඃ**=බමුණුතුමෙක්; **අභූත්**=විය. **තස්‍ය**=ඒබමුණුතුමාගේ; **ශිවපාද+අර්චනෙ රතඃ**=මෙහෙසුරු පා පිදුමෙහි ඇලුනාවූ; **කෙදාරඃ**= කෙදාර නම්වූ; **පුත්‍රඃ**= පුතෙක්; **අස්ති**= ඇති.

---

1. වෙදාන්ත. 2 පව්‍යෙකඃ.

3. තෙනෙදං ක්‍රියතෙ ඡන්දො ලක්ෂ්‍යලක්ෂණසංයුතම්,
වෘත්තරත්නාකරං නාම බාලානාං [1]සුඛබුද්ධයෙ.

---

3. **තෙන**= ඒ කෙදාරයා විසින්; **ලක්ෂ්‍යලක්ෂණ+සංයුතම්**= උදාහරණාත්මක සූත්‍රයෙන් යුක්තවූ; **වෘත්තරත්න+ආකරම් නාම**= වෘත්තරත්නාකර නම් වූ; **ඉදං ඡන්දඃ**= මේ සඳස; **බාලානාම්**= ඡන්දශ්ශාස්ත්‍රය නො දන්නවුන්ගේ; **සුඛබුද්ධයෙ**=සුඛාවබොධය (ස්වල්පොපායකින් ම දැන ගැණීම) පිණිස; **ක්‍රියතෙ**= කරණු ලැබේ.

**පරිකථා**: —

‘සුඛසන්තාන’ යනාදීන් ‘සුඛ’ ශබ්දය ආදියෙහි යෙදීමෙන් මෙය අසන්නවුන්හට අතිශය සුඛය ලැබෙන බව සූචිතයි.

‘සන්තාන’ ශබ්දප්‍රයොගයෙන් බ්‍රාහ්මණ ශාස්ත්‍රයාගේ අක්ෂර පරම්පරාසඞ්ඛ්‍යාතලක්ෂණය සූචිතයි. මාගධිකාවඡන්දශ්ශාස්ත්‍රකාරයෝ ද “නමත්ථු ජනසන්තාන තමසන්තාන භෙදිනො”යනුවෙන් ප්‍රාරම්භයෙහි “සන්තාන” ශබ්ද ප්‍රයොගය කළහ.

බ්‍රහ්ම-අච්‍යුත-ගෞරී-විනායක නාමග්‍රහණය මඞ්ගලාචරණයට අනතුරුව සමෘතිසංරූප සූචනය පිණිසයි. ඒ දෙවතාවන් ද ග්‍රන්ථාදියෙහි සිහිකිරීම විඝ්න(උවදුරු) සන්සිඳීමට හෙතු වෙතැයි දක්වනලදී.

‘ශඞ්කර’ යන තන්හි පූජාවයවවූ ‘ශම්’ යන්න අව්‍යයකි.

‘පිඞ්ගලනාග’ ශබ්දොපාදානයෙන් ‘මේ ශාස්ත්‍රය බ්‍රාහ්මණ කර්තෘකබැවින් ශ්‍රවණයෙහි දෙසක් නැතැයි හඟවයි’ යනු ටීකාකාරයන් කියනලද නමුදු ඒ සත්‍ය නො වේ. නාගයෙකු වූ පිඞ්ගලගේ ඡන්දශ්ශාස්ත්‍රය බමුණෝ අත්‍යාදරයෙන් පරිශීලනය කරත්. වෙදාන්තකර්තෘවූ ශඞ්කරාචාර්‍යයෝ ද සඞ්කරය යනු කිං වදන්නී සි. සෙව්‍යොත්කෘෂ්ටත්වය පවසනු සඳහා තදුපාදානයයි.

ලක්ෂ්‍යලක්ෂණ සංයුතම්-යන මෙහි ‘ලක්ෂ්‍ය’ නම් ඡන්දොනිබද්ධ කාව්‍යාදි උදාහරණයි. ‘ලක්ෂණ’නම් උදාහරණ ප්‍රතිපාදක සූත්‍රයි.

මේ වෘත්තරත්නාකරයෙහි වනාහි ලක්ෂ්‍යයත් ලක්ෂණයත් යන දෙක අභින්න සේ එකක් ම කරණලදී.

“උක්තා වසන්තතිලකා තභජා ජගෞ ගඃ” යනු වසන්තතිලකාවෘත්තයාගේ ලක්ෂණයි. **‘ත- භ- ජ- ජ’** යන ගණ සතර

---

1. සුඛසිද්ධයෙ.

4. පිඞ්ගලාදිභිරාචාර්‍යෛර්‍යදුක්තං ලෞකිකං ද්විධා,
මාත්‍රාවර්ණවිභේදේන ඡන්දස්තදිහ කථ්‍යතේ.

---

සහ අවසන ගුරු දෙකක් ද ඇති වෘත්තය වසන්තතිලකාය යනු එහි අදහසයි. එකී ලක්ෂණයාගේ ලක්ෂ්‍යය හෙවත් උදාහරණය එය ම වේ.

| තගණ | භගණ | ජගණ | ජගණ | ග. ග |
|---|---|---|---|---|
| ◡◡– | ◡–– | –◡– | –◡–– | ◡◡ |

උක්තාව- සන්තති- ලකාත- භජජ- ගෞ ගඃ.

යනු එහි ගුරුලඝු වින්‍යාසයයි. පළමුව අන්තලඝුඇති 'ත'ගණය ද, දෙවනුව ආදියෙහි ගුරු ඇති 'භ'ගණය ද, තෙවනුව මධ්‍යයෙහි ගුරුඇති 'ජ'ගණය ද, සිවුවෙනුවත් 'ජ'ගණය ද, ඉන් පසු ගුරු දෙකක් ද යෙදී තිබෙන බව පෙණේ. සෙස්සෙහි ද මෙසේ මැයි.

"වෘත්තරත්නාකරං නාම ඡන්දඃ" යනුවෙන් අභිධාන සන්දර්ශිතය. "ලක්ෂ්‍යලක්ෂණසංයුතම්" යනුවෙන් අභිධෙය සන්දර්ශිත ය. "බාලානාං සුඛබුද්ධයෙ" යනුවෙන් ප්‍රයොජන සන්දර්ශිතය. සම්බන්ධ කවර පදයකින් සන්දර්ශිත ද? යත්:-අභිධෙයශාස්ත්‍රප්‍රයොජන කථනයෙන් ම සම්බන්ධය උක්තයයි දතයුතු.

"අවද්‍යං ඡාදයතීති=ඡන්දඃ" යනු නිර්වචන හෙයින් දෙස් වසනුයේ ඡන්දස් නම් වේ. "ඡන්දයන්ති ආහ්ලාදයන්ති, ඡන්ද්‍යතෙ නෙනෙති වා=ඡන්දඃ" යනු ද විග්‍රහයි. ලක්ෂ්‍යත ඉති=ලක්ෂ්‍යම්-ලක්ෂණයෙන් හැඳින ගණු ලබන්නේ ලක්ෂ්‍යයි. ලක්ෂ්‍යතෙ 'නෙනෙති=ලක්ෂණම්-මෙයින් ලක්ෂ්‍යය හැඳින ගණු ලැබේ නු යි ලක්ෂණ නම්. හැඳිනීමට ඉවහල් වන්නේ ලක්ෂණයි. ලක්ෂ්‍ය මෙව ලක්ෂණම්= ලක්ෂ්‍යලක්ෂණම්, වෘත්තාන්‍යෙව රත්නානි=වෘත්ත රත්නානි; වෘත්තරත්නානාම් ආකරො යස්මිංස්තත්=වෘත්තරත්නාකරම්-'ආකර' යනු උත්පත්තිස්ථාන හෝ සමූහයි. කියනලද මැයි විශ්වප්‍රකාශයෙහි "ආකරෙ නිවහොත්පත්තිස්ථානශ්‍රෙෂ්ඨෙෂු කථ්‍යතෙ"යි.

මෙසේ සාමාන්‍යයෙන් ග්‍රන්ථකරණය ප්‍රතිඥා කොට දූන් ප්‍රතිපාදනය කටයුතු අර්ථය වෙසෙසින් ප්‍රතිඥා කරයි "පිඞ්ගලාදිභිඃ" යනාදීන්.

4. **පිඞ්ගල+ආදිභිඃ**=(සූත්‍රකාර) පිඞ්ගලනාගයන් ආදිකොට ඇති; **ආචාර්‍යෛඃ**= (භාෂ්‍යකාරාදි) ආචාර්‍යයන් විසින්; **ලෞකිකම්**=ලෞකික වූ; **යත්**= යම් ඡන්දසක්; **මාත්‍රාවර්ණවිභෙදෙන**=

මාත්‍රාඡන්දසය වර්ණඡන්දසය යන භෙදයෙන්; **ද්විධා**=දෙපරිද්දක්න්; **උදාහ්ටම්**=කියනලද ද; **ඉහ**= මේ වෘත්තරත්නාකරයෙහි; **තත් ඡන්දඃ**= ඒ ඡන්දස; **කථ්‍යතෙ**=කියනු ලැබේ.

**පරිකථා**:-

ඡන්දස වනාහි වෛදිකඡන්දසය ලෞකිකඡන්දස යයි දෙවැදෑරුම් වේ. වෙදමන්ත්‍රනිබද්ධඡන්දස වෛදික නම්. ඒ වනාහි ගායත්‍රි, උෂ්ණික්, අනුෂ්ටුභ්, වෘහතී, පඞ්ක්ති, ත්‍රිෂ්ටුභ් ජගතී යන වශයෙන් බෙදනලදී. ඒ ආර්ෂි, දෛවී, ආසුරි, ප්‍රාජාපත්‍යා, යාජුෂි, සාම්නී, ආර්චී, බ්‍රාහ්මී යයි වෙන් වෙන් වශයෙන් එකක් එකක් අට වැදෑරුම් වේ. පහත දක්වනු ලබන කොෂ්ඨයෙන් ඒ දතහැක.

| | ඡන්දස් | ගා. | උ. | අ. | වෘ. | ප. | ත්‍රි. | ජ. |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | ආර්ෂි | 24 | 28 | 32 | 36 | 40 | 44 | 48 |
| 2 | දෛවි | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 |
| 3 | ආසුරී | 15 | 14 | 13 | 12 | 11 | 10 | 9 |
| 4 | ප්‍රාජාපත්‍යා | 8 | 12 | 16 | 20 | 24 | 28 | 32 |
| 5 | යාජුෂි | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 |
| 6 | සාම්නී | 12 | 14 | 16 | 18 | 20 | 22 | 24 |
| 7 | ආර්චි | 18 | 21 | 24 | 27 | 30 | 33 | 36 |
| 8 | බ්‍රාහ්මී | 36 | 42 | 48 | 54 | 60 | 66 | 72 |

අක්ෂර සුවිස්සක් ඇතියේ ආර්ෂිගායත්‍රියයි. එක්අකුරක් ඇති ඡන්දස දෛවීගායත්‍රියයි. පඤ්චදශාක්ෂරඡන්දස ආසුරීගායත්‍රියයි. අකුරුඅටක් ඇතියේ ප්‍රාජාපත්‍යාගායත්‍රියයි යනාදි වශයෙන් වෛදිකඡන්දසෙහි භෙදය දතයුතු. ඒ මෙහි උපයොගී නොවන හෙයින් ප්‍රපඤ්ච නො කරමූ.

ලෞකිකඡන්දස ද මාත්‍රාඡන්දසය, වර්ණඡන්දස යයි දෙවැදෑරුම්. ඒ මෙහි විස්තර කරණු ලැබේ. මාත්‍රාවර්ණග්‍රහණයෙන් සමහරුන් විසින් කියනලද මාත්‍රාඡන්දස්, ගණඡන්දස්, යන ද්විභෙදය නිරාකෘතයි. වර්ණඡන්දස මුත් ගණඡන්දසක් මෙහි නැතැයි යනු භාවයි. මාත්‍රාවර්ණවිභාගයෙහි ගණඡන්දස ද අන්තර්ගීත වේ.

5. ෂඩධ්‍යාය නිබද්ධස්‍ය ඡන්දසෝ'ස්‍ය පරිස්ඵුටම්,
[1]ප්‍රමාණමපි විඥෙයං ෂට්ත්‍රිංශදධිකං ශතම්.

---

"ආදෞ තාවද්ගණච්ඡන්දො මාත්‍රාඡන්දස්තතඃ පරම්,
තෘතීයමක්ෂරච්ඡන්දශ්ඡන්දස්ත්‍රෙධා තු ලෞකිකම්.
ආර්‍ය්‍යාද්‍යුද්ගීතිපර්‍ය්‍යන්තං ගණච්ඡන්දඃ සමීරිතම්,
වෛතාලීයාදි චූලිකාන්තං මාත්‍රාඡන්දඃ ප්‍රකීර්තිතම්;
සමාන්‍යාද්‍යුත්කෘතිං යාවදක්ෂරච්ඡන්ද එව ච"

යනුවෙන් ගණ-මාත්‍රා-අක්ෂරවශයෙන් ඡන්දස තෙවැදෑරුම් යැයි හලායුධභට්ටයෝ කියත්. 'ගණච්ඡන්දස' නම් ආර්‍ය්‍යාදියයි. 'මාත්‍රාච්ඡන්දස' නම් වෛතාලීයාදියයි. තදන්‍ය වූ සාමාන්‍ය ච්ඡන්දස අක්ෂරච්ඡන්දස යයි ද කියත්.

අත්‍යන්තාතීත සම්භාවිතවූ ඡන්දස් මෙහි ඇතුළත්වනු වළක්වනු සඳහාත් ශිෂ්‍යයන්ගේ උත්සාහ වර්ධනය කරණු සඳහාත් සව ග්‍රන්ථය ප්‍රමාණවශයෙන් පිරිසිඳ දක්වනුවෝ "ෂඩධ්‍යාය නිබද්ධ ස්‍ය" යනාදිය කියත්.

5. **පරිස්ඵුටම්**=භාත්පසින් ප්‍රකට කොට; **ෂට්+අධ්‍යාය නිබද්ධස්‍ය**= අධ්‍යාය සයකින් බඳනාලද; **අස්‍ය ඡන්දසඃ**=වෘත්තරත්නාකර නම්වූ මේ ඡන්දෝග්‍රන්ථයාගේ; **ප්‍රමාණම් අපි**=ප්‍රමාණයත්; **ෂට්ත්‍රිංශත්+අධිකම්**=සතිසක් අධික කොට ඇති; **ශතම්**=ශ්ලෝක සියයකැයි; **විඥෙයම්**=දතයුතුයි.

**පරිකථා:—**

අක්ෂරනියමය සාමාන්‍යයෙන් ඡන්දසයයි කියතුදු තත්කථන ග්‍රන්ථය ද උපචාරවශයෙන් 'ඡන්දස්' නම් වේ.

ග්‍රන්ථගණනාවෙහි අෂ්ටාක්ෂරාත්මකඅනුෂ්ටුප්ඡන්දස ම ප්‍රසිද්ධ බැවින් මෙහි ද අනුෂ්ටුප් ඡන්දසින් ශ්ලෝක එක්සිය සතිසක් පමණ යයි සැලැකියයුතු.

මේ ප්‍රමාණකථනයෙන් භාෂ්‍යාදිග්‍රන්ථපර්‍ය්‍යෙහි නිෂ්ඵල වූ ප්‍රයාසය නො කොට ප්‍රසිද්ධ වූ සියලු ඡන්දසුන් දැන ගණු කැමැති යන් විසින් සංක්ෂිප්තවූ මේ ග්‍රන්ථය ම අල්පප්‍රයාසයෙන් හදරණු ලැබේ වායි අතිවිස්තෘත කඨින ග්‍රන්ථයන් හැදෑරීමෙහි මන්දෝත්සාහ ඇත්තවුන් අභිමුඛ කෙරෙති.

---

1. ප්‍රමාණමිත.

6. ම්‍යරසතජභ්නගෛර්ලාන්තෛරෙභිර්දශභිරක්ෂරෛඃ,
සමස්තං වාඞ්මයං ව්‍යාප්තං ත්‍රෛලොක්‍යමිව විෂ්ණුනා.

7. සර්වගුර්මෝ මුඛාන්තර්ලෞ යරාවන්තගලෞ සතෞ,
ගමධ්‍යාද්‍යෞ ජ්භෞ ත්‍රිලො නො'ෂ්ටෞ භවන්ත්‍යත්‍ර ගණාස්ත්‍රිකාඃ.

---

සියලු වචනයෙහි පැතිර පවත්නා බැවින් මගණාදීන්ට ස්තුති කෙරෙමින් දූන් ඔවුන්ගේ ලක්ෂණකථනය පිණිස "ම්‍යරසත" යනාදීන් ගණයන් උදෙසත්.

6. **විෂ්ණුනා**= විෂ්ණු විසින්; **ත්‍රෛලොක්‍යම් ඉව**= තුන්ලොව (පැතිරෙණ ලද්දක්)මෙන්; **සමස්තම්**= සියලු; **වාඞ්මයම්**= වචන සමූහය හෝ ශාස්ත්‍රය; **ලාන්තෛඃ**= ලඝුව අන්ත කොට ඇති; **ම්‍යරසතජභනගෛඃ**= 'ම' ගණ, 'ය' ගණ, 'ර' ගණ, 'ස' ගණ, 'ත'ගණ, 'ජ'ගණ, 'භ'ගණ, 'න'ගණ ගුරු යන; **එභිඃ**=මේ; **දශභිඃ අක්ෂරෛඃ**=අකුරු දසය විසින්; **ව්‍යාප්තම්**=පැතිර ගන්නාලදී.

**පරිකථා**:—

තුන්ලොව හැම තැන හැම දෙයෙහි විෂ්ණුතෙමේ පැතිර සිටීයයි වෛදිකයන්ගේ විශ්වාසයකි. ඒ බව "යච්ච කිඤ්චිජ්ජගත්‍යස්මින්"යනාදීන් ශ්‍රැතියෙහි දක්වනලදී. 'ම,ය' යනාදි ක්‍රමය වනාහි ත්‍ර්‍යක්ෂරච්ඡන්දස්හුගේ ප්‍රස්තාරයෙහි ලැබෙන පිළිවෙළින් යොදනලදී. 'මගණ' යනාදි සංඥා ද "ධී ශ්‍රී ස්ත්‍රී=ම්, ව රා සා=ය්, කා ගුහා=ර්" යනාදි පිළිවෙළින් පිඞ්ගලනාගයන් විසින් කරණ ලද පරිභාෂායි ධී, ශ්‍රී, ස්ත්‍රී, ශබ්දාදීන්ගේ ගැණීමේ හෙතු පිඞ්ගල සූත්‍රවෘත්තීන්ගෙන් දතයුතු.

7. **සර්වගුඃ**= සර්වගුරු ඇතියේ; **මඃ**= මගණයි. **මුඛාන්තලෞ**= ආදියෙහි හා මධ්‍යයෙහි ලඝු ඇත්තාහු; **යරෞ**= යගණ රගණ යෝයි. **අන්තගලෞ**=අන්තයෙහි ගුරු හා අන්තයෙහි ලඝු ඇත්තාහු; **සතෞ**= සගණ තගණයෝයි. **ගමධ්‍යාද්‍යෞ**= ගුරුමධ්‍ය ගුර්වාදි වූවාහු; **ජ්භෞ**= ජගණ භගණයෝයි **ත්‍රිලඃ**= ලඝුතුණක් ඇතියේ; **නඃ**= නගණයි. **අත්‍ර**=මේ ඡන්දශ්ශාස්ත්‍රයෙහි; **ත්‍රිකාඃ**= අකුරුතුණ බැගින් ඇති; **අෂ්ටෞ ගණාඃ භවන්ති**= ගණයෝ අටක් වෙති.

**පරිකථා**:—

කවරහෙයින් ගණයකට අකුරු තුණෙක් ම වී ද? යත්:- බ්‍රහ්ම, විෂ්ණු, මහෙශ්වර යන මූර්ත්තිත්‍රය හා සත්ත්ව, රජස්, තමස් යන ගුණ තුණත් පරමශීතය කරණු සඳහා ගණය අකුරුතුණකින් පරිමිත වීයයි ඇතැම්හු කියත්. ඒ ඔවුන්ගේ දෙවභක්ති

පූජීක මිතිමාත්‍රයෙකි. 'ගණ' නම් සමූහයි. සමූහවනුයේ යටත් පිරිසෙයින් තුණක් එක්වූ විටය. එහෙයින් ගණයක් හෙවත් සමූහයක් ඇති වන ඉතා අඩුගණන ගෙණ ගණය අක්ෂරත්‍රයයකින් පරිමිතබව සිතිය යුතුයි.

කවර හෙයකින් අඩු වැඩි නො ව ගණ අටක් ම වී ද? යත්:- අක්ෂරත්‍රයාත්මක වූ මධ්‍යාඡන්දස ප්‍රස්තාර කළ විට වෘත්ත අටක් ම ලැබෙන හෙයිනි. මෙහි ගණනාමයෙන් ගන්නාලද්දේ මධ්‍යාඡන්දසෙහි පිළිවෙළින් ලැබෙන වෘත්ත අටයි. මෙහි පහත දක්වනු ලබන කොෂ්ඨයෙන් ගණයන්ගේ නාමාදිය දතහැකි වේ.

| ගණනාම | ප්‍රස්තාර | දෙවතා | මිත්‍රාදි | ඵල | ශුභාදි | උදාහරණ |
|---|---|---|---|---|---|---|
| මගණ | ◡◡◡ | මහී | මිත්‍ර | ශ්‍රී | ශුභ | ධීශ්‍රීස්ත්‍රී |
| යගණ | —◡◡ | ජල | දාස | ආයු | ශුභ | වරුසා |
| රගණ | ◡—◡ | අග්නි | ශත්‍රු | දාහ | අශුභ | කාගුහා |
| සගණ | ——◡ | වායු | ශත්‍රු | විදෙශගමන | අශුභ | වසුධා |
| තගණ | ◡◡— | ආකාශ | උදාසීන | ශූන්‍ය | අශුභ | සාංතෙඩ |
| ජගණ | —◡— | රවි | උදාසීන | රුජා | අශුභ | කදාස |
| භගණ | ◡—— | චන්ද්‍ර | දාස | යශස් | ශුභ | කිංවද |
| නගණ | ——— | ස්වර්ගී | මිත්‍ර | වෘද්ධි | ශුභ | නහස |

('ජ-ර' ගණ උදාසීන යයි ද, 'ත-ස' ගණ ශත්‍රු යයි ද මතයක් පවතී.)

ශාන්ත්‍යාදිය සඳහා පද්‍යබන්ධනය කරණ විට පද්‍යයාගේ ආරම්භයෙහි හා කාව්‍යයෙන් අපෙක්ෂා කරණු ලබන නායකයාගේ නාමයට දෙපසෙහි ද ඉෂ්ටගණ යෙදීම ශිෂ්ට සම්ප්‍රදායයි. මෙහි කියනලද ඵල කාව්‍යනායකයාට හෝ පද්‍යය කළහුට හෝ එය පඨනය කරන්නාට හෝ යෙදෙන පරිද්දෙන් සමුචිතයි. දුෂ්ටඵල ඇති ගණයක් කාව්‍යප්‍රාරම්භයෙහි යෙදුන හොත් එය රකිණු සඳහා දෙවන ගණය ශුද්ධ කටයුතුයි. ප්‍රථමගණයට සීහෙන්නක් දෙවනු ව යෙදිය යුතුයි. මතු දක්වනු ලබන කොෂ්ඨයෙන් ඒ දත හැකි වේ.

| | මිත්‍ර ගණ වුව | දස ගණ වුව | උදසීන ගණ වුව | ශත්‍රු ගණ වුව |
|---|---|---|---|---|
| මිත්‍රගණයෙන් | සමෘද්ධ්‍යාදි වේ | ජයාදියවේ | ශූන්‍ය වේ | බන්ධුපීඩා |
| දස ,, | සර්වකාර්‍ය සිද්ධි | සියලුලාභ | ධනනාශ | ශෝක |
| උදසීන ,, | ස්වල්පකාර්‍ය සිද්ධි | ප්‍රභුත්වය | මන්ද ධෛර්‍ය | ස්වජනවෛර |
| ශත්‍රු ,, | භ්‍රම, නාශ | භාර්‍යා නාශය | සියකුලය නැසීම | විනාශය |

"මිත්‍රගණයෙන් පරව මිත්‍රගණ වුව හොත් සමෘද්ධ්‍යාදිය වේ. මිත්‍රගණයෙන් පරව දසගණ වුව හොත් ජයාදිය වේ. මිත්‍රගණයෙන් පරව උදසීනගණ වුව ශූන්‍ය වේ" යනාදි වශයෙන් යොදා ගතයුතුයි. කවිකණ්ඨපාශපරිශිෂ්ටයෙන් විස්තර පහසුවෙන් දතහැකි බැවින් නො ලියමු.

"නිපීය යස්‍ය ක්ෂිතිරක්ෂිණඃ කථාං
තථා'ද්‍රියන්තෙ න බුධාඃ සුධාමපි"

යනුවෙන් නෛෂධයෙහි ද,

"ශ්‍රියඃ පතිඃ ශ්‍රිමති ශාසිතුං ජගජ්
ජගන්නිවාසො වසුදෙව සද්මනි"

යනුවෙන් මාඝයෙහි ද පැණෙන ප්‍රාරම්භශ්ලෝක උදසීන ජගණයෙන් ආරම්භ කොට තිබෙන නමුදු දෙවනුව උදසීන ගණයක් ම යෙදී තිබෙන හෙයින් අශුභත්වයක් නැති නුයි දෙස් නො වේ.

"අක්ෂරෙ පරිශුද්ධෙ තු නායකො භූතිමෘච්ඡති" යනු හෙයින් අක්ෂරපරිශුද්ධිය ඇතිකල්හි නායකාදීන්ට ශුභ වේ නුයි මෙහි ඒ පිළිබඳ ස්වල්පයක් ම කියනු ලැබේ. ඛ ඣ ඤ ට ඨ ඪ ණ ප ඵ බ භ ම ර ල ව ෂ හ යන මේ අකුරු හා සංයොගාක්ෂර ද හැර සෙසු අකුරු ශුභඵලය යනු සංක්ෂෙපයි. ඒ බව භාමහාචාර්‍යයන් විසිනුදු "අවර්ණාත් සම්පත්තිර්භවති" යනාදීන් දක්වන ලදී. අක්ෂරයන්ගේ ශුභාශුභත්වය ආචාර්‍යමතයන්ගේ වශයෙන් නන්අයුරු වේ. සිද්ධාන්තසඞ්ග්‍රහාදියෙන් විස්තර උගත යුතු.

එසේ ම දුඃඛදරිද්‍ර්‍යාදිඅනිෂ්ටවාචකශබ්ද කාව්‍යාදීන්ගේ ආදියෙහි නො යෙදිය යුතු. දෙවතාදිවාචකශබ්දයක් පෙරටුව යෙදූ විට ගණවශයෙන් හෝ අක්ෂරවශයෙන් හෝ දෙසක් නො වේ. ආචාර්‍යභාමහයන් විසිනු දූ මේ කියනලදී:-

8. ඥෙයාඃ [1]සර්වාන්තමධ්‍යාදි ගුරවො'ත්‍ර චතුෂ්කලාඃ,
ගණාශ්චතුර්ලඝූපෙතාඃ පඤ්චාර්‍ය්‍යාදිෂු සංස්ථිතාඃ.

---

"දෙවතාවාචකාඃ ශබ්දා යෙ ච භද්‍රාදිවාචකාඃ,
තෙ සර්වෙ නෛව නින්ද්‍යාඃ ස්‍යුර්ලිපිතො ගණතො'පි වා"යි.

මෙසේ හෙයින් ම මාඝ-කිරාතාර්ජුනීයකාව්‍යයන්හි ආදියෙහි ජගණ හා සංයොගාක්ෂරත් යෙදුන තමුදු ශ්‍රී ශබ්දප්‍රයොග හෙතුවෙන් නිර්දෙෂ වේ.

උද්දිෂ්ට වූ දශාක්ෂරයෙන් අෂ්ටාක්ෂරයක් නිද්දිෂ්ට කල්හි අවශිෂ්ටාක්ෂරද්වය දක්විය යුතු වුව ද ගණව්‍යවස්ථාව දක්වූ ප්‍රස්තාවයෙහි ම ආර්‍ය්‍යාජාතියට උපයොගවත් වූ ගණව්‍යවස්ථාව දක්වනු පිණිස "ඥෙයාඃ" යනාදිය කීහු.

8. **අත්‍ර ආර්‍ය්‍යා+ආදිෂු**= මේ ආර්‍ය්‍යාදි ඡන්දස්හි; **සංස්ථිතාඃ**= සිටියාවූ; **චතුෂ්කලාඃ**= මාත්‍රා සතරකින් යුක්තවූ; **චතුර්ලඝු+උපෙතාඃ**= ලඝු සතරක් ඇති ගණයකින් ද යුක්තවූ; **සර්ව+අන්ත මධ්‍ය+ආදිගුරවඃ**= සර්වගුරු අන්තගුරු මධ්‍යගුරු ආදිගුරුවූ; **පඤ්ච ගණාඃ**= පස්ගණකෙනෙක්; **ඥෙයාඃ**= දතයුත්තාහ.

**පරිකථා**—

ඇසිපියහෙලුමක්තුල හෝ අසුරුසනක් තුල උච්චාරණය කරණු ලබන්නී එක් මාත්‍රාවකි. මාත්‍රාඡන්දසෙහි ගණයක් එබදු මාත්‍රා සතරක් ඇත්තේ වේ. එහෙයින් මාත්‍රාඡන්දසෙහි සර්වගුරුගණයට ගුරු අකුරු දෙකකි. සර්වලඝුගණයට ලුහු අකුරු සතරකි. මෙහි ද ගණ උදෙසනලද්දේ ප්‍රස්තාර ක්‍රමයෙනි. චතුර්මාත්‍රප්‍රස්තාරයෙහි සර්වගුරු වෘත්තය මූලට තබා යථාවිධින් ප්‍රස්තාර කළවිට ලැබෙන්නේ විරිත් පසකි. (මාත්‍රා ප්‍රස්තාරය පසුව ප්‍රකාශ කරණු ලැබේ.)

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 1. | | | ⌣ | ⌣ | සර්වගුරු | ගණය. (විගුරුයි) |
| 2. | | — | — | ⌣ | අන්ත්‍යගුරු | 'ස'ගණය |
| 3. | | — | ⌣ | — | මධ්‍ය ගුරු | 'ජ'ගණය |
| 4. | | ⌣ | — | — | ආදිගුරු | 'භ'ගණය |
| 5. | — | — | — | — | සර්වලඝු | ගණය (චතුර්ලඝුයි) |

ප්‍රස්තාරක්‍රමය මෙසේ හෙයින් ඇතැම්පොත්වල දක්නා පාඨාන්තරය යොග්‍ය නො වේ. මේ ගණක්‍රමය ආර්‍ය්‍යාවන් පිළිබඳ නෂ්ට-උද්දිෂ්ටයන්හට උපයොගි නුසි එහි ම දක්වනු ලැබේ. පඤ්චමාත්‍රිකාදි ගණයෝ ප්‍රාකෘතයෙහි මුත් සංස්කෘතයෙහි නො ලැබෙත්.

---

1. සර්වාදිමධ්‍යාන්තාඃ.

9. සානුස්වාරො විසර්ගාන්තො දීර්ඝො යුක්තපරශ්ච යඃ,
වා පාදාන්තෙ ත්වසෞ ග් වක්‍රො ඥෙයො'න්‍යො මාත්‍රිකො ලෘජුඃ.

---

ප්‍රස්තුත වූ වර්ණනිර්දේශයෙහි අවශිෂ්ටාක්ෂරද්වය දක්වනු පිණිස “සානුස්වරෙ” යනාදිය කියත්.

9. **යඃ**= යම් ස්වරයෙක්; **ස+අනුස්වාරඃ**= අනුස්වාර සහිත ද, **විසර්ග+අන්තඃ**= විසර්ජනීයාන්ත ද; **දීර්ඝඃ**= දීර්ඝ ද; **යුක්තපරඃ ච**=සංයොගයක්හු හෝ ව්‍යඤ්ජනමාත්‍රයක්හු පරකොට ඇත්තේ ද; **අසෞ**= මේ වර්ණය තෙමේ; **ග්**= ගුරු නම් වේ. **පාද+අන්තෙ තු**= පාදයාගේ අන්තයෙහි වැටෙන්නාවූ; **මාත්‍රිකඃ**= හ්‍රස්වාක්ෂරය තෙමේ; **වා**–ව්‍යවස්ථිතවිභාෂාවශයෙන්; **ග්**–ගුරු වේ. **වක්‍රඃ**–ප්‍රස්තාරයෙහි ලා රේඛා හෙයින් වක් වූයේ; **ඥෙයඃ**= දත යුතුයි. **අන්‍යඃ**= යථොක්ත ලක්ෂණයෙන් අන්‍යවූ; **මාත්‍රිකඃ**= එක් මාත්‍රාවක් ඇත්තේ; **ල්**–ලඝු නම් වෙයි. **ඍජුඃ**=(මෙ ද ප්‍රස්තාරයෙහි ලා රේඛා හෙයින්) ඍජු වූයේ; **ඥෙයඃ**= දත යුතු.

**පරිකථා**:—

‘අනුස්වාර’ නම් බින්දුවර්ණයි. ‘අං–කං’ යනාදියෙහි බින්දු වර්ණයට පෙරටුව සිටි හ්‍රස්වාක්ෂරය ගුරු වේ.

‘අඃ, කඃ’ යනාදීන්හි විසර්ගයට පෙරටුව සිටි හ්‍රස්වාක්ෂරය ගුරු වේ. ‘ආ, ඊ, කා’ යනාදි දීර්ඝය ගුරු වේ. දීර්ඝග්‍රහණයෙන් ම ප්ලුතය ද ගණු ලැබේ. ‘විෂ්ණු’ යනාදීන්හි සංයොගයට පෙරටු ව සිටි හ්‍රස්වය ගුරු වේ. ‘යුක්තපරශ්ච’ යන්නෙන් ම ව්‍යඤ්ජන උපධ්මානීය ජිහ්වාමූලීය යන මොහු ද ගණු ලැබෙත්. “තනුවාගවිභවො'පි සන්” යන තන්හි කෙවලව්‍යඤ්ජනය වූ නකාරයට පෙරටුව සිටි සකාරස්ථ අකාරය ගුරු විය. “මන්දඃ×කවියශඃ ප්‍රාර්ථී” යනතන්හි ජිහ්වාමූලීය උපධ්මානීයයන්ට පෙරටු වූ දකාරශකාරස්ථහ්‍රස්වඅකාර ගුරු විය. මේ ටීකාකාරමතයි. ‘මෙහි ‘විසර්ගාන්තඃ’ යන්නෙන් ම තදුදෙශවූ *ජිහ්වාමූලීයයාගේ හා උපධ්මානීයයාගේත් ග්‍රහණය වේ” යයි චිරන්තනසිංහල ව්‍යාඛ්‍යාවෙහි කියන ලදී.

සංයොගය පර කොට ඇත්තේ ගුරු වේ යයි මෙහි දක්වන ලද නමුදු ‘ප්‍ර, හ්‍ර’ යන සංයොගාක්ෂර පර වූ විට යථායොග්‍යයෙන් ගුරු වේ යයි ‘ප්‍ර හ්‍රෙ වා’ යනාදීන් ග්‍රන්ථාන්තරයෙහි

---

* ඔභාවශ්ච නිවෘත්තිශ්ච ශෂසා රෙඵ එව ච,
ජිහ්වාමූල මුපධ්මා ච ගතිරෂ්ටවිධොෂ්මණඃ”–පාණිනීයශික්ෂා.

දක්වන ලදී. අනතුරුව කථ්‍යමානක්‍රමසංඥයෙන් ම ඔවුන්ගේ සඞ්ග්‍රහය ද වේ යයි ටීකාකාරයෝ කියත්. "ගෘහීතප්‍රත්‍යුද්ගමනීය වස්ත්‍රා" යන කුමාරසම්භවපාඨයෙහි 'ප්‍ර' ශබ්දය පරකල්හි තත්පූර්ව වූ තකාරසථ අකාරයාගේ ලඝුත්වය ම පැණේ. නො එසේ වුව වෘත්තභෙදය වේ. "ප්‍රාප්‍ය නාභි¹හ්‍රදමජ්ජනමාශු" යන මාඝ පාඨයෙහි 'හ්‍ර' ශබ්දය පරකල්හි තත්පූර්වාක්ෂරය ලඝුත්වයෙන් ම සිටී. "තව ප්‍රියාපප්‍රියො මම ප්‍රිරහූත්" යනාදීන්හි ද මෙසේ මැයි.

"යදා තීව්‍රප්‍රයත්නෙන සංයොගාදෙරගෞරවම්,
න ඡන්දොභඞ්ග ඉත්‍යාහුස්තදා දොෂාය සූරයඃ"

යනුවෙන් සරස්වතීකණ්ඨාභරණකාරයෝ "සංයොගය තීව්‍රප්‍රයත්නයෙන් උසුරුවීමෙන් සංයොගාදිවර්ණයාගේ ලඝුත්වය වේ යයි කියත්. "එතච්ච ශ්‍රුත්වා ගදිතො මයා ත්වම්" "තානමෘතානපි ක්‍රව්‍යාදඃ" "ධනං ප්‍රදත්තෙන ශ්‍රුතෙන කර්ණඃ" යනාදීන්හි තීව්‍රප්‍රයත්නොච්චාරණය හෙයින් සංයොගාදිහුගේ ගුරුත්වය නො වීය. අතීව්‍රප්‍රයත්නයෙන් උච්චාරණය කිරීමෙහි දී සංයොගපූර්වයාගේ ගුරුභාවය ම වේ. "අථ ප්‍රජානාමධිපඃ ප්‍රභාතෙ" යනාදීන්හි ඒ දක්ක යුතු. ප්‍රාකෘතාදීයෙහි කෙවල වූ හෝ සව්‍යඤ්ජන වූ 'ඉං-හිං-උං-හුං-එ-ඔ'කාරයන්ගේ ගුරුභාවය විකල්පයෙන් වේ. ඒ මෙහි අනුපයොගි බැවින් විස්තර නො කරමු.

පාදාන්තයෙහි ලඝුව විකල්පයෙන් ගුරු වේ යයි සාමාන්‍යයෙන් කියන ලදී. නමුත් වසන්තතිලකාදිය හැර සෙසු සෑම වෘත්තයන්හි ද්විතීයචතුර්ථපාදයන්ගේ අවසානයෙහි ලැබෙන ලඝුව යයි "යත් පාදාන්තෙ ලඝොරපි ගුරුභාව උක්තස්තත් සර්වත්‍ර ද්විතීයචතුර්ථපාදවිෂයම්. ප්‍රථමතෘතීයපාදවිෂයං තු වසන්ත තිලකාදෙරෙව." යනුවෙන් සාහිත්‍යදර්පණකාරයන් විසින් වෙසෙසා දක්වන ලදී. මම්මටභට්ටයෝ¹ ද මෙය ම ප්‍රකාශ කළහ. "ආදිපදෙනෙන්ද්‍රවජ්‍රොපෙන්ද්‍රවජ්‍රයොඃ සඞ්ග්‍රහඃ" යනු විපර්ණි හෙයින් ඉන්ද්‍රවජ්‍රා–උපෙන්ද්‍රවජ්‍රා දෙක්හි ද ප්‍රථමතෘතීයපාදාවසාන යෙහි ලැබෙන ලඝුව ගුරු වේ. චිරන්තනසිංහලව්‍යාඛ්‍යාකාරයෝ වංශස්ථය ද මීට ඇතුළත් කළහ. ආර්‍යාදීන්හි ද පාදාන්ත ලඝුව ඇතැම්විට ගුරු වන බව වෘත්තරත්නාකරයෙහි ම පැණේ. මෙකී වෘත්ත හැර සෙසු වෘත්තයන්හි පළමුවන තුන්වන පාද

1. කාද-මුද්‍රිතමම්මටකාව්‍ය.

ගුරකින් අවසන් කළයුතු නම් නියතගුර්වක්ෂරයක් ම යෙදිය යුතු. අනන්තගුරුවෘත්තයන්හි ප්‍රථමතෘතීයපාදන්ත ලඝුයුක්ත කළ හොත් **අප්‍රාප්තගුරුභාවාන්තලඝුකාදොෂයෙන්** නො මිදේ. පාදවසානයෙහි ලඝු යෙදූවිට බන්ධයාගේ ශෛථිල්‍යශ්‍රැතිය වේ නම් එබන්දෙහි ලඝු නො යෙදිය යුතු. ලඝුවක් වුව ද දුඃශ්‍රවයෙන් යුක්ත විට නිදෙසි. "දෘෂ්ටෙ යත්‍ර පතන්ති මූර්ධසු සමස්ත්‍රාණි වස්ත්‍රාණි ච" යන්නෙහි අනන්ත්‍යවර්ණය ලිහිල් වූ ශ්‍රැතියෙන් යුත් හෙයින් සදෙස් වේ. එය ම "වස්ත්‍රාණ්‍යපි"යි ගත් කල්හි ලඝුවක් වුව ද දුඃශ්‍රවය ලැබෙන හෙයින් නිදෙස් වේ.

මෙහි 'වා' ශබ්දය ව්‍යවස්ථිතවිභාෂාර්ථ හෙයින් වසන්තතිලකාදියෙහි පාදන්තලඝුව නිත්‍යයෙන් ගුරු වේ. උද්ගතා අචලධෘති ආදියෙහි නිත්‍යයෙන් ම ලඝු වේ.

'ගන්තෙ' යන පිඞ්ගල සූත්‍රයට වෘත්ති ලියන හලායුධභට්ට යන් සූත්‍රයෙහි වාශබ්දග්‍රහණයක් නො පැණෙන හෙයින් හැම තන්හි පාදන්තලඝුව ගුරු වේ යයි ව්‍යාඛ්‍යා කරමින් "වා පාදන්තෙ ග්" යනු දුරුක්තියකැයි කියනලදී. ස්වොක්ති සමර්ථනය සඳහා

"වාන්තෙ ගවක්‍ර ඉති ප්‍රොක්තං යෛස්තු ශ්වෙතපටාදිභිඃ,
උත්සර්ගස්‍යාපවාදෙන බාධස්තෛරවධාරිතඃ"

ජෛන-කාලිදාසාදි යම් කෙනෙකුන් විසින් පාදන්තයෙහි ලඝුව විකල්පයෙන් ගුරු වේ යයි කියනලද ද ඔවුන් විසින් විශෙෂවිධියෙන් සාමාන්‍යවිධිහුගේ වැළැකීම නො සලකන ලදී-"යනු ද කියනලදී. පාදන්තලඝුහුගේ ගුරුත්වය උත්සර්ග (සාමාන්‍යවිධි) සිද්ධ යයි ද එද සමානීගීත්‍යාදීන්හි දී සූත්‍රයෙහි ලකාරශ්‍රැතියෙන් විශෙෂවිධිහෙයින් වළකී යයි ද ඔහු විසින් ම කියනලදී. මෙයින් පාදන්තලඝුහුගේ ගුරුත්වවිකල්පය ඔහු විසිනුදු පිළිගන්නා ලද හෙයින් ඔහුගේ කීම ම දුරුක්ති යයි පාශ්චාත්‍යයන් විසින් ඛණ්ඩිත ය. පාදන්තයෙහි ලඝුස්වරයාගේ කිසිතැනෙක්හි ගුරුත්වය ද කිසිතැනෙක ලඝුත්වය ද පැණෙයි යනු සාජීහෞමයන්ගේ ආශයයි.

"සංයොගෙ ගුරු" (1. 4. 11.) "දීර්ඝං ච" (1. 4. 14 ) යන සූත්‍රයන්ගෙන් ගුරුසංඥව කරණ පාණිනීන් විසින් පාදන්තලඝුහුගේ ගුරුත්වය අස්වීකෘතබැවින් "ගන්තෙ" යන ඡන්දස්සූත්‍රය ද, "වා පාදන්තෙ ත්වසෞ ගවක්‍රඃ" යනු ද විරුද්ධ නො වේ ද? යත්:- පාදන්තලඝුහුගේ ගුරුත්වප්‍රතිපාදනයෙන් ස්වශාස්ත්‍රයට ප්‍රයොජනයක් නැත් නුයි පාණිනීන් විසින් ඒ හරණ ලද නමුදු ඡන්දසෙහි උපයොගි බැවින් ම කිය යුතු නුයි විරෙධයක් නැත්තේයි.

10. පාදදවිහ වණ්ණස්‍ස සංයොගඃ [1]ක්‍රමසංඥිතඃ,
[2]පරස්ථිතෙන තෙන ස්‍යාල්ලඝුතාපි ක්වචිද්ගුරොඃ.

යුක්තපර වූ හ්‍රස්වය තෙම හැමතැන්හි ගුරු වේ නම් ආය්‍යා දියෙහි විගුණාදිගණව්‍යවස්ථාව ඇතැම් තැන අවලක්ෂණ ද වන්නේ ය යන අනතර්ලීනචොද්‍යශඞ්කායෙන් එයට පරිහාර පිණිස "පාදදෙ" යනාදිය දක්වත්.

10. **ඉහ**=මේ ඡන්දශාස්ත්‍රයෙහි; **පාද+ආදෞ**=ශ්ලොකපාදයාගේ ආදියෙහි වූ; **වණ්ණස්‍ය**=අක්ෂරය පිළිබඳ; **සංයොගඃ**=සංයොගය; **ක්‍රමසංඥිතඃ**= 'ක්‍රම' යන නමක් ඇති වේ. **පරස්ථිතෙන**= පර භාගයෙහි සිටියා වූ; **තෙන**= ඒ ක්‍රමසංඥිතයා හෙතු කොට ගෙණ; **ක්වචිත්**= කිසිතැනෙක්හි; **ගුරොඃ**= ගුරුහුගේ; **ලඝුතා අපි**= ලඝුභාවය ද; **ස්‍යාත්**= වන්නේය.

**පරිකථා**:—

'සංයොග'නම් ස්වරයන්ගෙන් ව්‍යවහිත නු වූ ව්‍යඤ්ජනයි. ශ්ලොකපාදයන්ගේ ආදියෙහි සිටි ඒ සංයොගය ක්‍රමසංඥාව ලබයි. ඒ පර කොට සිටි හ්‍රස්වය තෙමේ ඇතැම් තැන්හි ගුරු නො වේ. පාදනතයෙහි සිටි දීර්ඝස්වරය ක්‍රමසංඥය පර කොට සිටියේ නමුදු ගුරු ම වේ. ඔහුගේ ලඝුභාවයක් නො ලැබේ. ඡන්දෙමඤ්ජරීකාරයෝ විශෙෂයක් නැතිව පාදනතයෙහිවූ ගුර්වක්ෂරය ලඝු වේ යයි දක්වමින් "තරුණම්" යනාදි පථ්‍යාය්‍යා ශ්ලොකයත්

"අථ ලුලිතපතතත්‍රිමාලං-රුගණාසනබාණකෙශරතමාලම්,
ස වනං විචිකතමාලං-සීතාං ද්‍රෂ්ටුං ජගාමාලම්"

යන ශ්ලොකය ද දක්වත්. මෙහි ප්‍රථම පාදයෙහි අනත්‍යගුරුහු ලඝුවක් වුව හොත් මේ පිරිසිදු පථ්‍යාය්‍යාවක් වෙතැයි ගඞ්ගා දාසයෝ භ්‍රාන්ත වූහ "ත්‍රිමාලම්" යන මෙහි අනත්‍යගුර ලඝුවක් වූ විට ජගණය වේ. කිසිකලෙකත් ආය්‍යාවක විෂමස්ථානයෙහි ජගණය නො යෙදේ. එහෙයින් මේ පථ්‍යාය්‍යාවක් නො ව ගාථාවක් මැයි. "විෂමාක්ෂරපාදභ්වාත්" යනාදිය කී හෙයිනි. 'ත්‍රි' යන්න තීව්‍රප්‍රයත්නයෙන් උසුරුවත් හොත් දෙවෙනි ගණය චතුර්ලඝු වීමෙන් "මාලම්" යනු විගුරු ගණය වේ. එහෙත්

1. ක්‍රමසංඥකඃ. 2. පුරඃස්ථිතෙන.

ඉදමස්‍යොදාහරණම්:-

11. "තරුණං සර්ෂපශාකං-නවෞදනං පිච්ඡිලානි ච දධීනි,
අල්පව්‍යයෙන සුන්දරි-ග්‍රාම්‍යජනො මිෂ්ටමශ්නාති."

---

"පතතත්‍රිමාලම්" යන්න තිව්‍රප්‍රයත්නයෙන් උසුරුවිය නො හැකි මැයි. එහෙයින් හට්ටිකාව්‍යටිප්පණීකාරයෝ මේ ශ්ලොකය ගාථාවෘත්තයෙන් බඳිනලද්දකැයි කියති. ඊට ද හෙතුව ප්‍රථමපාදාන්තයෙහි ගුරක් වීමෙන් ප්‍රථමපාදයෙහි මාත්‍රා තෙළෙසක් වීම හා "ලම්" යන්න ලඝුවක් මෙන් සැලකූ විට ද තෘතියගණය ජගණය වීමයි. පථ්‍යාර්යායෙහි ප්‍රථමපාදයට ඇත්තේ මාත්‍රා දෙළොසෙකි.

ඉදම්= මේ වක්ෂ්‍යමාණපද්‍යය; අස්‍ය= මෙකී ලක්ෂණයට; උදාහරණම්= උදාහරණයි.

11. **සුන්දරි**= සොඳුර; **ග්‍රාම්‍යජනඃ**= ගැමිදනතෙමේ; **අල්පව්‍යයෙන**= මදවියදමකින්; **තරුණම්**= මොළොක් වූ; **සර්ෂපශාකම්**= අබපලා ද; **නව+ඔදනම්**=අළුත්සාලේ බත් හෝ නො පිලුනුබත් ද; **පිච්ඡිලානි**= බැඳුනු හෙවත් බෙලෙසුල්වූ; **දධීනි ච**= දී ද; **මිෂ්ටම්**= රසවත් සේ; **අශ්නාති**= කයි.

**පරිකථා:—**

මේ ආර්යාශ්ලොකයෙකි. සාමාන්‍යආර්යාවගේ ප්‍රථම තෘතීය පාද ගණතුණකින් හෙවත් මාත්‍රා දොළොසකින් පරිමිත ය. 'සුන්දරි' යන තන්හි අනන්‍යඉකාරය පරවූ 'ග්‍ර' යන සංයොගය හෙයින් ගුරු වුව හොත් ප්‍රථමපාදය මාත්‍රා තෙළෙසකින් යුක්ත වේ එවිට වෘත්තභඞ්ගය වේ. '◡—◡' මෙසේ වින්‍යාස කළ යුතු ගණයෙක් සංස්කෘතමාත්‍රාඡන්දසෙහි අවිද්‍යමානය. එහෙයින් පාදාදියෙහි සිටි 'ග්‍රා' යන ක්‍රමසංඥිතසංයොගයට පෙරටුව සිටි රිකාරය ලඝුවක් ලෙස ම සලකණු ලැබේ. එකල නිරවද්‍ය වේ. මෙසේ ලඝුත්වකල්පනයට ක්‍රමසංඥිතය පමණක් නො ව තීව්‍රප්‍රයත්නොච්චාරණය ද හෙතු වේ. ඒ යට දක්වන ලදී. "ගුණිනාමපි නිජරූප-ප්‍රතිපත්තිඃ පරත එව සම්භවති" යනාදීන්හි ක්‍රමසංඥිතයෙන් පෙරටු ව සිටියේ ද ගුරු ම වේ. 'තරුණම්' යනාදියෙහි ද්විතීයචතුර්ථපාදාන්ත "වා පාදාන්තෙ ත්වසෞ ග්" යන්නට උදාහරණයි. ආර්යාන්තය ගුර්වක්ෂරයකින් යුක්ත විය යුතු හෙයිනි.

12. අබ්ධිභූතරසාදීනාං ඥෙයාඃ [1]සංඛ්‍යාස්තු ලොකතඃ,
ඥෙයඃ පාදශ්චතුර්ථාංශො යතිර්විච්ඡෙද[2]සංඥිකා.

---

“තරුණම්” යනාදි වශයෙන් ආර්‍යාවක් ම උදාහරණ කරණ කේදාර භට්ටයෝ “ස්වරා අර්ධඤ්චාර්‍යාර්ධම්” යන පිඞ්ගලසූත්‍රයට වෘත්ති ලියන හලායුධභට්ටයන්ගේ “අත්‍රාධිස්‍ය ලක්ෂණං කුර්වාණ එවං ඥාපයත්‍යාචාර්‍යො-යදාර්‍යායාමවාන්තරපාදව්‍යවස්ථා නාස්ති. තෙන

විපාදන්‍යස්මාදපි-මධ්‍යාදපි ජලනිධෙර්දිශොප්‍යනන්තාත්,
ආනීය ඣටිති ඝටයති-විධිරභිමතමභිමුඛීභූතඃ”

ඉත්‍යාදෞ ගණත්‍රයස්‍යානෙන ගුරුත්වං න ස්‍යාත්” යනුවෙන් ආර්‍යාවන්ගේ විශෙෂ වූ පාදව්‍යවස්ථාවක් නැතැයි යන කිම ඛණ්ඩනය කෙරෙති. මෙහි ප්‍රකාශ ව තිබෙනුයේ “ගනෙන” යන සූත්‍රයාගේ වෘත්තියෙහි දී වූ භ්‍රාන්තියයි.

“ත්‍රිෂු ගණෙෂු පාදඃ පථ්‍යාඩේ ච”යන සූත්‍රයට වෘත්ති ලියමින් ආර්‍යාවට පාදව්‍යවස්ථා ඇතැයි ඔහු ම කියති. “විපා” යනාදිය ද පථ්‍යාර්‍යාවකි.

දැන් ඡන්දශ්ශාස්ත්‍රයට උපයොගි වූ අන්‍යපරිභාෂාවන් ද දක්වනුවෝ “අබ්ධි” යනාදිය කියත්.

12. **ලොකතඃ**= වෘද්ධලොකයා කෙරෙන් නොහොත් වෘද්ධ ව්‍යවහාරයෙන්; **අබ්ධිභූතරස+ආදීනාම්**= සමුද්‍ර (සතරෙක) භූත (පසෙක) රස (සයෙක) යන මේ ආදීන්ට; **සංඛ්‍යාඃ තු**= (චතුරාදි)සඞ්ඛ්‍යාවෝ; **ඥෙයාඃ**= දත යුත්තාහ. **චතුර්ථඃ**= සතරවැනි වූ; **අංශඃ**= භාගය තෙමේ; **පාදඃ ඥෙයඃ**= පාදයකැයි දත යුතුයි. **යතිඃ**= ‘යති’ තොමෝ; **විච්ඡෙදසංඥිකා**= විච්ඡෙද (විරාම) යන සංඥා ඇත්තීය.

**පරිභාෂා**:—

සංස්කෘතශාස්ත්‍රයෙහි එකක් ම ඇත්තේ යයි ප්‍රකට වස්තුව වාචක වූ ශබ්ද එකසඞ්ඛ්‍යාත්වයෙන් යොදනු ලැබේ. දෙකක් ඇතැයි ප්‍රකට වස්තුව වාචකශබ්ද ද්විසඞ්ඛ්‍යාත්වයෙන් යොදනු ලැබේ. එසේ ම රාශියකින් ප්‍රථමයා වාචක ශබ්ද එකසඞ්ඛ්‍යාව ලෙස ද, ද්විතීයාදි වාචක ශබ්ද ද්විසඞ්ඛ්‍යාදිවශයෙන් ද යොදනු ලැබේ. “පඞ්ක්තිරථ”යන තන්හි‘පඞ්ක්ති’යනු දශ සඞ්ඛ්‍යාවාචකය දශමව්‍යඤ්ජනස වාචක හෙයිනි.

---

1. සංඥාස්තු. 2. සංඥකාඃ. සඥිතා.

ආකාශවාචකශබ්ද බින්දු පර්යාය වේ. චන්ද්‍ර, භූමි පර්යායශබ්ද (1) ඒකසඞ්ඛ්‍යාවාචකය, හස්ත, පාද, නෙත්‍ර, කර්ණාදි පර්යායශබ්ද (2) ද්විසඞ්ඛ්‍යාවාචකය. වහ්නි; ශිවනෙත්‍රාදිපර්යායශබ්දයෝ (3) ත්‍රිසඞ්ඛ්‍යාවාචක වෙති. අබ්ධි, අර්ණ, යුග, වර්ණාදි වාචක ශබ්දයෝ (4) චතුස්සඞ්ඛ්‍යා වාචක වෙති. ශර, ඉන්ද්‍රිය, විෂයාදිවාචකයෝ (5) පඤ්චසඞ්ඛ්‍යාවාචක ය. රස, තර්ක, ඍතු, ගුහකාදිවාචකයෝ (6) ෂට්සඞ්ඛ්‍යාවාචක වෙති. ඍෂි, අශ්ව, පර්වත, ලෝකාදි වාචකයෝ (7) සප්තසඞ්ඛ්‍යාවාචකය. අඞ්ග, නාග, ගජාදි වාචකයෝ 8)අෂ්ටසඞ්ඛ්‍යාවාචක වෙති. රන්ධ්‍ර,ග්‍රහ,නිධි, වාරාදිපර්‍ය්‍යායයෝ (9) නවසඞ්ඛ්‍යාවාචක වෙති. දිශාදිපර්යායයෝ (10) දශසඞ්ඛ්‍යාවාචක ය. රුද්‍රාදිවාචකයෝ (11) ඒකාදශ සඞ්ඛ්‍යාවාචක වෙති. ආදිත්‍ය, මාසාදිවාචකයෝ (12) ද්වාදශසඞ්ඛ්‍යාවාචක වෙති. යනාදි වශයෙන් භූතසඞ්ඛ්‍යාවිභාගය දත යුතුයි. "බෞද්ධෙසමින් ගගනර්ෂිවර්ණනයනෙ" යන තන්හි භූතසඞ්ඛ්‍යාවෙන් බුද්ධවර්ෂය යොදන ලදි. ගගන (0) ඍෂි (7) වර්ණ (4) නයන (2) යනු එහි සඞ්ඛ්‍යා පිළිවෙළයි. මාගධ සංස්කෘත භාෂාවන්හි ක-ට-ප-ය, භූතසඞ්ඛ්‍යාදි සඞ්ඛ්‍යාවාචක ශබ්දයන්ගෙන් සඞ්ඛ්‍යාව පෙන්වන විට අවසානයෙහි සිට යොදනු ලැබේ. එහෙයින්"0 7 4 2" යන්න "2 4 7 0" යයි සැලකිය යුතු. විස්තර භූතසඞ්ඛ්‍යාග්‍රන්ථයන්ගෙන් දත හැකියි

'පාද' ශබ්දය වනාහි ස්වපර්යාය අඞ්ඝ්‍රි-චරණ ශබ්දාදීන්ට ද උපලක්ෂක ය. පාදාදිව්‍යවහාරයෙහි සැමතැන්හි සමචතුර්ථභාගය ම නො ගත යුතුයි. යම් පමණක් යම් වෘත්තයක කියනලද නම් එපමණ ගත යුතුයි. මාත්‍රා තිහක් ඇති පථ්‍යාර්යාපූර්වාර්ධයෙහි ප්‍රථමපාදය මාත්‍රා දොළොසකින් පරිමිතය. ද්විතීයපාදය මාත්‍රා අටළොසකින් (18) පරිමිතය. සෙස්සෙහි ද මෙසේ ම දත යුතු. සමවෘත්තයන්හි පාදය සමචතුර්ථභාගය වේ. සමහර අර්ධසම-විෂම වෘත්තයන්හි ද පාදයට සමචතුර්ථභාගය ලැබේ. වෘත්ත ලක්ෂණයෙන් ඒ දත යුතු.

'යතිය' නම් ජිහ්වාවට ඉෂ්ට වූ විශ්‍රාමස්ථානයයි. "විච්ඡිද්‍යතෙ විභජ්‍යතෙ පදපාඨො 'සම්තානීති=විච්ඡෙදෙ විශ්‍රාමස්ථානම්" යනු හලායුධවචන හෙයින් පදපර්‍යන්තය සිඳිනු ලබන හෝ බෙදනු ලබන නැවතුම්පල විච්ඡේදයයි. ඒ 'යති' යයි ද කියනු ලැබේ. ශ්‍රුතිසෞඛ්‍යාර්ථය පිණිස ඒ යතිතොමෝ නියතස්ථානයෙහි ම කට යුත්තීය. හලායුධයන් විසින් සංගෘහීතයත්‍යුපදෙශක උපනිෂද්හු මෙහි දක්වනු ලැබෙත්.

1. යතිඃ සර්වත්‍ර පාදාන්තෙ ශ්ලොකාර්ධෙ තු විශෙෂතඃ,
සමුද්‍රාදිපදාන්තෙ ච ව්‍යක්තාව්‍යක්තවිභක්තිකෙ.

(අ). සාමාන්‍යයෙන් යතිතොමෝ චතුර්ථාංශසඞ්ඛ්‍යාත පාදයාගේ අවසානයෙහි වේ. ඊට උදාහරණ මෙසේයි:-

"අත්‍ර මෙ සඛි සිඛණ්ඩිමණ්ඩනෙ-පුණ්ඩරිකකමනීයලොචනෙ,
ශ්‍යාමතාමරසදාමකොමලෙ-රමතාමති මනො මනොරමෙ."

මෙහි සියලු පාදයන්හි අවසන්හි විශ්‍රාමය වේ. ප්‍රත්‍යුදාහරණ:- "නමස්තස්මෛ මහාදෙවා-ය ශශාඞ්කාර්ධධාරිණෙ." අෂ්ටාක්ෂරපරිමිත මේ පථ්‍යාවක්ත්‍රවෘත්තයෙහි "දෙවා"-යන්නෙන් ප්‍රථමපාදය අවසන් වේ. ඊට සම්බන්ධ වූ ම යකාරය ද්විතිය පාදාදියෙහි පතිත විය. එහි අනෙකවර්ණත්වයක් නැත් නුයි යති භග්න වීය.

(ආ). විශෙෂයෙන් (නියමයෙන් ම) පාදද්වයසඞ්ඛ්‍යාතශ්ලොකාර්ධයෙහි යතිය වේ. උදාහරණ මෙසේයි:-

"තරුණං සර්ෂපශාකං-නවෞදනං පිච්ඡිලානි ච දධීනි,
අල්පව්‍යයෙන සුන්දරි-ග්‍රාම්‍යජනො මිෂ්ටමශ්නාති"

මෙහි "දධීනි" "අල්ප" යන දෙදෙනා අතර නියමයෙන් ම විශ්‍රාමයි. එහෙයින් පූර්වඉකාර හා පරඅකාරත් සන්ධි නො විය. ද්විතීයපාදාන්තයත් තෘතීයපාදාදියත් නිමිති ඇති වුව ද නියම යෙන් යතිස්ථාන හෙයින් සන්ධි නො කරණු ලැබේ. එසේ ම ද්විතියපාදාන්තයෙහි සමාසාදිවශයෙන් විභක්ති ලොප් නො වීමෙන් ප්‍රකට විභක්ති ඇති බව ද වේ. සන්ධියෙහි ප්‍රත්‍යුදාහරණ මෙසේයි:-

"ශ්‍යාමා කාමාකුලා රාමා-වමා භොගාය වාප්‍යතෙ-
'නෙකජන්මසුපුණ්‍යානාං-නිචයො න චිතො යදි."

මෙහි ද්විතීයපාදාන්තය හා තෘතීයපාදාදියත් එක් කොට (ආප්‍යතෙ + අනෙක) 'ආප්‍යතෙ'නෙක'යි සන්ධි කරණ ලදී. එහෙයින් මෙහි යති භග්න වීය. 'අනෙක' යනු 'නෛක'යි ගත් විට දොසක් නො වේ.

ප්‍රකට විභක්ති ඇතිබවට විරුද්ධොදාහරණ මෙසේයි:-

"සුරාසුරශිරොරත්න-ස්ඵුරත්කිරණමඤ්ජරී-
පිඤ්ජරීකෘතපාදාබ්ජ-ද්වන්ද්වං වන්දෙ මහාමුනිම්."

මෙහි ද්විතීයපාදය හා තෘතීයපාදයත් සමාස කරණලද හෙයින් යති භග්න වීය. ද්විතියපාදාන්තයෙහි විභක්ති ප්‍රකට ව තිබීම නියතය. ඒ මෙහි නො ලැබේ.

(ඉ). ශ්‍රූයමාණවිභක්ති ඇත්තාවූ ද සමාසාන්තර්ගත වීමෙන් අප්‍රකට විභක්ති ඇත්තාවූ ද සමුද්‍රාදිපදයාගේ අන්තයෙහි යතිය වේ. 'සමුද්‍රාදිපද'නම් ඒ ඒ වෘත්තයන්හි යතිය තැබීමට නියම කළ ස්ථානයි. ඒ එසේ මැයි. මන්දාක්‍රාන්තාවෘත්තයෙහි සමුද්‍රයෙන් හෙවත් වර්ණසතරකින් ද, වර්ණ සයකින් ද, අගයකින් හෙවත් වර්ණ සතකින් ද යති වේ යයි නියම කරණ ලදී. එසේ නියම කරණලද ස්ථානයන්හි ව්‍යක්තවිභක්තිකපදයන්ගෙන් පර ව ද අව්‍යක්තවිභක්තිකපදයන්ගෙන් පරව ද යතිය තැබිය යුතු. "සුප්තිඞන්තං (විභක්ත්‍යන්තම්) පදම්"යි සාමාන්‍ය නියමය වුව ද විභක්තිරහිතවූ ශබ්දප්‍රකෘති ද පදනාමයෙන් සලකණු ලබනබව පෙණේ. එකී යතියට උදාහරණ මෙසේයි:-

1 2 3 4 . 1 2 3 4 5 6 . 1 2 3 4 5 6 7
"ප්‍රත්‍යාසන්නෙ-නභසි දයිතා-ජීවිතාලම්බනාර්ථී" යනුයි.

මේ මන්දාක්‍රාන්තාපාදයෙහි අකුරුසතරකින් පරව යතිය යෙදීන. ඒ ව්‍යක්තවිභක්තියක්හුගේ අන්තයෙහිය. 'ප්‍රත්‍යාසන්නෙ' යනු සප්තම්‍යන්තනාමපදයෙකි. එහි ද්විතීයයතිය ප්‍රථමයති ස්ථානයෙන් පරවූ අකුරු සයකින් වේ. ඒ අව්‍යක්ත විභක්තික යක්හුගේ අන්තයෙහි යෙදීන. 'දයිතා' යනු සමාසවිෂයෙහි විභක්තිලොපය නිසා අව්‍යක්තවිභක්තික වීය.

'යතිඃ සර්වත්‍ර පාදාන්තෙ' යන්න 'ව්‍යක්තාව්‍යක්තවිභක්තිකෙ' යන්න හා සම්බන්ධ කොට ව්‍යක්ත-අව්‍යක්තවිභක්ති ඇති පදයන්ගේ අවසන්හි ද පාදාන්තයෙහි නියමිතයතිය වේ යයි කිය යුතුයි. ව්‍යක්තවිභක්තිකපදයා කෙරෙන් වූ පාදාන්තයතියට යට දක්වනලද 'අත්‍ර මෙ සඛි' යනාදි ශ්ලොකය ම උදාහරණයි. එහි ප්‍රථමතෘතීයපාදාන්තයෙහි විභක්ති ප්‍රකටය. අව්‍යක්තවිභක්තිකපදයාකෙරෙන් වූ පාදාන්තයතියට උදාහරණ මෙසේයි:-

"නමස්තුඞ්ගශිරශ්චුම්බි-චන්ද්‍රචාමරචාරවෙ,
ත්‍රෛලොක්‍යනගරාරම්භ-මූලස්තම්භාය ශම්භවෙ"

මෙහි ප්‍රථමපාදාන්තය ද්විතීයපාදාදිය සමග ද තෘතීය පාදාන්තය චතුර්ථපාදාදිය සමග ද සමාස වීමෙන් විභක්ති ලොප් වීමෙන් අප්‍රකට වීය. එහෙත් යති දූෂ්‍ය නො වීය.

ii. ක්වචිත්තු පදමධ්‍යෙ'පි සමුද්‍රාදෞ යතිර්භවෙත්,
යදි පූර්වාපරෞ භාගෞ න ස්‍යාතාමෙකවර්ණකෞ.

(ඊ) යතියෙන් පූර්වභාගය හෝ පරභාගය එක ම අකුරකින් යුක්ත නො වී නම් යතිය කිසිතැනෙක්හි (සමුද්‍රාදි වූ=හතරකින් හයකින් යති වේ යයි සූත්‍රයන්හි කියනලද තන්හි) පදයන්ගේ මධ්‍යයෙහි ද වේ. චතුරක්ෂරාද්‍යාත්මක යතිවිභාගයෙහි කිසියම් පදයක මුල අකුරකින් පරව හෝ අන්ත්‍යාක්ෂරයෙන් පූර්වයෙහි හෝ යතිය වුවොත් දූෂ්‍ය වේ. එසේ නො කොට දෙපසට අකුරු දෙක දෙක හෝ වැඩිගණනක් ඇති වන සේ පදමධ්‍යයෙහි යතිය යෙදිය යුතු.

උදාහරණ:—

“පයශ්‍රීංපතාං තප්තවාමී – කරකටකතටෙ – ශ්ලිෂ්ටශිතෙතරාංශෞ” යනුයි. මෙහි ‘තප්තවාමී–’ යන්නෙන් පරව යතියයි. ඒ පදමධ්‍යයයි. එහි යතියෙන් පූර්ව-පරභාගයන්හි අනෙකවර්ණ හෙයින් දූෂ්‍ය නො වේ. “කූජත්කොයෂ්ටිකොලා–හලමුඛර භුවඃ ප්‍රාන්තකාන්තාරදෙශාඃ” යන තන්හි ද ‘කොලාහල’ ශබ්දයාගේ මධ්‍යයෙහි යති වීය.

(උ) ‘සමුද්‍රාදි’ යන්නෙන් පාදමධ්‍යයෙහි ලැබෙන යතිය ම උපලක්ෂිත ය. එහෙයින් පාදාන්තයතිය පදමධ්‍යයෙහි තැබිය යුතු නො වේ.

“ප්‍රණමත භවබන්ධක්ලෙශනාශාය නාරා–
යණචරණසරොජද්වන්ද්වමානන්දහෙතුම්”

යනු ප්‍රත්‍යුදාහරණයි. මෙහි පාදාන්තයතිය ‘නාරායණ’ ශබ්දයාගේ මධ්‍යයෙහි වූ හෙයින් දූෂ්‍ය වීය.

(ඌ) යතියෙන් පූර්වාපරභාග යම් ශබ්දයකට අයත් එක අකුරකින් යුත් වී නම් දූෂ්‍ය වේ. ධාතු–නාම–ප්‍රත්‍යය–අව්‍යය යන මොවුන්ගේ භාගභෙදයෙන් ඒ ද සිවුවැදෑරුම්.

“එතාසාං රා–ජති සුමනසාං දම කණ්ඨාවලම්බි” යන්නෙහි හා “එතස්‍යා රා–ජති මුඛමිදං පූර්ණචන්ද්‍රප්‍රකාශම්” යන්නෙහි ද ‘රාජති’ යන පදයාගේ ‘රා’ යන්න පමණක් යතියෙන් පූර්වයෙහි වූ හෙයින් දූෂ්‍යයි.

“එතස්‍යා ග–ණ්ඩතලමමලං ගාහතෙ චන්ද්‍රකාක්ෂම්”
“සුරාසුරශිරොනිඝෘ–ෂ්ට චරණාරවින්දඃ ශිවඃ”

යන දෙතන්හි යතියට පූර්වභාගයෙහි හා පරභාගයෙහි නාමයක එක අකුරක් පමණක් ඉතිරි වීමෙන් දූෂ්‍ය වීය. “—” මේ ලකුණෙන් හඟුන්වනලද්දේ යතිස්ථානයි. සෙස්ස ද මේ නයින් සිතිය යුතු.

iii. පූර්වාන්තවත් ස්වරසන්ධෞ ක්වචිදේව පරාදිවත්,
දෘෂ්ටව්‍යෞ යතිචින්තායාං යණාදේශඃ පරාදිවත්.

(අ) සවර්ණය පරකල්හි වර්ණ දෙක එක් වී දීර්ඝ වීම ය, අවර්ණ ඉවර්ණ දෙකට එකාරාදේශය, අවර්ණ උවර්ණ දෙකට ඔකාරාදේශය යනාදි ස්වරසන්ධිවිධියක් වේ නම් එය සමහර තැනෙක යති යෙන් පූර්වාවයවයාගේ අන්තය මෙන් වේ. කිසිතැනෙක පරාව යවයාගේ ආදිය මෙන් වේ.

“කාසෙන දුරිද්‍රදවා-නල වදතු යශොවාවදූකො’පි දූතෙ’
“ස්‍යාදස්ථානො-පගතයමුනාසඞ්ගමෙවාභිරාමා”

යන තන්හි “දව+අනල” “අස්ථාන+උපගත” යන මොවුන් සන්ධි කළ කල්හි යතියෙන් පූර්වාවයවයාගේ අන්තය මෙන් වී.

“අනෙනවාසි දයාලුරුජ්ඣිතනයෙ-නාසාදිතො ජිෂ්ණුනා”
“ස්කන්ධං වින්ධ්‍යාද්‍රිබුද්ධ්‍යා නිකෂති මහිෂ-ස්‍යාහිතො
‘සූතහාර්ෂිත්”

යනාදි තන්හි “නයෙන+ආසාදිතඃ” “මහිෂස්‍ය+ආහිතඃ” යන මොවුන් සංහිතවූ කල සන්ධිවශයෙන් පැමිණි දීර්ඝස්වරය යතියෙන් පරයාගේ ආදිවර්ණ මෙන් සිටී. ස්වරය පරාදිවර්ණය මෙන් වන කල්හි ඒ හා බැඳුන බැවින් ව්‍යඤ්ජනයත් පරයාගේ ආදිවර්ණය මෙන් වේ. “යදි පූර්වාපරෞ භාගෞ න ස්‍යාතා මෙක වර්ණකෞ” යනු අනන්‍යාදිවද්භාවවිධියෙහි ද සම්බන්ධ කරණු ලැබේ. එහෙයින්

“අස්‍යා වක්ත්‍රං සමරජයි පූ-ර්ණේන්දුශොභං විභාති”

යනාදියෙහි යතියෙන් පූර්වභාගයට හිත්‍යා වූ පදාංශයෙහි අනෙකවර්ණත්වයක් නැත් නුයි ස්වරසන්ධි විධියෙන් ව්‍යඤ්ජනය ද පරයාගේ ආදිවර්ණය මෙන් වූ කල්හි ද දූෂ්‍ය වේ.

“ඉත්‍යෞත්සුක්‍යාදපරිගණයන් ගුහ්‍යකස්තං යයාචෙ” යනාදි තැන්හි ව්‍යඤ්ජනයාගේ ද පරාදිවද්භාවය දක්නා ලැබේ. “ඉති+ඖත්සුක්‍යාත්+අපරිගණයන්” යනු විශ්ලේෂයි. තකාර යට සන්ධිවිධියෙන් දකාරය වී. තකාරය පූර්වපදයට අයත් නමුදු ඊට මුලින් යති වීය.

(ආ) යණාදේශය යතියගේ පරාවයවය පිළිබඳ ආදිය මෙන් වේ. ‘යණාදේශ’ නම් “ඉකො යණචි” (පා: 6. 1. 77) යනුවෙන් අසවර්ණ ස්වරයක් පරකල්හි ඉ-උ-ඍ-ඏ වර්ණයන්ට වන ය-ව-ර-ල යන ආදේශයි.

"සඤ්ජාතාකූපාරප්‍රපිතපෘථුයශ-ස්‍යබ්ධිසාගෝ කෘතාගෝ"
යන තන්හි "යශසි+අබ්ධි" යනු සන්ධිවිධියෙන් යණාදෙශ වීමෙන් සිද්ධ හෙයින් "යශසි" යන පදයාගේ අකුරු දෙකක් ගෙවා එක් අකුරක් ඉතිරි කොට වූ යතිය නිදෙස් වේ. මෙබදු තන්හි පරාවයවය එකවර්ණ වුව ද නිදෙස් වේ.

"විතතඝනතුෂාරක්ෂෝදශුභ්‍රාංශු පූර්වා-
ස්වවිරලපදමාලාං ශ්‍යාමලාමුල්ලිඛන්ති"

යනු වකාරාදෙශ පරයාගේ ආදිවර්ණය මෙන් වීමට උදාහරණයි. "පූර්වාසු+අවිරල" යන තන්හි සකාරයෙහි උකාරයට වකාරාදෙශ ව "පූර්වාස්වවිරල"යි විය. සකාරය ද උකාරානුබද්ධ හෙයින් උකාරවිකෘතියෙහි දු පරභක්තත්වය නො හරණේය.

iv. නිත්‍යං ප්‍රාක්පදසම්බන්ධාශ්චාදයඃ ප්‍රාක්පදාන්තවත්,
පරේණ නිත්‍යසම්බන්ධාඃ ප්‍රාදයශ්ච පරාදිවත්.

(ක) පූර්වපදය හා සම්බන්ධවූ 'ච, වා' යනාදි නිපාතයෝ යතියෙන් පූර්වයාගේ අන්තය මෙන් වෙති. ඒ චාදීන්ගෙන් පරව මුත් පූර්වයෙහි යතිය නො කට යුතුයි.

"ස්වාදු ස්වච්ඡං-සලිලමපි ච-ප්‍රීතයෙ කස්‍ය න ස්‍යාත්"
යනු උදාහරණයි. මෙහි චකාරයෙන් පර ව ම යතිය විය. ආදිශබ්දයෙන් "රක්ෂෝභිඃ සුරමනුජෛර් දිතෛඃ සුතෛර්වා" යනාදිය ගණු ලැබේ. මෙහි 'වා' ශබ්දයෙන් පරව යති විය. "ප්‍රසමෘතඃ කිමථ වා පඨිතො නු" යනතන්හි 'නු' කාරයෙන් පරව යති විය.

ප්‍රත්‍යුදාහරණ:-

"මහාමෛත්‍රී මහාප්‍රඥ-ච යත්‍ර පරමෝදයා."

මෙහි චකාරයෙන් පරව තැබිය යුතු යතිය පෙරටු ච තබන ලද හෙයින් දුෂ්‍යයි. 'තාද්' ආදිනිපාතයෝ චාදියෙන් බැහැර වෙති. එහෙයින්

"මන්දායන්තෙ-න ඛලු සුහෘදමභ්‍යුපෙතාර්ථකෘත්‍යාඃ"

යන තන්හි නකාරයට පූර්වයෙහි යතිය විය. 'චාදි'යයි වෙසෙසා කිමෙන් චාදියෙන් පිටත්හි වූවත් ප්‍රාක්පද සම්බන්ධ වුව ද ඔවුන්ගෙන් පෙරටුව යතියට බාධා නො වේ. "සම්පත්තිඃ සෛව රමණී-සඛෛසී භුජ්‍යතෙ භුවි" යන්නෙහි "සඛෛඃ" යන්න නිත්‍යයෙන් පූර්වපදයා හා සම්බන්ධ වුව ද ඉන් පූර්වයෙහි යතිය විය.

(ඍ) පරපදයා හා නිත්‍යයෙන් සම්බන්ධ වූ ප්‍රාදිඋපසර්ගයෝ පරපදයාගේ ආදිවර්ණ මෙන් වෙති. ප්‍රාදීන්ගෙන් පෙරටුව මූත් පරව යතිය තැබිය යුතු නො වේ.

"සද්‍යඃ පාති-ප්‍රණයිහෘදයං-විප්‍රයොගෙ රුණද්ධි" යනු උදාහරණයි. මෙහි 'ප්‍ර, වි' යන උපසර්ගයන්හට පූර්වයෙහි ම යති විය. ප්‍රත්‍යුදාහරණ:-

"ප්‍රණමාමි ජිනං තමප්‍ර-වරං වරගුණාලයම්."

"දුඃඛං මෙ ප්‍ර-ක්ෂිපති හෘදයෙ-දුඃසහස්තාද්වියොග.ඃ" මෙහි 'ප්‍ර' උපසර්ගයෙන් පරව යති වූ හෙයින් දූෂ්‍යයි. මෙහි පවසනලද්දේ පිඞ්ගලච්ඡන්දඃසූත්‍රවෘත්තිකාරයන්ගේ මතයයි. නමුත් ඔහු ම

"දූරාරූඪප්‍රමොදං හසිතමිව පරි-ස්පෂ්ටමාශාඝබීභිඃ"

යනාදිය උදාහරණ කෙරෙමින් එකාක්ෂර වූ හෝ අනෙකාක්ෂර වූ චාදීන්ගේ ද ප්‍රාදීන්ගේ ද පාදාන්තයතියෙහි පරාදිවද්භාවය වේ යයි ද පාදමධ්‍යයතියෙහි අනෙකාක්ෂරනිපාතොපසර්ගයන් යතියෙන් පූර්වයාගේ අන්තය මෙන් වූවත් දෙසක් නැතැයි ද කියති. කාව්‍යකල්පලතාවෙහි ද "එකස්වරයක් ඇති උපසර්ගයෙන් විච්ඡේදය ශ්‍රවණසුඛය කරන්නේ යයි කියනලදී.

(ඒ) කර්මප්‍රවචනීයසංඥයන්ගෙන් පරව යතිය වේ. "ශ්‍රෙයාංසි බහු විඝ්නානි භවන්ති මහතාමපි" යන මෙහි 'අපි' සදින් පරව යතියයි.

යතිය නො කියන ලද තන්හි ද ශ්‍රැතිසුඛවූ යතිය කළ යුතු බව "අනුක්තයතිකෝ'ප්‍යෙවං කාය්‍යා ශ්‍රැතිසුඛා යතිඃ" යනුවෙන් කියනලදී. කාව්‍යකල්පලතාවෙහි ද

"එවං යථා යථොවෙගඃ සුධියාං නොපජායතෙ,
තථා තථා මධුරතානිමිත්තං යතිරිෂ්‍යතෙ"යි

දක්වනලදී.

ජෛනාදීහු පාදාන්තය ම යතිස්ථාන යයි කීහු. භාරතාදීහු යතියක් ම නො දක්වති. එහෙයින් ම හර්ෂහරිහු යති අපෙක්ෂාවක් නො කොට

"ලභෙච්ච සිකතාසු තෛ-ලමපි යත්නතඃ පීඩයන්
පිබෙච්ච මෘගතෘෂ්ණිකා-සු සලිලං පිපාසාර්දිතඃ"

යනාදීන් පෘථ්විවෘත්තයෙන් ශ්ලොකබන්ධනය කළහ. ජයදෙවාදීහු ද බොහෝවිට යතිය අපෙක්ෂා නො කළහ ප්‍රකාශදර්පණකාරාදීහු ඔවුන්ට දෙස් කීමෙන් ම සඞ්ග්‍රහ කළහ.

13. යුක් සමං විෂමං චායුක් ස්ථානං සද්භිර්නිගද්‍යතෙ,
සමමර්ධසමං වෘත්තං විෂමං ච [1]තථාපරම්.

---

මේ යති තොමෝ වෘත්තලක්‍ෂණයෙන් භින්න නමුදු කාව්‍ය ගුණාදි අපෙක්‍ෂාවෙනුත් වෘත්තමධ්‍යයෙහි වුවක් හෙයිනුත් පිඞ්ගලයන් විසින් "යතිර්විච්ඡෙදඃ" යනාදීන් ද "සමුද්‍රනවකෞ" යනාදිවශයෙන් ද ලක්‍ෂණමධ්‍යයෙහි බඳනාලදී. වෘත්තස්වභාව යෙන් නො වේ. මාත්‍රාගුරුලඝුනියමය වෘත්තලක්‍ෂණයි. යතිය විරාමය ලක්‍ෂණ කොට ඇත්තීය.

13. **සමං ස්ථානම්=** සම වූ (ද්විතීය චතුර්ථ ෂෂ්ඨ යනාදි) ස්ථානය; **යුක්=** 'යුජ්' යයි ද; **විෂමම්=**විෂම වූ(ප්‍රථම තෘතීය පඤ්චමාදි) ස්ථානය; **අයුක් ච=** 'අයුජ්' යයි ද; **සද්භිඃ=** පණ්ඩිතයන් විසින්; **නිගද්‍යතෙ=** කියනු ලැබේ. **තථා=**එසේ ම; **සමං වෘත්තම්=** සමවෘත්ත ද; **අර්ධසමං වෘත්තම්=** අර්ධසමවෘත්ත ද; **අපරම්=**(එයින්) අන්‍ය වූ; **විෂමං ච=** විෂමවෘත්ත ද කියනු ලැබේ.

**පරිකථා:—**

'යුක්'ගණය 'යුක්'පාදය යනාදි වශයෙන් 'යුජ්' යන්න යෙදුන විට එයින් 'සම'ය යි කියනලද ද්විතීය චතුර්ථාදි ගණ-පාදදිය ගත යුතු. 'අයුජ්' යන්න යෙදුනුවිට පළමුවන-තුන්වන ගණාදිය ගත යුතු.

"විෂමං චා 'යුක්'" යන තන්හි වග්‍රහණයෙන් සමස්ථානයට 'යුගම–අනොජ' යන සංඥ දෙක ද, විෂමස්ථානයට 'අයුගම-ඔජ, යන සංඥ දෙක ද සංග්‍රහ කරණු ලැබේ.

පාදසඞ්ඛ්‍යාත පදයන්ගෙන් කරණලද්දේ පද්‍යයි. ඒ 'ජාතිය' 'වෘත්ත'යයි දෙවැදෑරුම්. 'ජාති' නම් නියතමාත්‍රා ඇත්තීයඃ 'වෘත්ත' නම් නියත ගුරුලඝුවින්‍යාස ඇත්තේ ය. ආර්යාදිය ජාති ය සමාර්ධසමවිෂමාත්මක වූ උක්තා-අත්‍යුක්තාදිය වෘත්තයි. කියන ලද මැයි—

"පද්‍යං චතුෂ්පදී තච්ච වෘත්තං ජාතිරිති ද්විධා,
වෘත්තමක්‍ෂරසංඛ්‍යාතං ජාතිර්මාත්‍රාකෘතා භවෙත්"යි.

දැන් සමවෘත්තාදීන්ගේ ලක්‍ෂණ කියන්නාහ "අඞ්ඝ්‍රයඃ" යනාදීන්.

---

1. ත්‍රිධා මතම්.

14. අඞ්ඝ්‍රයො යස්‍ය චත්වාරස්තුල්‍යලක්‍ෂණලක්‍ෂිතාඃ,
තච්ඡන්දශ්ශාස්ත්‍ර[2]තත්‍වඥඃ සමං වෘත්තං [3]ප්‍රචක්‍ෂතෙ.

15. ප්‍රථමාඞ්ඝ්‍රිසමො යස්‍ය තෘතීයශ්චරණො භවෙත්,
ද්විතීයස්තුර්‍ය්‍යවද්වෘත්තං තදර්ධසමමුච්‍යතෙ.

16. යස්‍ය පාදචතුෂ්කෙ'පි ලක්‍ෂ්ම භින්නං පරස්පරම්,
තදාහුර්විෂමං වෘත්තං ඡන්දශ්ශාස්ත්‍රවිශාරදාඃ.

17. ආරභ්‍යෛකාක්‍ෂරාත් පාදාදෙකෛකාක්‍ෂරවර්ධිතෛඃ,
පෘථක් ඡන්දො භවෙත් පාදෛර්‍යාවත් ෂඩ්විංශතිං ගතම්.

---

14. **යස්‍ය**= යම් වෘත්තයක්හුගේ; **චත්වාරඃ අඞ්ඝ්‍රයඃ**=පාද සතර; **තුල්‍යලක්‍ෂණලක්‍ෂිතාඃ**= සමාන ලක්‍ෂණයෙන් යුක්ත ද; **තත්**= ඒ වෘත්තය; **සමං වෘත්තම්**= සමවෘත්ත යයි; **ඡන්දශ්ශාස්ත්‍රතත්ත්වඥාඃ**= ඡන්දශ්ශාස්ත්‍රයෙහි තත්‍ව දන්නෝ; **ප්‍රචක්‍ෂතෙ**= කියත්.

ප:—පාදචතුෂ්කය සමානලක්‍ෂණයන්ගෙන් යුත්හෙයින් 'ශ්‍රී' ආදී වෘත්තයෝ 'සමවෘත්ත' නම් වෙති.

15. **යස්‍ය**= යම් වෘත්තයක්හුගේ; **තෘතීයඃ චරණඃ**= තුන්වන පාදය; **ප්‍රථමාඞ්ඝ්‍රිසමඃ භවෙත්**= ප්‍රථමපාදය හා සදෘශ වන්නේ ද; **ද්විතීයඃ චරණඃ**= දෙවන පාදය; **තුර්‍ය්‍යවත්**= සතරවනපාදය වැනි වේ ද; **තත් වෘත්තම්**= ඒ වෘත්තය; **අර්ධසමම් උච්‍යතෙ**= අර්ධසම යයි කියනු ලැබේ.

ප:—'අර්ධසමවෘත්ත' නම් ද්‍රුතමධ්‍යාදියයි.

16. **යස්‍ය**= යම් වෘත්තයක්හුගේ; **පාදචතුෂ්කෙ අපි**= පාද සතරෙහි ම; **ලක්‍ෂ්ම**= ලක්‍ෂණ තෙමේ; **පරස්පරම්**= එකිනෙකට; **භින්නම්**= වෙනස් ද; **තත් වෘත්තම්**= ඒ වෘත්තය; **විෂමම්**= විෂම වෘත්ත යයි; **ඡන්දශ්ශාස්ත්‍රවිශාරදාඃ**= ඡන්දශ්ශාස්ත්‍රයෙහි නිපුණයෝ; **ආහුඃ**= කියත්.

ප:—'විෂමවෘත්ත'නම් පදචතුරූර්ධ්වාදියයි.

17. **ඒකාක්‍ෂරාත්**= එක් අකුරක් ඇති; **පාදාත්**= පාදයෙන්; **ආරභ්‍ය**= පටන් ගෙණ; **යාවත්**= යම්තාක්; **ෂඩ්විංශතිම්**= සවිස් සට හෙවත් සවිසිඅකුරක් ඇති පාදයට; **ගතම්**= පැමිණීම වේ ද; **තාවත්**= ඒතාක්; **ඒක+ඒක+අක්‍ෂරවර්ධිතෛඃ**= එක් එක් අකුරෙන් වඩනා ලද;**පාදෛඃ**= පාදයන් කරණ කොටගෙණ;**පෘථක්**= වෙන් වෙන්වූ; **ඡන්දඃ භවෙත්**= උක්තාදිවූ ඡන්දස් වන්නේ ය.

---

2. තත්‍වඥාඃ 3. ප්‍රචක්‍ෂ්‍යතෙ.

18. තදූර්ධ්වං චණ්ඩවෘෂ්ට්‍යාදිදණ්ඩකාඃ පරිකීර්ත්තිතාඃ,
ශෙෂං ගාථාස්ත්‍රිභිඃ ෂඩ්භිශ්චරණෛශ්චොපලක්ෂිතාඃ.

---

18. **තත්+ඌර්ධ්වම්**= ඒ ෂඩ්විංශත්‍යක්ෂරයෙන් මත්තෙහි; **චණ්ඩවෘෂ්ටි+ආදිදණ්ඩකාඃ**= චණ්ඩවෘෂ්ටිඅර්ණවාදිදණ්ඩකවෘත්තයෝ; **පරිකීර්ත්තිතාඃ**= කියන ලදහුයි. **ශෙෂම්**= (යථොක්ත සාමාන්‍ය විශෙෂලක්ෂණයෙන්) අන්‍ය වූ ඡන්දස; **ගාථාඃ**= 'ගාථා'නම් වේ. (ඒගාථාවෝ) **ත්‍රිභිඃ චරණෛඃ**= පාද තුණකින් ද; **ෂඩ්භිඃ ච**= පාද සයකින් ද; **උපලක්ෂිතාඃ**= යුක්ත වෙති.

**පරිකථා:—**

"ශෙෂම්" "ගාථාඃ" යන එකවචන බහුවචනයෝ ප්‍රකෘති විකෘති හෙයින් නිර්දෙස් වෙති. "ප්‍රමාණං රාමලක්ෂ්මණෞ" යනු මෙනි.

"චරණෛශ්ච" යන තන්හි චකාරයෙන් දශපාදදීහු ද, අසමානවූ ගුරුලඝුක්‍රම ඇති, එකිනෙකට අඩුවැඩි අකුරු ඇති පාද යන්ගෙන් යුක්ත වූවාහු ද සඞ්ග්‍රහ කරණු ලැබෙත්. පැරණි සන්නයෙහි ආ පරිකථා මතු දක්වනු ලැබේ. "චතුරක්ෂරවූ එකාක්ෂරවෘත්තයෙහි පටන් සතර සතර අක්ෂරයෙන් වෘද්ධාක්ෂරවූ ඡන්දස්හු උක්තාදි නම් වෙති යනු සාමාන්‍ය ලක්ෂණයි. එසේ වූ කල්හි උක්තාව චතුරක්ෂර වෙයි අත්‍යුක්තාව අෂ්ටාක්ෂර වෙයි. මධ්‍යාව ද්වාදශාක්ෂර වෙයි. මෙසේ ඡන්දසින් ඡන්දස්හි ක්‍රමයෙන් වඩනා අක්ෂරසඞ්ඛ්‍යාව ප්‍රතිනියත කල්හි පාද චතුෂ්කායකින් උපලක්ෂිත වුව ද අක්ෂරයන්ගේ න්‍යූනාතිරෙකයක් ඇත් නම් 'ගාථා' නම් වේ. එසේ වී නම් න්‍යූනාතිරෙකවූ අක්ෂරයන් ඇති හැම ම ගාථා නම් වෙති? යත්: එව්හු ගාථා නො වෙත් "ශෙෂං ඡන්දඃ ගාථාඃ"යි උක්ත හෙයින්. "උක්තාදන්‍යඃ ශෙෂඃ" යනුයි." ආර්‍ය්‍යාවෛතාලීයාදීහු ද නානාප්‍රකාරවූ අර්ධසම විෂමවෘත්තයෝ ද උක්ත හෙයින් විශෙෂලක්ෂණයෙන් සිද්ධ හෙයින් ද 'ශෙෂං ඡන්දඃ' යන්නෙහි අන්තර්ගත නො වෙති.

"යුධිෂ්ඨිරො ධර්මමයො මහාද්‍රුමඃ
සකන්ධො'ර්ජුනො භීමසෙනො'ස්‍ය ශාඛා,
මද්‍රාසුතෞ පුෂ්පඵලෙ සමෘද්ධෙ
මූලං කෘෂ්ණො බ්‍රහ්ම ච බ්‍රාහ්මණාශ්ච."

යනු චතුශ්චත්වාරිංශදක්ෂර (44) වුව හොත් ත්‍රිෂ්ටුප් නම් වන්නේයි. පඤ්චචත්වාරිංශදක්ෂර (45) වූ හෙයින් ගාථා ම වේ.

19. [1]උක්තාත්‍යුක්තා තථා මධ්‍යා [2]ප්‍රතිෂ්ඨා'න්‍යා සුපූර්විකා;
ගායත්‍ර්‍යුෂ්ණිගනුෂ්ටුප් ච බෘහතී පඞ්ක්තිරෙව ච.

20. ත්‍රිෂ්ටුප් ච ජගතී චෛව තථාතිජගතී මතා,
ශක්වරී සා'ති පූර්වා ස්‍යාදෂ්ට්‍යත්‍යෂ්ටී තතඃ සමෘතෙ.

21. ධෘතිශ්චාතිධෘතිශ්චෛව කෘතිඃ ප්‍රකෘතිරාකෘතිඃ,
විකෘතිඃ සංකෘතිශ්චෛව [3]තථාතිකෘතිරුත්කෘතිඃ.

---

"දශ ධර්මං න ජානන්ති ධෘතරාෂ්ට්‍ර නිබොධ තාන්,
මත්තඃ ප්‍රමත්තශ්චොන්මත්තඃ ශ්‍රාන්තඃ ක්‍රුද්ධො බුභුක්ෂිතඃ,
චිරප්‍රවාසී රොගී ච ලුබ්ධඃ කාමී ච තෙ දශ"

යනු අෂ්ටචත්වාරිංශදක්ෂර හෙයින් සාමාන්‍ය ලක්ෂණයෙන් 'ජගතී' නම් විය යුතු වූයේ ද "පාදශ්චතුර්ථාංශඃ" යන විශෙෂලක්ෂණයෙන් චතුර්භාගපාද නො ව ෂඩ්භාගපාද වී නුසි ගාථා නම් වේ පාදත්‍රයයෙන් විරචිත ගාථා නිර්දේශයෙන් ද්‍රෂ්ටව්‍යයි"යනුයි.

එක්එක්අකුරෙන් වැඩුනු ඡන්දසුන්ට නම් දක්වන්නාහු 'උක්තා' යනාදිය කියත්.

19. **උක්තා**=(එක් පාදයක එක අකුර බැගින් පාද සතරෙහි අකුරු සතරක් ඇති) (1) 'උක්තා' නම් ඡන්දස ද; **අත්‍යුක්තා**=(පාද යෙක දෙඅකුරක් ඇති) (2) අත්‍යුක්තා ද; **තථා**= එසේ; **මධ්‍යා**= (අකුරු තුණක් ඇති) (3) මධ්‍යා ද; **ප්‍රතිෂ්ඨා**=(අකුරු සතරක් ඇති) (4 ප්‍රතිෂ්ඨා ද; (අක්ෂරසඞ්ඛ්‍යා මත්තෙහි ද මෙලෙස වැඩි කොට යෙදිය යුතු.) **සුපූර්විකා**='සු'යන්න පූර්ව කොට ඇති; **අන්‍යා**= අතික ද හෙවත් (5)සුප්‍රතිෂ්ඨා ද; **ගායත්‍රී**= 6) ගායත්‍රී ද; **උෂ්ණික්**= (7) උෂ්ණිග් ද; **අනුෂ්ටුප් ච**=(8) අනුෂ්ටුභ් ද; **බෘහතී**=(9) බෘහතී ද; **පඞ්ක්තිඃ එව ච**=(10) පඞ්ක්ති ද.

20. **ත්‍රිෂ්ටුප් ච**= (11) ත්‍රිෂ්ටුභ් ද; **ජගතී ච එව**= (12) ජගතී ද; **තථා**= එසේ; **අතිජගතී**= (13) අතිජගතී ද; **මතා**= දන්නා ලදී. **ශක්වරී**=(14) ශක්වරී ද; **සා**=ඒ ශක්වරී තොමෝ;**අතිපූර්වා ස්‍යාත්**= 'අති' යන්න පූර්ව කොට ඇත්තී ද හෙවත් (15) අතිශක්වරී ද වන්නී ය. **තතඃ**= ඉක්බිත්තෙන්; **අෂ්ට්‍යත්‍යෂ්ටී**=(16) අෂ්ටි (17) අත්‍යෂ්ටි යන දෙදෙන ද; **සමෘතෙ**= දන්නා ලදහ.

21. **ධෘතිඃ**=(18) ධෘති ද; **අතිධෘතිඃ ච එව**= (19) අතිධෘති ද; **කෘතිඃ**=(20) කෘති ද; **ප්‍රකෘතිඃ**=(21) ප්‍රකෘති ද; **ආකෘතිඃ**= (22)

---

1. උක්ථාත්‍යුක්ථා 2. ප්‍රතිෂ්ඨාසුප්‍රතිෂ්ඨිතා 3 තථාභිකෘති.

22. ඉත්‍යුක්තාශ්ඡන්දසාං සංඥාඃ ක්‍රමශො වච්මි සාම්ප්‍රතම්,
ලක්ෂණං සර්වවෘත්තානාං මාත්‍රාවෘත්තානුපූර්විකම්.

**ඉති ශ්‍රීකෙදරභට්ටවිරචිතෙ වෘත්තරත්නාකරෙ සංඥාභිධානො නාම ප්‍රථමො'ධ්‍යායඃ.**

---

ආකෘති ද; **විකෘතිඃ**=(23)විකෘති ද; **සංකෘතිඃ ච අපි**=(24)සංකෘති ද; **තථා**=එසේ; **අතිකෘතිඃ**=(25) අතිකෘති ද; **උත්කෘතිඃ**=(26 උත්කෘති දැයි—(මත්ත හා සම්බන්ධයි )

**ප**:-අර්ථකථනයෙහි දී 'උක්තා නම් ඡන්දසය' යනාදි වශයෙන් 'ඡන්දස්' ශබ්දය පර කොට යෙදීම යුතු වේ.

උක්තාදිඡන්දස් පස දැක්වීම පිඞ්ගල මතයට විරුද්ධ නො වේ ද? යත්:- නො වේ. පිඞ්ගලයන් විසින් ගායත්‍රි ආදිහු සමවෘත්තයන් වශයෙන් කියන ලදහ. උක්තාදීහු වෙසෙසින් නො කියන ලදහ. 'විකෝෂ ගෙලෂ' යනාදි සූත්‍රයන්ගෙන් කියනලද ප්‍රස්තාරය තමා උක්තාදි සංඥ හඟවන බැවින් ද, කවීන් විසින් බහුල ව උක්තාදීන් ප්‍රයොග නො කරණලද බැවින් ද ලක්ෂණ කථන ප්‍රස්තාවයෙහි උක්තාදීහු නො කියන ලදහ. ප්‍රස්තාරකථනයෙන් උක්තාදිකාර්‍ය්‍යය ද පිරිමැසෙන හෙයින් පිඞ්ගලසූත්‍රයන්ට මේ විරුද්ධ නො වේ.

පාදයක් පාසා එක් එක් අකුර වැඩි කිරීමෙන් සියලු ඡන්දස්හි අකුරු සතර බැගින් වැඩි වේ. එහෙයින් උක්තාව චතුරක්ෂර ය, අත්‍යුක්තාව අෂ්ටාක්ෂර ය. මත්තෙහි ද මෙසේයි. අන්තයෙහි උත්කෘතිඡන්දසෙහි පාදයට සවිසිඅකුරක් බැගින් සිව්පදයට අකුරු (104) එක්සිය සතරක් වේ.

22. **ඉති**= මෙසේ; **ඡන්දසාම්**= ඡන්දසුන්ගේ; **සංඥාඃ**= ජාතිසංඥ වෝ; **උක්තාඃ**= කියනලදහ. **සාම්ප්‍රතම්**= දැන්; **මාත්‍රාවෘත්ත+අනුපූර්විකම්**= මාත්‍රාවෘත්තයන්ගේ අනුක්‍රමය ඇති කොට හෙවත් මාත්‍රාවෘත්තයන් පෙරටු කොට; **සර්වවෘත්තානාම්**= සියලු වෘත්තයන්ගේ; **ලක්ෂණම්**= ලක්ෂණ; **ක්‍රමශඃ**=පිළිවෙළින්; **වච්මි**= කියමි.

**ප**:-මාත්‍රාවෘත්තය පළමු කොට කියා අනතුරු ව වර්ණවෘත්තය කියමි යනු භාවයි.

ශ්‍රී කෙදරභට්ටයන් විසින් රචනා කරණලද වෘත්තරත්නාකරයෙහි 'සංඥාභිධාන' නම් පළමුවන අදියර මෙතෙකින් නිමි.

---

## II

# ද්විතීයොධ්‍යායඃ.

1. ලක්ෂ්මෛතත් සප්ත ගණා—ගොපෙතා භවති නෙහ විෂමෙ ජඃ,
ෂෂ්ඨො'යං නලඝු වා—ප්‍රථමෙ'ර්ධෙ නියතමාර්යායාඃ.

---

## ii

## ද්විතීයාධ්‍යාය.

“මාත්‍රාවෘත්තානුපූර්වීකං ලක්ෂණං වච්මි”යි කළ ප්‍රතිඥාවට අනුරූප කොට ගායත්‍ර්‍යාදීන්ගේ සාංඛ්‍යාර්යයෙන් උපන් විෂම වෘත්තයන්ගේ අක්ෂරසංඥාව නො ගෙණ මාත්‍රාසඞ්ඛ්‍යාවෙන් භින්නාවූ ආර්යාවූ මාත්‍රාවෘත්තයන්ගේ ලක්ෂණ දක්වන්නාහු “ලක්ෂ්මෛතත්” යනාදීන් කියත්.

1. **ආර්යායාඃ**= ආර්යාවගේ; **ප්‍රථමෙ අර්ධෙ**= පළමුවන අර්ධයෙහි; **එතත්**= මේ; **නියතම්**= නියතවූ හෙවත් හැමතන්හි යෙදෙන; **ලක්ෂ්ම**= ලක්ෂණයි. (එනම්:–) **ග+උපෙතාඃ**=(අන්ත යෙහි) ගුරකින් යුක්ත වූ; **සප්ත ගණාඃ**= ගණ සතකි. **ඉහ**= මේ ආර්යාර්ධයෙහි; **විෂමෙ**= විෂමවූ ප්‍රථම තෘතීය පඤ්චම සප්තම) ස්ථානයෙහි; **ජඃ**= ජගණය; **න භවති**= නො වෙයි. **ෂෂ්ඨඃ**= සවනගණය; **අයං** (**ජඃ භවති**)= මේ ජගණය වෙයි; **නලඝු වා**= නගණ ලඝු දෙදෙන හෝ වෙති. (‘ලඝුසතරක් හෝ වෙයි’ යනු අර්ථයි.)

**පරිකථා**:—

මෙයින් ආර්යාවගේ ප්‍රථමාර්ධයෙහි සාමාන්‍ය ලක්ෂණ කියන ලදී. ආර්යාප්‍රථමාර්ධයෙහි ගණහතක් හා අන්තයෙහි ගුරක් ද වේ. මාත්‍රාගණතින් මාත්‍රා තිහකි. ඒ ගණ අතුරෙන් විෂම ගණස්ථානයන්හි ජගණය නො යෙදිය යුතුයි. සවන ගණස්ථාන යෙහි ජගණය හෝ චතුර්ලඝුගණය යෙදිය යුතුයි.

මෙසේ හෙයින් ප්‍රථමගණස්ථානයෙහි ජගණය හැර සෙසු ගණසතරෙන් යම්කිසි ගණයක් යෙදේ. තුන්වන, පස්වන, හත්වන ගණස්ථාන ද මෙසේ මැයි. දෙවන ගණස්ථාන යෙහි යථොක්ත ගණ පසෙන් යම් කිසිවක් ම යෙදිය හැකියි. සතරවන ගණය ද එසේ මැයි. සවන ගණස්ථානයෙහි සර්වලඝු-ජගණ දෙකින් අභිමත එකක් යෙදිය හැකියි ගණසතින් අන්ත යෙහි අර්ධගණයක් හෙවත් ගුරක් ම යෙදේ. සියල්ල එක්කළවිට මාත්‍රා තිහක් විය යුතු.

2. ෂෂ්ඨෙ විතීයලාත් පරකෙ—නෙල මුඛලාච්ච—සයති—
පදනියමඃ,
චරමේ'ඪේ පඤ්චමකෙ—තස්මා—දිහ භවති ෂෂ්ඨෝ ලඃ.

1 2 3 4 5 6 7 ගු



"ලක්ෂ්මී තත්සප්තගණා ගොපෙතා භවතිනෙහ විෂමෙ ජඃ" යනු ම ඊට උදාහරණයි. එහි විෂමස්ථානයන්හි ජගණය නො යොදන ලදී. සවනගණය ජගණයයි. මේ ලඟ පෙණෙන ආර්යාවගේ පූර්වාර්ධයෙහි සවනගණය සර්වලඝු ගණයයි. අන්‍යඋදාහරණ පෙන්වීමෙන් ග්‍රන්ථය මහත් වීවත් ශිෂ්‍යයන්ගේ ග්‍රන්ථනිරුත්සාහ යත් ඇතිවීම ඵලයි. එහෙයින් මෙහි යුක්තස්ථානයන්හි මුත් හැම තන්හි අන්‍යශ්ලෝකයන් උදාහරණ වශයෙන් නො දක්වමු. අර්ථීන් විසින් ජෛනුමඤ්ජර්‍යාදියෙන් ඒ ඒ වෘත්තයන්ට උදාහරණශ්ලෝක ගත යුතු. වෘත්තරත්නාකරයෙහි සූත්‍රය ම සූත්‍රොක්තියට උදාහරණ යයි මුල දී ම ප්‍රකාශ කරණ ලදී.

දැන් ආර්යාවගේ යතිස්ථානත් විතීයාර්ධයෙහි විශෙෂ ලක්ෂණත් දක්වත්.

2. **ෂෂ්ඨෙ**= (ආර්යාපූර්වාර්ධයෙහි) සවනගණය; **නෙල**= නගණ ලඝු ගණයක් හෙවත් සර්වලඝුගණයක් වූ කල්හි; **විතීයලාත්**= ඒ සවනගණයාගේ දෙවන ලඝුහු කෙරෙන් පූර්ව ව; **සයතිපදනියමඃ**= යතිය සහිත පදයාගේ නියමය වේ. (සවනගණයෙහි පූර්වලඝුහු කෙරෙන් පරව යතිය වෙයි යන අර්ථයි.) **පරකෙ**= (සවනගණයෙන්) පරවූ (සත්වන) ගණය; **නෙල**=සර්වලඝු ගණයක් වූ කල්හි; **මුඛලාත් ච**= (සත්වනගණයාගේ) ආදි ලඝුහු කෙරෙන් පූර්ව ව; **සයතිපදනියමඃ**= යතිසහිතපදනියමය වේ **චරමෙ අර්ධෙ**= අපරාර්ධයෙහි; **පඤ්චමකෙ**= පස්වනගණය; **නෙල**= සර්වලඝුවූ කල්හි; **තස්මාත් මුඛලාත්**= ඒ ආදි ලඝුහු කෙරෙන් පළමු ව; **සයතිපදනියමඃ**= යතිසහිතපදනියමය වේ. **ඉහ**= මේ චරමාර්ධයෙහි; **ෂෂ්ඨඃ**= සවනගණය; **ලඃ**= (හුදු) ලඝුවක් වේ.

**පරිකථා:—**

මෙහි වින්‍යාසය මෙසේයි:-

1-4 2-5 3-4 4-5 5-4 6-2 7-4 ගු



=මාත්‍රා 30

1-4 2-5 3-4 4-5 5-4 6-1 7-1 ගු



=මාත්‍රා 27

ආයර්‍යාපූර්වාර්ධයෙහි සවනගණය සර්වලඝුගණයක් ද විය හැකි යයි මුල දී කියනලදී. එසේ සර්වලඝු ගණයක් වුවොත් ඒ සර්වලඝු ගණයාගේ පූර්වලඝුහු කෙරෙන් පරව පෙර කියනලද රීත්‍යනුකූල ව යති තැබිය යුතුයි. මේ මුඛවිපුලායර්‍යාව ම ඊට උදාහරණයි. මෙහි ප්‍රථමගණය "ෂඬෙඨ"යනුයි. "විතීය" යනු දෙවන ගණයි. "ලාත්පර" යනු තෘතීයගණයි."කෙතෙල" යනු චතුර්ථ ගණයි. "මුඛලාක්"යනු පඤ්චම ගණයි. **"ව ස යති" යනු සවන ගණයි.** මෙහි යතිය වූයේ 'ව' යන්නෙන් පරවයි. මෙබඳු සෙසු තන්හි ද මෙසේ ම යති තැබිය යුතු. (මේ මුඛවිපුලා හෙයින් පූර්වාර්ධයෙහි චතුර්ථගණ මධ්‍යයෙහි පාදන්ත යතිය වේ.)

'පරකෙ'යි යොදනලද්දේ ෂෂ්ඨගණාපෙක්‍ෂාවෙනි. එහෙයින් සත්වනගණය ද සර්වලඝු වූ කල්හි සත්වනගණයෙහි ප්‍රථම ලඝුහුගෙන් පෙරටුව හෙවත් සවන ගණයෙන් පරව ද යති තැබිය යුතු. "පදතිය" යනු මේ ආයර්‍යාවෙහි සත්වනගණයයි ඒ සර්වලඝුයි. එහෙයින් ඔහුගේ පූර්වලඝුහට පෙරටුව හෙවත් "ව සයති" යන සවන ගණයෙන් පරව යති විය විත්‍යාසයෙහි "|" මේ ලකුණෙන් පෙන්වනලද්දේ යතිස්ථානයි.

විතීයාර්ධයෙහි ද සාමාන්‍යයෙන් මාත්‍රාතුණකින් අඩු ගණ හතක් හා අවසානයෙහි ගුරක් ද වේ යයි දතයුතු. චරමාර්ධයෙහි සවනගණය වෙනුවට යෙදෙන්නේ කෙවලලඝුවකි. එහෙයින් මාත්‍රා තුණක් ඌන වේ අපරාර්ධයෙහි මාත්‍රා විසිහතකි. ප්‍රථම ආයර්‍යාවෙහි ද "ෂඬෙඨා" යනු ප්‍රථමගණයි. "යංතල" "ඝුවා" "ප්‍රථමෙ" "ඨෙතිය" යනු 2. 3. 4. 5. වන ගණයි. සවෙනුව "ත"යි හුදුලඝුවකි. "මායර්‍යා"යි හත්වන ගණයයි. "යාඃ"යි අන්තයෙහි ගුරයි. චරමාර්ධයෙහි ද විෂමස්ථානයෙහි ජගණ නො යෙදේ. සවනගණය හුදු ලඝුවක් ම වේ යයි කීමෙන් ම සෙසු ලක්‍ෂණ පූර්වාර්ධයෙහි මෙනැයි හැගේ.

චරමාර්ධයෙහි පස්වනගණය සර්වලඝු වුවොත් ඒ ගණයාගේ පළමු ලඝුහු කෙරෙන් පූර්වයෙහි හෙවත් සතරවනගණයෙන් පරව යතිය වේ. දෙවන ආයර්‍යාශ්ලෝකයෙහි ඒ පැණේ. එහි "චරමෙ" "ඨෙපඤ්" "චමකෙ" "තඤමා" යනු පිළිවෙළින් 1. 2. 3. 4. වන ගණයි. "දිනහච" යනු පස්වන සර්වලඝුගණයයි. එහෙයින් 'දි' යන්නට මුලින් යතිය විය 'ති' යනු සවන හුදු ලඝුවයි. "ෂෂ්ඨෙ" යනු සත්වනගණයයි. "ලඃ"යනු අන්තයෙහි වූ ගුරයි.

පූර්වාර්ධ අපරාර්ධ දෙක්හි ලක්‍ෂණ හා යතිනියමයත් සෙසු ආයර්‍යාවන්හි ද මෙසේ ම යයි දත යුතු. මතු කියනු ලබන්නේ **විශෙෂ ලක්‍ෂණ පමණකි.**

මෙහි "වාමී-කර" ආදීන්හි මෙන් පූර්වාපරභාගයන්හි අනෙකවර්ණත්වයත් ඇත ද එබඳු පදමධ්‍යයතිය නො යෙදිය යුතු ය යනු ක්ෂෙත්‍රරාජයන්ගේ මතයි.

මෙහි ප්‍රථම ආර්යාව ෂෂ්ඨජගණපක්ෂයෙහි සාමාන්‍යලක්ෂණයට උදාහරණයි ෂෂ්ඨගණය චතුර්ලඝුගණයක් වීමට හා පෙරබෙහි දෙවැදෑරුම්යතියට ද ද්විතීයාර්යාවගේ පූර්වාර්ධය උදාහරණයි. උත්තරාර්ධයෙහි යතියටත්, උත්තරාර්ධලක්ෂණයටත් එහි ද්විතීයාර්ධය ම උදාහරණයි.

ආර්යාභෙද අටකොටි දහනවලක්ෂ විසිදහසක් (8,19,20000) ඇත්තේ ය. ඒ මෙසේ වන්නේ ය. ආර්යාවෙහි විෂමවූ පළමුවන තුන්වන පස්වන සත්වන ගණස්ථානයන්හි ජගණය හැර සෙසු සර්වලඝු-අන්ත්‍යගුරු-ආදිගුරු-සර්වලඝු ගණසතරෙන් යම්කිසි වක් යෙදිය හැකි බැවින් වෙන් වෙන් වශයෙන් භෙද සතර බැගින් වේ. සමගණස්ථානයන්හි ජගණනිෂෙධයක් නැති බැවින් භෙද පස බැගින් වේ. එහෙත් ෂෂ්ඨගණස්ථානයෙහි ජගණ-සර්වලඝුගණවශයෙන් භෙද දෙකකි. එහෙයින් ප්‍රථමගණස්ථානයෙහි භෙද සතරකි. දෙවැන්නෙහි භෙද පසකි තෙවැන්නෙහි සතරකි. සිවුවැන්නෙහි ද පසකි. පස්වැන්නෙහි සතරකි. සවැන්නෙහි දෙකකි. සත්වැන්නෙහි සතරකි. අටවැන්නෙහි ගුරුඅකුරක් ම හෙයින් භෙද එකකි. වින්‍යාසයෙහි ගණාඞ්කය පළමුවත් ඒ ඉදිරියෙහි එහි ලැබෙන භෙදත් "1-4" යනාදිවසයෙන් දක්වනලදී. මොවුන් එකිනෙක ගුණ කිරීමෙන් $(4 \times 5=20 \times 4=80 \times 5=400 \times 4=1600 \times 2=3200 \times 4=12800)$ දෙලොස් දහස් අටසියයක් පූර්වාර්ධභෙදයෝ වෙති.

උත්තරාර්ධයෙහි සවන ගණස්ථානය හැර සෙස්සෙහි භෙද පෙර සේ මැයි. සවැන්නෙහි හුදු ලඝුවක් හෙයින් භෙද එකකි. පෙර සේ එහි ද එකිනෙක ගුණ කිරීමෙන් උත්තරාර්ධභෙද සදස් සිවුසියයක් (6400) ලැබේ. අර්ධ දෙක්හි භෙද එකිනෙක ගුණ කිරීමෙන් (8,19,20000) අටකෝටි දහනවලක්ෂ විසිදහසක් ලැබේ. මේ ආර්යාවක් ප්‍රස්තාර කිරීමෙන් ලැබිය හැකි වෘත්ත භෙදයි. මෙ ම කියන ලදී:—

"ජගණවිහීනා විෂමෙ—චත්වාරඃ පඤ්ච යුජි ජගණ නලෞ,
ෂෂ්ඨෙ ද්වාවිති ච ගණාස්—තථාන්ත්‍යගඃ ප්‍රථමදලසංඛ්‍යා.
එවං පරාර්ධසංඛ්‍යා—ෂෂ්ඨෙ ස්‍යාල්ලඝුති චෛකස්මින්,
ආර්යාසංඛ්‍යෝභයදල—සංඛ්‍යාතා සා විනිර්දිෂ්ටා"ති.

ආර්යාවන් පිළිබඳ **නෂ්ට-උද්දිෂ්ටප්‍රත්‍යය** මෙහි ම කිය යුතු වේ. **සාමාන්‍යමාත්‍රාෂට්ප්‍රත්‍යය** මත්තෙහි දී පළවන බැවින් විස්තර එහි දී උගත යුතු. **'නෂ්ටප්‍රත්‍යය'** නම් සංඛ්‍යාවක් කියා මෙනම් සංඛ්‍යාව ඇති වෘත්තයෙහි ගුරුලඝුවින්‍යාසය කෙසේ දැයි ප්‍රශ්න කළවිට එය දැනගැණීමේ උපායයයි. ප්‍රස්තාර කිරීමෙන් එය දත හැකි වුවත් ප්‍රස්තාරයට බොහෝ කාලයක් ගත වන බැවිනුත් ඇතැම්විට ප්‍රමාදයෙන් ප්‍රස්තාරය වැරැදිය හැකි බැවිනුත් මේ 'නෂ්ටප්‍රත්‍යය' දැන ගැන්ම නොපෙණෙන ගුරුලඝු වින්‍යාසය ඇති ආර්යාවන්ගේ ගුරුලඝුවින්‍යාසය දැනීමට ඉවහල් වේ. ප්‍රස්තාරයාගේ ශුද්ධාශුද්ධභාවය දැන ගැණීමට ද මේ ඉවහල් වේ. (3,74,409) තුන්ලක්ෂ හැත්තෑහාරදස් සාරසියනව වන ආර්යාවෙහි ගුරුලඝු කෙසේ ද?

නෂ්ටවෘත්තය සොයා ගැණීමට-කියනලද සංඛ්‍යාව ප්‍රථම ගණ විකල්ප සතරෙන් බෙදූවිට යම් සංඛ්‍යාවක් ඉතිරි වේ ද, එය ප්‍රථමස්ථානයෙහි යෙදිය යුතු ගණයාගේ අඞ්කයයි. දෙක ඉතිරි වූයේ නම් යට (9 පිටෙහි) දක්වන ලද මාත්‍රාගණ අතුරෙන් දෙවෙනි ගණය ප්‍රථමස්ථානයෙහි යෙදිය යුතු. බෙදා ලැබුනු ඵලයට එකක් එකතු කොට නැවැත ද්විතීය ගණ විකල්පයන්ගෙන් බෙදූවිට ඉතිරි වන සංඛ්‍යාව එහි යෙදිය යුතු ගණයාගේ අඞ්කයයි. මේ ක්‍රමයෙන් ආර්යාව සම්පූර්ණ වන තෙක් සෙවිය යුතු. යම් තැනෙක්හි බෙදීමේ දී ඉතිරි නුවූයේ නම් බෙදූ සංඛ්‍යාවට සමානගණය ගත යුතුයි. සතරෙන් බෙදූවිට සංඛ්‍යාවක් ඉතිරි නුවූවොත් (ජගණය හැර සෙසු) ගණයන්ගෙන් සතර වන (චතුර්ලඝු) ගණය ම ඒ ස්ථානයෙහි යෙදිය යුතු. නියතගණස්ථානයන්හි ඒ ගණය ම යෙදිය යුතු. යථොක්ත සංඛ්‍යාවෙන් නෂ්ටය සොයන අයුරු මෙහි දක්වනු ලැබේ.

4 | 374409 ÷ 4 (ප්‍රථමස්ථානයෙහි හෙද සතරකි)
93602 — 1 = 1
◡ ◡ පළමුවනගණය)

සතරෙන් බෙදූවිට එකක් ඉතිරි වූ හෙයින් ගණයන්ගෙන් පළමුවන ගණය හෙවත් (◡ ◡) සර්වගුරුගණය මූලට යෙදිය යුතු. බෙදීමෙන් ලැබුනු ඵලය වූ 93,602ට එකක් එකතු කොට ද්විතීයගණවිකල්ප වූ පසෙන් බෙදා ඉතිරි වන ගණනට සමාන ගණය ද්විතීය ස්ථානයෙහි යෙදිය යුතු.

93602+1
1
5 | 93603÷5 (ද්විතීයස්ථානයෙහි ලැබෙන භෙද පසකි.)
18720—3 = 2

– ⏑ – දෙවනගණය.

තුණක් ඉතිරි හෙයින් ද්විතීයස්ථානයෙහි තුන්වනගණය හෙවත් ජගණය යෙදිය යුතු. මත්තෙහි ද මේ ක්‍රම මැයි.

18720
1
4 | 18721÷4 (තෘතීයස්ථානයෙහි භෙද සතරකි.)
4680—1= 3

⏑ ⏑ තුන්වනගණයයි.

1
5 | 4681÷5 (චතුර්ථස්ථානයෙහි භෙදපසකි.)
936—1= 4

⏑ ⏑ සතරවනගණයයි.

1
4 | 937÷4 (පඤ්චමස්ථානයෙහි භෙද සතරකි.)
234—1= 5

⏑ ⏑ පස්වනගණයයි.

1
2 | 235÷2 ෂෂ්ඨස්ථානයෙහි විකල්ප දෙකකි.)
117—1= 6

–⏑– සවනගණය

මෙහි එකක් ඉතිරි වූ හෙයින් ෂෂ්ඨස්ථානයෙහි යෙදෙන ගණ දෙක අතුරෙන් පළමුවන ගණය හෙවත් ජගණය යෙදිය යුතු.

117
1
4 | 118÷4 (සප්තමස්ථානයෙහි භෙද සතරකි.)
29—2 7

– – ⏑ සත්වනගණය.

මින් පසු අටවැනි ව සියලු ආයර්‍යාවන්හි නියත ගුරුඅකුර යෙදිය යුතුයි. දැන් පූර්වාර්ධය සම්පූර්ණය. ද්විතීයාර්ධය සෙවීමට ද මෙහි දී ලැබුනු ඵලය ම එකක් එක් කොට යථොක්ත ක්‍රමයෙන් බෙදිය යුතු.

29+1

1

4 ⟌ 30 ÷ 4 (වරමාධිප්‍රථමගණස්ථානයෙහි ද භෙද සතරකි.)

7—2= 1

වරමාධියෙහි ප්‍රථමගණයයි. – – ⏑

1

5 | 8 ÷ 5 (ද්විතීයභෙදයි.)

1—3= 2

ද්විතීයගණයයි. – ⏑ –

1

4 | 2 ÷ 4 (තෘතීයභෙදයි.)

0—2= 3

තෘතීයගණයි. – – ⏑

(බෙදිය නො හැකි තැන බෙදනු ලබන ගණන ම ඉතිරි යයි සැලකිය යුතු.)

1

5 | 1 ÷ 5 (චතුර්ථභෙදයි.)

0—1= 4

සතරවන ගණයි ⏑⏑

4 | 1 ÷ 4 (පඤ්චමභෙදයි.)

0—1= 5

පස්වනගණයි. ⏑⏑

(ෂෂ්ඨගණස්ථානයෙහි නියතලඝුවකි.)

1

4 | 1 ÷ 4 (සප්තමභෙදයි.)

0—1= 7

හත්වනගණයයි. ⏑⏑

(අෂ්ටමස්ථානයෙහි නියත ගුරකි.)

දැන් වරමාධිය ද සම්පූර්ණය. අධිදෙක්හි ම ගණවින්‍යාසය මෙහි ලැබුනු ක්‍රමයෙන් මෙසේයි:—

| | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 |
|---|---|---|---|---|---|---|---|---|
| ප්‍රථමාධිය:— | ⏑⏑ | – ⏑ – | ⏑⏑ | ⏑⏑ | ⏑⏑ | – ⏑ – | – – ⏑ | ⏑ |
| වරමාධිය:— | – – ⏑ | – ⏑ – | – – ⏑ | ⏑⏑ | ⏑⏑ | — | ⏑⏑ | ⏑ |

යථොක්ත සඞ්ඛ්‍යා (3,74,409) ඇති ආයඨිාවෘත්තයෙහි ගුරු ලඝුවින්‍යාසය මෙයයි. මෙය සත්‍ය ද යනු උද්දිෂ්ටප්‍රත්‍යයයෙන් දත හැකි වේ. සෙසු නෂ්ටවෘත්තයන්හි ද ගුරුලඝු වින්‍යාසය මේ ක්‍රමයෙන් ම සොයා ගත යුතු. නෂ්ටප්‍රත්‍යය ද—

"නෂ්ටාඞ්කෙ ප්‍රථමං හත්වා ගණාඞ්කෛශ්චතුරාදිකෛඃ,
ශෙෂසඞ්ඛ්‍යා ගණෝ ඥෙයො ලබ්ධං කුර්‍යාත් සරූපකම්.
පුනර්භජෙත් පුනර්ලබ්ධං සරූපං ශෙෂසඞ්ඛ්‍යයා,
ගණාන් දද්‍යාද්ගණෙ ශෙෂෙ ගාථා'ථ ප්‍රාග්ගණක්‍රමඃ."

යනුවෙන් දක්වන ලදී. ගීත්‍යාදීන්හි ද මෙසේ ම දත යුතු

**'උද්දිෂ්ටප්‍රත්‍යය'** නම් ආර්‍යාවක් පෙන්වා මෙය ආර්‍යා ප්‍රස්තාරයෙහි කිවන වෘත්තය දැයි ඇසූවිට එය සොයා ගන්නා ක්‍රමයයි. එහි පළමුව කියනලද ආර්‍යාව ගුරුලඝුවින්‍යාස කොට ඒ ගණස්ථානයන්හි යෙදිය හැකි ගණසඞ්ඛ්‍යාව 4. 5. 4. 5. 4. 2. 4. 1. යනාදිවසයෙන් යෙදිය යුතු. ඉන් පසු අපරාර්ධයාගේ අන්තයෙහි යෙදී තිබෙන (1) එකසඞ්ඛ්‍යාව ඊට මුලින් සප්තමස්ථානයෙහි භෙදසඞ්ඛ්‍යාව වූ සතරෙන් ගුණ කළ යුතු. ලැබුන ඵලයෙන් සප්තමස්ථානයෙහි යෙදුනුගණයට යටින් ප්‍රස්තාරයෙහි පැණෙන, ඒ සප්තමස්ථානයෙහි යෙදිය හැකි ගණයන් අඩු කළ යුතුයි. (සප්තමස්ථානයෙහි සර්වගුරුගණය යෙදී තිබේ යයි සිතමු. ප්‍රස්තාරයෙහි ඊට යටින් ගණ සතරක් තිබේ. එයින් ජගණය විෂමස්ථානයෙහි නො යෙදෙන බැවින් සෙසු ගණතුන අඩු කළ යුතු.) අඩු කිරීමෙන් ලත්ඵලය- (ෂෂ්ඨස්ථානයෙහි භෙදයක් නැති හෙයින්) පස්වන ස්ථානයෙහි යෙදෙන විකල්ප සතරෙන් ගුණ කළ යුතුයි. ඵලයෙන්—පඤ්චමස්ථානයෙහි යෙදී තිබෙන ගණයට යටින් ප්‍රස්තාරයෙහි පැණෙන, (9. පිට බලනු.) පස්වැන්නෙහි යෙදිය හැකි ගණ අඩු කළ යුතුයි. මේ ක්‍රමයෙන් ප්‍රථමාර්ධයෙහි ප්‍රථමගණය තෙක් අඩුවැඩි කළ යුතු. අන්තයෙහි ලැබෙන්නේ ආර්‍යාසංඛ්‍යාවයි හෙවත් අසනලද්දට පිළිතුරයි.

"ශ්‍රීරත්නසාරනාමා ස්වාමීන්ද්‍රො'සෞ භුවිහ විබුධෙශඃ,
සුතරාං දයාර්ද්‍රහෘදයො රජ්‍යාත් ප්‍රිත්‍යා සුඛං ශශ්වත්."

මේ ආර්‍යාව ආර්‍යාප්‍රස්තාරයෙහි කතමස්ථානයෙහි ලැබේ ද? එහි ගුරුලඝුගණ වින්‍යාසය මෙසේයි:-




මෙහි ගණස්ථාන මතුවෙහි දක්වනලද්දේ එහි යෙදිය හැකි භෙදයි.

මේ ආයසීාවගේ අපරාර්ධාන්තයෙහි යෙදුනු (I) එකාඞ්කය ඊට මුලින් යෙදුනු සතරෙන් ගුණ කොට සප්තමයෙහි සර්වගුරු ගණය හෙයින් ප්‍රස්තාරයෙහි ඊට යටින් යෙදුනු ජගණවර්ජිත ගණත්‍රය එයින් අඩු කළ යුතු.

1×4
4
3 — එවිට එකක් ඉතිරි වීය සවැන්නෙහිභෙදයක් නැතිහෙයින් ඒ ගැණ සෙවිය යුතුනො වේ.
1

ඉතිරි එක පස්වැන්නෙහි යෙදෙන භෙද සතරෙන් ගුණ කොට පෙර සේ අඩු කළ යුතු.

1×4
4
3 (පස්වැන්නෙහි සර්වගුරු යෙදී තිබෙන හෙයින් තුණක් අඩු [කරණුලැබේ.)
1×5 (සිවුවැන්නෙහි යෙදියහැකි භෙද)
5
4 (සිවුවැන්නෙහි සර්වගුරු යෙදුනු හෙයින් සතරක් අඩු [කරණුලැබේ.)
1×4 (තෙවැන්නෙහි භෙද)
4
2 (තෙවැන්නෙහි ද්විතීයගණය යෙදුනෙන් ජගණවර්ජිත සෙසු [ දෙක අඩුකරණුලැබේ.)
2×5 (දෙවැන්නෙහි භෙද)

| | | | |
|---|---|---|---|
| 10——10 | | (සෙස්ස ද මෙසේ මැයි.) | |
| 2 | 235 × 4 | 4681 × 4 | 93603 × 4 |
| 8×4 | 940 | 18724 | 374412 |
| 32 | 3 | 3 | 3 |
| 2 | 937 × 5 | 18721 × 5 | 374409 මේ උද්දිෂ්ටයාගේ සඞ්ඛ්‍යාවයි. |
| 30×4 | 4685 | 93605 | |
| 120 | 4 | 2 | |
| 2 | 4681 | 93603 | |
| 118 × 2 | | | |
| 236 | | | |
| 1 | | | |
| 235 | | | |

මේ ක්‍රමයෙන් සෙසු ආයසීාවන්ගේ ද උද්දිෂ්ටය දතයුතු. "ලක්ෂ්මී" යනාදි ආයසීාශ්ලෝකය 1,14,21,621 වන ස්ථානයෙන් උද්ගත වේ. ආයසීාවන්පිළිබඳ උද්දිෂ්ටය මෙසේ උගන්වන ලදී:—

"ගණානුද්දිෂ්ටගාථායාඃ සංස්ථාප්‍ය තදධො ලිඛෙත්,
චතුඃපඤ්චාදිකාං සඞ්ඛ්‍යාං ස්ථානස්ථානොචිතාං තතඃ.
හත්වා හත්වාඞ්කමන්ත්‍යන චොපරිස්ථාද්ගණාදධඃ,
පාථගස්ථාතගණෙභ්‍යො'ථ ගණසඞ්ඛ්‍යාං විකල්පයෙත්.
හතාද්වායෙසීාචිතා තාවද්‍යාවද්‍යාඞ්කසම්භවඃ,
තත්සඞ්ඛ්‍යාමුද්දිශෙද්ගාථාමුද්දිෂ්ටප්‍රත්‍යයෙ බුධඃ"යි.

ආයසීානෂ්ටෝද්දිෂ්ටප්‍රත්‍යය විධිය මෙතෙකින් නිමි.

3. ත්‍රිෂ්වංශකෙෂු පාදෙ—දලයොරාද්‍යෙෂු දෘශ්‍යතෙ යස්‍යාඃ,
පථ්‍යෙති නාම තස්‍යාශ්—[1]ඡන්දොවිද්භිඃ සමාඛ්‍යාතම්.

4. [2]සංලඞ්ඝ්‍ය ගණත්‍රයමාදිමං—ශකලයොර්වයොර්භවති පාදඃ,
යස්‍යාස්තාං පිඞ්ගලනාගො—විපුලාමිති සමාඛ්‍යාති.

---

3. **යස්‍යාඃ**- යම් ආර්‍ය්‍යාවකගේ; **දලයොඃ**- දෙ අඩෙහි; **ආද්‍යෙෂු**-ආදිවූ; **ත්‍රිෂු අංශකෙෂු**-(චතුර්මාත්‍රික)ගණ තුනෙහි; **පාදඃ**- පාදය; **දෘශ්‍යතෙ**- දක්නා ලැබේ ද; **තස්‍යාඃ**- ඒ ආර්‍ය්‍යාවට; **පථ්‍යා ඉති නාම**- 'පථ්‍යා' යන නාමය; **ඡන්දොවිද්භිඃ**- ඡන්දස් දන්නවුන් විසින්; **සමාඛ්‍යාතම්**- කියන ලදී.

**පරීක්ෂා**:—

ගණතුනකින් පරව අඩ දෙක්හි ම පාදය වේ නම් ඒ 'පථ්‍යාර්‍ය්‍යා' නම්. එහි ගණතුනින් පාදය පරිච්ඡින්න හෙයින් පාදන්තයතිය ගණතුනකින් පර ව විය යුතු. සෙසු ලක්ෂණත් යති විභාගත් සාමාන්‍ය ආර්‍ය්‍යාවෙහි කියන ලදී. 'ත්‍රිෂ්වංශකෙෂු' යනාදියෙහි ගුරුලඝුවින්‍යාසය මෙසේයි:—

1=4 2=5 3=4 4=5 5=4 6=2 7=4 ගු
◡◡ —◡— ◡◡, - - ◡ ◡◡ —◡— ◡◡ ◡ = මාත්‍රා 30

1=4 2=5 3=4 4=5 5=4 6=1 7=4 ගු
◡◡ —◡— ◡◡, ◡◡ ◡◡ — ◡◡ ◡ = මාත්‍රා 27

මෙහි තුන්වන ගණයෙන් ප්‍රථමපාදය අවසන් වේ. නෂ්ටොද්දිෂ්ටයන් පෙර සේ මැයි. ගුරුලඝු වින්‍යාසයෙහි ගණාඞ්කයන්ට අනතුරු ව දක්වනු ලබන්නේ ඒ ස්ථානයෙහි යෙදිය හැකි ගණවිකල්පයයි. මේ 1,02,569 වන ආර්‍ය්‍යාවයි. ඇතැම් පොතෙක "ප්‍රකීර්තිතං නාගරාජෙන"යි ඇතත් ඒ නො යෙදේ. එසේ ගත හොත් ජඝනචපලා මැයි. පථ්‍යා නො වේ.

4. **යස්‍යාඃ**- යම් ආර්‍ය්‍යාවකගේ; **ද්වයොඃ ශකලයොඃ**- අඩ දෙක්හි; **ආදිමං ගණත්‍රයම්**- ආදි වූ ගණතුන; **සංලඞ්ඝ්‍ය**- ඉක්මවා; **පාදඃ**- පාදය; **භවති**- වේ ද; **තාම්**- ඒ ආර්‍ය්‍යාව; **විපුලාමිති**- 'විපුලා' යයි; **පිඞ්ගලනාගඃ**- පිඞ්ගලනාග තෙමේ; **සමාඛ්‍යාති**- කියයි.

---

1. ප්‍රකීර්තිතං නාගරාජෙන. 2. උල්ලඞ්ඝ්‍ය.

5. උභයාර්ධයෝර්ජකාරෞ—ද්විතීයතුර්‍යෞ ගමධ්‍යගෞ යස්‍යාඃ, චපලේති නාම තස්‍යාඃ—ප්‍රකීර්තිතං නාගරාජේන.

---

**පරිකථා**:—

ගණතුණක් ඉක්මවා සතරවනගණයාගේ මධ්‍යයෙහි පාදය අවසන් වේ නම් හෙවත් පාදන්තයති වේ නම් ඒ ආර්‍යාව ‘විපුලා’යයි කියනු ලැබේ. සාමාන්‍යලක්ෂණ හා යති 1 2. ශ්ලෝකයන්හි කියන ලදී. මෙහි ගුරුලඝුවින්‍යාසය මෙසේයි:—

1=4 2=5 3=4 4=5 5=4 6=2 7=4 ගු = මාත්‍රා 30
⏑⏑ – – ⏑ – – ⏑ – ⏑, – – – ⏑ – ⏑ – – – ⏑ ⏑

1=4 2=5 3=4 4=5 5=4 6=1 7=4 ගු = මාත්‍රා 27
⏑⏑ ⏑⏑ – – ⏑ ⏑, – – ⏑ – – — ⏑⏑ ⏑

වින්‍යාසයෙහි “,” මේ ලකුණෙන් දක්වනලද්දේ පාදන්තයි. සතරවන ගණමධ්‍යයෙහි පාදන්තයතිය වේ පාද දෙක සමස්ත ව හෝ ව්‍යස්ත ව තිබිය හැකියි. මේ ආර්‍යාව ප්‍රස්තාරයෙහි 1,35,71,785 වන ස්ථානයෙහි ලැබේ.

මෙහි ‘ඉති’ ශබ්දය ප්‍රකාරාර්ථයෙහි යයි ද, ‘විපුලාම්’ යනු කර්මයෙහි ද්විතීයා යයි ද, ඉතිශබ්දය ප්‍රකාරවාචි බැවින් චපලාදීන්ගේ ද ගණතුණ ඉක්ම විරාමත්වප්‍රකාරය ඇතිකල්හි විපුලාබව ද වෙයි යන සංකීර්ණභේදත් සංගෘහීත යයි ද කියන ලදී. මේ මුඛවිපුලා, ජඝනවිපුලා, උභයවිපුලා යයි තුන්වැදෑරුම්. පූර්වාර්ධයෙහි ම සතරවනගණයාගේ මධ්‍යයෙහි විරාමය ඇත්තී ‘මුඛවිපුලා’යි. අපරාර්ධයෙහි ම එසේ වූවා ‘ජඝනවිපුලා’යි. අර්ධදෙක්හි ම එසේ වූවා ‘උභයවිපුලා’යි. මීට ම ‘මහාවිපුලා’යයි ද කියති. වෘත්තරත්නාකරයෙහි දක්වනලද්දේ මහාවිපුලායි. “ෂණ්ඨෝ” යනාදි මෙහි දෙවන ශ්ලෝකය මුඛවිපුලාවට උදාහරණයි. එහි ප්‍රථමාර්ධයෙහි පමණක් විපුලාලක්ෂණ පැණේ. අපරාර්ධයෙහි පථ්‍යාලක්ෂණ පැණේ. ජඝනවිපුලාවට උදාහරණ ස්වයං චින්ත්‍යයි.

5. **යස්‍යාඃ**- යම් ආර්‍යාවකගේ; **උභය+අර්ධයෝඃ**- අර්ධ දෙක්හි; **ද්විතීයතුර්‍යෞ**- දෙවන සතරවන; **ජකාරෞ**- ජගණ දෙදෙන; **ගමධ්‍යගෞ**- (පූර්වාපර ව සිටි) ගුරුදෙකක්හුගේ

**6. ආද්‍යං දලං සමස්තං—භජේත ලක්ෂ්ම චපලාගතං යස්‍යාඃ,**
**ශෙෂෙ පූර්වජලක්ෂ්මා—මුඛචපලා සෝදිතා මුනිනා.**

---

මධ්‍යයට ගියාහු වෙද් ද; **තස්‍යාඃ**- ඒ ආර්‍ය්‍යාවට; **චපලා ඉති නාම**- 'චපලා' යන නාමය; **නාගරාජේන**- පිඞ්ගලනාගරාජයා විසින්; **ප්‍රකීර්තිතම්**- කියන ලදී.

**පරිකථා:—**

මෙහි දෙවෙනි වූ "ධයෝජි" යන ජගණය තෙම "යාර්—කා" යන පූර්වාපර වූ ගුරුන් දෙන්නාගේ මධ්‍යයෙහි සිටියේයි. සතරවනගණ වූ "චිතීය" යන ජගණ තෙමේ "රෞ—තූර්" යන ගුරුන්ගේ මධ්‍යයෙහි සිටියේයි. දෙවන අර්ධයෙහි "තිනාම" යන ජගණය පූර්වාපරවූ "ලෙ—තස්" යන ගුරුන් දෙන්නාගේ මධ්‍යයෙහි ද, සතරවන "ප්‍රකීර්ති" යන ජගණය "ස්‍යාඃ—තං" යන ගුරුන් දෙන්නාගේ මධ්‍යයෙහි ද සිටියේයි. යථෝක්ත සූත්‍ර ශ්ලෝකයෙහි ගණවින්‍යාසය මෙසේයි:--

1=2 2=1 3=1 4=1 5=2 6=2 7=4 ගු = මාත්‍රා 30
– – ⏑ —⏑— ⏑⏑, —⏑— ⏑⏑ —⏑— ⏑⏑ ⏑

1=2 2=1 3=1 4=1 5=2 6=1 7=4 ගු = මාත්‍රා 27
– – ⏑ —⏑— ⏑⏑, —⏑— ⏑⏑ — ⏑⏑ ⏑

මේ චපලාර්‍ය්‍යාවෙහි ප්‍රථමගණස්ථානයෙහි සර්වගුරු අන්ත ගුරු දෙකින් එකක් මිස අතික් ගණයක් නො යෙදේ. දෙවැන්න නිත්‍යයෙන් ජගණයි. තුන්වැන්න නිත්‍යයෙන් සර්වගුරු විය යුතුයි. සිවුවැන්න නිත්‍යජගණයි. පස්වැන්න සර්වගුරු ආදිගුරු ගණ දෙකෙන් එකක් වේ. මීට වෙනස් වුවොත් චපලාලක්ෂණ නො ලැබේ. 6-7 වන ගණ පෙර සේ මැයි. එකිනෙක ගුණ කිරීමෙන් පූර්වාර්ධයෙහි (2×1=2×1=2×1=2×2=4×2=8×4=32) භෙද තිස්දෙකක් ද, එසේ ම අපරාර්ධයෙහි (2×1=2×1=2×1=2×2=4×1=4×4=16) භෙද සොළොසක් ද වේ. පූර්වාර්ධ අපරාර්ධ භෙද ගුණ කිරීමෙන් මහාචපලාර්‍ය්‍යා භෙද පන්සිය දොළොසක් (512) ලැබේ. ඔහු ද යථෝක්ත ආර්‍ය්‍යාභෙදයන්හි ඇතුළත් වූවෝ් වෙති. මෙහි දක්වනලද්දේ චපලාභෙදයන්ගෙන් 34 වන චපලාර්‍ය්‍යාවයි. තඤ්ඤාදීන්ට ද පෙර කී ක්‍රමානුසාරයෙන් ම චපලානුකූල සේ යොදා ගත යුතු.

6. **යස්‍යාඃ**- යම් ආර්‍ය්‍යාවකගේ; **ආද්‍යං දලම්**- පළමුවන අර්ධය; **චපලාගතම්**- චපලාවට ඇතුළත් වූ; **සමස්තං ලක්ෂ්ම**- සියලු ලක්ෂණය; **භජේත**- සෙවුනේ ද; **ශේෂේ**- අතික් දෙවෙනි

7. ප්‍රාක්ප්‍රතිපාදිතමර්ධේ—ප්‍රථමෙ ප්‍රථමෙතරෙ තු චපලායාඃ,
ලක්‍ෂමාශ්‍රයෙත සොක්තා—විශුද්ධධීභිර්ජඝනචපලා.

**ඉත්‍යාශ්‍යාප්‍රකරණම්.**

---

අර්ධයෙහි; **පූර්වලක්‍ෂමා**- පළමු පථ්‍යායෙහි වූ ලක්‍ෂණ ඇති; **සා**- ඕතොමෝ; **මුඛචපලා**- 'මුඛචපලා' නමැයි; **මුනිනා**- පිඬගල මුනිහු විසින්; **උදිතා**- කියන ලදී.

**පරිකථා:—**

පූර්වාර්ධයෙහි චපලාලක්‍ෂණත් අපරාර්ධයෙහි පථ්‍යාලක්‍ෂණත් ඇත්තී 'මුඛචපලා'යි. පූර්වාර්ධයෙහි දෙවනගණවූ "දලංස" යන ජගණය "ද්‍යං—මස්" යන ගුරුදෙක මැද ද, සතරවන "හජේත" යන ජගණය "තං—ලක්" යන ගුරුදෙක අතර ද සිටියේයි. අනික් අර්ධයෙහි පථ්‍යාලක්‍ෂණයි. එහෙයින් 'මුඛචපලා'යි. විත්‍යාසය මෙසේයි:—

1=2 2=1 3=1 4=1 5=2 6=2 7=4 ගු


= මාත්‍රා 30

1=4 2=5 3=4 4=6 5=4 6=1 7=4 ගු


= මාත්‍රා 27

මේ මුඛචපලාවෙහි පූර්වාර්ධය(මහා)චපලාවගේ පූර්වාර්ධලක්‍ෂණ යුක්ත හෙයින් එහි ලැබෙන භෙද දෙතිස මෙහි ද ලැබේ. අපරාර්ධය පථ්‍යාලක්‍ෂණ සෙවුනා බැවින් එහි ආයර්‍යාඅපරාර්ධයට කියනලද භෙද (6400) හදස්හාරසියය ලැබේ. පූර්වාපරාර්ධභෙද එකිනෙක ගුණ කළවිට (2,04,800) දෙලක්‍ෂහාරදස්අටසියයක් භෙද ලැබේ. මේ මුඛචපලාභෙද ද යථොක්තආයර්‍යාභෙද මෙන් ම සැලකිය යුතු.

7. (**යා**- යම් ආයර්‍යාවක් තොමෝ;) **ප්‍රථමෙ අර්ධෙ**- පළමුවන අර්ධයෙහි;**ප්‍රාක් ප්‍රතිපාදිතං ලක්‍ෂම**-පළමු පථ්‍යාවෙහි ප්‍රතිපාදනය කරණ ලද ලක්‍ෂණ; **ආශ්‍රයෙත**- ආශ්‍රය කරන්නී ද; **ප්‍රථම+ඉතරෙ තු**- දෙවනඅර්ධයෙහි වනාහි; **චපලායාඃ (ලක්‍ෂම ආශ්‍රයෙත)**- චපලාලක්‍ෂණය ආශ්‍රය කරන්නී ද; **සා**- ඒ ආයර්‍යා තොමෝ; **විශුද්ධධීභිඃ**- ශුද්ධබුද්ධි ඇත්තවුන් විසින්; **ජඝනචපලා උක්තා**- 'ජඝනචපලා'යයි කියන ලදී

ස:-මෙහි පළමුවන අඩියෙහි පථ්‍යාලක්‍ෂණ ය. දෙවෙනි අඩියෙහි 'ශ්‍රයෙත' යන විතීයවූ ජගණය "මා—සො" යන ගුරු දෙක අතර ද, සතරවන "විශුද්ධ" යන ජගණය "තා—ධි" යන ගුරු දෙක අතර ද සිටි හෙයින් 'ජඝනචපලා'වී. වින්‍යාසය:—

1=4 2=5 3=4 4=5 5=4 6=2 7=4 ගු

⏑ – – ⏑ – – ⏑ ⏑, – – ⏑ – – ⏑ – ⏑ – – – ⏑ ⏑ = මාත්‍රා 30

1=2 2=1 3=1 4=1 5=2 6=1 7=4 ගු

⏑ ⏑ – ⏑ – ⏑ ⏑, – ⏑ – ⏑ ⏑ – – – – – ⏑ = මාත්‍රා 27

ගණවිකල්ප එකිනෙක ගුණ කිරීමෙන් ප්‍රථමාඩියෙහි හෙද ආර්‍ය්‍යාප්‍රථමාඩියෙහි සේ ම (12800) දෙළොස්දහස්අටසියයක් ද, අපරාඩියෙහි චපලාපරාඩියට කී හෙද සොළොස ද ලැබේ. අඩි දෙක්හි හෙද ගුණ කිරීමෙන් දෙලක්‍ෂහාරදස් අටසියයක් (2,04,800) ලැබේ.

අඩිදෙක්හි ම චපලාලක්‍ෂණ යුක්තවූවා මහාචපලායි. "උභයාඩියොඃ" යනාදීන් කියනලද්දේ ඒ මහාචපලාවයි. එක්පථ්‍යාවකි. මහාවිපුලා, මුඛවිපුලා, ජඝනවිපුලා යයි විපුලාහෙද තුණකි. ඔවුන්ගේ හෙදය පාදවිච්ඡේදහෙදයෙන් වේ. චපලාවෙහි ද පථ්‍යා-විපුලාවන්ගේ සේ පාදවිච්ඡේදය කරණු ලැබේ. එහෙයින් චපලා තුණ යථොක්ත හෙද සතරින් ගුණ කළ විට හෙද දෙළොසක් වේ. ඒ දෙළොසට යට කී ශුද්ධපථ්‍යාය විපුලා තුණය යන සතර එක් කළ විට සොළොසක් (16) වේ. මේ ආර්‍ය්‍යා හෙදයි. මෙහි 1. 2. ශ්ලොකයන්ගෙන් දක්වනලද්දේ ආර්‍ය්‍යාවන් සියල්ලට ම සාධාරණ වූ ලක්‍ෂණයි. එහෙයින් එය විශෙෂ ආර්‍ය්‍යාවක් සේ නො සිතිය යුතු. හලායුධයෝ ආර්‍ය්‍යාහෙද මෙසේ දක්වත්:—

"එකෛව භවති පථ්‍යා—විපුලාස්තිස්‍රස්තතශ්චතස්‍රස්තාඃ,
චපලාභෙදෛස්ත්‍රිභිරපි—භින්නා ඉති ෂොඩශාර්‍ය්‍යාඃ ස්‍යුඃ"යි.

හලායුධභට්ටයන් විසින්දු ආර්‍ය්‍යාහෙද නියම කිරීමෙන් ම ආර්‍ය්‍යාවන්හි පාදවිච්ඡේදය ඇතැයි පිළිගත්තේ වේ. එහෙයින් ඔවුන්ගේ මේ කීමෙන් ම යට (15 පිටෙහි) දක්වනලද "අත්‍රාඩිස්‍ය ලක්‍ෂණම්" යනාදි තද්‍යුක්තිය ම ඛණ්ඩිත වේ.

**ආර්‍ය්‍යාප්‍රකරණය මෙතෙකින් සමාප්තයි.**

——×——

8. ආර්‍යාප්‍රථමදලොක්තං—යදි කථමපි ලක්‍ෂණං භවෙදුභයොඃ,
දලයොඃ කෘතයතිශොභාං—තාං ගීතිං ගීතවාන් භුජඞ්ගෙශඃ.

---

8. **යදි**= ඉදින්; **ආර්‍යාප්‍රථමදල+උක්තම්**= ආර්‍යාවගේ ප්‍රථමාර්ධයෙහි කී; **ලක්‍ෂණම්**=ලක්‍ෂණය; **උභයොඃ දලයොඃ**= අර්ධ දෙක්හි; **කථම් අපි**= කෙසේ නමුත්; **භවෙත්**= වේ නම්; (**තද**= එකල්හි) **කෘතයතිශොභාං**=කරණ ලද යතිශොභා ඇති; **තාම්**=ඒ ආර්‍යාව; **භුජඞ්ග+ඊශඃ**= පිඞ්ගලනාගරාජතෙමේ; **ගීතිං**= 'ගීති'යයි; **ගීතවාන්**= කී.

පඃ-අර්ධ දෙක ම පූර්වෝක්ත ආර්‍යාපූර්වාර්ධලක්‍ෂණයෙන් යුක්ත වූවා 'ගීති'නම් වන්නීය. වින්‍යාසය මෙසේයි:—

1=4 2=5 3=4 4=5 5=4 6=2 7=4 ගු
= මාත්‍රා 30
⏑⏑ – – – – ⏑⏑, – – – – – – ⏑ – ⏑ – ⏑ – – ⏑

1=4 2=5 3=4 4=5 5=4 6=2 7=4 ගු
= මාත්‍රා 30.
– – ⏑ – – – – ⏑⏑, ⏑⏑⏑⏑ – ⏑ – ⏑⏑ ⏑

සම්පූර්ණගීතියට මාත්‍රා හැටක් විය යුතුයි. මෙහි අපරාර්ධයෙහි ද සවනගණය හුදු ලඝුවක් නො ව ජගණ හෝ චතුර්ලඝුගණය වන්නේය. ආර්‍යාප්‍රථමාර්ධයට කී යතිලක්‍ෂණ මෙහි උභයාර්ධයෙහි ම යෙදේ.

මේ ගීතිය ද පථ්‍යා-ත්‍රිවිධවිපුලා-චාදශචපලාභෙදයෙන් ද යුක්ත වේ. පථ්‍යාගීති, මහාවිපුලාර්‍යාගීති, මුඛවිපුලාර්‍යාගීති, ජඝනවිපුලාර්‍යාගීති, පථ්‍යාමහාචපලාර්‍යාගීති, පථ්‍යාමුඛචපලාර්‍යාගීති, පථ්‍යාජඝනචපලාර්‍යාගීති, මහාවිපුලාමහාචපලාර්‍යාගීති යනාදි වශයෙන් ගීතිය ද සොළොස්වැදෑරුම් වේ. ආර්‍යාපූර්වාර්ධලක්‍ෂණ ම මෙහි අර්ධ දෙක්හි ම යෙදී තිබෙනහෙයින් මෙහි අපරාර්ධයෙහි ද පූර්වාර්ධයට සමාන භෙද ඇති වේ ආර්‍යාපූර්වාර්ධභෙද දොළොස්දහස්අටසියයකි. මෙහි අපරාර්ධය ද එසේ මැයි. එහෙයින් (12800×12800=16,38,40000) සොළොස් කෙළ තිස් අට ලක්‍ෂ හතළිස්දහසක් ගීතිභෙද ඇතැයි දත යුතු. චපලාදිභෙද එක් වනවිට මේ භෙද තවත් අධික වේ. නෂ්ටොද්දිෂ්ට යට කී ක්‍රම මෙහි යෙදෙන පරිදි ගෙණ යොදා ගත යුතු.

'යදි' ශබ්දප්‍රයොගය නිසා 'තද' ශබ්දය අධ්‍යාහෘතයි.

9. ආර්යාද්විතීයකෙ'ර්ධෙ—යද්ගදිතං ලක්ෂණං තත් ස්‍යාත්,
යද්‍යුභයෝරපි දලයෝ—රුපගීතිං තාං [1]මුනිර්බ්‍රූතෙ.

10. ආර්යාශකලද්විතයං—ව්‍යත්‍යයරචිතං භවෙද්‍යස්‍යාඃ,
සොද්ගීතිඃ කිල [2]කථිතා—තද්වද්‍යත්‍යංශභෙද සංයුක්තා

---

9. **ආර්යාද්විතීයකෙ අර්ධෙ**= ආර්යාවගේ දෙවන අර්ධයෙහි; **ගදිතම්**=කියනලද; **යත් ලක්ෂණම්**= යම් ලක්ෂණයෙක් ඇද්ද; **තත්**= ඒ ලක්ෂණය; **උභයොඃ දලයොඃ අපි**= උභයාර්ධයෙහි ම; **යදි ස්‍යාත්**= ඉදින් වී නම්; **තාං**= ඒ ආර්යාව; **මුනිඃ**= පිඞ්ගලමුනි තෙමේ; **උපගීතිං**= 'උපගීති'යයි; **බ්‍රූතෙ**= කියයි.

ප:-ආර්යාද්විතීයාර්ධයෙහි කී ලක්ෂණ උභයාර්ධයෙහි ම පැණේ නම් ඒ 'උපගීති' නම් වේ. එහි වින්‍යාසය මෙසේයි:—

1=4 2=5 3=4 4=5 5=4 6=1 7=4 ගු
= මාත්‍රා 27
⏑⏑ —⏑— ⏑⏑, ⏑—— ⏑⏑ — ⏑⏑ ⏑

1=4 2=5 3=4 4=5 5=4 6=1 7=4 ගු
=මාත්‍රා 27
⏑—— ⏑—— ——⏑, ——⏑ ⏑⏑ — ⏑⏑ ⏑

මෙහි අර්ධදෙක්හි ම සවන ස්ථානයෙහි එක ම ලඝුවකි. ආර්යාඅපරාර්ධයෙහි මෙන් මෙහි පූර්වාර්ධයෙහි භෙද 6400 කි. අපරාර්ධයෙහි ද 6400 කි. ඒ දෙක ගුණ කිරීමෙන් (6400 × 6400=40960000) සිවුකෙළනවලක්ෂහැටදහසක් උපගීතිභෙද ලැබේ. නෂ්ටොද්දිෂ්ට යථොක්තක්‍රමානුසාරයෙන් යෙදිය යුතු.

උපගීතිය ද පථ්‍යාර්යාදි භෙද සොළොසින් ගුණිත ව "පථ්‍යාර්‍යොපගීති, මහාවිපුලාර්‍යොපගීති, -පථ්‍යාචපලාර්‍යොපගීති— යනාදි වශයෙන් සොළොස්වැදෑරුම් වේ.

10. **ආර්යාශකලද්විතයම්**= ආර්යාවෙහි අර්ධ දෙක; **යස්‍යාඃ**= යම් ආර්යාවක් සම්බන්ධ ව; **ව්‍යත්‍යයරචිතං භවෙත්**= විපර්යාස යෙන් කරණ ලද්දේ වේ ද; **තද්වත්**= ඒ ආර්යාවෙහි සෙයින් ම; **යති+අංශභෙදසංයුක්තා**= යතිභෙද ගණභෙදයෙන් යුක්ත වූ; **සා කිල**= ඒ ආර්යාතොමෝ වනාහි; **උද්ගීතිඃ**= 'උද්ගීති'යයි; **කථිතා**= කියන ලදී.

ප:-'කිල'ශබ්දය ප්‍රසිද්ධාර්ථයෙහි ය. ආර්යාඅපරාර්ධයෙහි කී ලකුණු පූර්වාර්ධයෙහිත්, ආර්යාපූර්වාර්ධයෙහි කී ලකුණු අපරාර්ධ යෙහිත් ඇතිවන සේ බඳනා ලද්දේ උද්ගීතියි වින්‍යාසය මෙසේයි:—

---

1. බුධඃ. 2. ගදිතා.

11. ආර්යාපූර්වාර්ධං යදි-ගුරුණෛකේනාධිකේන නිධනෙ යුක්තම්,
ඉතරත්තද්වන්නිඛිලං-[1] දලං යදීයමුදිතේ'යමාර්යාගීතිඃ.

**ඉති ගීතිප්‍රකරණම්.**

---

1=4 2=5 3=4 4=5 5=4 6=1 7=4 ගු =මාත්‍රා27
⏑⏑ ––⏑ ––⏑, ⏑–– ––⏑ – ⏑⏑ ⏑

1=4 2=5 3=4 4=5 5=4 6=2 7=4 ගු = මාත්‍රා 30
⏑⏑ ⏑–– ––⏑, ⏑⏑ ⏑⏑ –⏑– ⏑⏑ ⏑

මෙහි ද යති හා පාද විනිශ්චය ආර්යාවෙහි මෙනි. උද්ගීති යෙහි පථ්‍යායෝද්ගීති ආදිවශයෙන් ෂොඩශ භෙදයකි. ප්‍රස්තාරයෙන් ලැබෙන භෙදසංඛ්‍යාව ආර්යාවෙහි මෙන් ම 8,19,20000 කි. නෂ්ට-උද්දිෂ්ට ද විනාත්‍යයි.

11. **ආර්යාපූර්ව+අර්ධම්**= ආර්යාවෙහි පළමු අර්ධය; **නිධනෙ**= කෙළවරෙහි; **අධිකෙන**= අධිකවූ; **එකෙන ගුරුණා**= එක්ගුර කින්; **යදි**=ඉදින්; **යුක්තම්**=යුක්ත වී ද; **යදීයම්**= යම් ගීතියක් පිළිබඳ; **ඉතරත් නිඛිලං දලම්**= අනික් සියලු අර්ධය; **තද්වත්**= ඒ පළමුවන අර්ධය වැනි ද; **සා**= ඒ ආර්යාතොමෝ; **ආර්යාගීතිඃ**= 'ආර්යාගීති'යයි; **උදිතා**= කියන ලදී.

ස:-ආර්යාපූර්වාර්ධයෙහි අන්තයට තවත් ගුරක් එකතු කොට ගණ අටක් කොට ඒ ලක්‍ෂණයෙන් අර්ධදෙක ම බඳනා ලද්දී ආර්යාගීතියි. සෙසු ලක්‍ෂණ ආර්යාවෙහි මෙනි. උභයාර්ධයෙහි මාත්‍රා 64 කි. එහි වින්‍යාසය මෙසේයි:—

1=4 2=5 3=4 4=5 5=4 6=2 7=4 8-1 =මාත්‍රා 32
⏑⏑ ⏑⏑ ⏑––, ––⏑ ⏑⏑ –⏑– ––⏑ ⏑⏑

1=4 2=5 3=4 4=5 5=4 6=2 7=4 8-1 =මාත්‍රා 32
––⏑ ⏑⏑ ––⏑ –⏑– ⏑–– –⏑– ⏑⏑ ⏑⏑

මෙහි පූර්වාර්ධයෙහි සම්පූර්ණගණ අටකි. අපරාර්ධයෙහිත් එසේ මැයි. අන්ත්‍යඅෂ්ටමගණය නිත්‍යයෙන් සර්වගුරු හෙයින් විකල්ප නැති. එහෙයින් වින්‍යාසයෙහි අෂ්ටමගණය මතුවෙහි "8=1" යනු දක්වන ලදී. මෙහි ද "පථ්‍යාර්යාගීති" යනාදි වශයෙන් පථ්‍යාදිසංකලනයෙන් ආර්යාගීති සොළොසක් ලැබේ.

---

1. තවත්.

මෙහි ගණභෙද එකිනෙක ගුණ කිරීමෙන් ($4 \times 5 = 20 \times 4 = 80 \times 5 = 400 \times 4 = 1600 \times 2 = 3200 \times 4 = 12800 \times 1 = 12800$) පූර්වාර්ධයෙහි භෙද දෙලොස්දහස්අටසියයකි. අපරාර්ධයෙහි ද පූර්වාර්ධයට සමාන හෙයින් භෙද දෙලොස්දහස්අටසියයක් වේ. අර්ධ දෙක්හි ලැබෙන භෙද එකිනෙක ගුණ කිරීමෙන් ($12800 \times 12800 =$ 16,38,40000) සොළොස්කෙළ අටතිස්ලක්‍ෂ හතළිස්දහසක් භෙද ලැබේ. මෙපමණ ආර්‍යාගීති ඇතැයි දත යුතු. නෂ්ටොද්දිෂ්ට පූර්වක්‍රමයෙන් විනත්‍යයි.

ඇතැම්හු ආර්‍යාඅපරාර්ධයට අන්තයෙහි ගුරක් එකතු කිරීමෙන් මාත්‍රා විසිනවයකින් යුක්ත කොට ආර්‍යාගීතියෙහි අපරාර්ධය සිද්ධ කෙරෙති. ඒ අදහස් ලැබෙන සේ මීට ව්‍යාඛ්‍යාන ද කෙරෙති. පිඞ්ගලසූත්‍රවිරොධ හෙයින් ඒ නො පිළිගත හැක. ඇතැම්හු මීට 'සංගීති'යයි ද, අන්‍යයෝ 'සකන්ධක'යයි ද කියති. ආර්‍යාපූර්වික හෙයින් 'ආර්‍යාගීති'යනු ම යුක්තතරය. යථොක්ත පථ්‍යාදිභෙද සියල්ල එකතුවූ විට ආර්‍යාවිකල්ප අසූවකි. හලායුධයන් විසිනුදු කියනලදී:—

"ගීතිචතුෂ්ටයමිත්‍ථං—ප්‍රත්‍යෙකං ෂොඩශප්‍රකාරං ස්‍යාත්,
සාකල්‍යෙනාර්‍යාණා—මශීතිරෙවං විකල්පාඃ ස්‍යුඃ" යි.

| | | |
|---|---|---|
| ආර්‍යා | භෙද | 16 |
| ගීති | ,, | 16 |
| උපගීති | ,, | 16 |
| උද්ගීති | ,, | 16 |
| ආර්‍යාගීති | ,, | 16 |
| | | 80 |

මෙයින් අන්‍යවූ ද එකොළොස් ගීති කෙනෙක් වෙත්. ඔහු නම් වශයෙන් හා ලක්‍ෂණ වශයෙනුත් මෙහි දක්වනු ලැබෙත්. ග්‍රන්ථය මහත්වන බැවින් උදාහරණ නො දක්වමු.

1. ආර්‍යාව ම අන්තයෙහි අධික ගුරකින් යුක්ත වූවා 'සංගීති' නම්.
2. ආර්‍යාපූර්වාර්ධයෙහි ම අධික ගුරකින් යුක්ත වූවා 'සුගීති' නම්.
3. ආර්‍යාඅපරාර්ධයෙහි ම අධික ගුරකින් යුක්ත වූවා 'ප්‍රගීති' නම්.
4. සුගීතියෙහි අර්ධ දෙක විපර්‍යාස කොට යොදනලද්දී 'අනුගීති' නම්.
5. ප්‍රගීතියෙහි අර්ධදෙක විපර්‍යාස කොට යොදනලද්දී 'මඤ්ජුගීති' නම්.

12. ෂඩ් විෂමේ'ෂ්ටෞ සමේ කලාඃ- [1]ෂට් ච සමේ ස්‍යුර්නො
නිරන්තරාඃ,
න සමා'ත්‍ර පරාශ්‍රිතා කලා-වෛතාලීයේ'න්ත්‍ය රලෞ ගුරුඃ.

---

6. ආර්‍යාඅපරාර්ධයෙහි අන්ත්‍යගුර වෙනුවට ගණයක් ම යොදා ඒ ලක්‍ෂණයෙන් අර්ධදෙක ම බඳනාලද්දී '**විගීති**' නම්.

7. උද්ගීතියෙහි අර්ධදෙක්හි ම අන්ත්‍යඅධිකගුරකින් යුක්ත වූවා '**චාරුගීති**' නම්.

8. ආර්‍යාගීතිය ම උත්තරාර්ධඅන්තයෙහි එක්ගුරකින් හීන වූවා '**චලගුගති**' නම්.

9. ආර්‍යාගීතිය ම පූර්වාර්ධඅන්තයෙහි එක්ගුරකින් හීන වූවා '**ලලිතා**' නම්.

10 උපගීතිය ම පූර්වාර්ධයෙහි අධික එක්ගුරකින් යුක්ත වූවා '**ප්‍රමදා**' නම්.

11. උපගීතිය ම අපරාර්ධයෙහි අධික එක්ගුරකින් යුක්ත වූවා '**චන්ද්‍රිකා**' නම්.

මොහු ද වෙන් වෙන් වසයෙන් සොළොස් සොළොස්වැදෑරුම් වෙති. සියලු ම භෙද (16 × 1 =176) එක්සියහැත්තෑහයකි. යථොක්ත චතුර්විධගීතීන්ගේ භෙද ද (16 × 4=64) සිවුසැටකි. (176+64=240) ඓක්‍යයෙහි ගීතිසඞ්ඛ්‍යා දෙසියසතළිසකි. මොවුන් හා ශුද්ධආර්‍යාභෙදත් එක්වූ විට ඓක්‍යය (240 + 16=256) දෙසියසපණසකි. ගණවිකල්පවශයෙන් ලැබෙන භෙද යථොක්ත ක්‍රමානුසාරයෙන් තර්කණය කළ යුතුයි.

**ගීතිප්‍රකරණය මෙතෙකින් සමාප්තයි.**

—+—

මාත්‍රාඡන්දසට ම අයත් හෙයින් වෛතාලීයප්‍රකරණය ආරම්භ කරණුවෝ "ෂඩ් විෂමෙ" යනාදිය කියත්.

12. **වෛතාලීයෙ**= වෛතාලීය නම් මාත්‍රාවෘත්තයෙහි; **විෂමෙ**- විෂමවූ (පළමුවනතුන්වන) පාදයෙහි; **ෂට් කලාඃ**- මාත්‍රාවෝ සදෙනෙක් වෙත්. **සමෙ**- සමවූ(දෙවනසතරවන)පාදයෙහි; **අෂ්ටෞ**- මාත්‍රාවෝ අටදෙනෙක් වෙත්. **සමෙ**- සමපාදයෙහි; **ෂට් ච**- මාත්‍රාවෝ සදෙනෙක්; **නිරන්තරාඃ**- ගුරුඅකුරක්හු විසින් අව්‍යවහිත වූවාහු; **නො ස්‍යුඃ**- නො වෙත්. **අත්‍ර**- මේ වෛතාලීය ජාතියෙහි; **සමා කලා**- සමවූ (දෙවන සතරවන සවන) මාත්‍රා

---

1. නාශව.

තොමෝ; **පශ්‍රිතා න** (භවති)- (නමභව) පර ව සිටි මාත්‍රාව ඇසුරු කළා නො වන්නීය. **අනෙන**- අන්තයෙහි; **රලෞ**- රග ණය ලඝුය යන දෙකක් ද; **ගුරුඃ**- ගුරක් ද යන මොහු වෙති

**ප:**-මෙයින් වෛතාලීයලක්‍ෂණකථිත ය. මෙහි විෂම පාද යන්හි මූලට මාත්‍රා සයක් ද, සම පාදයන්හි මූලට මාත්‍රා අටක් ද, ඉන් අනතුරුව රගණලඝුගුරුහු ද වෙති. දෙවන සතරවන පාදයන්හි මාත්‍රා සයක් හෙවත් ලඝු අකුරු සයක් (අතර ගුරක් නැතිව) පිළිවෙළට ම නො සිටිත්. ගුරක් ඒ අතරට වැටුන හොත් නිදෙස් වේ. විෂමපාදයන්හි රුචි ලෙස යෙදිය හැක. සමමාත්‍රා පරමාත්‍රාව ඇසුරු කොට නො සිටී; හෙවත් දෙවෙනි මාත්‍රාවත් තුන්වන මාත්‍රාවත් එක් වී ගුරක් නො වේ. සතරවන මාත්‍රාවත් පස්වන මාත්‍රාවත් එක් වී ගුරක් නො වේ සවන මාත්‍රාවත් සත්වන මාත්‍රාවත් එක් ව ගුරක් නො වේ. "තදූ" යන තන්හි මාත්‍රා තුණකි. එයින් පළමුවන මාත්‍රාව තකාරයයි. දෙවනතුන්වන මාත්‍රා දෙක 'දූ'යන්නයි. එහෙයින් දෙවන මාත්‍රාව තුන්වන මාත්‍රාව ආශ්‍රිතය. සෙසු තැන ද මෙසේයි. (මාගධිකාවණිකඩසෙහි සමමාත්‍රා පරාශ්‍රිත වන බවපැණේ. "සමෙ ත වන් රලගා" යන වුතෙනාදයවචනයෙහි ද ඒ යෙදී තිබේ.)

"ෂඩ්විෂමෙ" යනාදියෙහි වින්‍යාසය මෙසේයි:—

(1) මාත්‍රා 6 — රගණ — ලඝු — ගු
⏑ — — ⏑ ⏑ — ⏑ — ⏑

(2) මාත්‍රා 8 — රගණ — ලඝු — ගු
⏑ — — ⏑ ⏑ ⏑ — ⏑ — ⏑

(3) මාත්‍රා 6 — රගණ — ලඝු — ගු
— — ⏑ — ⏑ — ⏑ — ⏑

(4) මාත්‍රා 8 — රගණ — ලඝු — ගු
⏑ ⏑ ⏑ ⏑ ⏑ — ⏑ — ⏑

මෙහි ද සමපාදයන්හි පිළිවෙළින් ම ලඝු සයක් නැත්තේය. එසේ ම සමමාත්‍රා පරාශ්‍රිත ව නැති. වෛතාලීයයෙහි විෂමපාද යෙහි මාත්‍රා තුදුසකි. සමපාදයෙහි මාත්‍රා සොළොසකි. මේ සම-විෂම පාදයන්හි මාත්‍රා නිවෙශය මෙහි පහත දක්වනු ලබන ක්‍රමයකින් වූ විට නිදෙස් වේ. මාත්‍රා ෂට්කයෙහි විකල්ප අටකි. සමපාදයන්හි ආදිමාත්‍රාඅෂ්ටකයෙහි විකල්ප තෙළෙසකි.

මේ භෙද ගුණකළවිට (13×8=104) එක්සියසතරක් භෙද පූර්වාර්ධයෙහි ලැබේ. අපරාර්ධයෙහි ද එපමණ ම ය. අර්ධ දෙක්හි භෙද ගුණ කළවිට (104×104=10816) දහදාස්අටසියසොළො සක් භෙද ලැබේ. මේවෛතාලීයයෙහි ප්‍රභෙදයි. (අන්තයෙහි රගණලඝුගුරු නිත්‍ය හෙයින් විකල්ප නො ලැබේ.) මාත්‍රා නිවෙශය මෙසේයි:-

13. පර්‍ය්‍යන්තෙ ර්‍ය්‍යෞ තථෛව ශෙෂ-මෞපච්ඡන්දසිකං සුධීභි
රුක්තම්.

| විෂමපාදයන්හි මාත්‍රා සෂයෙහි විකල්ප 8 (A) | | සමපාදයන්හි අෂ්ටමාත්‍රා විකල්ප 13. (B) | |
|---|---|---|---|
| 1. | ⏑ ⏑ ⏑ | 1. | ⏑ ⏑ ⏑ ⏑ |
| 2. | ⏑ — — ⏑ | 2. | ⏑ ⏑ ⏑ — — |
| 3. | — — ⏑ ⏑ | 3. | ⏑ ⏑ — — ⏑ |
| 4. | ⏑ ⏑ — — | 4. | ⏑ — — ⏑ ⏑ |
| 5. | — — ⏑ — — | 5. | — — ⏑ ⏑ ⏑ |
| 6. | — — — — ⏑ | 6. | ⏑ ⏑ — — — — |
| 7. | ⏑ — — — — | 7. | ⏑ — — ⏑ — — |
| 8. | — — — — — — | 8. | ⏑ — — — — ⏑ |
| | | 9. | — — — — ⏑ ⏑ |
| | | 10. | — — ⏑ ⏑ — — |
| | | 11. | — — ⏑ — — ⏑ |
| | | 12. | — — ⏑ — — — — |
| | | 13. | — — — — ⏑ — — |

මේ වින්‍යාසයන්හි ගුරුලඝු යොදනලද ක්‍රමයට යෙදූවිට සමපාදයන්හි නිරන්තර ව ලඝු සයක්වත්, සමවිෂමපාදයන්හි සමමාත්‍රාවන්ගේ පරාශ්‍රිත බවක්වත් නො ලැබේ.

13. **පර්‍ය්‍යන්තෙ**= (විෂමසමපාදයන්හි ෂට්-අෂ්ටමාත්‍රාවන්ගේ) කෙළවර; **ර්‍ය්‍යෞ**= රගණ යගණයෝ වෙත් ද; **ශෙෂම්**= සෙසු ලක්‍ෂණ; **තථා එව**= එසේ ම (=සාමාන්‍යවෛතාලීයයෙහි මෙන්) වේ ද; (ඒ වෘත්තය); **ඖපච්ඡන්දසිකම්**- 'ඖපච්ඡන්දසික' නමැයි; **සුධීභිඃ**- පණ්ඩිතයන් විසින්; **උක්තම්**- කියනලදී.

**ප**:-වින්‍යාසය උක්තක්‍රමානුසාරයෙන් යෙදියයුතු. මේ එක් අඩියෙකි. අනික් අඩිය ද කියනලද ලක්‍ෂණයෙන් සම්පූර්ණ කට යුතු. මෙහි 'ශෙෂ' යන තැන්හි පාදාන්තලඝුව ගුරක් සේ සලකණලදී.

යථොක්ත වෛතාලීයවෘත්තයාගේ පාද සතර කෙළවර අධිකගුරක් යුක්තකළ කල්හි මෙකී ලක්‍ෂණ ලැබේ. ඖපච්ඡන්දසික විෂමපාදයෙහි මාත්‍රා සොළොසක් ද, සමපාදයෙහි මාත්‍රා අටළොසක් ද වේ. මෙහි ද භෙද (10,816) දසදහස් අටසිය සොළොසකි.

14. ආපාතලිකා කථිතේ'යං–භාද්ගුරුකාවථ පූර්වවදන්‍යත්.
15. තෘතීයයුග්දක්ෂිණාන්තිකා–සමස්තපාදේෂු ද්විතීයලඃ.

---

14. **අථ**- ඉක්බිත්තෙන්(=ෂඩ්-අෂ්ටමාත්‍රාවන් කෙරෙන් පරවූ;) **භාත්**= භගණයා කෙරෙන් පර ව; **ගුරුකෞ**- ගුරුදෙදෙනෙක් වෙත් ද; **අන්‍යත්**- සෙසු ලක්‍ෂණ; **පූර්වවත්**- පෙර (වෛතාලීය වෘත්තයෙහි) කී පරිද්දෙන් ම වේ ද; (එසේ කල්හි) **ඉයම්**- මේ මාත්‍රාජාති තොමෝ; **ආපාතලිකා**-'ආපාතලිකා'නමැයි; **කථිතා**- කියනලද්දී.

**ප**:-මෙහි විෂමපාදයෙහි මාත්‍රා සයකින් හා සමපාදයෙහි මාත්‍රා අටකින් පරව භගණය හා ගුරුදෙදෙනෙක් ද වන මේ අඩියකි. අනික් අඩියත් සම්පූර්ණ වූ විට ශ්ලෝකය පිරෙයි. ආපාතලිකා විෂමපාදය මාත්‍රා තුදුසකින් ද සමපාදය මාත්‍රා සොළොසකින් ද පරිමිත ය. මෙහි ද 10816 ක් භෙද ලැබේ. ඖපච්ඡන්දසික-ආපාතලිකා දෙකෙහි මාත්‍රාවිකල්පය යට(A–B දෙකින්) දක්වනලද වින්‍යාසය පරිදියි.

15. **සමස්තපාදේෂු**- සියලුපාදයන්හි; **ද්විතීයලඃ**- දෙවන මාත්‍රාව; **තෘතීයයුක්**= තුන්වනමාත්‍රාව හා යුක්ත වේ ද; (ඒ මාත්‍රාජාති තොමෝ) **දක්ෂිණාන්තිකා**- 'දක්ෂිණාන්තිකා' නම් වේ.

**ප**:-මෙහි "තෘතීය" යන තන්හි මාත්‍රා සතරකි. එයින් පළමු මාත්‍රාව "තෘ" යන්න යි ඉන් පසු දෙවන මාත්‍රාවත් තුන්වන මාත්‍රාවත් එක් වී "තී" යන ගුරු පැණේ. එයින් ද්විතීයමාත්‍රාව තෘතීයයුක්ත වූ අයුරු දත හැක. "සමස්ත" යන තන්හි ද එසේ මැයි. "මස්" යන්නෙහි දෙවන තුන්වන මාත්‍රා අන්තර්ගත ය. හැම පාදයන්හි මූල ජගණයක් වූ විට මෙකී ලක්‍ෂණ ලැබේ.

ද්විතීයමාත්‍රාව තෘතීයයුක්ත වීම හැර සෙසු ලක්‍ෂණ වෛතාලීයයෙහි මෙනි. දෙවන මාත්‍රාව තුන්වන මාත්‍රාව හා යුක්ත වේ යයි කීමෙන් "න සමාත්‍ර පරාශ්‍රිතා කලා" යනුවෙන් කී සාමාන්‍ය ලක්‍ෂණය මෙයින් බැහැර කරණ ලදී. සෙස්ස ද පැමිණි අයුරකින් යෙදිය යුතු යයි දක්වන ලදී. දක්ෂිණාන්තිකාවෙහි විශෙෂ ලක්‍ෂණ හැර සාමාන්‍ය ලක්‍ෂණ වෛතාලීය-ඖපච්ඡන්දසික-ආපාතලිකාවන්හි මෙන් විය හැකි බැවින් දක්ෂිණාන්තිකාව වෛතාලීයදක්ෂිණාන්තිකා යනාදි වශයෙන් තුන්වැදෑරුම් වේ. අඩියක ලැබෙන මාත්‍රාසංඛ්‍යාව යථොක්ත ත්‍රිවිධභෙදය සේ ත්‍රිවිධ වේ. මේ ත්‍රිවිධභෙදයෙහි ම විෂමපාදයන්හි භෙද දෙකකි. සමපාදයන්හි භෙද සතරකි. ඒ මතු පැණෙන වින්‍යාසයන්ගෙන් දත යුතුයි.

16. උදීච්‍යවෘත්තිර්ද්විතීයලඃ-සක්තො'ග්‍රෙණ භවෙදයුග්මයොඃ.

17. පූර්වෙණ යුතො'ථ පඤ්චමඃ-ප්‍රාච්‍යවෘත්තිරුදිතෙති යුග්මයොඃ

| විෂමපාද විකල්ප 2. | සමපාද විකල්ප 4. |
|---|---|
| 1. — ◡ — ◡ | 1. — ◡ — ◡ ◡ |
| 2. — ◡ — — — | 2. — ◡ — — — ◡ |
| | 3. — ◡ — ◡ — — |
| | 4. — ◡ — — — — — |

මෙහි දක්වනලද හෙදයන් අතුරෙන් එක් අයුරකින් සම විෂමපාදයන්හි ගුරුලඝු යෙදෙන සේ බන්ධනය කළවිට නිවරද වේ. පාද දෙක්හි හෙද එකිනෙක ගුණ කිරීමෙන් (2 × 4=8) එක් අර්ධයක හෙද අටක් ලැබේ. අපරාර්ධයෙහි ද මෙපමණ ම බැවින් උභයාර්ධයෙහි හෙද ගුණ කළවිට (8 × 8=64) හැටහතරක් දක්ෂිණාන්තිකා හෙද ලැබේ.

16. **අයුග්මයොඃ**= පළමුවනතුන්වන පාද දෙක්හි; **ද්විතීයලඃ**= දෙවන මාත්‍රාව; **අග්‍රෙණ**= ඔහු ඉදිරියෙහි වූ තුන්වන මාත්‍රාව හා; **සක්තඃ භවෙත්**= ඇලුනේ වේ ද; (ඒ වෘත්තය), **උදීච්‍ය වෘත්තිඃ**= 'උදීච්‍යවෘත්ති' නම් වේ.

**ප**:—විෂමපාදයන්හි පමණක් ද්විතීයමාත්‍රාව තුන්වන මාත්‍රාව හා එක්වීමෙන්-මූල ජගණයකින් යුක්ත වෘත්තය 'උදීච්‍යවෘත්ති' නම්. මේ ද 'වෛතාලීයොදීච්‍යවෘත්ති' යනාදි වශයෙන් තුන් වැදෑරුම් වේ. අර්ධයන්හි ලැබෙන මාත්‍රාසඞ්ඛ්‍යාව ද ඔවුන්ගේ හෙදයෙන් වෙනස් වේ. විෂමපාදයන්හි විකල්ප දක්ෂිණාන්තිකා වෙහි මෙන් දෙකක් ද සමපාදයන්හි වෛතාලීයයෙහි මෙන් තෙළෙසක් ද ලැබේ. පාද දෙක්හි හෙද ගුණ කිරීමෙන් (13 × 2= 26) අර්ධයක හෙද සවිස්සක් වේ. අර්ධ දෙක්හි (26 × 26=676) හසියහැත්තෑහයක් විකල්පයෝ වෙත්. වින්‍යාසය පෙර සේ යොදා ගත යුතු.

17. **අථ**- ඉදින්; **යුග්මයොඃ**- සමපාද දෙක්හි; **පඤ්චමඃ**- පස්වනමාත්‍රාව; **පූර්වෙණ**- පූර්වවූ සතරවන මාත්‍රාව හා; **යුතඃ**- යුක්ත වී නම්; **ප්‍රාච්‍යවෘත්තිඃ ඉති**- 'ප්‍රාච්‍යවෘත්ති'යයි; **උදිතා**- කියනලදී.

**ප**:-මෙහි දෙවන පාදයෙහි '4+5' මාත්‍රා එක් වී ගුරක් විය. චතුර්ථපාදයෙහි ද මෙසේ ම ය. අතික් අර්ධයත් සම්පූර්ණ වූ විට ශ්ලොකය පිරේ. චතුර්ථපඤ්චම මාත්‍රා එක් වීම "න සමං" යනාදි

18. යදා සමාවොජයුග්මකෞ-පූර්වයොර්භවති තත් ප්‍රවෘත්තකම්.
19. අස්‍ය යුග්මරචිතා'පරාන්තිකා.

---

යට කී ලක්‍ෂණයට විරුද්ධ විශෙෂලක්‍ෂණයකි. සෙසු ලක්‍ෂණ වෛතාලීය ලක්‍ෂණ මෙනි. මෝ ද පෙර මෙන් තෙවැදෑරුම්. සමපාදයන්හි මාත්‍රා අට සිවුඅයුරකින් යෙදිය හැක. ඒ මෙසේයි:—

1. — — — ⏑ — — —  3 ⏑ — ⏑ — — —
2. ⏑ — ⏑ — ⏑  4. — — — ⏑ — ⏑

විෂමපාදයන්හි වෛතාලීයයෙහි මෙන් අටඅයුරකින් යෙදිය හැකියි ඒ හෙද ගුණ කිරීමෙන් (4 × 8=?2) අර්ධයක දෙතිසක් හෙද ලැබේ. අර්ධ දෙක්හි ම හෙද (32 × 32=1024) එක්දහස් සූවිස්සකි. මේ ප්‍රාච්‍ය වෘත්ති හෙදයි.

18. **යදා**- යම් කලෙක්හි; **ඔජයුග්මකෞ**- විෂමසමපාද දෙදෙන; **පූර්වයොඃ**- පූර්වූ උදීච්‍යවෘත්ති ප්‍රාච්‍යවෘත්ති දෙදෙනාට; **සමෞ**- සම ද, (**තදා**- එකල්හි;) **තත්**- ඒ වෘත්තය; **ප්‍රවෘත්තකං භවති**- 'ප්‍රවෘත්තක' නම් වේ.

**ප**:-ප්‍රථම තෘතීය පාද උදීච්‍යවෘත්ති ප්‍රථම තෘතීය පාද මෙන් ද ද්විතීයචතුර්ථපාද ප්‍රාච්‍යවෘත්ති ද්විතීයචතුර්ථපාද මෙන් ද බඳනා ලද්දේ 'ප්‍රවෘත්තක' නම්.

අතික් අර්ධය ද මෙසේ යෙදිය යුතු. මෙහි ප්‍රථම පාදයෙහි දෙවනතුන්වන මාත්‍රා එකතු ව ගුරක් විය. ද්විතීයපාදයෙහි සතරවන පස්වන මාත්‍රා එකතු ව ගුරක් විය. මේ ද පෙර මෙන් තෙවැදෑරුම්. විෂමපාදයන්හි උදීච්‍යවෘත්තියෙහි මෙන් හෙද දෙකකි. සමපාදයන්හි ප්‍රාච්‍යවෘත්තියෙහි මෙන් සතරකි. (2 × 4=8) අර්ධයක හෙද අටකි. සම්පූර්ණවෘත්තයෙහි (8 × 8=64) හෙද සිවුසැටකි.

19. **අස්‍ය**- මේ ප්‍රවෘත්තකයාගේ; **යුග්මරචිතා**- සමපාදයෙන් රචනා කරණ ලද්දී; **අපරාන්තිකා**- 'අපරාන්තිකා' නමි.

**ප**:—ප්‍රවෘත්තකයාගේ යුක්පාද නම් ප්‍රාච්‍යවෘත්තිසමපාද මැයි. එකී ලක්‍ෂණ පාද සතරෙහි ම යෙදෙන සේ බඳනාලද්දී අපරාන්තිකායි. පාදයක මාත්‍රා සොළොස බැගින් විය යුතු. පාදයක හෙද සතරකි. අර්ධයක සොළොසකි. සම්පූර්ණවෘත්ත යෙහි දෙසිය සපණසකි. මෝ තොමෝ ද පෙර මෙන් තෙවැදෑරුම් වේ.

20. අයුගභවා චාරුහාසිනී.

**ඉති වෛතාලීයප්‍රකරණම්.**

---

21. වක්‍ත්‍රං නාද්‍යාන්නසෞ ස්‍යාතාමබ්ධේඃ'නුෂ්ටුභි ඛ්‍යාතම්.

---

20. **අයුග්භවා**- ප්‍රවෘත්තකයාගේ විෂමපාදයෙන් උපන්නී; **චාරුහාසිනී**- 'චාරුහාසිනී' නම්.

**ප**:-ප්‍රවෘත්තකඅයුක්පාද නම් උදීච්‍යවෘත්තිහුගේ විෂමපාදයි. එහි කී ලක්‍ෂණ සිවුපදයෙහි ම යෙදෙන සේ බඳනාලද්දී චාරු හාසිනී ය. සියලු පාදයන්හි මාත්‍රා තුදුස බැගින් ද ප්‍රථම මාත්‍රා ෂට්කයෙහි ද්විතීය තෘතීය මාත්‍රා එක් කොට ගුරක් ද කට යුතු. පෙර මෙන් මෝ ද තෙවැදෑරුම්. මෙහි පාදයක හෙද දෙකකි. අඩියක සතරකි. මුලුල්ල සොළොසකි. මෙහි නො දක්වන ලද වෛතාලීය හෙද ද ඇත්. ඔවුන්ගේ ලක්‍ෂණ පමණක් මෙහි දක්වනු ලැබේ. උදහරණ තමන් විසින් ම ඌහ්‍යයි

1. වෛතාලීය සමපාදයෙන් සිවුපදය බඳනාලද්දී 'අන්‍ය දක්‍ෂිණාන්තිකා'නම්.
2. වෛතාලීයවිෂමපාදයෙන් විරචිත වූවා '**උත්තරාන්තිකා**' නම්.
3. ආපාතලිකා—ප්‍රාච්‍යවෘත්තීන්ගේ විෂමපාදයන්ගෙන් රචිත වූවා '**අපාතලිකා**'නම්.
4. ආපාතලිකාදි සප්තච්ඡන්දසුන්ගේ අන්තයෙහි අධික ගුරක් යුක්ත කළ විට 'ආපාතලිකෞපච්ඡන්දසික, දක්‍ෂිණාන්තිකෞපච්ඡන්දසික' යනාදි වශයෙන් ඒ ඒ ඡන්දස්වල නම් මුල් කොට ඇති ඖපච්ඡන්දසික හතක් ලැබේ කියනලද මැයි:—

"ආපාතලිකාදිෂු වෙදෙකො-ගුරුරධිකො භවති ප්‍රතිපාදන්තෙ,
ආපාතලිකාදික සංඥ-යුගෞපච්ඡන්දසිකං තදභිප්‍රෙතම්"යි.

මේ ආදිවශයෙන් වතවිට වෛතාලීයසංඥ තිස්හතකි.

**වෛතාලීයප්‍රකරණය මෙතෙකින් සමාප්තයි.**

---

වෛතාලීයප්‍රකරණයට අනතුරුව වක්‍ත්‍රච්ඡන්දස දක්වනු වෝ "වක්‍ත්‍රම්" යනාදිය කියත්.

21. **ආද්‍යාත්**=(යම් වෘත්තයෙක්හි) පළමු අක්‍ෂරයා කෙරෙන්; **නසෞ**= නගණ සගණ දෙදෙන; **න ස්‍යාතාම්**= නො වෙත් ද; **අබ්ධේඃ**= අකුරුසතරකින් පර ව; **යඃ**= යගණය වේ ද; **අනුෂ්ටුභි**= අනුෂ්ටුප් ඡන්දසෙහි ලා; **ඛ්‍යාතම්**= (පිඞගලයන් විසින්) කියනලද ඒ වෘත්තය; **වක්‍ත්‍රම්**= 'වක්‍ත්‍ර' නම්.

ප:—වක්ත්‍රජාතියගේ සාමාන්‍යලක්‍ෂණ මෙසින් කථිතය. "අනුෂ්ටුභි ඛ්‍යාතම්" යන්නෙන් මෙහි පාදයක් අක්‍ෂර අට කින් යුක්ත විය යුතු බව සූචිත ය. මෙහි පාදය කොටස්සතර කට බෙදනු ලැබේ. එයින් ප්‍රථම කොටස එක් අකුරකි. එය ගුරක් හෝ ලඝුවක් විය හැකි බැවින් ප්‍රථම කොටසෙහි භෙද දෙකක් වේ. දෙවෙනි කොටස අක්‍ෂරත්‍රයාත්මකගණයකින් පරිච්ඡින්නයි. එහි ද නගණ සගණ හැර සෙසු ගණ සයෙන් යම් කිසි ගණයක් ම යෙදිය හැකි බැවින් භෙද සයක් වේ. තුන්වන කොටස ද ගණයකි. එහි නිත්‍යයෙන් යගණය ම යෙදිය යුතු බැවින් භෙදයක් නො ලැබේ. සිවුවන කොටස ද එක් අකුරකි. එහි ද ගුරුලඝු දෙකින් ඉෂ්ටයක් යෙදිය හැකි බැවින් භෙද දෙකකි "වක්ත්‍රං" යනාදියෙහි වින්‍යාසය මෙසේයි:—




මේ අර්ධයකි. අනික් අර්ධයත් සම්පූර්ණවූ විට ශ්ලෝකය පිරේ. මේ දෙපාදයෙහි ප්‍රථමාක්‍ෂරයෙන් පර ව නගණ සගණ යෙදී නැත. අකුරුසතරකින් පර ව යගණය යෙදිනි. මෙකී ස්ථාන භෙද ගුණ කිරීමෙන් (2×6=12×2=24) පාදයක භෙද සූවිස්සක් ලැබේ. පාදභෙද ගුණ කිරීමෙන් (24×24=576) අර්ධයක පන්සිය හැත්තෑහයක් භෙද ලැබේ. අර්ධ දෙක්හි භෙද ගුණ කිරීමෙන් (576×576-331776)තුන්ලක්‍ෂතිස්එක්දහස්හත්සියහැත්තෑහයක් වක්ත්‍රභෙද ලැබේ.

මෙහි සමපාදයන්හි ප්‍රථමාක්‍ෂරයෙන් පර ව රගණය ද නො කට යුතුය යන ආචාර්‍ය්‍යසම්ප්‍රදායයෙක් ද ඇත. එසේ වූ විට සමපාදයන්හි ද්විතීයස්ථානයෙහි භෙද පසකි. එකිනෙක ගුණ කිරීමෙන් පාදයෙහි භෙද විස්සකි. විෂමපාදයන්හි සූවිස්ස ම ය. පෙර සේ ගුණ කිරීමෙන් දෙලක්‍ෂතිස්දහස්හාරසියයක් (2,30,400) භෙද ලැබේ.

"ආද්‍යාත්" යන්නට 'ආදිගණයෙන් පර ව'යයි කියා ද, "අබ්ධෙඃ" යන්නට 'ගණ සතරකින් පර ව'යි කියා ද, ව්‍යාඛ්‍යා නො කට හැකි ද? නො කට හැකියි. 'අනුෂ්ටුභි ඛ්‍යාතම්' යන්න එබඳු ව්‍යාඛ්‍යාන වළක්වයි. අනුෂ්ටුභ්හි ගණචතුෂ්ටයක් නො ලැබෙන බැවිනි.

අනුෂ්ටුභ්හි අනන්තගීත නම් කවරහෙයකින් මාත්‍රාවෘත්ත ප්‍රස්තාවයෙහි නිර්දිෂ්ට ද? අක්‍ෂරසඞ්ඛ්‍යාවෙන් අනුෂ්ටුප්ඡන්දස හා සම වුව ද අනුෂ්ටුභ්හි මෙන් මේ වක්ත්‍රජාතියෙහි සකලස්ථාන

22. යුජෝජේන සරිද්‍භර්තුඃ පථ්‍යාවක්‍ත්‍රං ප්‍රකීර්තිතම්.

23. [1]ඔජයොජේන වාරිධෙස්තදෙව විපරීතාදි.

24. චපලාවක්‍ත්‍රමයුජෝර්නකාරශ්චෙත් [2]පයොරාශෙඃ

---

යෙහි නියතගුරුලඝු නැති බැවින් ද මාත්‍රාඡන්දසට අයත් චපලාවිපුලාදිනාමසමපීර්ණය මෙහි සිට සුකරබැවින් ද මාත්‍රා වෘත්තප්‍රස්තාවයෙහි නිර්දිෂ්ටයි.

පිඞ්ගලයෝ වක්‍ත්‍රාදිය ආර්‍යාදි ජාතියෙන් බැහැර කොට වෘත්තසඞ්ඛ්‍යාවෙහි ම ලා සැලකූහ. (මෙහි වර්ණවෘත්තයට අයත් ගණ ම යෙදිය යුතුයි )

22. **යුජෝඃ**= යුක් (2-4) පාදයන්හි; **සරිද්භර්තුඃ**= අකුරු සතර කින් පර වූ; **ජේන**= ජගණය කරණ කොට; **පථ්‍යාවක්‍ත්‍රම්**= 'පථ්‍යාවක්‍ත්‍ර'යයි; **ප්‍රකීර්තිතම්**= කියනලදී.

ප:-පථ්‍යාවක්‍ත්‍රයෙහි ද සමවිෂමපාදයන්හි ප්‍රථමාක්‍ෂරයෙන් පර ව නගණ සගණ නො යෙදිය යුතු. විෂමපාදයන්හි අකුරු සතරකින් පර ව යගණය ද සමපාදයන්හි අකුරු සතරකින් පර ව ජගණය ද යෙදිය යුතු. වින්‍යාසය හා භෙද උක්තක්‍රම යෙන් විනතනය කට යුතු

23. **ඔජයොඃ**= විෂම (1-3) පාදයන්හි; **වාරිධෙඃ**= සතරකින් පරවූ; **ජේන**= ජගණය කරණ කොට ගෙණ; **තදෙව**= ඒ පථ්‍යා වක්‍ත්‍රය ම; **විපරීතාදි**= 'විපරීත' යන්න ආදි කොට ඇත්තේ වේ ("විපරීතපථ්‍යාවක්‍ත්‍ර'නම්' යනු අර්ථයි.)

ප:-මෙහි විෂමපාදයන්හි මුලකුරෙන් පර ව නගණ සගණ හැර සෙසු ගණයක් ද සතරකින් පර ව ජගණය ද කට යුතුයි. සමපාදයන්හි වක්‍ත්‍රයෙහි කී ලක්‍ෂණ මැයි.

24. **අයුජෝඃ**= අයුක්පාද දෙක්හි; **පයොරාශෙඃ**= අකුරුසතර කින් පර ව; **චෙත්**= ඉදින්; **නකාරඃ**= නගණය වී නම්; **චපලා වක්ත්‍රම්**= 'චපලාවක්‍ත්‍ර' නම්.

**ප**: වක්‍ත්‍රයට වඩා මෙහි වෙනස විෂමපාදයන්හි සතරකුර කින් පර ව නගණය වීමයි. සමපාදයන්හි සතරකින් පර ව යගණය මැයි. භෙද පෙර සේ දත යුතු.

---

1. අයුජෝඃ. 2. චයොරශෙඃ.

25 යස්‍යාං ලඃ සප්තමො යුගෙව සා යුගමවිපුලා මතා.
26. සෛතවස්‍යා'බිලෙෂ්වපි.
27. භෙනාබ්ධිතො භාද්විපුලා.

---

25. **යස්‍යාම්**= යම් අනුෂ්ටුබ් ජාතියෙක්හි; **යුගෙම**= යුක්පාද යෙහි; **සප්තමඃ**= සත්වන වර්ණය; **ලඃ**= ලඝුවෙක් වී නම්; **සා**= ඕ තොමෝ; **යුග්මවිපුලා**= 'යුගමවිපුලා'යයි; **මතා**= දන්නා ලදී.

**ස**:-පථ්‍යාවකත්‍රයෙහි ද සත්වන අකුර ලඝුවකි. නමුත් එහි ජගණය නිසා ම අනන්‍යලඝුව වීය. මෙහි වනාහි නගණ, ජගණ, භගණ, තගණයන්ගෙන් යම් කිසිවක් අකුරුසතරෙන් පරව යෙදී මෙන් ම සප්තමලඝුව ලැබේ. එහෙයින් පථ්‍යාවකත්‍රය හා මෙය මිශ්‍ර නො වේ. ජගණ පක්ෂයෙහි වෘත්ත දෙක සංකර නො වේ ද? සඞ්කර වේ. එහි ලා සංඥාවිකල්පය ම දත යුතු

"විපුලා යුගලඃ සප්තමඃ"යනු අධිකාරසූත්‍ර යයි කියා මෙයින් ම විෂමපාදයන්හි යගණයාගේ අපවාදය ද වේ යයි හලායුධ භට්ටයෝ කිහ. ඔහුගේ මතයේ පරිදි විපුලාවිෂමපාදයන්හි සතරකින් පරව යගණය ද නො වේ. කෙදාරමතානුයායී ව මෙහි හෙද දක්වමු. මතු දක්වනුලබන විත්‍යාසයෙන් ඒ ඒ ස්ථානයන්ගේ හෙද දූන යට කී නයින් ගුණ කිරීමෙන් සර්වහෙද දත යුතු.

(1) 1=2 2=6 3=1 4=4 (2) 1=2 2=6 3=4 4=2
අ. ගණ. ගණ. අ. අ. ගණ. ගණ. අ.

අතික් අඩියේ හෙද ද මෙසේ මැයි.

"සප්තමඃ අයුගෙම සා අයුගමවිපුලා"සිව්ච්ඡෙද කොට අයුක් පාදයෙහි සත්වන වර්ණය ලඝු වේ යයි ඇතැම්හු කියත්.

26. **සෛතවස්‍ය**= සෛතවාචාර්‍යයාගේ මතයෙහි; **අඛිලෙෂු අපි**= සියලුපාදයන්හි ම (සත්වන වර්ණය ලඝු වී නම් 'විපුලා' යයි) දන්නා ලදී.

**ස**:-විපුලාවෙහි හැම පාදයෙහි සත්වන වර්ණය ලඝු වේ යයි සෛතවයෝ කියත්. ඔහුගේ මතයෙහි පරිදි ප්‍රථමස්ථානයෙහි හෙද දෙකකි. ද්විතීයස්ථානයෙහි සයකි තෘතියස්ථානයෙහි සතරකි. චතුර්ථස්ථානයෙහි දෙකකි. මෙසේ පාදයක් පාසා හෙද අනුනය බැගින් ලැබේ. සම්පූර්ණහෙද 8,49,34,656 කි.

27 **අබ්ධිතඃ**=සතරකින් පරවූ; **භෙන**= භගණය කරණ කොට; **භාද්**= භයන්තෙන් පර; **විපුලා**= 'විපුලා' නම්. (භවිපුලා'නමැයි සේයි.)

28. ඉත්‍ථමන්‍යා රශ්චතුර්ථාත්.
29. නෝ'ම්බුධේශ්ච නතාවිපුලා.
30. තෝ'බ්ධේස්තත්පූර්වා'න්‍යා භවෙත්.

ඉති වක්‍ත්‍රප්‍රකරණම්.

---

31. [1]විකගුණිතවසුලඝුරචලධෘතිරිහ.[2]

---

ප:-සමහරු මෙහි "අබ්ධේශ්වපි" යන්න අනුවර්තනය කරත්. "ශ්‍රෞෂ නෞතෞ ච" යන සූත්‍රයට වෘත්ති ලියන හලායුධයෝ "සෛතවස්‍ය" යනු නිවෘත්ත යයි ද, "වපලා'යුජෞ න්" යන්නෙන් "අයුජ්" යන්න අනුවර්තනය වේ යයි ද කියා භගණාදිය විෂමපාදවිෂයක ම යයි කීහ. භෙදසඞ්ඛ්‍යා ස්වයංචින්ත්‍යයි.

28. ඉත්‍ථම්= මෙසේ (භවිපුලාවෙහි මෙන්); චතුර්ථාත්= අකුරු සතරකින්; රඃ=රගණය වී නම්; අන්‍යා= අන්‍ය වූ 'රවිපුලා' වෙයි.

ප:-භෙදසඞ්ඛ්‍යාදිය පෙර කී නයින් චින්ත්‍යයි.

29. චෙත්= ඉදින්; අම්බුධෙඃ= සතරකින් පර ව; නඃ= නගණය වී නම්; නවිපුලා- 'නවිපුලා' නම්.

ප:-මෙසේ ම මගණය වී නම් 'මවිපුලා' යයි ද, යගණය වී නම් 'යවිපුලා' යයි ද දත යුතු. ඒ දෙක මෙහි නො දක්වන ලදී.

30. අබ්ධෙඃ- සතරකුරකින් පර ව; තඃ- තගණය වී නම්; තත්පූර්වා- එම තකාරය පූර්ව කොට ඇති; අන්‍යා භවෙත්-අනික් විපුලා (තවිපුලා) වන්නී ය

ප:-විපුලාභෙද අනන්ත ය. ඔහු කවිප්‍රයොගයන්හි දක්න යුත්තාහ. සියල්ලෙහි ම බොහෝ සෙයින් සතරවන වර්ණය ගුරු වේ යයි කියනු ලැබේ. ග්‍රන්‍ථ විස්තරභීතීන් සියල්ල නො දක්වමු.

වක්‍ත්‍රප්‍රකරණය මෙතෙකින් සමාප්තයි.

—+—

දැන් මාත්‍රාසමප්‍රකරණය උපන්‍යස්ත කරණුවෝ "විකගුණිත" යනාදිය කියත්.

31. ඉහ- මෙහි; විකගුණිතවසුලඝුඃ- දෙකකින් ගුණ කරණ ලද අට ලඝුවක් ඇත්තී හෙවත් ලඝු සොළොසක් ඇත්තී; අචලධෘතිඃ- 'අචලධෘති' නම්.

---

1. වි. 2. ඉති.

## 32. මාත්‍රාසමකං නවමො [1]ල් ගාන්තම්.

**ප**:-සතරපාදයෙහි ම සොළොස් සොළොස් ලඝු වෙයි. එක ද ගුරෙක් නැති. මෙසේ වූ වෘත්තය 'අචලධෘති' නම් වේ.

මේ වනාහි 'අෂ්ටි' නම් වර්ණච්ඡන්දසෙහි (65536 වන) අන්තිම වෘත්තය වශයෙන් ද දත යුතු. එහි ලැබෙන ලකුණු මෙහි ද ඇති හෙයිනි. මෙය ම "ගීත්‍යාර්‍යා ලඃ" යන සූත්‍රයෙන් පිඞ්ගලයෝ "ගීත්‍යාර්‍යා" නාමයෙන් ගත්හ. 'චිත්‍රගුණිත' යනාදි පදය මත්ත හා ද සැබඳ කරණු ලැබේ. එයින් මාත්‍රාසමකාදීන්හි සොළොස් මාත්‍රා ම වේ යයි සූචිතයි. මෙහි භෙද නැති.

32. (**යත්‍ර**- යම්-පාදයෙක සොළොස් මාත්‍රා ඇති වෘත්තයෙහි;) **නවමඃ**- නවවැන්න; **ල්**- ලඝුවක් වේ ද; **ගාන්තම්**- ගුරක් අන්ත කොට ඇති ඒ වෘත්තය; **මාත්‍රාසමකම්**- 'මාත්‍රාසමක' නම් වේ.

**ප**:—මෙහි නවවන මාත්‍රාව ලඝු ද කෙළවර අකුර ගුරු ද විය යුතු. සෙසුතැන්හි ගුරු ලඝු මිශ්‍ර ව ද වෙයි. මාත්‍රා සොළොසකින් අඩුවැඩි නො වේ. සියලු මාත්‍රාසමවෘත්තයන්හි වෛතාලීයජාතියෙහි මෙන් ම සමමාත්‍රා පරමාත්‍රාවන් හා එක් කොට ගුරු නො කට යුතු ය යනු සම්ප්‍රදායයි. "ගාන්තම්" යනු ද සියල්ල හා සම්බන්ධ කරණු ලැබේ. මේ මාත්‍රාසමකය ගණ වශයෙන් කොටස් සතරකට බෙදිය හැක. එයින් (i) ප්‍රථම ගණස්ථානයෙහි සර්වගුරු, අන්ත්‍යගුරු, ආදිගුරු, සර්වලඝු යන ගණයන්ගෙන් එකක් යෙදිය හැක. සමමාත්‍රාව පරමාත්‍රාශ්‍රිත නො වන හෙයින් ජගණය නො යෙදේ. (ii) ද්විතීයස්ථානයෙහි සර්වගුරු, ආදිගුරු, අන්ත්‍යගුරු ගණ තුණෙන් එකක් යෙදේ. මධ්‍යගුරු සර්වලඝුගණයෝ විපුලාකයට ඉෂ්ට බැවින් නො යෙදෙත්. (iii) තෘතීයස්ථානයෙහි අන්ත්‍යගුරුගණය පමණක් යෙදේ. එහි නවවනමාත්‍රාව ලඝු විය යුතු යයි කීහෙයින් ආදිගුරු ගණය නො යෙදේ. මධ්‍යගුරුසර්වලඝුගණයෝ වානවාසිකා ලක්ෂණයෙහි ඇතුළත් බැවින් නො වෙත්. (iv) චතුර්ථස්ථානයෙහි සර්වගුරුඅන්ත්‍යගුරු ගණයෝ යෙදෙත් ගුරු අන්ත විය යුතු බැවින් සෙස්සෝ නො යෙදෙත්. 'මාත්‍රා' යනාදියෙහි වින්‍යාසය මෙසේයි:-

| 1=4 | 2=3 | 3=1 | 4=2 |
| --- | --- | --- | --- |
| ◡◡ | – – ◡ | – – ◡ | ◡◡ |

9.

1. ල්ගොන්තය:-ලගන්තම්.

## 33. ජෝ නලාවථාම්බුධෙර් විශ්ලොකඃ.

මෙහි නවවන මාත්‍රාව ලඝුවකි. පෙර කී සේ ඒ ඒ ස්ථාන යෙහි යෙදෙන ගණ පමණක් යෙදූවිට දෝෂයක් නො වේ මෙහි එක් පාදයක හෙද සූවිස්සක් බැවින් සිවුපදයෙහි හෙද යට කී සේ ගුණ කළ විට (331776) තුන්ලක්‍ෂතිස්එක්දහස් හත්සිය හැත්තෑහයක් වේ.

33. **අම්බුධෙඃ**– මාත්‍රා සතරකින් පරව; **ජඃ**– ජගණයෙක් හෝ; **අථ**– නො හොත්; **නලෞ**– නගණය ලඝුවක යන මොහු වෙත් ද; **විශ්ලොකඃ**– ඒ වෘත්තය 'විශ්ලොක' නම් වේ.

**පඃ**—මෙහි ද මාත්‍රා සොළොසකි. "ජෝ නලා" යන සතර මාත්‍රාවකින් පර ව "වථාම්බු" යන ජගණය සිටියේ ය.

පිඞ්ගලයෝ විශ්ලොකයෙහි "විශ්ලොකඃ පඤ්චමාෂ්ටමෞ" යන සුතුරෙන් පස්වැනි අටවැනි මාත්‍රා දෙක ලඝු කිරීම පමණක් කීහු. එහෙයින් මේ එය හා විරුඬ නො වේ ද? නො වේ. චතුර්ථ මාත්‍රාවෙන් අනතුරු ව ජගණය හෝ චතුර්ලඝුගණය යෙදූ විට ම පඤ්චම-අෂ්ටම-මාත්‍රා ලඝු වනු මිස අන් ක්‍රමයකින් ලඝු නො වේ. ජගණපක්‍ෂයෙහි සූත්‍රය ම උදාහරණයි. නලඝුපක්‍ෂයෙහි උදාහරණ මෙසේයි:—

| | | | |
|---|---|---|---|
| ◡◡ | - - - - | ◡ - - | ◡◡ |
| "මිත්‍රං . | පරිහර | සාධූවි | ගීතම්" |

මෙහි මාත්‍රා සතරින් පර ව නගණලඝුයි.

ප්‍රථමස්ථානවිකල්ප 4.

1. ◡ ◡
2. — — ◡
3. ◡ — —
4. — - - — —

මෙහි ජගණය නො යෙදේ. හෙතු යට දක්වීමු.

ද්විතීයස්ථානවිකල්ප 2.

1. —◡—
2. — — — —

තෘතීයස්ථානවිකල්ප 2.

1. ◡ ◡
2. ◡ — —

සෙසු ගණ තුන මාත්‍රාසමක වානවාසිකා චිත්‍රා පාදයා බැවින් මෙහි නො යෙදේ.

චතුර්ථස්ථානවිකල්ප 2.

1. ◡ ◡
2. — — ◡

ගුර්වන්ත විය යුතු බැවින් සෙසු ගණ මෙහි නො යෙදේ.

මේ හෙද එකිනෙක ගුණ කිරීමෙන් $(4\times 2=8\times 2=16\times 2=32)$ දෙතිසක් හෙද විශ්ලොකපාදයක ලැබේ. පෙර සේ ගුණ කිරීමෙන් සම්පූර්ණහෙද දශලක්‍ෂහතළිස්අටදහස්පන්සියහැත්තෑහයක් (1048576) ලැබේ.

34. තද්‍යුගලාද්වානවාසිකා[1] ස්‍යාත්.

35. බාණාෂ්ටනවසු යදි ලශ්චිත්‍රා.

34. **තද්‍යුගලාත්**= අම්බුධිචයයකින් හෙවත් මාත්‍රා අටකින්; (ජගණ හෝ නලඝු වී නම්); **වානවාසිකා ස්‍යාත්**= 'වානවාසිකා' නම් වන්නේ ය. ("ජෝ නලාවථ" යනු අධ්‍යාහාරයයිසි.)

**ප**:—මෙහි ද මාත්‍රා සොළොසකි. "තද්‍යුගලාද්වා" යන මාත්‍රා අටෙන් පර ව 'නවාසි' යන ජගණය සිටියේය.

"චාද්‍ශශව වානවාසිකා" යනුවෙන් පිඞ්ගලයන් විසින් දොළොස්වන මාත්‍රාවත් වග්‍රහණයෙන් නවම මාත්‍රාවත් ලඝු වන බව දක්වන ලදී. වෘත්තරත්නාකරෙකතිලෙස ම යෙදූවිට එසේ ලඝු ලැබේ. ජගණපක්‍ෂයෙහි සූත්‍රය ම උදාහරණයි. නගණ ලඝු පක්‍ෂයෙහි උදාහරණ මෙසේයි:-

⏑ — — ⏑ ⏑ — — — — ⏑ ⏑

"ලොකහිතාර්ථං මුනිවර ධර්මඃ"

| ප්‍රථමවිකල්ප4. | ද්විතීයවිකල්ප3 | තෘතීයවිකල්ප2. | චතුර්ථවිකල්ප2. |
|---|---|---|---|
| 1. ⏑ ⏑ | 1. ⏑ ⏑ | 1. — ⏑ — | 1. ⏑ ⏑ |
| 2. — — ⏑ | 2. ⏑ — — | 2. — — — — | 2. — — ⏑ |
| 3. ⏑ — — | 3. — — ⏑ | | |
| 4. — — — — | | | |

මේ දක්වනලද ගණයන්ගෙන් යම්කිසිවක් ම ඒ ඒ ගණස්ථානයෙහි යෙදිය යුතු. පාදයක භෙද $(4\times3=12\times2=24\times2=48)$ හතළිස්අටකි. සම්පූර්ණභෙද පණස්තුන්ලක්‍ෂඅටදහස්සාරසියසොළොසක් (5308416) වේ.

35. **යදි**= ඉදින්; **බාණාෂ්ටනවසු**= පස්වන අටවන නවවන තැන්හි; **ලඃ**= ලඝු වී නම්; **චිත්‍රා**= 'චිත්‍රා' නම් වෘත්තය වේ,

**ප**:—මෙහි දු "බාණාෂ්ට" යන්නෙහි 'ට' යන පස්වන මාත්‍රාව ද, 'නවසු' යන්නෙහි 'සු' යන අෂ්ටම මාත්‍රාව ද, 'යදි' යන තන්හි 'ය' යන නවවන මාත්‍රාව ද ලඝුයි. පාදයක් ෂොඩශමාත්‍රා පරිච්ඡින්නයි

| ප්‍රථමවිකල්ප4. | ද්විතීයවිකල්ප2. | තෘතීයවිකල්ප2. | චතුර්ථවිකල්ප2. |
|---|---|---|---|
| 1. ⏑ ⏑ | 1. — ⏑ — | 1. — — ⏑ | 1. ⏑ ⏑ |
| 2. — — ⏑ | 2. — — — — | 2. — — — — | 2. — — ⏑ |
| 3. ⏑ — — | | | |
| 4. — — — — | | | |

1. ඛ්‍යා.

36. [1]උපචිත්‍රා නවමෙ පරයුක්තෙ.

37. යදතිතකෘත[2]විවිධලක්ෂ්මයුතෛ
මාත්‍රාසමාදිපාදෛඃ කලිතම්,
අනියතවෘත්තපරිමාණ[3]යුක්තං
ප්‍රථිතං ජගත්සු පාදාකුලකම්

---

එකිනෙක ගුණ කිරීමෙන් පාදයක (4×2=8×2=16×2=32) හෙද දෙතිසකි. තෘතීයස්ථානයෙහි ජගණය ද යෙදේ යයි ඇතැම්හු කියත්. එවිට එහි හෙද තුණකි.

36. **නවමෙ**= නවවන මාත්‍රාව; **පරයුක්තෙ**= පර වූ දශමමාත්‍රාව හා යුක්ත වූ කල්හි (9+10 මාත්‍රා එක් ව ගුරක් වී නම්); **උපචිත්‍රා**= ඒ වෘත්තය 'උපචිත්‍රා' නම්. සෙස්ස පෙර මෙනි.

**ප**:—"පරයුක්තෙනොපචිත්‍රා" යනු පිඞ්ගලවචනයි. ජය දෙවයෝ එකාදශවාදශාදිමාත්‍රාවන්හි ද නියමය කරණුවෝ "අෂ්ටාභ්‍යා ගො ල්‍යාවුපචිත්‍රා"—මාත්‍රා අටකින් පර ව ගුරු-ලඝු-යගණයෝ වෙත් නම් 'උපචිත්‍රා'නමැයි කීහු. පඤ්චිකාකාරයෝ අටකින් පර ව භගණ ය වේ යයි කීහු. මෙහි තෘතීයස්ථානයෙහි සර්වගුරු, ආදිගුරුගණයෝ ම යෙදෙත්. සෙසු ගණස්ථානවිකල්ප මාත්‍රාසමකයෙහි මෙනි. පාදයක හෙද අටසාළිසකි.

37. **යත්**= යම් වෘත්තයක්; **අතීත**= ඉකුත්වූ; **කෘත**= කරණලද; **විවිධලක්ෂ්මයුතෛඃ**= නානාප්‍රකාරලක්ෂණයෙන් යුක්ත වූ; **මාත්‍රා සම දිපාදෛඃ**= මාත්‍රාසමකාදිවෘත්තයන්ගේ පාදයන්ගෙන්; **කලිතම්**= කරණලද ද; **අනියතවෘත්තපරිමාණයුක්තම්**= නියම රහිතවෘත්තපරිමාණයෙන් යුක්ත වූ නොහොත් අනියත වූ වෘත්ත හා ෂොඩශමාත්‍රාසඞ්ඛ්‍යාතපරිමාණ ඇති; **තත්**= ඒ වෘත්තය; **ජගත්සු**= ලෝවැස්සන් අතර; **පාදාකුලකම්**= 'පාදාකුලක' යයි; **ප්‍රථිතම්**= ප්‍රසිද්ධයි.

**ප**:—යට කියනලද මාත්‍රාසමකාදිවෘත්තයන් පිළිබඳ පාද යන්ගේ ලක්ෂණ මිශ්‍ර කොට හෝ පාදය ම මිශ්‍ර කොට බඳනාලද්දේ 'පාදාකුලක' නම්. 'පාදාකුලක' යනු අන්වර්ථසංඥයි. මෙහි ප්‍රථම පාදය මාත්‍රා සමක විශෙලාක චිත්‍රා වෘත්තයන්ගේ ලක්ෂණ මිශ්‍ර ව සිද්ධ ය. විතීයපාදය විශෙලාක උපචිත්‍රා දෙදෙනාගේ ලක්ෂණ මිශ්‍ර

---

2. "අබ්ධියුගාද්භශෙචදුපචිත්‍රා," "අෂ්ටාංභෙ‍යාභාල්ලාවුපචිත්‍රා" යනු පඤ්චිකා-ව්‍යාඛ්‍යා පාඨයි. "නවමෙ භවති ගුරාවුපචිත්‍රා"යනු ද පාඨයි. 2. විධි. 3. සහිතම්.

38. වෘත්තස්‍ය ලා විනා වර්‍ණෛර්‍ගා වර්‍ණා ගුරුභිස්තථා,
ගුරවො ලෛර්‍ද්විලෙ නිත්‍යං ප්‍රමාණමිති නිශ්චිතම්.

**ඉති මාත්‍රාසමප්‍රකරණම්.**

---

වීමෙන් ද, තෘතීයපාදය මාත්‍රාසමක වානවාසිකා දෙදෙනාගේ ලක්‍ෂණ යොගයෙන් ද, චතුර්ථපාදය උපචිත්‍රාවිශ්ලොක දෙදෙනාගේ ලක්‍ෂණයොගයෙන් ද සිද්ධ ය. පාදයක් පාසා යෙදෙන්නා.අනෙක ලක්‍ෂණ යොගය දැන උදාහරණ දත යුතු.

ඇතැම්හු පාදයක් පාසා එකලක්‍ෂණයොගය ම කියමින් පාද සතරෙහි විවිධලක්‍ෂණයොගය වෙයි යන අදහසින් ව්‍යාඛ්‍යා කෙරෙත්. එසේ කිව ද නිවරද ය එහෙයින් ම පිඞ්ගලයෝ "එභිඃ පාදකුලකම්"යි සාමාන්‍යයෙන් කීහු. "හලායුධ භට්ටයෝ මාත්‍රාසමක-විශ්ලොක-වානවාසිකා-උපචිත්‍රාපාදයන් ගෙන් බඳනාලද, නානාලක්‍ෂණයෙන් අසංකීර්ණපාද ඇති—

"අලිවාචාලිතවිකසිතචූතෙ
කාලෙ මදනසමාගමදූතෙ,
සම්‍යත්වා කාන්තාං පරිගෘතසාර්ථිඃ
පාදකුලකං ධාවති පාන්ථඃ"

යන ශ්ලොකය ද, තවත් එබඳු ම අසඞ්කීර්ණපාද ඇති "පුංසෙකාකිල" යනාදි ශ්ලොක ද උදාහරණ කළහ"යි ටීකාවෙහි කියතුදු "අලිවාචාලිත"යනාදියෙහි සඞ්කීර්ණපාදත්වය ම පැණේ. යථොක්ත වෘත්තයන් ඔවුනොවුන් මිශ්‍ර වීමෙන් අනන්ත භෙද ලැබේ. මතු දක්වනු ලබන උපජාතිප්‍රස්තාරයෙහි මෙන් ම මෙහි ද වෘත්ත දෙදෙනෙකුන්ගේ සංකරයෙහි භෙද තුදුසක් ලැබේ. එසින් අනන්ත භෙද ඇති වේ. විස්තර උපජාතිප්‍රස්තාරය දෙස බැලී මෙන් තමන් විසින් ම සිතා ගත යුතු. 1-2. 1-3. 1-4. 1-5. යන වෘත්තසඞ්කලනයෙන් භෙද සපණසක් ලැබේ. මෙසේ ම 2-1. 2-3. 2-4. 2-5. යන මොවුන් මිශ්‍ර වීමෙන් ද භෙද සපණසකි. මෙසේ දෙදෙනා දෙදෙනා මිශ්‍රිත වීමෙහි භෙද 140 ක් ලැබේ.

මාත්‍රාසමප්‍රකරණයෙහි වෘත්තලක්‍ෂණ පවසා දැන් උක්ත වූ ද වක්‍ෂ්‍යමාණ වූ ද වෘත්තයන්ගේ ගුරුලඝුමාත්‍රාවර්ණ තතු සේ පිරිසිඳ දැන ගැණීමේ උපාය "වෘත්තස්‍ය" යනාදීන් කියත්.

38. (A) **වෘත්තස්‍ය**= වෘත්තයාගේ; **ලාඃ**= මාත්‍රාවෝ; **වර්‍ණෛඃ විනා**= අක්‍ෂරයන් හැර (ස්ථියාහු); **ගාඃ**=ගුරුහු වෙති. (B) **තථා**= එසේ ම;**ගුරුභිඃ විනා**= ගුරු අකුරු හැර(සිටි මාත්‍රාවෝ); **වර්‍ණාඃ**= (වෘත්තයෙහි) අක්‍ෂරයෝ වෙති. (C)**ලෛඃ**= ලඝු අකුරු හැර(සිටි

මාත්‍රා); **දලෙ**= අඩ කළ කල්හි; **ගුරවඃ**= ගුරුහු වෙති. **ඉති**= මේ ප්‍රකාරයෙන්; **ප්‍රමාණම්**= ගුර්වාදීන්ගේ ප්‍රමාණය; **නිත්‍යම්**= සතත යෙන්; **නිශ්චිතම්**= නිශ්චිත වේ. (කථිතන්‍යායයෙන් අකථිතක්‍රම ද තර්කණය කළ යුතු;)

**ප**:—(A) පථ්‍යාර්යාදිවෘත්තයක වර්ණසංඛ්‍යාව කියා එහි ගුරු කොතෙක් දැයි යමෙකු ඇසුවොත් ඒ වෘත්තයට අයත් මාත්‍රාගණනින් වර්ණසංඛ්‍යාව අඩු කළ විට වෘත්තයෙහි පැණෙන ගුරුසංඛ්‍යාව ලැබේ. ඒ ඒ ජාතියට අයත් මාත්‍රාසංඛ්‍යා යට දක්වන ලදී. වර්ණ තිස්නවයක් ඇති මාත්‍රාසමක ශ්ලෝකයෙහි ගුරු කොතෙක් ද? මාත්‍රාසමකයෙහි පාදයකට මාත්‍රා දහසයක් බැගින් පාද සතරට මාත්‍රා සූසැටකි. මාත්‍රා සූසැටෙන් වර්ණ තිස්නවය අඩු කළ යුතු. එවිට ලැබෙන්නේ ගුරුසංඛ්‍යාවයි.

මාත්‍රා 64
වර්ණ 39
25

ගුරු විසිපහකි. මෙසේ ලැබීමට කාරණ නම්: ගුරුඅකුරට මාත්‍රා දෙකක් වුවත් වර්ණ ගිණීමේ දී ගුරෙහි ඇති මාත්‍රාදෙක නො සලකා ඒ දෙක ම එක වර්ණයක් සේ සලකණු ලැබීමයි එක් එක් ගුරෙහි එසේ නො සලකා හරිණලද මාත්‍රාවක් ඇත්තේ ය. එහෙයින් සම්පූර්ණමාත්‍රාගණනින් වර්ණසංඛ්‍යාව හළ විට නො සලකා හරිණලද මාත්‍රාගණන ඉතිරි වේ. ඒ ගුරු සංඛ්‍යාවයි. පථ්‍යාර්යාදියෙහි ද මේ ක්‍රම මැයි.

(B) ගුරුසංඛ්‍යාව කියා වෘත්තයෙහි වර්ණ කොතෙක් දැයි විචාළවිට මාත්‍රාගණනින් ගුරුසංඛ්‍යාව අඩු කළ යුතු. ඉතිරි වන්නේ වර්ණගණනයි. ගුරුඅකුරු පස්විස්සක් ඇති මාත්‍රාසමක යෙහි අක්ෂර කොතෙක් ද?

මාත්‍රා 64
ගුරු 25
39

වර්ණ එකුන්සාළිසකි. මීට කාරණ කී නයින් ම සිතනු.

(C) ලඝුසංඛ්‍යාව පෙන්වා වෘත්තයෙහි ගුරු කොතෙක් දැයි විචාළ විට වෘත්තයට අයත් මාත්‍රාගණනින් ලඝුගණන අඩු කොට ඉතිරි ගණන අඩ කරණු හෙවත් දෙකෙන් බෙදනු. එවිට ලැබෙන්නේ ගුරුසංඛ්‍යාවයි. ලඝු තුදුසක් ඇති මාත්‍රාසමකයෙහි ගුරු කොතෙක් ද?

මාත්‍රා 64
ලඝු 14
2 | 50 ÷ 2
25 ගුරු විසිපහකි.

39. ශිඛිගුණිතදශලඝුරචිතමපගතලඝුයුගලමපරමිදමඛිලම්,
සගුරුශකලයුගලකමපි සුපරිඝටිතලලිතපදවිතති භවති ශිඛා

(වර්ණසංඛ්‍යාවෙන් ගුරුසංඛ්‍යාව හළ (අඩු කළ) විට ලඝු සංඛ්‍යාව ලැබේ.)

මෙසේ වර්ණගුරු ලඝු ලැබෙන ශ්ලෝකය මෙසේයි:—

"අශවශ්‍රැමුඛො විරලෛර්ද්දිනෛන-ගිමහිරක්ෂිමිතනාසාශ්‍රු,
තිමිංඛහනුඃ සප්තිනෛඃ කෙශෛ-මාත්‍රාසමකං ලභතෙ දුඃඛම්."

"වෘත්තස්‍ය" යනු ශබ්දාදියට ද උපලක්ෂණ යයි කියනලදී. එහෙයින් ශබ්දාදියෙහි මාත්‍රාසංඛ්‍යාව හා ගුරුසංඛ්‍යාව නොහොත් ලඝු සංඛ්‍යාව හෝ වර්ණසංඛ්‍යාව කියා ඉතරසංඛ්‍යා විචාළවිට මේ ක්‍රමයෙන් ම සොයා ගත යුතු. මාත්‍රාසංඛ්‍යානියමයක් නැති ශබ්දාදියක ඉතරසංඛ්‍යාවක් දී තදන්‍යසංඛ්‍යා විචාරණ විට මාත්‍රා සංඛ්‍යාව ද කිය යුතුයි.

**මාත්‍රාසමප්‍රකරණය මෙතෙකින් සමාප්තයි.**

—— + ——

මාත්‍රානියමයෙන් කරණලදහෙයින් මාත්‍රාවෘත්තප්‍රසඞ්ග යෙන් ම ශිඛාදි විඛණ්ඩකයන් කියත්.

39. (**ශකලම්**= ප්‍රථමාර්ධය;) **ශිඛි**= තුණින්; **ගුණිත**= ගුණ කරණලද; **දශලඝු**= ලඝුදශයකින් නොහොත් ලඝු තිසකින්; **රචිතම්**= රචනා කරණ ලද ද; **අපගතලඝුයුගලම්**= (ඒ පූර්වාර්ධය) පහවූ ලඝු දෙකක් ඇත්තේ ද වේ. **අපරම්**= අනික් අර්ධය; **ඉදම් අඛිලම්**= මේ සියල්ලම වේ ද; **ශකලයුගලකම් අපි**= අර්ධ දෙක ම; **සගුරු**= (අන්තයෙහි) අධික එක් ගුරකින් යුක්ත ද; **සුපරිඝටිත**= මනා කොට සටනා කරණලද; **ලලිත**= ලීලොපෙත වූ; **පදවිතති**= පදපඞ්ක්ති ඇත්තේ ද, (ඒ වෘත්තය); **ශිඛා භවති**= 'ශිඛා' නම් වෙයි.

**ෂ**:-ගාර්හපත්‍ය-ආහවනීය-දක්ෂිණා යයි වහ්නිත්‍රයයකි. එහෙයින් වහ්නිපර්‍ය්‍යායශබ්ද ත්‍රිසංඛ්‍යාවාචක ය 'ශිඛි' යනු ද වහ්නිපර්‍ය්‍යාය ය ප්‍රථමාර්ධයෙහි දෙකක් අඩුවූ ලඝු තිසක් නොහොත් ලඝු විසිඅටක් ද අන්තයෙහි ගුරක් දූයි අකුරු එකුන්තිසක් ද, ද්විතීයාර්ධයෙහි ලඝු තිසක් හා අන්තයෙහි ගුරක් දූයි අකුරු එක්තිසක් ද ඇති වෘත්තය 'ශිඛා' නම්.

40. විනිමයවිනිහිතශකලයුගල[1]කලිතපදවිතතිවිරචිතගුණ
නිචයා,
ශ්‍රුතිසුඛකෘදියමපි ජගති ඤි ජශිර උපගතවති සති භවති
ඛජා.

---

මොවුන්හට 'විපාද්' 'විඛණ්ඩක' යනු ද සාමාන්‍යසංඥා ය. මෙහි දක්වනලද පාද දෙකින් ම ශ්ලෝකය පිරෙණ හෙයින් ඒ නාම අන්වර්ථය. පඤ්චිකාකාරයෝ මේ දක්වනලද්දේ අර්ධය කැයි සිතා ඒ අර්ථය ලැබෙන සේ ව්‍යාඛ්‍යාන කොට තවත් මෙබඳු ම අර්ධයක් එකතු කොට උදාහරණ ද රචනා කළහ. සිංහලව්‍යාඛ්‍යාකාරයෝ ද එය අනුගමනය කළහ.

'සුපරිසචිත' යන්නෙන් ශ්‍රුතිසුඛවූ යතිය කළ යුතු බව හඟවයි.

40. **විනිමය විනිහිත**= විපර්‍ය්‍යාස (මාරු) කොට තබනලද; **ශකලයුගල**= ශිඛායෙහි අර්ධ දෙකින්; **කලිත**= කරණ ලද; **පද විතති**= පදපඞ්ක්තින්; **විරචිත**= රචනා කරණලද; **ගුණනිචයා**= සෞකුමාර්‍ය්‍යාදි ගුණසමූහ ඇති; **ශ්‍රුතිසුඛකෘත්**= ශ්‍රවණයට සුව ගෙණ දෙන; **ඉයම් අපි**= මේ ඡන්දෝජාති ද; **ජශිරඃ**= ජකාරයාගේ මස්තකයට; **උපගතවති**= පැමිණියා වූ; **ඤි සති**= ඤකාරයා ඇති කල්හි; **ජගති**= ලොකයෙහි; **ඛජා භවති**= 'ඛජා' නම් වන්නීය. ('ඛඤ්ජා' නම් වෙයි යනු අර්ථයි.)

**භා**:-ශිඛායෙහි ප්‍රථම පාදය ඛඤ්ජාවෙහි ද්විතීයපාදය වේ. ඛඤ්ජාවෙහි ප්‍රථමපාදය ශිඛාවෙහි ද්විතීයපාදය වේ. 'ඛඤ්ජා' යි ගුරුවයයක් මෙහි නො ලැබෙනහෙයින් 'ජකාරයාගේ මස්තකයට පැමිණි ඤකාරය ඇති ඛජා'යි කියනලදී.

පිඞ්ගලයෝ "අන්‍යේ" යන සුතුර අධිකාර කොට "ශිඛෛකොනත්‍රිංශදේකත්‍රිංශදන්තෙ ග්"යි "ඛඤ්ජාවිහත්‍ය'යුජ්" යි ද ශිඛා-ඛඤ්ජාලක්ෂණ දක්වූහ. ඔහුගේ මතය පරිදි වෘත්තරත්නාකරයෙහි පැණෙන්නේ ශිඛා-ඛඤ්ජාවන්ගේ අර්ධ ම නො වේ ද? නො වේ. මෙහි කියනලද ශිඛාඛඤ්ජාවන් පිඞ්ගලයෝ නො කීහ. පිඞ්ගලයන් විසින් කියනලද ශිඛාඛඤ්ජාවන් අර්ධසමවෘත්ත බැවින් මෙහි චතුර්ථාධ්‍යායයෙහි ලා සිතිය යුතු

---

1. ලඝුලලිතපදවිතති රචිත ගණනිචයා.

41. අෂ්ටාවධේ ගාව්‍යහ්‍යස්තා යස්‍යාඃ සා'නඞ්ගක්‍රීඩේ'ක්තා,
දලමපරමපි වසුගුණිතසලිලනිධිලඝු කවිරචිතපදවිතති
භවති.

නොහොත් ශකලශබ්දය අවයවවාචක යයි ගෙණ 'පාද ස්වරූප අවයව'යයි අර්ථ ගත්කල්හි ද දෙසක් නැති මෙහි දක්වනලද උදාහරණ ශිඛා-ඛඤ්ජාවන්ගේ අර්ධයට යයි සිතා අර්ධසමත්වය ඇත ද මාත්‍රාතියමාත්මක හෙයින් වතුර්ථාධ්‍යාය යෙහි නො හෙලා මෙහි ලා බඳන ලදැයි ද කිය හැකි වේ. එවිට පඤ්චිකොදාහරණ මෙහි යෙදේ. නමුත් "විපාද්" යනු නො ගැළපේ.

41. **යස්‍යාඃ**= යම් ඡන්දෛජාතියක; **අර්ධේ**= පළමුවන අර්ධයෙහි; **ව්‍යහ්‍යස්තාඃ**= දෙකින් ගුණ කරණ ලද; **අෂ්ටෞ ගාඃ**= ගුරුහු අට දෙනෙක් (ගුරුසොළසක්) වෙත් ද, **අපරං දලම් අපි**= අනික් දෙවෙනි අර්ධය ද; **වසුගුණිත**= අටකින් ගුණ කරණලද, **සලිල නිධිලඝු**= සතර ලඝුවක් හෙවත් ලඝු දෙතිසක් ඇත්තේ ද; **කවිරචිත**= කවින් විසින් රචනා කරණලද; **පදවිතති භවති**= පදපඞ්ක්ති ඇත්තේ වේ ද; **සා**= ඒ ඡන්දෛජාති තොමෝ; **අනඞ්ග ක්‍රීඩා**= අනඞ්ගක්‍රීඩා නමැයි; **උක්තා**= කියන ලදී.

සː-"ශිඛා විපර්‍යස්තාර්ධා" "ශශෛවත් සෞම්‍යා" යනුවෙන් පාදයෙක්හි සොළොස් ලඝුවක් බැගින් ඇති ගීත්‍යාර්‍යාව විපර්‍යස්ත කරණලද්දී හෙවත් අර්ධයක ලඝු දෙතිසකුත් අර්ධයක ගුරුසො ළොසකුත් ඇත්තී 'සෞම්‍යා ශිඛා'යයි අන්‍යශිඛාවක් ද පිඞ්ගල යන් විසින් දක්වන ලදී. මෙහි 'අනඞ්ගක්‍රීඩා'යයි කියනලද්දී ඒ සෞම්‍යා ශිඛා මැයි. ප්‍රථමාර්ධයෙහි ගුරුදහසයක් ද දෙවෙනි අර්ධයෙහි ගුරු දෙතිසක් ද ඇත්තී අනඞ්ගක්‍රීඩාවයි. (මේ අෂ්ටා වඬේ" යන්නෙන් ද යට දක්වූ"ශිඛිගුණිත"යනාදිය ශිඛා-ඛඤ්ජා වන්ගේ අර්ධනොවනබව හැගේ.) පඤ්චිකාකාරයෝ මෙහි අප රාර්ධය අතිරුචිරාවෙහි පූර්වාර්ධයයි සලකා ව්‍යාඛ්‍යාන කොට උදා හරණ ද රචනා කළහ. ඔවුන්ගේ අනඞ්ගක්‍රීඩාව "මො මො ගො ගො විද්‍යුන්මාලා"යි(71පිට ,මතු කියනුලබන විද්‍යුන්මාලාවට නො වෙනස් වේ. එහෙයින් පඤ්චිකොක්තිය අනාදරණීයයි.

"ලඃ පූර්වශෛවජ්‍යෝතිඃ" යනුවෙන් අනඞ්ගක්‍රීඩාවෙහි අර්ධ විපර්‍යාස කළවිට 'ජ්‍යොතිස්'නම්'ශිඛා'වේ යයි පිඞ්ගලයෝ කීහ. ඊට උදාහරණ මෙසේයි:-

"යදි සුඛමනුපමමපරමභිලෂසි පරිහර යුවතිෂු රතිමතිශයමිහ,
ආත්මජ්‍යොතිර්යෝගාභ්‍යාසාද් දෘෂ්ටවා දුඃඛච්ඡේදං කුරුෂ්වාඃ."

42. ත්‍රිගුණනවලඝුරවසිතිගුරුරිති දලයුගකෘතතනුරතිරුචිරා.

**ඉති මිපාත්ප්‍රකරණම්.**

---

**ඉති ශ්‍රී කෙදරභට්ටවිරචිතෙ වෘත්තරත්නාකරෙ මාත්‍රා වෘත්තාධිකාරො නාම ද්විතීයො'ධ්‍යායඃ.**

---

III

## තෘතීයො'ධ්‍යායඃ

---

**1. අථ උක්තායාම්—2.**

---

42. **ත්‍රිගුණ**= තුණින් ගුණිතවූ; **නවලඝුඃ**= ලඝුනවයක් හෙවත් ලඝු සත්විස්සක් ඇත්තී වේ ද; **අවසිතිගුරුඃ**= අවසානයෙහි ගුරක් ඇත්තී ද; **ඉති**= මෙසේ; **දලයුගකෘතතනුඃ**= අඩ දෙකින් කරණලද ශරීර ඇත්තී; **අතිරුචිරා**= 'අතිරුචිරා' නමි.

ස:-පිඞ්ගලච්ඡන්දස්හි මීට 'චූලිකා'යයි කියනලදැයි ටීකා කාරයෝ කියති. "චූලිකෙකොනත්‍රිංශදෙකත්‍රිංශදන්තෙ ග්" යනුවෙන් චූලිකාවෙහි ලක්ෂණ අතිරුචිරාලක්ෂණයට වඩා වෙනස් කරණලද බව පෙණේ. වෘත්තිකාරයන් විසින් චූලිකාඩි මෙකොනත්‍රිංශදන්තෙ ග්"යි ඝාවිත්‍යාපාඨයක් වශයෙන් දක්වනලද සූත්‍රයෙහි අතිරුචිරාලක්ෂණ පැණේ. උදාහරණ හලායුධයෝ මෙසේ දැක්වූහ:—

"ඝනපරිමලමිලදලිකුලමුඛරිතනිබිලකමලමලයපවනෙ,
ජනයති මනසි ශශිමුඛි මුදමතිශයමිහ මම මධුරයමධුනා"

**මිපාත්ප්‍රකරණය මෙතෙකින් සමාපතයි.**

---

ශ්‍රී කෙදරභට්ටයන් විසින් රචනාකරණලද වෘත්තරත්නාකර යෙහි මාත්‍රාවෘත්තාධිකාර නම් වූ දෙවෙනි අදියර මෙතෙකින් නිමි.

---

III

**තෘතීයාධ්‍යාය.**

මාත්‍රාච්ඡන්දස දක්වා අනතුරු ව වර්ණච්ඡන්දස දක්වනු පිණිස "අථ උක්තායාම්" යනාදිය කියත්.

**1. අථ**= ඉක්බිත්තෙන්; **උක්තායාම්**= උක්තාච්ඡන්දසෙහි (වෘත්ත කියනු ලැබේ.)

1. 1. ග් ශ්‍රීඃ.

**2. අථාත්‍යුක්තායාම්—4.**

2. 1. ගෞ ස්ත්‍රී.

**3. අථ මධ්‍යායාම්—8.**

3. 1. මෝ නාරී.

4. 2. රෝ මෘගී.

5. 3. ය කොශා.

**4. අථ ප්‍රතිෂ්ඨායාම්—16.**

6. 1. මෞගෞ චෙත් කන්‍යා.

---

1. 1. **ග්**= ගුරක් වී නම්; **ශ්‍රීඃ**= (ඒ වෘත්තය) 'ශ්‍රී' නමි.

**ප:**—පාදචතුෂ්කයෙහි ම ගුරු සතරක් වී නම් ශ්‍රී වෘත්තයි උක්තාව එකාක්ෂර හෙයින් වෘත්ත දෙකකි. ඒ ඒ ඡන්දසුන්ගේ වෘත්ත සඞ්ඛ්‍යාව ඡන්දස උදෙසා ඒ ළඟ ම ලියනු ලැබේ.

මේ සූත්‍රය "ගුඃ ශ්‍රීඃ"යි ගෙණ ශ්‍රීවෘත්තයාගේ අධියකැයි සමහරු කියත්. සෙස්ස හා නො ගැළපෙන බැවින් ඒ නො යෙදේ.

**2. අථ**= අනතුරුව; **අත්‍යුක්තායාම්**= අත්‍යුක්තා ඡන්දසෙහි (වෘත්ත කියනු ලැබේ.)

2. 1. **ගෞ**= (පාදයක) ගුරුදෙදෙනෙක් වෙත් ද; **ස්ත්‍රී**= (ඒ වෘත්තය) 'ස්ත්‍රී' නමි.

**ප:**—මේ එක් පාදයකි. මෙබඳු පාද සතරක් වූ විට ශ්ලෝකය පිරේ. සෙස්ස ද මෙසේ මැයි.

**3. අථ**= නැවත; **මධ්‍යායාම්**= මධ්‍යාච්ඡන්දසෙහි (වෘත්ත කියනු ලැබේ.)

3. 1. **මඃ**= මගණය වී නම්; **නාරී**= 'නාරී' වෘත්තයි.

4. 2. **රඃ**= රගණය වී නම්; **මෘගී**= 'මෘගී' වෘත්තයි.

5. 3. **ය**= යගණය වී නම්; **කොශා**= 'කොශා' වෘත්තයි.

**ප:**—'ය' යනු සාංකෙතිකපදයකි, මේ වෘත්තය ඇතැම් පොත්හි නො පැණේ.

**4. අථ**= ඉක්බිත්තෙන්; **ප්‍රතිෂ්ඨායාම්**= ප්‍රතිෂ්ඨාඡන්දසෙහි (වෘත්ත කියනු ලැබේ.)

6. 1. **චෙත්**= ඉදින්; **මෞගෞ**= මගණ ගුරු යන දෙදෙන වූහු නම්; **කන්‍යා**= 'කන්‍යා' වෘත්තයි.

7. 2. යගෞ ව්‍රීඩා.
8. 3. ජ්ග ලාසිනී.
9. 4. භෞ සුමුඛී.
10. 5. සුමතිඃ සගෞ.
11. 6. රෞ සමෘද්ධිඃ.

**5. අථ සුප්‍රතිෂ්ඨායාම්—32.**

12. 1. භෞ ගිති පඞ්ක්තිඃ.
13. 2. රෞ ගිති ප්‍රීතිඃ.
14. 3. සතී ජගෞ ගඃ.
15. 4. මන්‍දු තලගෞඃ.

---

7. 2. **යගෞ**= යගණ ගුරු දෙදෙන වූහු නම්; **ව්‍රීඩා**= 'ව්‍රීඩා' වෘත්තයි.

8. 3. **ජග**= ජගණය හා ගුරක් වී නම්; **ලාසිනී**= 'ලාසිනී' වෘත්තයි.

**ස**:—'ජ්ග' යනු ලුප්තවිභක්තිකයි.

9. 4. **භෞ**= භගණගුරු දෙදෙන වූහු නම්; **සුමුඛී**= 'සුමුඛී' වෘත්තයි.

10. 5. **සගෞ**= සගණගුරු දෙදෙන වූහු නම්; **සුමතිඃ**= 'සුමති' වෘත්තයි.

11. 6. **රෞ**= රගණ ගුරු දෙදෙන වූහු නම්; **සමෘද්ධිඃ**= 'සමෘද්ධි' වෘත්තයි

**ස**:—ඇතැම් පොත්හි ව්‍රීඩාදිවෘත්තපඤ්චකය නො පැණේ.

**5. අථ**= ඉක්බිත්තෙන්; **සුප්‍රතිෂ්ඨායාම්**= සුප්‍රතිෂ්ඨා ඡන්‍දසෙහි වෘත්ත කියනු ලැබේ.

12. 1 **භෞ**= භගණගුරු දෙදෙන ද; **ග්**= නැවැත ගුරක් ද යන මොහු වූහු නම්; **ඉති**= මෙසේ වූ වෘත්තය; **පඞ්ක්තිඃ**= 'පඞ්ක්ති' නම්.

13. 2. **රෞ**= රගණගුරු දෙදෙන ද; **ග්**= නැවැත ගුරක් දැයි; **ඉති**= මේ ප්‍රකාරයෙන් වූ වෘත්තය; **ප්‍රීතිඃ**= 'ප්‍රීති' නම්.

14. 3. **ජගෞ**= ජගණගුරු යන දෙදෙනය; **ගඃ**= නැවැත ගුරක් ය යන මොහු වූ නම්; **සතී**= 'සතී' වෘත්තයි.

15. 4. **තලගෞඃ**= තගණ ලඝු ගුරු කරණ කොට ගෙණ; **මන්‍දු**= 'මන්‍දු' නම් වෘත්තය වේ

### 6. අථ ගායත්‍ර්‍යාම්—64.

16. 1. ත්‍යෞ ස්තස්තනුමධ්‍යා.
17. 2. ශශිවදනා න්‍යෞ.
18. 3. මෞ සාවිත්‍රීමාහුඃ.
19. 4. ම්‍රෞ යස්‍යාඃ සා නදී.
20. 5. ම්සෞ ප්‍රොක්තං මුකුලම්.
21. 6. මාලිනී ර්භ්‍යාං ස්‍යාත්.
22. 7. සයුගං රමණී.

---

ප:—ඇතැම් පොත්හි 'ප්‍රීති' ආදි වෘත්තත්‍රය නො පැණේ. මේ උක්තාදි ඡන්දස් පස වෙසෙසින් පිඞ්ගලයෝ නො දක්වූහ. (27 වන පිට බලනු.)

**6. අථ**= ඉක්බිත්තෙන්; **ගායත්‍ර්‍යාම්**= ගායත්‍රි ඡන්දසෙහි වෘත්ත කියනු ලැබේ.

16 1. **ත්‍යෞ**= තගණයගණයෝ; **ස්තඃ**= වෙත් නම්; **තනුමධ්‍යා**= 'තනුමධ්‍යා' වෘත්තයි.

17. 2. **න්‍යෞ**= නගණයගණයෝ වෙත් නම්; **ශශිවදනා**='ශශිවදනා' වෘත්තයි.

18. 3. **මෞ**= මගණදෙදෙනෙක් වෙත් නම්; **සාවිත්‍රීම්**= 'සාවිත්‍රී' නමැයි; **ආහුඃ**= කියත්.

ප:—මීට 'විද්‍යුල්ලේඛායයි' ද කියති. "විද්‍යුල්ලේඛා මෝ මඃ" යනු ඇතැම් පොතෙක පැණෙන සූත්‍රයි.

19. 4. **යස්‍යාඃ**= යම් වෘත්තයක් පිළිබඳ ව; **ම්‍රෞ**= මගණරගණයෝ වෙත් ද; **සා**= ඕ තොමෝ; **නදී**= 'නදී' නම්.

20. 5. **ම්සෞ**= මගණසගණයෝ වෙත් නම්; **මුකුලම්**= 'මුකුල' යයි; **ප්‍රොක්තම්**= කියනලදී.

ප:—'සොමකුල'යයි ද මීට ම නමකි. "ස්‍යාන්මෙසෞ සොමකුලම්" යනු ඡාවිතකපාඨයි.

21. 6. **ර්භ්‍යාම්**= රගණමගණ කරණ කොට ගෙණ; **මාලිනී ස්‍යාත්**= 'මාලිනී' වෘත්තය වේ.

22. 7. **සයුගම්**= සගණයුගමයක් වේ නම්; **රමණී**= 'රමණී' වෘත්තයි.

23. 8. තෞසෟ වෙදවසුමතී.

**7. අථ උෂ්ණිහි—128.**

24. 1. මෞසෟ ගඃ ස්‍යාන්මදලේඛා.

25. 2. කුමාරලලිතා ජ්සෞ ග්.

26. 3. [1]මධු යදි නනගාඃ.

27. 4. [2]සරගා හංසමාලා.

**8. අථා'නුෂ්ටුභි—256.**

---

23. 8 **තෞසෟ**= තගණසගණයෝ; **වෙත්**= ඉදින් වේත් නම්; **වසුමතී**= 'වසුමතී' වෘත්තයි.

පඃ—පෛඞ්ගලයෙහි තනුමධ්‍යාව පමණක් දක්වන ලදී. ගායත්‍රියෙහි විශෙෂයෙන් පාදන්තයෙහි යතිය කට යුතු ය යනු ගුරූපදෙශයි.

**7. අථ**= ඉක්බිත්තෙන්; **උෂ්ණිහි**= උෂ්ණික් ඡන්දසෙහි වෘත්ත යෝ කියනු ලැබෙත්.

24. 1. **මෞසෟ**= මගණසගණයෝ වෙත් ද, **ගඃ**= නැවත ගුරක් වේ ද; **මදලේඛා ස්‍යාත්**= ඒ වෘත්තය 'මදලේඛා' නම් වේ.

25. 2. **ජ්සෞ**= ජගණසගණයෝ; වෙත් ද; **ග්**= නැවැත ගුරක් වේ ද; **කුමාරලලිතා**= ඒ වෘත්තය 'කුමාරලලිතා' නම්

පඃ—මෙහි අකුරු තුණකින් හා හතරකින් යතිය වේ පෛඞ්ගලයෙහි පැණෙනුයේ මෙපමණකි. මේ ම එහි ද සූත්‍රයි.

26. 3. **යදි**= ඉදින්; **නනගාඃ**= නගණ-නගණ ගුරුහු වෙත් ද; **මධු**= 'මධු' වෘත්තයි.

පඃ - මීට 'මධුමතී'යයි ද ඇතැම්හු කියත්. පඤ්චිකාකාරයෝ 'මධුමතී' යයි ගෙණ-"නගණ භගණ ගුරුහු වෙති"යි කියා උදාහරණ ද දක්වූහ. පුරාතනව්‍යාඛ්‍යානයෙහි හා අන්‍යසංස්කෘත ටීකාවන්හිත් පැණෙන පාඨ අප විසින් අධිගීකෘත ය.

27. 4. **සරගාඃ**= සගණ රගණ ගුරුහු වෙත් නම්; **හංසමාලා**= 'හංසමාලා' වෘත්තයි.

පඃ—අකුරු දෙකකින් හා පසකින් යති වේ යයි ද, පාදන්ත යෙහි ම යති වේ යයි ද කියත්.

**8. අථ**= ඉක්බිත්තෙන්; **අනුෂ්ටුභි**= අනුෂ්ටුප්ඡන්දසෙහි වෘත්ත කියනු ලැබේ.

---

1. නනගී මධුමතී. මධුමතීනභගාඃ. මධුමති නනගාඃ. 2. සරමෞගඃ.

28. 1. භෞ ගිති චිත්‍රපද ගඃ.
29. 2. මො මො ගො ගො විද්‍යුන්මාලා.
30. 3. මාණවකං භාත්තලගාඃ.
31. 4. මේනෞ ගෞ හංසරුතමේතත්.
32. 5. නාගරකං භරෞ ලගෞ.
33. 6. නාරාචිකා තරෞ ලගෞ.
34. 7. ජෞ සමානිකා ගලෞ ච.

---

28. 1. **භෞ**= භගණදෙදෙනෙක් වෙත් ද; **ග්**= ගුරක් වේ ද; **ගඃ**= නැවත ගුරක් වේ ද, **ඉති**- මෙසේ වූ වෘත්තය; **චිත්‍රපද**- 'චිත්‍රපද' නම්.

**ප**:—පාදන්තයෙහි යතිය වේ.

29. 2. **මඃ**- මගණයක් ද; **මඃ**- නැවත මගණයක් **ද; ගඃ**- ගුරක් ද; **ගඃ**- (නැවත) ගුරක් ද වේ නම්; **විද්‍යුන්මාලා**- ඒ වෘත්තය 'විද්‍යුන්මාලා' නම්.

**ප**:—සතරෙන් සතරෙන් යතියි.

30. 3. **භාත්**-භගණයෙන් පර ව; **තලගාඃ**- තගණ ලඝු ගුරුහු වෙත් ද; **මාණවකම්**- ඒ වෘත්තය 'මාණවක' නම්.

**ප**:—මිට 'මාණවකාක්‍රිඩිතක' යයි පිඞගලයෝ කිහ. සත රෙන් සතරෙන් යතියි.

31. 4. **මේනෞ**- මගණතගණයෝ වෙත් ද; **ගෞ**- ගුරුදෙදෙනෙක් වෙත් ද; **එතත්**- මේ වෘත්තය; **හංසරුතම්**- 'හංසරුත' නම්.

**ප**:-පාදන්තයෙහි යතියි.

32. 5. **භරෞ**= භගණරගණයෝ වෙත් ද; **ලගෞ**= ලඝුගුරුහු වෙත් ද; **නාගරකම්**= ඒ වෘත්තය 'නාගරක'නම්.

33. 6. **තරෞ**= තගණරගණයෝ වෙත් ද; **ලගෞ**= ලඝුගුරුහු වෙත් ද; **නාරාචිකා**= ඒ වෘත්තය 'නාරාචිකා' නම්.

34. 7. **රජෞ**=රගණජගණයෝ වෙත් ද, **ගලෞ ච**=ගුරුලඝුහු ද වෙත් ද; **සමානිකා**= ඒ වෘත්තය 'සමානිකා' නම්.

**ප**:-"ගලිති සමානී" යනු පිඞගලසූත්‍රයි. ගුරක, ලඝුවක යන ක්‍රමයෙන් බඳනාලද අෂ්ටාක්ෂරවත් පාදය ඇත්තෝ සමානිය යනු එහි අදහසයි. මෙහි කියන ලද ක්‍රමයෙන් ගණ යෙදූවිට ද ක්‍රමයෙන් ගුරුලඝු ලැබේ.

35. 8. ප්‍රමාණිකා ජරෞ ලගෞ.
36. 9. විතානමාභ්‍යාං යදන්‍යත්.

---

35. 8. **ජරෞ**= ජගණරගණයෝ වෙත් ද; **ලගෞ**= ලඝුගුරුහු වෙත් ද; **ප්‍රමාණිකා**= ඒ වෘත්තය 'ප්‍රමාණිකා' නමි.

**ෂ:**—"ලගිති ප්‍රමාණි" යනු පිඞ්ගලසූත්‍රයි. ලඝුගුරුන්ගෙන් ක්‍රමයෙන් බඳනාලද අෂ්ටාක්‍ෂරපාදය ඇත්තී ප්‍රමාණී වේ. මෙහි කී ගණ යොදා බැඳි විට එසේ ලඝුගුරු යෙදේ. 'නාරාච' යනු ද මීට ම නමකැයි කියත්.

36. 9. **ආභ්‍යාම්**= මේ සමානිකා ප්‍රමාණිකා දෙදෙනාගෙන්; **අන්‍යත්**= අන්‍ය වූ; **යත්**= යම් අෂ්ටාක්‍ෂර පාද වෘත්තයක් වේ ද; **විතානම්**= ඒ 'විතාන' නමි.

**ෂ:**-"විතානමන්‍යත්" යනු පිඞ්ගලසූත්‍රයි. හලායුධයෝ ඊට වෘත්ති ලියනුවෝ "සූත්‍රකාරෙ විතානස්‍යානෙකප්‍රකාරතාං දර්‍ශයති. අන්‍යථා 'විතානං භෞ ගෞ' ඉත්‍යෙව විදධ්‍යාත්" "සූත්‍රකාර තෙමේ විතානවෘත්තයාගේ අනෙකප්‍රකාරත්වය දක්වයි. එසේ නො වේ නම්- ජෛනයන් කියන පරිදි භගණ දෙකක් සහ ගුරු දෙකක් ද ඇත්තේ 'විතාන' නමැයි විධාන කරන්නේ"යයි කීහු. එහෙයින් මේ මේ වෘත්ත 'විතාන' යයි නියමයක් කළ හැකි නො වේ. "විතානමාභ්‍යාං යදන්‍යත්" යනුවෙන් යථොක්ත නියම ඉක්මවා උදාහරණ කරණ ලද්දේත් එහෙයින් ම ය.

පඤ්චිකාකාරයෝ වෘත්තිකාරමතයට ද උඩින් පැන "යථොක්තක්‍රම දෙකින් අන්‍ය වූ (1) ජගණ තගණ හා ගුරුදෙදෙනෙකුන්ගෙන් එක් විතානයක් ද (2) රගණ සගණ හා ලඝු දෙදෙනෙකුන්ගෙන් එක් විතානයක් දැයි විතාන දෙකක් නිපදවති. පඤ්චිකාකාරයන්ගේ මතය පරිදි නම් ඒ දෙක පමණක් නො ව තවත් ක්‍රම නිපදවිය හැක.

සමහරු "සමානිකාව ගුරුලඝු ක්‍රමයෙන් ද, ප්‍රමාණිකාව ලඝුගුරු ක්‍රමයෙන් ද යෙදෙන හෙයින් විතානයෙහි (I) ගුරු දෙකක් ද අනතුරු ව ලඝු දෙකක් ද නැවැත ගුරුදෙකක් හා ලඝු දෙකක් ද යෙදේ යයි එක් විතානයක් ද, (II) ලඝුදෙකක් ද ගුරු දෙකක් ද ලඝුදෙකක් ද ගුරු දෙකක්දැයි තවත් ක්‍රමයක් ද, (III) මුලට ගුරුවයයක් ද අනතුරුව ලඝු ගුරු එක එක බැගින් අතික් ක්‍රමයක් දැයි නොයෙක් ක්‍රම කියත්. වෘත්තිකාරයන්ගේ උදාහරණ දෙස දෘෂ්ටි හෙලීමෙන් එසේ කියන බව සිතිය හැක. ඒ භෙදයන්ට උදාහරණ හලායුධයෝ මෙසේ දැක්වූහ:—

**9. අථ බෘහත්‍යාම් —512.**

37. 1. රාන්නෞසාවිහ හලමුඛී.
38. 2. භුජගශිශුභෘතා නෞ මඃ.

**10. අථ පඞ්ක්තෞ—1024.**

39. 1. ම්සෞ ජ්ගෞ ශුද්ධවිරාඩිදං මතම්.

---

I "තෘෂ්ණාං ත්‍යජ ධර්මං භජ-පාපෙ හෘදයං මා කුරු,
ඉෂ්ටා යදි ලක්ෂ්මීස්තව-ශිෂ්ටානතිශං සංශ්‍රය."

II "හෘදයං යස්‍ය විශාලං-ගගනාභොගසමානම්,
ලභතෙ'සෞ මණිචිත්‍රං-නෘපතිර්මූර්ධ්නි විතානම්."

III "තස්‍යාඃ සමරම් සුන්දරං-චන්ද්‍රොපමානමානනම්,
කන්දර්පචාපභඞ්ගුර-භ්‍රූවිභ්‍රමොපශොභිතම්."

ශ්වෙතපටජෛනාචාර්‍ය්‍යයෝ භගණ දෙකක් හා ගුරු දෙකක් ඇත්තේ 'විතාන' නමැයි කියති. චිත්‍රපදාවෘත්තය ද එකිලක්ෂණයෙන් යුත් හෙයින් ඒ නිරර්ථක ය. ජෛනාචාර්‍ය්‍යයන්ගේ විතානයට උදාහරණත් තත්ඛණ්ඩනයත් මෙසේයි:-

"අන්‍යදතො හි විතානං-ශ්වෙතපටෙන යදුක්තම්,
චිත්‍රපදා'පි ච භෞ ගෞ-තෙන ගතාර්ථම්වෛතත්."

මේ ඡන්දසෙහි "කුමාරලලිතා ජ්සෞ ගෞ" යනු ද සමහර පොත්වල පැණේ.

**9. අථ**= අනතුරු ව; **බෘහත්‍යාම්**= බෘහතීඡන්දසෙහි වෘත්ත කියනුලැබේ.

37. 1. **ඉහ**= මෙහි; **රාත්**= රගණයෙන් පර ව; **නෞසෞ**= නගණ සගණයෝ වූ නම්; **හලමුඛී**= 'හලමුඛී' වෘත්තයයි.

**ප**:—අකුරුතුණකින් හා සයකින් යතියයි.

38. 2. **නෞ**= නගණයෝ දෙදෙනෙක් වෙත් ද; **මඃ**= (නැවැත) මගණයෙක් වේ ද; **භුජගශිශුභෘතා**= ඒ වෘත්තය 'භුජගශිශුභෘතා' නම්.

**ප**:—'භුජගශිශුසෘතා' යනු ද කියත්. එක් ගමන් ඇත්තේ ය යනු අර්ථයි. අකුරු හතකින් හා දෙකකින් යතියයි.

**10. අථ**= ඉක්බිත්තෙන්; **පඞ්ක්තෞ**= පඞ්ක්තිච්ඡන්දසෙහි වෘත්තයෝ කියනු ලැබෙත්.

39. 1. **ම්සෞ**= මගණසගණයෝ වෙත් ද; **ජ්ගෞ**= (නැවත) ජගණගුරුහු වෙත් ද, **ඉදම්**= මේ වෘත්තය; **ශුද්ධවිරාට්**= 'ශුද්ධ විරාජ්'යයි; **මතම්**= දන්නා ලදී.

**ප**:—පාදාන්තයෙහි යතියයි. "ශුද්ධවිරාඩ්-(ට්)" යන සංස්කෘත ප්‍රථමාවිභක්ත්‍යන්තය සිංහලයෙහි ප්‍රකෘතිවශයෙන් ගැන්ම වර දැකී "ශුද්ධවිරාජ්" යනු ප්‍රකෘතියි. "ඡශෂරාජාදෙඃ ෂඃ" (සා: 4. 4. 17.) යනාදීන් උක්තකාර්‍ය්‍ය වූ කල "ශුද්ධවිරාඩ්, ශුද්ධවිරාට්" යන

40\. 2. ම්නෞ යෞ චෙති පණවනාමෙදම්.
41\. 3. ජ්‍රෞ ර්ගෞ මයූරසාරිණී ස්‍යාත්.
42\. 4. භ්මෞ සගයුක්තෞ රුක්මවතීයම්.
43\. 5. ඥෙයා මත්තා මභසගයුක්තා.
44\. 6. න්‍රජගෛර්භවෙන්මනොරමා.
45\. 7. ත්‍රිසගා අපි මෙඝවිතානම්.

---

පද සිද්ධ වේ. තත්සමවශයෙන් සිංහලයට ශබ්ද ගන්නාවිට ප්‍රකෘතිය ම ගණු ලැබේ. "යුජ්, ත්‍රිෂ්ටුභ්, අනුෂ්ටුභ්, භද්‍රවිරාජ්" යනාදිය ද මෙසේ මැයි

40\. 2. **ම්නෞ**= මගණ නගණයෝ වෙත් ද; **යෞ ච**=(නැවැත) යගණ ගුරුහු වෙත් ද; **ඉති**= මෙසේ බඳනාලද; **ඉදම්**= මේ වෘත්තය; **පණවනාම**= 'පණව' නමි.

**ප**:—"ම්තෞ ජෞ චෙති පණවනාමකම්"යි ඇතැම් පොත් වල පැණේ. 'ම-ත-ජ'ගණ ගුරු වේ නම් 'පණව' නමි-යනු එහි අදහසයි. හේ "පණවො ම්නෞ යෞ" යන පිඞ්ගලවචනයට විරුද්ධ හෙයින් අනඞ්ගීකෘත ය අකුරු පසකින් පසකින් යතිය වේ.

41\. 3. **ජ්‍රෞ**= රගණජගණයෝ වෙත් ද; **ර්ගෞ**= රගණ ගුරුහු වෙත් ද; **මයූරසාරිණී ස්‍යාත්**=(ඒ වෘත්තය)'මයූරසාරිණී' නම් වන්නේ ය.

**ප**:—පාදාන්තයෙහි යතිය වේ.

42\. 4. **භ්මෞ**= භගණමගණයෝ; **සගයුක්තෞ**= සගණගුරුන් ගෙන් යුක්ත වෙත් ද; **ඉයම්**= මේතොමෝ **රුක්මවතී** 'රුක්ම වතී' නමු.

**ප**:—"චම්පකමාලා චෙද්භමසාද්ගඃ" යි ඇතැම් පොත්වල පෙණෙන සූත්‍රයෙහි ද මෙකී ලක්ෂණ අන්තර්ගත ය. එහෙයින් රුක්මවතියට 'චම්පකමාලා' යනු ද අපරනාමයකැයි ගැණීම යොග්‍යයි. මීට "පඤ්චකමාලා'යයි ද කියති 'රූපවතී'යනු ද නමකි. පාදාන්තයෙහි යතියයි. "ඉන්ද්‍රියබාණෛශ්චිත්‍ර විරාමඃ-සා කථනීයා චම්පකමාලා"යි පසකින් පසකින් යති වේ යයි කාලිදාසයෝ කීහු.

43\. 5. **මභසගයුක්තා**= මගණ භගණ සගණ ගුරු යන මොවුන් ගෙන් යුක්ත වූවා; **මත්තා**='මත්තා' යයි; **ඥෙයා**= දත යුත්තී ය.

**ප**:—සතරකින් හා සයකින් යතියයි.

44\. 6. **න්‍රජ්ගෛඃ**= නගණ - රගණ - ජගණ - ගුරුන්ගෙන්; **මනොරමා භවෙත්**= 'මනොරමා'වෘත්තය වන්නේය.

**ප**:—පාදාන්තයෙහි යතියයි.

45\. 7. **අපි**= නැවැත; **ත්‍රිසගාඃ**= සගණ තුණක්ය ගුරක්ය යන මොහු වෙත් නම්; **මෙඝවිතානම්**= 'මෙඝවිතාන' වෘත්තයි.

46. 8. රශ්ච සෞ සගුරුර් මණිරාගඃ.
47. 9. චරිතගතිස්තු තජතගෛඃ.
48. 10. තෞජෞ ජෝ ගුරුණේයමුපස්ථිතා.

**11. අථ ත්‍රිෂ්ටුභි—2048.**

49. 1. [1]ස්‍යාදින්ද්‍රවජ්‍රා යදි තෞ ජගෞ ගඃ.
50. 2. උපෙන්ද්‍රවජ්‍රා ජතජාස්තතො ගෞ.

---

46. 8. **රශ්ච**= රගණය වේ ද; **සෞ**=(නැවත) සගණ දෙදෙනෙක් වෙත් ද, **සගුරුඃ**= (අන්තය) ගුරක් සහිත වේ ද; **මණිරාගඃ**= ඒ වෘත්තය 'මණිරාග' නම්.

47. 9. **තජතගෛඃ තු**= තගණ-ජගණ-තගණ-ගුරුන්ගෙන් වතාහි; **චරිතගතිඃ**= 'චරිතගති'නම් වෘත්තය වේ

48. 10. **තෞජෞ**= තගණ ජගණයෝ වෙත් ද; **ජඃ**= (නැවැත) ජගණයක් වේ ද; **ගුරුණා**=(අන්තයෙහි) ගුරකින් යුක්තවූ; **ඉයම්**- මෝ තොමෝ; **උපස්ථිතා**- 'උපස්ථිතා' නමු.

**ප:**—පඤ්චිකාකාරයන් සහ සිංහලව්‍යාඛ්‍යාකාරයෝ ද සමහර ටීකාකාරයෝ ද මේ වෘත්තය අන්තයෙහි අතිකුද්‍ර ගුරක් හෙළා ත්‍රිෂ්ටුප්ඡන්දසට ඇතුළත් කොට "තෞජෞ ජෞ ගුරුණේ'ය මුපස්ථිතො ක්තා"යි ගත්හ. එය පිඞ්ගලමතයට විරුද්ධවන හෙයින් පඞ්ක්තිච්ඡන්දසට ම ඇතුළත් කෙළෙමු. "උපස්ථිතා තෞජෞ ජෞගෞ" යනු සූත්‍රයි. මීට හලායුධයෝ මෙසේ උදාහරණ දක්වූහ:-

"ඒෂා ජගදේකමනෝහරා-කාන්‍යා කනකෝජ්ජ්වලදීධිතිඃ
ලක්ෂ්මීරිව දූනවසූදනං-පුණ්‍යෛස්තිරතාථමුපස්ථිතා"

මෙහි අකුරු දෙකකින් හා අටකින් යතිය වේ.

"ශුද්ධයා හංසී මහතගයුතා' - "දීපකමාලා වෙදහමෞ ජගෞ" යන වෘත්තසූත්‍රයෝ ද සමහර පොත්වල පැණෙත්.

**11. අථ**= ඉක්බිත්තෙන්; **ත්‍රිෂ්ටුභි**= ත්‍රිෂ්ටුප්ඡන්දසෙහි වෘත්තයෝ කියනු ලැබෙත්.

49. 1. **යදි**= ඉදින්; **තෞ**= තගණ දෙදෙනෙක් වෙත් ද; **ජගෞ**= (නැවැත) ජගණ ගුරුහු වෙත් ද; **ගඃ**=(අන්තයෙහි) ගුරක් වේ ද; **ඉන්ද්‍රවජ්‍රා ස්‍යාත්**= ඒ වෘත්තය 'ඉන්ද්‍රවජ්‍රා' නම් වන්නේය.

**ප:**—පාදාන්තයෙහි යතිය වේ.

50. 2. **ජතජාඃ**= ජගණ-තගණ-ජගණයෝ වෙත් ද; **තතඃ**= ඉන් පසු; **ගෞ**= ගුරු දෙදෙනෙක් වෙත් ද; **උපෙන්ද්‍රවජ්‍රා**= ඒ වෘත්තය 'උපෙන්ද්‍රවජ්‍රා' නම්.

**ප:**—පාදාන්තයෙහි යතිය වේ.

---

1. මීට මුලින් "මඃ සෞ ජෞ ගුරුයුගමච්ඡකාරූපම්" යනු ද පඤ්චිකාවෙහි පැණේ.

51. 3. අනන්තරෝදීරිතලක්ඛමභාජෞ
පාදෞ යදීයාවුපජාතයස්තාඃ,
ඉත්ථං කිලාන්‍යාස්වපි මිශ්‍රිතාසු
[1]වදන්ති ජාතිෂ්විදමෙව නාම.

---

51. 3. **යදීයෞ** - යම් වෘත්තයක් පිළිබඳ වූ; **පාදෞ** - පාදයෝ; දෙදෙන; **අනන්තරෝදිරිතලක්ෂ්මභාජෞ**= අනන්තර කොට කියනලද ඉන්ද්‍රවජ්‍රා උපේන්ද්‍රවජ්‍රා දෙදෙනාගේ ලක්‍ෂණ භජනය කරත් ද; **තාඃ**= ඔහු; **උපජාතයඃ**= 'උපජාති' නම් වෙති. **ඉත්ථම්**= මෙසේ; **අන්‍යාසු**= සෙසු ඡන්දෝජාතීන්; **මිශ්‍රිතාසු අපි**= මිශ්‍ර කළ කල්හි දු; **ඉදං එව නාම**= මේ 'උපජාති' යන නම ම; **වදන්ති**= කියත්.

ප:—ඉන්ද්‍රවජ්‍රා-උපේන්ද්‍රවජ්‍රා පාදයන් මිශ්‍ර කොට පාදචතුෂ්කය බඳනාලද්දේ 'උපජාති' නමි. ඒ දෙක මිශ්‍ර වීමෙන් භෙද තුදුසක් ලැබේ. මේ දක්වනු ලබන ප්‍රස්තාරයෙන් එය දත හැකියි. ප්‍රස්තාරයෙහි 'ඉ' යන්නෙන් ඉන්ද්‍රවජ්‍රාව ද, 'උ' යන්නෙන් උපේන්ද්‍රවජ්‍රාවද හඳුන්වනු ලැබේ. "ඉ ඉ ඉ ඉ"යි ඉන්ද්‍රවජ්‍රාව මුලට තබා ගත යුතු. පාදසතර ම ඉන්ද්‍රවජ්‍රා හෙයින් මෙයින් එය බැහැර කෙළෙමු. අනන යෙහි ලැබෙන "උ උ උ උ" යන්න ද ශුද්ධ උපේන්ද්‍රවජ්‍රා හෙයින් බැහැර කරණ ලදී. චතුරක්‍ෂරච්ඡන්දස ප්‍රස්තාර කරන් නාක් මෙන් 'ඉ, උ' වර්ණ යන් යොදා ආද්‍යන්තයන් හළවිට උපජාති භෙද ලැබේ. ප්‍රථමපාදය උපේන්ද්‍රවජ්‍රාලක්‍ෂණයෙනුත් සෙසු පාද තුණ ඉන්ද්‍රවජ්‍රාලක්‍ෂණ යෙනුත් බඳනාලද්දේ 'කීර්ති' නම් උපජාතිය-යනාදි වශයෙන් මෙහි ක්‍රමය දතයුතු. උදාහරණ ස්වයං චින්ත්‍යයි.

| 1. පාදය | 2. පාදය | 3. පාදය | 4. පාදය | නම | |
|---|---|---|---|---|---|
| උ | ඉ | ඉ | ඉ | කීර්ති | 1 |
| ඉ | උ | ඉ | ඉ | වාණී | 2 |
| උ | උ | ඉ | ඉ | මාලා | 3 |
| ඉ | ඉ | උ | ඉ | ශාලා | 4 |
| උ | ඉ | උ | ඉ | හංසී | 5 |
| ඉ | උ | උ | ඉ | මායා | 6 |
| උ | උ | උ | ඉ | ජායා | 7 |
| ඉ | ඉ | ඉ | උ | බාලා | 8 |
| උ | ඉ | ඉ | උ | ආර්ද්‍රා | 9 |
| ඉ | උ | ඉ | උ | භද්‍රා | 10 |
| උ | උ | ඉ | උ | ප්‍රේමා | 11 |
| ඉ | ඉ | උ | උ | රාමා | 12 |
| උ | ඉ | උ | උ | ඍද්ධි | 13 |
| ඉ | උ | උ | උ | බුද්ධි | 14 |

1. සමරතති.

52. 4. ¹නජජලෛගෛගදිතා සුමුඛී.
53. 5. දෝධකවෘත්තමිදං භභභාද්ගෞ.

---

සංග්‍රහශ්ලෝකා:-

"කීර්ත්තිර්වාණී තථා මාලා ශාලා හංසී තථෛව ච,
මායා ජායා තථා බාලා ආර්ද්‍රා භද්‍රා තතඃ පරම්.
ප්‍රේමා රාමා තථා ඍද්ධිඃ බුද්ධිශ්චෛව විචක්ෂණෛඃ,
උක්තාන්‍යේතානි නාමානි විඥේයානි යථාක්‍රමම්."

මෙසේ ජගතී ආදි ජාතීන්හි ද සමානඅක්ෂරසඞ්ඛ්‍යා සමාන යති ඇති වෘත්තයන් මිශ්‍ර වූ කල්හි මේ 'උපජාති' නාමය ම කියත්. මෙහි 'ඉත්‍ථම්' යන පදයෙන් විෂමවර්ණසඞ්ඛ්‍යා හා විෂම යති ඇති ජාතීන්ගේ මිශ්‍රණයෙහි උපජාති නො වේ යයි සූචිතයි. ඇතැම් ටීකාකාරයෝ—

"නමෝ'ස්තු වාචස්පතයෙ සවක්‍රිණෙ-ස්වයම්භුවෙචාපි හුතාශනාය,
අනෙන චොක්තං යදිදං මමාග්‍රතො-වනෞකසාං තච්ච
තථාස්තු නාන්‍යථා."

යන රාමායණගාථාවක් උදාහරණ කරමින් විෂමාක්ෂර ඇති වෘත්ත කීපයක පාද මිශ්‍ර වීමෙහි ද උපජාති වෙතැයි ද, 'සමාක්ෂර පාද ඇති වෘත්තමිශ්‍රණයෙහි පමණක් උපජාති ලැබේ, යන මතය ගරු නො කට යුතු යයි ද කියති වෘත්තිකාර හලායුධයෝ එසේ නො කීහ. ඉන්ද්‍රවංශා-වංශස්ථපාදමිශ්‍රණයෙන් ද උපජාති තුදුසක් ලැබේ. ශාලිනී-වාතෝර්මිවෘත්තමිශ්‍රණයෙන් ද, අන්‍යවූ ස්වල්ප භෙද ඇති වෘත්තයන්ගේ මිශ්‍රණයෙන් ද උපජාති ලැබේ.

උපජාතීන් විෂම අර්ධසමස්වරූප නමුදු සමවෘත්තයන් අතර උපන්‍යාස කරණලද්දේ සමවෘත්තපාදයන්ගෙන් කරණලද හෙයිනි.

52 4. **නජජලෛගෛඃ**= නගණ-ජගණ-ජගණ-ලඝු-ගුරුන්ගෙන්; **සුමුඛී**= 'සුමුඛී' වෘත්තය වේ යයි; **ගදිතා**= කියනලදී.

**ය**:—අකුරු පසකින් ද ඉන් පසු සයකින් ද යති වේ

53. 5. **භභභාද්**= භගණත්‍රයයකින් පර ව; **ගෞ**- ගුරුදෙදෙනෙක් වෙත් ද; **ඉදම්**- මේ වෘත්තය; **දෝධකම්**-'දෝධක' නම්.

**ය**:-පාදන්තයෙහි යතිය වේ.

---

1. සජජාලගෛඃ.

54. 6. ශාලින්‍යුක්තා ම්තෞ ත්ගෞ ගෝ'බ්ධිලෝකෛඃ.
55. 7. වාතෝර්මීයං ගදිතා ම්භෞ ත්ගෞ ගඃ.
56. 8. ම්භෞ න්ලෞ ගඃ ස්‍යාද්භ්‍රමරවිලසිතම්.
57. 9. බාණරසෛඃ ශ්‍රීභ්තනගගෛඃ ස්‍යාත්.
58. 10. රාන්නරාවිහ රථෝද්ධතා ලගෞ.
59. 11. ස්වාගතේති රනභාද්ගුරුයුග්මම්.

---

54. 6. **ම්තෞ**= මගණ-තගණයෝ වෙත් ද; **ත්ගෞ**= තගණ ගුරුහු වෙත් ද; **ගඃ**- (නැවැත) ගුරක් වේ ද; **අබ්ධිලෝකෛඃ**- සතරකින් හා සතකින් යතිය වේ ද; **ශාලිනී**- ඒ වෘත්තය 'ශාලිනී' නමැයි; **උක්තා**- කියනලදී.

55. 7. **ම්භෞ**- මගණ-භගණයෝ වෙත් ද; **ත්ගෞ**- තගණ ගුරුහු වෙත් ද; **ගඃ**- ගුරක් වේ ද; **ඉයම්**- (ශාලිනියෙහි කී යති ඇති) මේ තොමෝ; **වාතෝර්මී**- 'වාතෝර්මී' නමැයි; **ගදිතා**- කියනලද්දී.

**ප**:-හතරකින් හා හතකින් යතිය වේ.

56. 8. **ම්භෞ**- මගණ-භගණයෝ වෙත් ද; **න්ලෞ**- නගණ ලඝුහු වෙත් ද; **ගඃ**- (අන්තයෙහි) ගුරක් වේ ද; **භ්‍රමරවිලසිතං ස්‍යාත්**- 'භ්‍රමරවිලසිත'නම් වන්නේ ය.

**ප**:—හතරකින් ද හතකින් ද යති වේ.

57. 9. **භ්තනගගෛඃ**- භගණ-තගණ-නගණ-ගුරු-ගුරු යන මොවුන්ගෙන්; **ශ්‍රීඃ ස්‍යාත්**- 'ශ්‍රී' වෘත්තය වේ. **බාණරසෛඃ**- පස කින් හා සයකින් යති වේ.

**ප**:—මීට 'සත්‍රී' යනු ද ඇතැම් පොත්වල පෙණේ.

58. 10 **ඉහ**- මෙහි; **රාන්**- රගණයෙන් පරව; **න්රෞ**-නගණ රගණයෝ වෙත් ද; **ලගෞ**- ලඝුගුරුහු වෙත් ද; **රථෝද්ධතා**- ඒ වෘත්තය 'රථෝද්ධතා' නම්.

**ප**:—පාදන්තයෙහි යතියයි.

59. 11. **රනභාත්**- රගණ-නගණ-භගණ යන මෙයින් පරව; **ගුරුයුග්මම්**- ගුරුයුවලක් වේ ද; **ඉති**- මෙසේ වූ වෘත්තය; **ස්වාගතා**- 'ස්වාගතා' නම්.

**ප**:—පාදන්තයෙහි යතිය වේ.

60. 12. නනසගගුරුරචිතා වෘන්තා.
61. 13. නනරලගුරුභිඃ සුභද්‍රිකා.
62. 14. [1]ශ්‍යෙනිකා රජෞ රලෞ ගුරුර්‍යදා.
63. 15. මෞක්තිකමාලා යදි භතනාද්ගෞ.

---

60. 12. **නනසගගුරුරචිතා**- නගණ-නගණ-සගණ-ගුරු ගුරු යන මොවුන්ගෙන් රචනා කරණලද්දී; **වෘන්තා**- 'වෘන්තා' නමි.

**ප:**—මේ වෘත්තයට ''වෘත්තා''යයි ද කියති ''වෘන්තා නෞ සෞ ග්'' යන පිඞ්ගලසූත්‍රයෙන් හා ''ඵලමිව පවනහතං **වෘන්තාත්**'' යන හලායුධයන්ගේ උදාහරණ ශ්ලෝකපාදයෙන් ද මීට 'වෘන්තා' යනු ම සම්මතබව ස්ඵුට වේ 'පෘථ්වී'යයි ද කියති. සතරකින් ද සතකින් ද යති වේ.

61. 13. **නනරලගුරුභිඃ**= නගණ-නගණ-රගණ-ලඝු-ගුරු යන මොවුන්ගෙන් යුක්ත වෘත්තය; **සුභද්‍රිකා**= 'සුභද්‍රිකා' නමි.

**ප:**—මීට 'භද්‍රිකා' යයි ද කියති. 'චන්ද්‍රිකා' යයි ඇතැම්පොත්වල පෙණේ. පාදාන්තයෙහි යතියයි.

62. 14. **යදා**= යම්කලෙක්හි; **රජෞ**= රගණ-ජගණයෝ ද; **රලෞ**=රගණ ලඝුහු ද වෙත් ද; **ගුරුඃ**=ගුරක් වේ ද; **ශ්‍යෙනිකා**= ඒ වෘත්තය 'ශ්‍යෙනිකා' නමි.

**ප:**—ලක්දිව පොත්හි මීට 'වෛතිකා'යයි දක්නාලැබේ. ඒ ලිපිභ්‍රාන්තියක් බව ''ශ්‍යෙනී ජෞ ලෞ ග්'' යන පිඞ්ගල සූත්‍රයෙන් හා ''**ශ්‍යෙනිකේව** සා විගර්හිතාඞ්ගනා'' යන උදාහරණයෙන් ද, ''ශ්‍යෙනත්‍යුදීරිතා රජෞ රලෞ ගුරුඃ'' යන ඡන්දෝමඤ්ජරී වචනයෙන් ද ස්ඵුට වේ. පාදාන්තයෙහි යතියයි.

63. 15. **යදි**= ඉදින්; **භතනාත්**= භගණ-තගණ-නගණයන් ගෙන් පරව; **ගෞ**= ගුරු දෙදෙනෙක් වෙත් නම්; **මෞක්තික මාලා**= ඒ වෘත්තය 'මෞක්තිකමාලා'නමි.

**ප:**—පසකින් ද සයකින් ද යතිය වේ. ''අත්‍රානුක්තං ගාථා'' යන්හට අනතුරුව ''කුඩ්මලදන්තී භෞ න්ගෞ ගිඥ්‍රියරසාඃ'' යන සූත්‍රය හදුරා පිඞ්ගලයන් විසින් 'කුඩ්මලදන්තී' නම් ගාථාව යයි කියනලද්දේ මේ වෘත්තයයි. කේදාරභට්ටයෝ ඒ මතය නො පිළිගෙණ ගාථානාමයෙන් මුක්ත කොට මෙහි යෙදූහ.

---

1. ශෙවයිකා

64. 16. උපස්ථිතමිදං ජ්සෞ තාද්‍යකාරෞ.
65. 17. මඃ සො ජෝ ගුරුයුගම්මෙකරූපම්.

**12. අථ ජගත්‍යාම් –4096.**

66. 1. වංශස්ථවිලම් 'නිගදන්ති රනභසෛඃ
67. 2. ජතෞ තු වංශස්ථමුදීරිතං ජරෞ.
68. 3. ස්‍යාදින්ද්‍රවංශා තතජෛ රසංයුතෛඃ.
69. 4 ඉහ තොටකමම්බුධිසෛඃ ප්‍රමිතම්.

---

64. 16. **ජ්සෞ**= ජගණසගණයෝ වෙත් ද; **තාත්**= (¹ඉන් පසු ව යෙදුනු) තගණයෙන් පර ව; **ගකාරෞ**= ගුරු දෙදෙනෙක් වෙත් ද; **ඉදම්**= මේ වෘත්තය; **උපස්ථිතම්**= 'උපස්ථිත'නම්.

**ප:**—පාදන්තයෙහි යතියයි

65. 17 **මඃ**= මගණය වේ ද; **සඃ**=(නැවැත)සගණය වේ ද; **ජඃ**= (අනතුරුව) ජගණය වේ ද; **ගුරුයුගම්**= අන්තයෙහි ගුරු යුවලක් වේ ද; **එකරූපම්**= ඒ වෘත්තය 'එකරූප'නම්.

**ප:**—ශ්‍රැතිසුඛ සේ යතිය කට යුතු.

**12. අථ**= ඉක්බිත්තෙන්; **ජගත්‍යාම්**= ජගති ඡන්දසෙහි වෘත්ත කියනුලැබේ.

66. 1. **රනභසෛඃ**= රගණ-නගණ-භගණ-සගණයන්ගෙන්; **වංශස්ථම්**= 'වංශස්ථම්' නම් වෘත්තය; **නිගදන්ති**= කියත්.

**ප:**—හතරකින් ද අටකින් ද යතිය වේ.

67. 2. **ජතෞ**= ජගණ-තගණයෝ වෙත් ද; **තු**= නැවත; **ජරෞ**= ජගණ-රගණයෝ වෙත් ද; **වංශස්ථම්**= ඒ වෘත්තය 'වංශස්ථ'යයි; **උදීරිතම්**= කියනලදී.

**ප:**—පාදන්තයෙහි යතියයි. මීට 'වංශස්ථවිල,' 'වංශස්තනිත' යයි ද කියති

68. 3. **රසංයුතෛඃ**= (අන්තයෙහි) රගණයකින් යුක්ත වූ; **තතජෛඃ**=තගණ-තගණ-ජගණයන්ගෙන් හෙවත් 'ත-ත-ජ-ර'ගණයන්ගෙන්; **ඉන්ද්‍රවංශා ස්‍යාත්**='ඉන්ද්‍රවංශා' නම් වෘත්තය වේ.

**ප:**--පාදන්තයෙහි යතියයි.

69. 4. **ඉහ**= මෙහි; **අම්බුධිසෛඃ**= සගණසතරකින්; **ප්‍රමිතම්**= ප්‍රමාණකරණලද වෘත්තය; **තොටකම්**= 'තොටක' නම්.

**ප:**—පාදන්තයෙහි යතියයි.

---

1. ගදිතතකු.

70. 5. ද්‍රුතවිලම්බිතමාහ නභෞ භරෞ.
71. 6 වසුයුගවිරතිර්නෞ ම්‍යෞ පුටෝ'යම්
72. 7. ප්‍රමුදිතවදනා භවෙන්නෞ රරෞ.
73 8. නයසහිතෞ න්‍යෞ කුසුමවිචිත්‍රා.
74. 9. රසෛර්ජසජසා ජලෝද්ධතගතිඃ.

---

70. 5. **නභෞ** - නගණ-භගණයෝ වෙත් ද; **භරෞ** - භගණ-රගණයෝ වෙත් ද; **ද්‍රුතවිලම්බිතම්** - ඒ වෘත්තය 'ද්‍රුතවිලම්බිත' යයි; **ආහ** - කියයි

**ප**:—පාදන්තයෙහි යතියයි.

71. 6. **නෞ**-නගණයෝ දෙදෙනෙක් වෙත් ද;**ම්‍යෞ**-මගණ-යගණයෝ වෙත් ද; **වසුයුගවිරතිඃ** - අකුරු අටකින් හා සතරකින් යතිය වේ ද; **අයම්** - මේ; **පුටඃ** - 'පුට' නම්.

**ප**:—සමහරටීකාවෙක "මුනිශරවිරතිඃ" යන පාඨය ගෙණ "මුනිභිඃ-සප්තභිඃ, ශරෛඃ-පඤ්චභිශ්ච විරතිර්යත්‍ර"යි කියනලදී. ඒ ටීකාකාරයා "පුටෝ නෞ ම්‍යෞ වසුසමුද්‍රාඃ" යන පිඞ්ගලවචනය හා නො යෙදෙයි.

72. 7. **නෞ** - නගණදෙදෙනෙක් ද; **රරෞ** - රගණ දෙදෙනෙක් ද වෙත් නම්; **ප්‍රමුදිතවදනා භවෙත්** - ඒ වෘත්තය 'ප්‍රමුදිත වදනා' නම් වන්නේ ය.

**ප**:—පාදන්තයෙහි යතියයි. 'චඤ්චලාක්ෂිකා' යනු පිඞ්ගලයන්ගේ සංඥවයි."චඤ්චලාක්ෂිකා නෞ රෞ"යනු ඔහුගේ සූත්‍රයි. 'මන්දාකිනී' යයි ජන්දෝමඤ්ජරීකාරයෝ කියති. (85. 21. බලනු) "ගෞරී නෞ රෞ"යන සූත්‍රයෙන්'ගෞරී'නම් ගාථාවයයි පිඞ්ගලයන් විසින් කියන ලද්දේත් මේ වෘත්තය මැයි.

73. 8. **නයසහිතෞ** - නගණ-යගණ සහිත; **න්‍යෞ** නගණ-යගණයෝ වෙත් ද; **කුසුමවිචිත්‍රා** - ඒ වෘත්තය 'කුසුමවිචිත්‍රා' නම්.

**ප**:—පාදන්තයෙහි යතියයි.

74. 9. **ජසජසාඃ** - ජගණ-සගණ-ජගණ-සගණයෝ වෙත් ද; **රසෛඃ** - සයකින් සයකින් යති වේ ද; **ජලෝද්ධතගතිඃ** - ඒ වෘත්තය 'ජලෝද්ධතගති' නම්.

**ප**:—"රසාශ්ච රසාශ්ච-රසාඃ, එකශෙෂද්වන්ද්වයයි. තෛඃ රසෛඃ.

75\. 10. චතුර්ජගණං වද මෞක්තිකදාම.
76\. 11. [1]භුජඞ්ගප්‍රයාතම් භවෙද්‍යෛශ්චතුර්භිඃ.
77\. 12. රෛශ්චතුර්භිර්යුතා ස්‍රග්විණී සම්මතා.
78\. 13. භුවි භවෙන්නභජරෛඃ ප්‍රියංවදා.
79\. 14. ත්‍යෞ ත්‍යෞ මණිමාලා ඡින්නා ගුහවක්ත්‍රෛඃ.
80\. 15. ධීරෛරභාණි ලලිතා තභෞ ජරෞ.

---

75\. 10. **චතුර්ජගණම්**- ජගණසතරක් ඇති වෘත්තය; **මෞක්තිකදාම**- 'මෞක්තිකදාමන්' නමැයි; **වද**- කියව.

**ප**:—මේ වෘත්තය පඤ්චිකාදියෙහි නො පැණේ. පාදාන්තයෙහි යතිය වේ.

76\. 11. **චතුර්භිඃ යෛඃ**- යගණසතරකින්; **භුජඞ්ගප්‍රයාතං භවෙත්**- 'භුජඞ්ගප්‍රයාත' නම් වෘත්තය වේ.

**ප**:—පාදාන්තයෙහි යතියයි. පිඞ්ගලනාගතෙමේ ද්වාදශාක්ෂර ප්‍රස්තාරයෙහි යගණචතුෂ්කස්ථානයට පැමිණ ගරුඩයාගෙන් මුක්ත ව සමුද්‍රයෙහි නිමග්න වී යයි කියනු ලැබේ. එහෙයින් යගණචතුෂ්කයට 'භුජඞ්ගප්‍රයාත' යන නාමය වී ලූ.

77\. 12. **චතුර්භිඃ රෛඃ**= රගණසතරකින්; **යුතා**= යුක්ත වූවා; **ස්‍රග්විණී**= 'ස්‍රග්විණී' යයි; **සම්මතා**= සම්මත ය.

**ප**:—පාදාන්තයෙහි යතියයි.

78\. 13. **භුවි**= ලොකයෙහි; **නභජරෛඃ**= නගණ-භගණ-ජගණ-රගණයන්ගෙන්; **ප්‍රියංවදා භවෙත්**= 'ප්‍රියංවදා' නම් වෘත්තය වේ.

**ප**:—පාදාන්තයෙහි යතිය වේ.

79\. 14. **ත්‍යෞ**= (යම් වෘත්තයෙක්හි) තගණයගණයෝ ද; **ත්‍යෞ**= තගණ යගණයෝ ද වෙත් ද; **ගුහවක්ත්‍රෛඃ**= ස්කන්ද මුඛයන්ගෙන් හෙවත් සයකින් සයකින්; **ඡින්නා**= යතිවශයෙන් පිරිසිඳිනලද්දී ද; **මණිමාලා**= ඒ වෘත්තය 'මණිමාලා' නම්.

80\. 15. **තභෞ**= තගණ-භගණයෝ වෙත් ද; **ජරෞ**= ජගණ-රගණයෝ වෙත් ද; **ලලිතා**= ඒ වෘත්තය 'ලලිතා' නමැයි; **ධීරෛඃ**= ධීරයන් විසින්; **අභාණි**= කියනලදී.

**ප**:—පාදාන්තයෙහි යතියයි.

---

1\. චතුර්භිර්යකාරෛර්භුජඞ්ගප්‍රයාතම්.

81. 16. ප්‍රමිතාක්ෂරා සජසසෛරුදිතා
82. 17. නනභරසහිතාභිහිතොජ්ජ්වලා.
83. 18. පඤ්චාශ්වෛශ්ඡින්නා වෛශ්වදේවී මමෞ යෞ.
84. 19. අබ්ධ්‍යෂ්ටාභිර්ජලධරමාලා මෞභෞ සෞමෞ.
85. 20. ඉහ [1]නවමාලිනී [2]නජභයෛඃ ස්‍යාත්.

---

81. 16. **සජසසෛඃ**= සගණ-ජගණ-සගණ-සගණයන්ගෙන්; **ප්‍රමිතාක්ෂරා උදිතා**= 'ප්‍රමිතාක්ෂරා' වෘත්තය කියනලදී.

**ප**:—පාදාන්තයෙහි යතියයි.

82. 17. **නනභරසහිතා**= නගණ-නගණ-භගණ-රගණයන් ගෙන් යුක්ත වූවා; **උජ්ජ්වලා අභිහිතා**= 'උජ්ජ්වලා' යයි කියන ලදී.

**ප**:—පාදාන්තයෙහි යතියයි.

83. 18. **මමෞ**= මගණ දෙදෙනෙක් ද; **යෞ**=(නැවැත) යගණ දෙදෙනෙක් ද වෙත් ද; **පඤ්චාශ්වෛඃ**= පසකින් හා සතකින්; **ඡින්නා**= යතිහෙයින් පිරිසිඳිනලද ද; **වෛශ්වදේවී**= ඒ වෘත්තය 'වෛශ්වදේවී' නම්.

84. 19. **මෞභෞ**=(යම් වෘත්තයෙක්හි) මගණ-භගණයෝ වෙත් ද; **සෞමෞ**= සගණ-මගණයෝ වෙත් ද; **අබ්ධි+අෂ්ටාභිඃ**= සතරකින් හා අටකින් යතිහෙයින් පිරිසිඳින ලද ද; **ජලධරමාලා**= ඒ වෘත්තය 'ජලධරමාලා' නම්.

**ප**:—පිඞ්ගලයන් විසින් මිට 'කාන්තොත්පීඩා' යයි කියන ලදැයි නාරායණභට්ටයෝ කියති. කාන්තොත්පීඩාවෙහි ලක්ෂණ මෙයින් භින්නයි. "කාන්තොත්පීඩා භ්මෞ සෞමෞ"–'භ-ම-ස-ම' ගණ ඇත්තී 'කාන්තොත්පීඩා' නමු. ඊට උදාහරණ මෙසේ දැක්වූහ:—

"කාමශරෛර්ව්‍යාප්තා බලු කාන්තොත්පීඩා
මාපන්නවතී දුඃඛෛඃ පරිමූහ්‍යන්ති යා"

කාන්තොත්පීඩාවෙහි යතිය පාදාන්තයෙහි වේ. මීට පිඞ්ගලයන්ගේ සංඥාව ද 'ජලධරමාලා' යනු ම ය. ඒ ඔහු විසින් ගාථාභියෙන් ආරෝපිත ය. "ජලධරමාලා මෞභෞ සෞමෞ සමුද්‍රවසවඃ" යනු පිඞ්ගලසූත්‍රයි. සමවෘත්ත හෙයින් කෙදාරයෝ මෙහි ම යෙදූහ.

85. 20. **ඉහ**= මෙහි; **නජභයෛඃ**= නගණ-ජගණ-භගණ-යගණයන්ගෙන්; **නවමාලිනී ස්‍යාත්**= 'නවමාලිනී' වෘත්තය වේ.

---

1. නවමාලිකා. 2. නජපරෞ භ්‍යෞ.

86. 21. සවරශරවිරතිර්නනෞ රෞ ප්‍රභා.
87. 22. භවති නජාවථ මාලතී ජරෞ.
88. 23. ඉති වද තාමරසං නජජ්‍යඃ.

---

පෘ:—අකුරු අටකින් හා සතරකින් යතිය වේ.

86. 21. **නනෞ**= නගණ දෙදෙනෙක් වෙත් ද; **රෞ**= නැවත රගණයෝ දෙදෙනෙක් වෙත් ද; **සවරශරවිරතිඃ**= හතකින් හා පසකින් වූ යති ඇත්තී ද; **ප්‍රභා**= ඕ තොමෝ 'ප්‍රභා' නම්.

**පෘ**:—මේ වනාහි **ප්‍රමුදිතවදනා** වෘත්තයට වඩා ලක්‍ෂණයෙන් වෙනසක් නැති නමුදු යතියෙන් වෙනස් වන හෙයින් යතිස්ථාන ද පිරිසිඳ අන්‍යවෘත්තයක් සේ දක්වනලදී. වෘත්ත දෙක්හි භෙදය යතියෙන් පමණකි. (72. 7. බලනු.)

87. 22. **නජෞ**= නගණ-ජගණයෝ වෙත් ද; **අථ**= නැවත; **ජරෞ**= ජගණ-රගණයෝ වෙත් ද; **මාලතී භවති**= 'මාලතී' නම් වෘත්තය වේ.

**පෘ**:—පසකින් හා සතකින් යතිය වේ. "වරතනුර් නෞජෞ ජ්‍රෞ ෂඩ්සාඃ" යන සූත්‍රයෙන් 'වරතනු' නම් ගාථා යයි පිඞගල යන් විසින් කියනලද්දේ මෙබඳු වෘත්තයකි. එහි නම් සයකින් සයකින් යති වේ යයි සූත්‍රයෙහි ම කියනලදී. ඊට හලායුධ යන්ගේ උදාහරණ මෙසේයි:-

"අයි විජහිහි දෘඪොපගූහනං
ත්‍යජ නවසඞ්ගමභීරු වල්ලභම්,
අරුණකරොද්ගම එෂ වර්තතෙ
**වරතනු** සම්ප්‍රවදන්ති කුක්කුටාඃ."

(ජානකීහරණ සංදෙපනය බලනු )

**උදාහරණ** වශයෙන් දක්වූ මේ ශ්ලෝකයෙහි යතිය සූත්‍රයට විරුද්ධ ය.

88. 23. **නජජාත්**= නගණ-ජගණ-ජගණයන්ගෙන් පර ව; **යඃ**- යගණය වේ ද; **ඉති**- මෙසේ වූ වෘත්තය; **තාමරසම්**= 'තාමරස' යයි; **වද**- කියව.

**පෘ**:—මීට "අභිනව තාමරස' යයි ද, 'ලලිතපද' යයි ද කියති. පාදාන්තයෙහි යතිය වේ.

(1) "ජහෞ ජරෞ වදති **පඤ්චචාමරම්** (2) නයුගරයුගලං ච **ශෞරි මතා** (3) පඤ්චමුනී මෞ සාත් සයුතා **ලලනා** (4) **ලලිත**

## 13. අථාතිජගත්‍යාම්—8192.

89. 1. තුරගරසයතිර්නෞ තතෞ ගඃ ක්ෂමා.
90. 2. ම්නෞ ජ්‍රෞ ගස්ත්‍රිදශයතිඃ ප්‍රහර්ෂිණීයම්.
91. 3. චතුර්ග්‍රහෛරිහ රුචිරා [1]ජභස්ජගාඃ.
92. 4. වේදෛ රන්ධ්‍රෛර්ම්තෞ යසගා මත්තමයූරම්.

---

මභිහිතං තෞ ම්‍රෞ නාමතඃ (5) ද්‍රුතපදං භවති නභනයාශ්චෙත්” යන සූත්‍රයෝ ද දක්නා ලැබෙත්.

මෙහි ‘ලලිත’ නාමයෙන් පැණෙනුයේ “තතං තෞ ම්‍රෞ” යනුවෙන් පිඞ්ගලයන් විසින් කියනලද ‘තත’ නම් වෘත්තයයි.

**13. අථ**= ඉක්බිත්තෙන්; **අතිජගත්‍යාම්**= අතිජගතී ඡන්දසෙහි වෘත්ත කියනු ලැබේ.

89. 1. **නෞ**= නගණයෝ දෙදෙනෙක් ද; **තතෞ**= තගණයෝ දෙදෙනෙක් ද වෙත් ද; **ගඃ**= අන්තයෙහි ගුරක් වේ ද; **තුරගරස යතිඃ**= හතකින් හා සයකින් වූ යති ඇත්ති ද; **ක්ෂමා**=ඒ වෘත්තය ‘ක්ෂමා’ නමි.

පා:—‘චන්ද්‍රිකා’යයි ඇතැම්හු කියත්. “කුටිලගතිර්නෞ තෞ ග් සවරතීවඃ” යන සූත්‍රයෙන් ‘කුටිලගති’ නම් ගාථා යයි පිඞ්ගලයන් විසින් කියනලද්දේ මේ වෘත්තයයි.

90. 3. **ම්නෞ**=(යමෙක්හි)මගණ-නගණයෝ ද; **ජ්‍රෞ**=ජගණ රගණයෝ ද වෙත් ද; **ගඃ**= අන්තයෙහි ගුරක් වේ ද; **ත්‍රිදශයතිඃ**= (යමක්) තුණකින් හා දශයකින් යති ඇත්තී ද; **ඉයම්**= මෝ තොමෝ; **ප්‍රහර්ෂිණී**= ‘ප්‍රහර්ෂිණී’ නමි.

91. 3. **ජභස්ජගාඃ**= ජගණ – භගණ – සගණ – ජගණ – ගුරුහු වෙත් ද; **චතුර්ග්‍රහෛඃ**– සතරකින් හා නවයකින්(යති හෙයින්) පිරිසිඳිනලද ද; **ඉහ**= මේ ඡන්දශාස්ත්‍රයෙහි; **රුචිරා**= ඕ තොමෝ ‘රුචිරා’ නමු.

පා:—‘අතිරුචිරා’යයි ඇතැම් පොත්හි පෙණේ. නමුත් පිඞ්ගලයෝ “රුචිරා ජෞභෞ සෞජෞග් චතුර්නවකෞ”යි කීහු.

92. 4. **ම්තෞ**= මගණ-තගණයෝ වෙත් ද; **යසගාඃ**= යගණ-සගණ-ගුරුහු වෙත් ද; **වේදෛඃ**= සතරකින් ද; **රන්ධ්‍රෛඃ**= (එතැන සිට) නවයකින් ද පිරිසිඳිනලද ද; **මත්තමයූරම්**= ඒ වෘත්තය ‘මත්තමයූර’ නමි.

---

1. ජෞභෞ සජෞ ග්.

93. 5. යමෞ රෞ විඛ්‍යාතා චඤ්චරීකාවලි ගඃ.

94. 6. සජසා ජගෞ භවති මඤ්ජුභාෂිණී.

95. 7. නනතරගුරුභිඃ චන්ද්‍රිකාශ්වෂඩ්භිඃ.

**14. අථ ශක්වර්‍යාම්—16384.**

96. 1 මෙතෞ නසෞ ගාවක්ෂග්‍රහවිරතිරසම්බාධා.

---

93. 5. **යමෞ**= යගණ-මගණයෝ වෙත් ද; **රෞ**= රගණ දෙදෙනෙක් වෙත් ද; **ගඃ**= අන්තයෙහි ගුරක් වේ ද; **චඤ්චරී කාවලි**= ඒ වෘත්තය 'චඤ්චරීකාවලී' යයි; **විඛ්‍යාතා**= කියනලදී.

**ප**:—හයකින් හා හතකින් යතිය වේ.

94. 6. **සජසාඃ**= සගණ-ජගණ-සගණයෝ වෙත් ද; **ජගෞ**= ජගණ ගුරුහු වෙත් ද; **මඤ්ජුභාෂිණී භවති**– ඒ වෘත්තය'මඤ්ජුභාෂිණී' නම් වේ.

**ද**:—පසකින් හා අටකින් යති වේ. ඇතැම්හු මේ සූත්‍රය "ජතෞ සජෞ.ගො භවති මඤ්ජුභාෂිණී"යි කියත්. සමහරු මීට 'සුනන්දිනී'යයි කියත්. 'ප්‍රබොධිතා' යයි ගඞ්ගාදාසයෝ කීහ. "කනකප්‍රභා සෙජෞ සෙජෞ ග්" යන සූත්‍රයෙන්'කනකප්‍රභාගාථා' යයි පෛඞ්ගලයෙහි කියනලද්දේ මේ වෘත්ත යයි. කනකප්‍රභා වෙහි යතිය පාදාන්තයෙහි යයි කීහ.

95. 7. **නනතරගුරුභිඃ**= නගණ-නගණ-තගණ-රගණ-ගුරු යන මොවුන්ගෙන්; **චන්ද්‍රිකා**= 'චන්ද්‍රිකා' වෘත්තය වේ. **අශ්වෂඩ්භිඃ**= සතකින් හා හයකින් යති වේ.

**ප**:—මේ සුතුර "නනතතගුරුභිශ්චන්ද්‍රිකාශ්වර්තුභිඃ"යි දක්නට ලැබේ. එසේ වුවොත් 'ක්‍ෂමා' වෘත්තයට වඩා වෙනසක් නො වේ.

ඇතැම් පොත්වල (1)"**උපස්ථිත**මිදං ජෙසෞ තෙසෞ සගුරුකං චෙත්" (2) "නසරයුගගෛශ්චන්ද්‍රලේඛර්තුලොකෛඃ" (3) "ඍතුමුනියති **විද්‍යුන්න**නතෞ තෞ ගුරුඃ" යන සූත්‍රයෝ ද දක්නා ලැබෙත්. මේ 'විද්‍යුත්' වෘත්තය ද යතියෙන් භින්නවූ 'ක්‍ෂමා' වෘත්තය මැයි. "ගෞරී නෞ නසෞ ග්" යනුවෙන් පිඞ්ගලයන් කී 'ගෞරී' වෘත්තය මෙහි නො පැණේ.

**14. අථ**= ඉක්බිත්තෙන්; **ශක්වර්‍යාම්**= ශක්වරීඡන්දසෙහි වෘත්තයෝ කියනු ලැබෙත්.

96. 1. **මතෞ**= මගණ-තගණයෝ වෙත් ද; **නසෞ**= නගණ-සගණයෝ වෙත් ද; **ගෞ**= අන්තයෙහි ගුරු දෙදෙනෙක් වෙත්

97. 2. නතරසලඝුගෞඃ ස්වරෛරපරාජිතා.
98. 3. නනභන[1] ලඝුගෞඃ ප්‍රහරණ[2] කලිතා.
99. 4. (a) උක්තා වසන්තතිලකා තභජා ජගෞ ගඃ.
(b) [3]සිංහොන්නතෙයමුදිතා මුනිකාශ්‍යපෙන.
(c) උද්ධර්ෂිණීයමුදිතා මුනිසෛතවෙන.

---

ද; **අක්ෂග්‍රහවිරතිඃ**= පසකින් හා නවයකින් වූ යති ඇත්ති ද; **අසම්බාධා**= ඒ වෘත්තය 'අසම්බාධා' නම්.

97. 2. **නතරසලඝුගෞඃ**= නගණ-තගණ-රගණ-සගණ-ලඝු-ගුරු යන මොවුන්ගෙන්; **අපරාජිතා**= 'අපරාජිතා' වෘත්තය වේ. **ස්වරෛඃ**= සතකින් සතකින් යති වේ.

ප: –ස්වරශ්ච ස්වරශ්ච-ස්වරාඃ; තෛඃ. ඒකශෙෂද්වන්ද්වයි.

98. 3. **නනභනලඝුගෞඃ**= නගණ-නගණ-භගණ-නගණ-ලඝු-ගුරු යන මොවුන්ගෙන්; **ප්‍රහරණකලිතා**= 'ප්‍රහරණකලිතා' නම් වෘත්තය වේ.

ප:—සතකින් සතකින් යති වේ. 'ප්‍රහරණකලිකා' යයි ඇතැම් පොත්වල පෙණේ. පිඞ්ගලසූත්‍රයට හා හලායුධොදාහරණයටත් විරුද්ධ හෙයින් එය හළෙමු. "ප්‍රහරණකලිතාං පශුපතිදයිතාම්" යනු වෘත්තිකාරයන්ගේ උදාහරණාංශයි.

99. 4. **තභජාඃ**= තගණ-භගණ-ජගණයෝ වෙත් ද; **ජගෞ**= නැවැත ජගණ ගුරු දෙදෙන වෙත් ද; **ගඃ**- අන්තයෙහි ගුරක් වේ ද; **වසන්තතිලකා**= ඒ වෘත්තය'වසන්තතිලකා' යයි; **උක්තා**= කියනලදී.

ප:—පාදාන්තයෙහි යතිය වේ යයි වෘත්තිකාරයෝ කිහ. කාලිදාසයෝ-

"අෂ්ටාභිරිහ්නවදනෙ විරතිශ්ච ෂඩ්භිඃ
කාන්තෙ වසන්තතිලකාං කිල තාං වදන්ති"

යනුවෙන් අටකින් හා සයකින් යති වේ යයි කිහු.

(b) **ඉයම්**= මෝතොමෝ; **මුනිකාශ්‍යපෙන**= කාශ්‍යපමුනිහු විසින්; **සිංහොන්නතා**= 'සිංහොන්නතා' යයි; **උදිතා**= කියනලදී.

ප:—"සිංහොන්නතා කාශ්‍යපස්‍ය" යනු පිඞ්ගලසූත්‍රයි.

(c) සෛතවමුනිහු විසින් 'උද්ධර්ෂිණී' යයි කියනලදී.

---

1. ලඝිති. 2. කලිකා. 3. සිංහොඬතා.

100 5. ඉන්‍දුවදනා භජසනෛඃ සගරුයුග්මෛඃ.
101. 6. විඃසපතවජිදලොලා මෙසෞ මෙභෞ ගෞ චරණෙ වෙත්.

15. අථා'තිශක්වර්යාම්—32768.

102. 1. මිගතභශලඝුරථ ගිති ශශිකලා.

---

පඃ—"උද්ධර්ෂිණී සෙතවස්‍ය" යනු පිඞ්ගලසූත්‍රයි. "ශ්‍රී පිඞ්ගලෙන කපිතා මධුමාධවිති"යි සූත්‍රයක් පැණෙන නමුත් පිඞ්ගලයෝ "වසන්තතිලකා තෙභෞ ජෞ ගෞ" යනුවෙන් වසන්ත තිලකා' යයි ම කිහ. රාමයන් විසින් 'මධුමාධවී' යයි කියන ලදැයි සමහර තැන්හි පෙණේ. ඊට උදාහරණ හලායුධයෝ මෙසේ දක්වූහ:—

"උද්ධර්ෂිණී ජනදෘශාං සතනභාරගුර්වී
නීලොත්පලද්‍යුතිමලිම්ලුචලොචනා ච,
සිංහොන්නතත්‍රිකතටී කුටිලාලකාන්තා
කාන්තා වසන්තතිලකා නෘපවල්ලභා'සෞ."

100. 5. සගුරුයුග්මෛඃ= අන්තයෙහි ගුරුයුවලක් සහිත වූ; භජසනෛඃ= භගණ-ජගණ-සගණ-තගණයන්ගෙන්; ඉන්‍දුවදනා= 'ඉන්‍දුවදනා' වෘත්තය වේ.

පඃ—"වරසුන්‍දරී භෙජෞ සෙනෞ ගෞ"යි පිඞ්ගලයන් විසින් 'වරසුන්‍දරී' නම් ගාථා යයි කියනලද්දේ මේ වෘත්තයයි. පාදාන්ත යෙහි යතියයි.

101. 6. වෙත්= ඉදින්; චරණෙ= පාදයෙක්හි; මෙසෞ= මගණ-සගණයෝ ද; මෙභෞ= (නැවැත) මගණ-භගණයෝ ද; ගෞ= ගුරුදෙදෙනෙක් ද වෙත් ද; විඃසපතවජිද්= දෙවරක් සතකින් හෙවත් සතින් සතින් යතිහෙයින් පිරිසිඳුම් ඇත්තී ද; අලොලා= ඒ වෘත්තය 'අලොලා' නම්.

(1) "නනතජගුරුගෛඃ සප්තයතිර්නන්‍දී ස්‍යාත් (2) "ලක්ෂ්මී රත්නරවිරාමා මෙසෞ තභෞ ගුරුයුග්මම්" (3) "ත්‍රිනතගගිති වසු යති සුපවිත්‍රම්" (4) "මධ්‍යක්ෂාමා යුගදශවිරාමා මෙභෞ නෞ ය්‍ගෞ" (5) "නජභජලා ගුරුශ්ච භවති ප්‍රමද්‍රා" (6) "සජසා යලෞ ගිති ශරග්‍රහෛර්ම්ඎපදී" (7) නජභජෛර්ගුරුශ්ච වසුඝට් කුමාරී" යනාදීහු ද මේ ඡන්‍දස්හි පැණෙත්.

15. අථ= ඉක්බිත්තෙන්; අතිශක්වර්යාම්= අතිශක්වරීඡන්‍දසෙහි වෘත්තයෝ කියනු ලැබෙත්.

102. 1. මිගතභශලඝුඃ= දෙකින් ගුණ කරණලද ලඝු සතක් (=තුදුසක්) ඇත්තී වේ ද; අථ= නැවත; ග්= (අන්තයෙහි) ගුරුක් වේ ද; ඉති= මෙසේ වූ වෘත්තය; ශශිකලා= 'ශශිකලා' නම්.

103. 2. ස්‍රගිති භවති රසනවකයතිරියම්.
104. 3. වසුහයයතිරිහ මණිගුණනිකරඃ.
105. 4. නනමයයයුතේ'යං මාලිනී භොගිලොකෛඃ.
106. 5. භවති නජෞ භජෞ රසහිතෞ ප්‍රභද්‍රකම්.
107. 6. සජනා නයෞ ශරදශ[1]යතිරතිරේඛා
108. 7. ම්‍රෞ ම්‍යෞ යාන්තෞ භවෙතාං සප්තාෂ්ටභිශ්චන්ද්‍ර ලෙඛා.

---

**ප**:—පෛඞ්ගලයෙහි "**චන්ද්‍රාවර්තා** නෞ නෞ ස්" යනුවෙන් මීට ම 'චන්ද්‍රාවර්තා' යයි කීහු. හතකින් හා අටකින් යති වේ යයි ආම්නායයි.

103. 2. **ඉයම්**= මේ ශශිකලා තොමෝ ම; **රසනවකයතිඃ**= සයකින් හා නවයකින් යති ඇත්තී; **ස්‍රක් ඉති භවති**= 'ස්‍රජ්' නම් වේ.

**ප**:—'මාලා' යනු පිඞ්ගලොක්තනාමයි.

104 3. **ඉහ**= මෙහි; **වසුහයයතිඃ**= අටකින් හා සතකින් යති ඇති ශශිකලාව ම; **මණිගුණනිකරඃ**= 'මණිගුණනිකර' නම් වේ.

**ප**:—ඇතැම්හු මෙය 'මණිගණකිරණ' යයි ගත්හ එහෙත් පිඞ්ගලච්ඡන්දසෙහි "මණිගුණනිකරෙ වස්වෘෂයඃ"—"ස්පෘෂති න වපුරිහ **මණිගුණනිකරඃ**" යනුවෙන් 'මණිගුණනිකර'යයි ම පෙණේ.

105. 4. **නනමයයයුතා**= නගණ-නගණ-මගණ-යගණ-යගණ යන්ගෙන් යුත් වූ; **ඉයම්**= මෝ තොමෝ; **මාලිනී**= 'මාලිනී' නම් වේ. **භොගිලොකෛඃ**= අටකින් හා සතකින් යති වෙයි.

106. 5. **නජෞ**= නගණ-ජගණයෝ ද; **භජෞ**= භගණ-ජගණයෝ ද; **රසහිතෞ**= (අන්තයෙහි) රගණයකින් යුක්ත වූවාහු වෙත් ද; (ඒ වෘත්තය) **ප්‍රභද්‍රකං භවති**= 'ප්‍රභද්‍රක' නම් වේ.

**ප**:—සතකින් හා අටකින් යතිය වේ.

107. 6. **සජනාඃ**= සගණ-ජගණ-නගණයෝ ද; **නයෞ**= (අන්තයෙහි) නගණ-යගණ දෙදෙන ද වෙත් ද; **ශරදශයතිඃ**= පසකින් හා දශයකින් යති ඇති (මෝ තොමෝ;) **අතිරෙඛා**= 'අතිරෙඛා' නම්.

**ප**:—'එලා' යනු ද මීට ම නමකි.

108. 7 **ම්‍රෞ**= මගණ-රගණයෝ ද; **ම්‍යෞ**= (අනතුරු ව) මගණ-යගණයෝ ද; **යාන්තෞ**= යගණය අන්ත කොට ඇත්තාහු; **භවෙතාම්**= වෙත් ද; **සප්තාෂ්ටභිඃ**= සතින් හා අටින් යති හෙයින් සිදිනාලද ඕ තොමෝ; **චන්ද්‍රලෙඛා**= 'චන්ද්‍රලෙඛා' නම්.

---

1. යතිරියමෙලා.

### 16. අථාෂ්ටෞ—65536.

109. 1. භ්‍රත්‍රිනගෛඃ ස්වරාත් ඛමෘෂභගජවිලසිතම්.
110. 2. නජභජරෛඃ සදා භවති වාණිනී ගයුක්තෛඃ.

### 17. අථාත්‍යෂ්ටෞ—1,31,072.

111. 1. රසෛ රුද්‍රෛශ්ඡින්නා යමනසභලා ගඃ ශිඛරිණී.
112. 2. ජසෞ ජසයලා වසුග්‍රහයතිශ්ච පෘථ්වී ගුරුඃ.

---

**16. අථ**= අනතුරු ව; **අෂ්ටෞ**= අෂ්ටිච්ඡන්දසෙහි වෘත්තයෝ කියනු ලැබෙත්.

109. 1. **භ්‍රත්‍රිනගෛඃ**= භගණ-රගණ හා නගණ තුණකින් ද ගුරකින් ද; **ඍෂභගජවිලසිතම්**= 'ඍෂභගජවිලසිත' වෘත්තය වේ. **ස්වරාත්**= සතකින් පරව; **ඛම්**= විරාමය වේ.

**පඃ**—ඇතැම්හු "**ස්වරඃ ඛම්**"යි ගෙණ 'සතකි, නවයකි'යි අර්ථ කියත්. "ස්වරාත් ඛම්" යන්නෙන් පාදමධ්‍ය යතිය පමණක් කියනලදී. 'නවයකින් වේ' යයි පිඞ්ගලාදීන් විසින් කියන ලද්දේ පාදාන්ත යතියයි. ඒ නො කිවත් අවශ්‍යයෙන් ම පැමිණෙන හෙයින් මෙහි නො කියනලදී.

110. 2. **ගයුක්තෛඃ**= (අන්තයෙහි) ගුරකින් යුක්ත වූ; **නජභජරෛඃ**= 'න-ජ-භ-ජ-ර'ගණයන්ගෙන්; **සදා**= හැමකල්හි; **වාණිනී භවති**= 'වාණිනී' වෘත්තය වේ.

**පඃ**—"නජභජතෛඃ-ගාන්විතෛඃ"යි පඤ්චිකාව ගුරුතන්හි තබන්නෝ ගණිති. සෙසු වෘත්තරත්නාකරව්‍යාඛ්‍යාවන්ට හා ඡන්දෝමඤ්ජර්‍යාදිතදන්‍යග්‍රන්ථයන්ට ද අවිරුද්ධ නම් ඒ ද වරදක් නො වේ. යතිය පාදාන්තයෙහි ය.

**17. අථ**= ඉක්බිත්තෙන්; **අත්‍යෂ්ටෞ**= අත්‍යෂ්ටිච්ඡන්දසෙහි වෘත්තයෝ කියනු ලැබෙත්.

111. 1. **යමනසභලාඃ**= 'ය-ම-න-ස-භ'ගණ ලඝු යන මොහු වෙත් ද; **ගඃ**=(අන්තයෙහි) ගුරක් වේ ද; **රසෛඃ**= වර්ණ සයකින් ද; **රුද්‍රෛඃ**= වර්ණ එකොළොසකින් ද; **ඡින්නා**= යති හෙයින් සිඳින ලද ද; **ශිඛරිණී**=(ඕ තොමෝ) 'ශිඛරිණී' නමු.

112 2. **ජසෞ**= ජගණ-සගණයෝ ද; **ජසයලාඃ**= නැවත 'ජ-ස-ය'ගණ ලඝු යන මොහු ද වෙත් ද; **ගුරුඃ**=(අන්තයෙහි) ගුරක් වේ ද; **වසුග්‍රහයතිශ්ච**= අටකින් හා නවයකින් යති ඇත්තී ද; **පෘථ්වී**= ඕ තොමෝ 'පෘථ්වී' නමි.

**113. 3.** දිඞ්මුනි වංශපත්‍රපතිතං භරනභනලඝෛඃ.

**114. 4.** රසයුගහයෛර්න්සෞ ම්‍රෞ ස්ලෞ ගො යදා
හරිණී තදා.

**115. 5.** මන්දාක්‍රාන්තා ජලධිෂඩගෛම්භෞ නතෞ
තාද්ගුරූ චෙත්.

**116. 6.** හයදශභිර්න්ජෞ භජ්ජලා ගුරු නර්දටකම්.

---

113. 3. **භරනභනලඝෛඃ**='භ-ර-න-භ-න'ගණ ලඝුගුරු යන මොවුන්ගෙන්; **වංශපත්‍රපතිතම්**= 'වංශපත්‍රපතිත' වෘත්තය වේ· **දිඞ්මුනි**= දශය හා සත යතිස්ථානයි (දශයකින් හා සතකින් යති වේ යයි සේයි )

114. 4. **යදා**= යම් කලෙක්හි; **න්සෞ**= නගණ-සගණයෝ වෙත් ද; **ම්‍රෞ**= මගණ-රගණයෝ වෙත් ද; **ස්ලෞ**= සගණ ලඝු යන දෙදෙන වෙත් ද; **රසයුගහයෛඃ**= සයකින් හා සතරකින් ද හතකින් ද යති හෙයින් පිරිසිඳිනලද ද; **තදා**= එකල්හි; **හරිණී**= 'හරිණී' වෘත්තය වේ.

115. 5. **චෙත්**= ඉදින්; **ම්භෞ**= මගණ-භගණයෝ වෙත් ද; **නතෞ**= නගණ-තගණයෝ වෙත් ද; **තාත්**= (ඉන් අනතුරු) තගණයා කෙරෙන් පර ව; **ගුරූ**= ගුරුදෙදෙනෙක් වෙත් ද; හෙවත් 'ම-භ-න-ත-ත'ගණ සහ ගුරු-ගුරු යන මොහු වෙත් ද; **ජලධිෂඩ්+අශ්වෛඃ**= සතරකින් සයකින් සතකින් යතිහෙයින් ඡින්න ද; **මන්දාක්‍රාන්තා**= ඕ තොමෝ 'මන්දාක්‍රාන්තා' නම්.

116. 6. **න්ජෞ**= නගණ ජගණයෝ වෙත් ද; **භජ්ජලාඃ**='භ-ජ-ජ'ගණ ලඝු යන මොහු වෙත් ද; **ගුරූ**= (අන්තයෙහි) ගුරක් වේ ද; **හයදශභිඃ**= සතකින් හා දශයකින් ඡින්න ද; **නර්දටකම්**= ඒ වෘත්තය 'නර්දටක' නම්.

**ප**:—මේ වෘත්තයට 'තත්කුටක' 'තර්කුටක' යන නාමයන් ඇතැම්හු කියත් ඡන්දොමඤ්ජරියෙහි මේ වෘත්තයට උදාහරණ කරණලද ශ්ලෝකයෙන් පාදයක්වූ "රුචිරපදවලීඝටිතනර්දටකෙන කවිඃ" යන්නෙන් ද ඇතැම් වෘත්තරත්නාකරයන්හි අත්ලිපිවලින් ද 'නර්දටක' යනු ම සම්මත බව පැහැදිලි ව පෙණේ. මෙය පෛඞ්ගලයෙහි "අවිතථං නජෞ භජෞ ජලෞ ග්" යන සූත්‍රෙන් 'අවිතථගාථා'යයි කියනලදී. අවිතථයෙහි යතිය **පාදාන්තයෙහි ය.**

117. 7. මුනිගුහකාර්ණ්ණවෛශ්චිතියුතං වද කොකිලකම්.

**18. අථ ධෘත්‍යෞ—2,62,144.**

118. 1. ස්‍යාද්භූතත්වර්ත්තෛශ්ඡෛ කුසුමිතලතාවෙල්ලිතා
මෞත්‍යෞ නයෞ යෞ.

119. 2. ර්සෞ ජජෞ හරසංයුතෞ කරිබාණකෛර්හීර
නර්තකම්.

---

117. 7. **මුනිගුහක+අර්ණ්ණවෛඃ**= වර්ණි සතකින් ද සයකින් ද සතරකින්ද කරණලද; **යතියුතම්**= යති ඇති නර්දිටකය ම; **කොකිලකම්**= 'කොකිලක'යයි; **වද**= කියව.

**ප**:—මෙහි "යතියුතම්" යනු "කෘතයතිම්"යි ඇතැම් පොත්වල පැණේ. 'නර්දිටකම්' යන කැලිවලිඹගයට විශෙෂණ වන හෙයින් ඒ සදෙසි. සමහරපොත්වල "කෘතයති"යි ඇත ද ලක්ෂ්‍යදුෂ්ටත්වය ලැබෙන හෙයින් එය ද හැර ජනෙද්‍රමක්‍ෂ්ජයාංතු සාරයෙන්"යතියුතම්"යි යොදනලදී.'ගුහ-ක'යනු සකන්දවකාත්‍රයි. කඳකුමරුට මුණු සයකි. "වසවිත්‍රිය සමුද්‍රාශ්චෙත් කොකිලකම්" යනුවෙන් අටකින් පසකින් සතරකින් යති ඇති අවිතථගාථාව ම 'කොකිලක' නමැයි පිඹගලයෝ කිහ. මෙහි මත දෙක්හි විරොධය පැණේ.

**18. අථ**= ඉක්බිත්තෙන්; **ධෘත්‍යෞ**= ධෘති ච්ඡන්දසෙහි වෘත්තයෝ කියනු ලැබෙත්.

118. 1. **මෞත්‍යෞ**= මගණ-තගණයෝ වෙත් ද; **නයෞ**= නගණ-යගණයෝ වෙත් ද; **යෞ**= අනතුරුව යගණ දෙදෙනෙක් වෙත් ද; **භූත+ස්‍ෂ්ථ+අර්ත්තෛඃ**= පසකින් සයකින් සතකින් යති හෙයින් ඡින්න ද; **කුසුමිතලතාවෙල්ලිතා ස්‍යාත්**= ඒ වෘත්තය 'කුසුමිතලතාවෙල්ලිතා' නම් වේ.

119 2. **ර්සෞ**= රගණ-සගණයෝ වෙත් ද; **ජජෞ**= ජගණ-ජගණයෝ; **හරසංයුතෞ**= (අන්තයෙහි) භගණ-රගණ යුක්ත වූවාහු වෙත් ද; **කරිබාණකෛඃ**= අටකින් හා පසකින් ඡින්න ද; **හරනර්තකම්**= ඒ වෘත්තය 'හරනර්තක' නම්.

**ප**:—මෙහි කියනලද්දේ පාදමධ්‍යයති පමණකි. නො කීව ද අවශ්‍යයෙන් කළයුතුහෙයින් පාදාන්තයතිය නො කියනලදී. "විබුධප්‍රියා ර්සෞ ජෞ භ්‍රෞ වසුදිශඃ"යන්නෙන්'විබුධප්‍රියා' නම් ගාථා යයි පිඹගලයන් විසින් කියනලද්දේ මේ වෘත්තයයි. එහි යතිය අටකින් හා දශයකින් වේ.

120. 3. කපිතමිහ තනෞ රරෞ වේද්‍රරෞ සිංහවික්‍රීඩිතම්.

**19. අථා'තිධෘතෞ—5,24,288.**

121. 1. රසතම්ශෛඛෙයෞම්ෞ නෙසෞ රරගුරුයුතෞ
මෙඝවිස්ඵූර්ජිතා ස්‍යාත්.

122. 2. සූය්‍ය්‍යාශ්වෛශ්ව මසජසතතාඃ සගුරවඃ ශාර්දූලවික්‍රීඩිතම්.

**20. අථ කෘතෞ—10,48,576.**

---

120. 3. **වෙත්**= ඉදින්; **තනෞ**= තගණ දෙදෙනෙක් ද; **රරෞ**= රගණ දෙදෙනෙක් ද; **රරෞ**= (අන්තයෙහි) රගණ-රගණයෝ ද වෙත් ද; (ඒ වෘත්තය) **ඉහ**= මෙහි; **සිංහවික්‍රීඩිතම් කපිතම්**= 'සිංහවික්‍රීඩිත'යයි කියනලදි.

**ස**:—'නාරාච'යනු ඡන්දොමඤ්ජරියෙහි ආ නාමයයි. "නාරාචකං තනෞ රෞ රෞ" යනුවෙන් පෛඞ්ගලයෙහි "නාරාචක" නම් ගාථා යයි කියනලද්දේ ද මේ වෘත්තයයි. නාරාචකයෙහි යතිය දශයකින් හා අටකින් කළයුතු යයි කි හෙයින් මෙහි ද එසේ කළයුතු. මේ වෘත්තය ම දශයකින් හා අටකින් යති වී නම් 'අලසා' යයි "දශවසුවිරතිර්නිතෞ රෞශචතුර්භිර්යුතා **සාලසා**" යනුවෙන් ඇතැම් පොත්වල කියනලදී. 'නාරකා' යනු ද මීට නමකි.

**19. අථ**= නැවත; **අතිධෘතෞ**= අතිධෘතියෙහි වෘත්ත කියනු ලැබේ.

121. 1. **යෙමෞ**= යගණ-මගණයෝ වෙත් ද; **නෙසෞ**= නගණ-සගණයෝ; **රරගුරුයුතෞ**= (අන්තයෙහි) රගණ-රගණ-ගුරු යුක්ත වෙත් ද; **රස+ඍතු+අශ්වෛඃ**= සයකින් හා සයකින් ද සතකින් ද ඡින්න ද; **මෙඝවිස්ඵූර්ජිතා ස්‍යාත්**= 'මෙඝවිස්ඵූර්ජිතා' නම් වන්නීය.

**ස**:—"විසමිතා යෙමෞ නසෞ රෞ ග් රසර්තුස්වරාඃ"යනුවෙන් 'විසමිතා' නම් ගාථා යයි පෛඞ්ගලයෙහි කියනලද්දේ මේ වෘත්තයයි.

122 2. **මසජසතතාඃ**= 'ම-ස-ජ-ස-ත-ත'ගණයෝ; **සගුරවඃ**= (අන්තයෙහි) ගුරක් සහිත වෙත් ද; **සූර්‍ය්‍ය+අශ්වෛඃ**= දොළොසකින් හා සතකින් ද යතිහෙයින් ඡින්න ද; **ශාර්දූලවික්‍රීඩිතම්**= 'ශාර්දූලවික්‍රීඩිත' නමි.

**20. අථ**= ඉක්බිත්තෙන්; **කෘතෞ**= කෘතිච්ඡන්දසෙහි වෘත්ත කියනු ලැබේ.

123. 1. සභරා නමෞ යලගාස්ත්‍රයොදශයතිර්මත්තෙභ
වික්‍රීඩිතම්.

124. 2. ඥෙයා සප්තාශ්වෂඩ්භිර්මරභනයයුතෞ භලෞ ගඃ
සුවදනා.

125. 3. ත්‍රි රජෞ ගලෞ භවෙදිහෙදෘශෙන ලක්ෂණෙන
වෘත්තනාම.

126. 4. සජජා භරෞ සලගාශ්ච වෙදුදිතං තදා ප්‍රමදානනම්.

---

123. 1. **සභරාඃ**= 'ස-භ-ර'ගණයෝ වෙත් ද; **නමෞ**= නගණ-මගණයෝ වෙත් ද; **යලගාඃ**= (අන්තයෙහි) යගණ ලඝු ගුරු යන මොහු වෙත් ද; **ත්‍රයොදශයතිඃ**= තෙළෙසකින් යතිය වේ ද; **මත්තෙභවික්‍රීඩිතම්**= ඒ වෘත්තය 'මත්තෙභවික්‍රීඩිත' නමි.

**පු**:—මෙහි ද පාදමධ්‍යයතිය පමණක් කියනලදී.

124. 2. **මරභනයයුතෞ**= (ආදියෙහි) 'ම-ර-භ-න-ය'ගණයන්ගෙන් යුත් වූ; **භලෞ**= භගණ ලඝු යන මොහු වෙත් ද; **ගඃ**=(අන්තයෙහි) ගුරක් වේ ද; **සප්ත+අශ්ව+ෂඩ්භිඃ**= සතකින් හා සතකින් ද සයකින් ද ඡින්න වූ ඕ තොමෝ; **සුවදනා ඥෙයා**= 'සුවදනා' යයි දත යුතු.

125. 3. **ත්‍රිඃ**= තුන්වරක්; **රජෞ**= රගණ-ජගණයෝ වෙත් ද; **ගලෞ**=(අන්තයෙහි) ගුරු ලඝුහු වෙත් ද; **ඉහ**= මේ ඡන්දශ්ශාස්ත්‍රයෙහි; **ඊදෘශෙන ලක්ෂණෙන**= මෙබඳු ලකුණින්; **වෘත්තනාම**= 'වෘත්ත' නම් වෘත්තය වේ.

**පු**:—"ගුර්විති වෘත්තම්" යනු පිඞ්ගලසූත්‍රයි. ගුරක්ය, ලඝුවක්ය යන ක්‍රමයෙන් ගුරුලඝු විස්සක් ඇත්තේ වෘත්ත නමි. 'ර-ජ'ගණ තුන්වරක් යොදා අන්තයෙහි ගුරුලඝු දෙකක් කළ විට ද එසේම ගුරුලඝු පිහිටයි. මෙහි යතිස්ථානය පාදාන්තයයි.

126. 4. **චෙත්**= ඉදින්; (**යදා**= යම් කල්හි;) **සජජාඃ**= සගණ-ජගණ-ජගණයෝ වෙත් ද; **භරෞ**= (නැවත) භගණ-රගණයෝ වෙත් ද; **සලගාඃ ච**= (අන්තයෙහි) සගණ-ලඝුගුරු යන මොහු වෙත් ද; **තදා**= එකල්හි; **ප්‍රමදානනම්**= 'ප්‍රමදානන' වෘත්ත යයි; **උදිතම්**= කියනලදී.

**පු**:—ඡන්දොමඤ්ජරියෙහි මීට 'රීතිකා'යයි කියනලදී. පාදාන්තයෙහි යතියයි.

## 21. අථ ප්‍රකෘතෞ—20,97,152.

127. 1. ම්‍රභ්නෛර්‍යානාං ත්‍රයේණ ත්‍රිමුනියතියුතා ස්‍රග්ධරා කීර්ත්තිතේ'යම්.

128. 2. භෞ භභභාශ්ච භරෞ යදි කීර්ත්තය පුත්‍රක මත්තවිලාසිනීම්.

## 22. අථා'කෘතෞ—41,94,304.

129. 1. භ්‍රෞ නරනා රනාවථ ගුරුර්දිගර්ක්කවිරමං හිභද්‍රකමිදම්.

## 23. අථ විකෘතෞ—83,88,608.

130. 1. යදිහ නජෞ භජෞ භජභලග් තදශ්වලලිතං හරර්කයතිමත්.

---

**21. අථ**= ඉක්බිත්තෙන්; **ප්‍රකෘතෞ**= ප්‍රකෘතිච්ඡන්දසෙහි වෘත්ත යෝ කියනු ලැබෙත්.

127. 1. **ම්‍රභ්නෛඃ**= 'ම-ර-භ-න'ගණයන්ගෙන් හා; **යානාං ත්‍රයේණ**= යගණතුණකින් ද උපලක්ෂිත වූ; **ත්‍රිමුනියතියුතා**= සතින් තුන්වරක් හෙවත් සතකින් සතකින් සතකින් කරණලද යතියෙන් යුත් වූ; **ඉයම්**= මෝ තොමෝ; **ස්‍රග්ධරා**= 'ස්‍රග්ධරා'යයි; **කීර්ත්තිතා**= කියනලදී.

128. 2. **පුත්‍රක**= දරුව; **යදි**= ඉදින්; **භෞ**= භගණදෙදෙනෙක් වෙත් ද; **භභභාඃ ච**= (නැවත) භගණයෝ තිදෙනෙක් වෙත් ද; **භරෞ**=(අන්තයෙහි)භගණරගණයෝ වෙත් ද; **මත්තවිලාසිනීම්**= (ඒ වෘත්තය) 'මත්තවිලාසිනී'යයි; **කීර්ත්තය**= කියව.

**ප**:—පාදාන්තයෙහි යතිය වේ.

**22. අථ**= ඉක්බිත්තෙන්; **ආකෘතෞ**= ආකෘතිච්ඡන්දසෙහි වෘත්ත කියනු ලැබේ.

129. 1. **භ්‍රෞ**= භගණ-රගණයෝ වෙත් ද; **නරනාඃ**= 'න-ර-න'ගණයෝ වෙත් ද; **රනෞ**= රගණ නගණයෝ වෙත් ද; **දික්+අර්ක්කවිරමම්**= දසයකින් හා දොළොසකින් වූ යති ඇති; **ඉදම් හි**= මේ වෘත්තය වනාහි; **භද්‍රකම්**= 'භද්‍රක' නම්.

**ප**:—"**භද්‍රකං** භ්‍රෞ න්‍රෞ න්‍රෞ නෞගෞ දිගාදිත්‍යෛඃ"-'**භද්‍රක** ගීතිභිඃ සත්‍යදපි සතුවන්ති භව යෙ භවන්තමවම්" යනාදිය නුදුටු වාහු මෙය 'ප්‍රභද්‍රක'යයි ගත්හ.

**23. අථ**= නැවත; **විකෘතෞ**= විකෘතිච්ඡන්දසෙහි වෘත්ත කියනු ලැබේ.

130. 1. **ඉහ**= මෙහි ලා; **නජෞ**= නගණ-ජගණයෝ වෙත් ද; **භජෞ**= භගණ-ජගණයෝ වෙත් ද; **භජභලග්**= 'භ-ජ-භ'ගණ

131. 2. මත්තාක්‍රීඩා මෞ තෞ නෞ නලගිති භවති
වසුශරදශයතියුතා.

132. 3. භෛරථ සප්තභිරත්‍ර කෘතා ගුරුණා ගුරුණා ච
මයූරගතිඃ ස්‍යාත්.

**24. අථ සඞ්කෘතයෞ—1,67,77,216.**

133. 1. භූතමුනීනෛර්‍යතිරිහ භතනාඃ සභෞ භනයාශ්ච
යදි භවති තන්වී.

---

හා ලඝු ගුරු වේ ද; **හර+අර්කයතිමත්**= ඒකාදශයකින් හා ද්වාදශයකින් වූ යති ඇති; **යත්**= යම් වෘත්තයක් වේ ද; **තත්**= ඒ වෘත්තය; **අශ්වලලිතම්**= 'අශ්වලලිත' නම්.

**ප:**—ඡන්දෝමඤ්ජරියෙහි 'අද්‍රිතනයා'යි කියනලද්දේ මීට ය.

131. 2. **මෞ**= මගණයෝ දෙදෙනෙක් වෙත් ද; **තෞ**= තගණ-තගණයෝ වෙත් ද; **නෞ**= නගණයෝ දෙදෙනෙක් වෙත් ද; **නල්ග්**=(නැවත)නගණ-ලඝු-ගුරු වේ ද; **ඉති**= මෙසේ බඳනාලද; **මත්තාක්‍රීඩා**= 'මත්තාක්‍රීඩා' තොමෝ; **වසුශරදශයතියුතා**= අටකින් හා පසළොසකින් වූ විශ්‍රාම ඇත්තී; **භවති**= වේ.

**ප:**—ඇතැම්හු 'වසුශරදශ' යන්නට 'අටකින් හා පසකින් හා දශයකින් දැ'යි අරුත් බෙණෙති. "මත්තාක්‍රීඩා මෞ තෞ නෞ නලෞ ග් වසුපඤ්චදශකෞ" යනු පිඞ්ගලසූත්‍රයි. ඒ අරුත් ව්‍යක්ත සප්‍රතිෂ්ඨ වීමට නම් මෙය "වසුපඤ්චදශකාඃ"යි බහුවචන විය යුතුයි. යතිස්ථාන දෙකක් ම හෙයින් පිඞ්ගලයෝ එය ද්විවචනයෙන් යෙදූහ. "අෂ්ටභිඃ පඤ්චදශභිශ්ච යතිඃ" යනු වෘත්තියි. 'වාජිවාහන' යනු ද මීට ම නමකි.

132. 3. **අත්‍ර**= මේ ඡන්දස්හි; **සප්තභිඃ භෛඃ**= භගණ සතකින් ද; **අථ**= නැවත; **ගුරුණා**- ගුරකින් ද; **ගුරුණා ච**- (තවත්) ගුරකින් ද; **කෘතා**- කරණලද්දී; **මයූරගතිඃ ස්‍යාත්**- 'මයූරගති' නම් වේ.

**ප:**—ශ්‍රැතිසුඛ සේ යතිය කට යුතු.

**24. අථ**- විකෘතියට අනතුරු ව; **සඞ්කෘතයෞ**- සඞ්කෘතිච්ඡන්දසෙහි වෘත්ත කියනු ලැබේ.

133. 1. **ඉහ** - මෙහි; **යදි**- ඉදින්; **භතනාඃ**- 'භ-ත-න'ගණයෝ වෙත් ද; **සභෞ** - (නැවත) සගණ-භගණයෝත් වෙත් ද; **භනයාඃ ච**- 'භ-න-ය'ගණයෝත් වෙත් ද; **භූත**-මුනි+**ඉනෛඃ**- පසකින් හා සතකින් ද දොළොසකින් ද; **යතිඃ**- යතිය වේ ද; **තන්වී භවති**- (ඒ වෘත්තය) 'තන්වී' නම් වේ.

**25. අථා'තිකෘතෞ—3,35,54,432.**

134. 1. ක්‍රෞඤ්චපදා භෞමෞ ස්භෞ නනනා නනාවිෂුශර
වසුමුනිවිරතිරිහ භවෙත්.

**26. අථොත්කෘතෞ—6,71,08,864.**

135. 1. වසවීශාශ්වච්ඡෙදෝපෙතං මමතනයුගනරස
ලගෛර්භුජඞ්ගවිජෘම්භිතම්.

136. 2. මෝ නාඃ ෂට් සගගිති යදි නවරසරසශරයති
යුතමපවාහාඛ්‍යම්.

**ඉත්‍යුත්කෘතාදිප්‍රකරණම්.**

---

**25. අථ**- ඉක්බිත්තෙන්; **අතිකෘතෞ**- අතිකෘතිච්ඡන්දසෙහි වෘත්තයෝ කියනු ලැබෙත්.

134. 1. **ඉහ**- මෙහි; **භෞමෞ**- භගණ-මගණයෝ ද; **ස්භෞ**- සගණ-භගණයෝ ද; **නනනාඃ**- 'න-න-න'ගණයෝ ද; **නෞගෞ**- නගණ ගුරු යන මොහුත් වෙත් ද; **ඉෂු-ශර-වසු-මුනිවිරතිඃ**- පසකින් පසකින් අටකින් සතකින් විරාමය ඇති ඕ තොමෝ; **ක්‍රෞඤ්චපදා භවෙත්**- 'ක්‍රෞඤ්චපදා' නම් වන්නීය.

**26. අථ**- ඉක්බිත්තෙන්; **උත්කෘතෞ**- උත්කෘතිච්ඡන්දසෙහි වෘත්තයෝ කියනු ලැබෙත්.

135. 1. **වසු+ඊශ+අශ්වච්ඡෙදෝපෙතම්**- අටකින් එකොළොස කින් සතකින් කරණලද විරාම ඇති; **මමතනයුගනරසලගෛඃ**- 'ම-ම-ත-න-න-න-ර-ස'ගණ හා ලඝුගුරුන්ගෙන් ද උපලක්ෂිත වූ වෘත්තය; **භුජඞ්ගවිජෘම්භිතම්**- 'භුජඞ්ගවිජෘම්භිත' නම් වේ.

**ප**:—මෙහි 'නයුග' යන්නෙන් නගණදෙකක් ගණුලැබේ.

136. 2. **මඃ**- මගණයෙක් වේ ද; **ෂඩ් නාඃ**- නගණයෝ සදෙනෙක් වෙත් ද; **සගග් ඉති**- සගණය ගුරුවයක යන මොහුත් වෙත් ද; **නව-රස-රස-ශර-යතියුතම්**= නවයකින් හා සයකින් ද (නැවත) සයකින් හා පසකින් ද වූ යති ඇති ඒ වෘත්තය; **අපවාහාඛ්‍යම්**- 'අපවාහ' යන නම් ඇත්තේ වේ.

**විශේෂය**:—මෙහි ගණ කීපයක් කිය යුතු තැන පහසුව සඳහා 'ම-න-ත'ගණ යන වශයෙන් අන්තයෙහි පමණක් ගණ ශබ්දය යොදනලදී. අර්ථ කියනකල එබඳුතන්හි ගණශබ්දය යොදා කිය යුතු.

**උත්කෘතාදිප්‍රකරණය මෙතෙකින් සමාප්තයි.**

## අථ දණ්ඩකාඃ.

1. යදිහ නයුගලං තතඃ සප්ත රේඵාස්තදා චණ්ඩවෘෂ්ටි
[1]ප්‍රපාතො භවෙද්දණ්ඩකඃ.

2. ප්‍රතිචරණවිවෘද්ධරේඵාඃ ස්‍යුරර්ණාර්ණවව්‍යාලජීමූතලීලා
කරෝද්දාමශඞ්ඛාදයඃ.

---

**අථ**= උක්තාදිප්‍රකරණයට අනතුරු ව; **දණ්ඩකාඃ**= (සමවෘත්ත ප්‍රසඞ්ගයෙන් තත්ස්වරූප වූ) දණ්ඩකයෝ කියනු ලැබෙත්.

1. **ඉහ**= මේ ඡන්දශ්ශාස්ත්‍රයෙහි; **යත් නයුගලම්**= යම් නගණ යුවළක් වේ ද; **තතඃ**= ඉන් පසු; **සප්ත රේඵාඃ**= රගණයෝ සත් දෙනෙක් වෙත් ද; **තදා**= එකල්හි; **චණ්ඩවෘෂ්ටිප්‍රපාතඃ**= 'චණ්ඩවෘෂ්ටිප්‍රපාත' නම් වූ; **දණ්ඩකඃ භවෙත්**= දණ්ඩකය වන්නේ ය.

**ප:**—මේ එක්පාදයක ලක්ෂණයි. "දණ්ඩකො නෞ රඃ" "ප්‍රථමශ්චණ්ඩවෘෂ්ටිප්‍රපාතඃ" "අන්‍යත්‍ර රාතමාණ්ඩව්‍යාභ්‍යාම්" යනු මේ සඳහා පිඞ්ගලයන් විසින් හදූරණලද සූත්‍රයි. "උත්කෘතෙඃ ෂඩ්විංශත්‍යක්ෂරායාඃ සමනන්තරං දණ්ඩකස්‍ය පාඨාත් සප්තවිංශත්‍යක්ෂරත්වමෙව යුක්තම්, සර්වේෂාං ඡන්දසාමෙකෛකාක්ෂරවෘද්ධ්‍යා ප්‍රවෘත්තෙඃ. ඉත ඌර්ධ්වං පුනරේකෛකරේඵවෘද්ධ්‍යා ප්‍රස්තාරඃ"— සවිසිඅකුරක්ඇති උත්කෘතියට අනතුරු ව පඨනය කරණලද හෙයින් දණ්ඩකය සත්විසිඅකුරකින් විය යුතු ය, සියලු ඡන්දස් එක්එක්අකුර වැඩීමෙන් පවත්නා බැවිනි. මින් මතු එක් එක් රගණය වැඩීමෙන් ප්‍රස්තාරය වේ- යනු හලායුධවචනයි. රාත-මාණ්ඩව්‍ය දෙදෙනා මීට අන්‍යසංඥා කරණබව ද යථොක්තපිඞ්ගල වචනයෙන් හැගේ.

මෙහි භෙද 13,42,17,728කැයි ඇතැම්හු කියත්. ගුරුසත්විස් සක් මූලට තබා වක්ෂ්‍යමාණක්‍රමයෙන් ප්‍රස්තාර කළ හොත් එබඳු සඞ්ඛ්‍යාවක් ලැබේ. දණ්ඩකයන්හි එබන්දක් නැතිහෙයින් කිසි සේත් එපමණ දණ්ඩකභෙද විය හැකි නො වේ. එසේ වතොත් උක්තාදිවශයෙන් ඡන්දස් සවිස්සක් නො ව ඊට අධිකසඞ්ඛ්‍යාවක් දක්වනු නිසැක ය.

2. **ප්‍රතිචරණවිවෘද්ධරේඵාඃ**= පාදයක් පාසා වැඩිවූ රගණ ඇත්තාහු; **අර්ණ-අර්ණව-ව්‍යාල-ජීමූත-ලීලාකර-උද්දාම-ශඞ්ඛ-ආදයඃ**- 'අර්ණ-ශඞ්ඛ' යනාදි දණ්ඩකයෝ වෙති.

**ප:**—එක් එක් රගණය වැඩි වීමෙන් අර්ණාදිදණ්ඩකයෝ වෙති. දණ්ඩකයන්ගේ ගණසඞ්ඛ්‍යා හා නාම මෙසේයි:—

---

1. ප්‍රයාතො.

3. ප්‍රචිතකසමභිධො ධීරධීභිඃ ස්මෘතො දණ්ඩකො නද්වයා
දුත්තරෛඃ සප්තභිර්යෛඃ.

**ඉති ශ්‍රී කෙදාරභට්ටවිරචිතෙ වෘත්තරත්නාකරෙ
සමවෘත්තාධ්‍යායස්තෘතීයඃ.**

---

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1. | නගණ2 | – | රගණ | 7='චණ්ඩවෘෂ්ටිප්‍රපාත' | 14. | නගණ2 | – | රගණ | 20='සාර' |
| 2. | ,, | ,,– | ,, | 8='අර්ණ' | 15. | ,, | ,,– | ,, | 21='කාසාර' |
| 3. | ,, | ,,– | ,, | 9='අර්ණව' | 16. | ,, | ,,– | ,, | 22=විස්තාර' |
| 4. | ,, | ,,– | ,, | 10='ව්‍යාල' | 17. | ,, | ,,– | ,, | 23='සංහාර' |
| 5. | ,, | ,,– | ,, | 11='ජීමූත' | 18. | ,, | ,,– | ,, | 24='නීහාර' |
| 6. | ,, | ,,– | ,, | 12='ලීලාකර' | 19. | ,, | ,, | ,, | 25='මන්දාර' |
| 7. | ,, | ,,– | ,, | 13='උද්දාම' | 20. | ,, | ,,– | ,, | 26='කෙදාර' |
| 8. | ,, | ,,– | ,, | 14='ශඞ්ඛ' | 21. | ,, | ,,– | ,, | 27='සාධාර' |
| 9. | ,, | ,,– | ,, | 15='ආරාම' | 22. | ,, | ,,– | ,, | 28='සත්කාර' |
| 10. | ,, | ,,– | ,, | 16='සඞ්ග්‍රාම' | 23. | ,, | ,,– | ,, | 29='සංස්කාර' |
| 11. | ,, | ,,– | ,, | 17='සුරාම' | 24. | ,, | ,,– | ,, | 30='මාකන්ද' |
| 12. | ,, | ,,– | ,, | 18='වෛකුණ්ඨ' | 25. | ,, | ,,– | ,, | 31='ගොවින්ද' |
| 13. | ,, | ,,– | ,, | 19='සොත්කණ්ඨ' | 26. | ,, | ,,– | ,, | 32='සානන්ද' |
| | | | | | 27. | ,, | ,,– | ,, | 33='සන්දෙහ' |
| | | | | | 28. | ,, | ,,– | ,, | 34='නන්ද' |

මේ ක්‍රමයෙන් එක් එක් රගණය වැඩීමෙන් නොයෙක් නම් ඇති දණ්ඩකයෝ වෙත්. අන්තිමදණ්ඩකවෘත්තයෙහි එක් පාදයක නගණ දෙකක් හා රගණතුන්සියතිස්එකක් ද ලැබේ. ඒ අන්ත්‍යදණ්ඩකයෙහි එක්පාදයක අක්ෂර නවසියඅනූනවයකි. කියනලද මැයි;—

"එකොනසහස්‍රාක්ෂර–පර්‍ය්‍යන්තා දණ්ඩකාඩ්‍රයඃ ප්‍රොක්තාඃ,
වර්ණත්‍රිකගණවෘද්ධ්‍යා–න්විතයාද්‍ය මහාමතිභිඃ"යි.

රගණයෙන් කරණලද දණ්ඩක සියල්ල ම තුන්සියවිසිපහකි. රගණ හතකින් ම ප්‍රථමවෘත්තය ආරබ්ධහෙයිනි. යගණාදීන්ගෙන් බඳනාලද දණ්ඩකයෝ ද මෙතරම් භෙද ඇත්තෝ වෙත්.

3. **නද්වයාත්**= නගණදෙකකින්; **උත්තරෛඃ**= පර වූ; **සප්තභිඃ යෛඃ**= යගණසතකින්; **ප්‍රචිතකසමභිධඃ**= 'ප්‍රචිත' යන නම් ඇති; **දණ්ඩකඃ**= දණ්ඩකය වේ යයි; **ධීරධීභිඃ**= පණ්ඩිතයන් විසින්; **ස්මෘතඃ** දන්නාලදී.

ෂ:—මෙහි දු පෙර මෙන් ම එක් එක් යගණය එකතු කිරීමෙන් දණ්ඩක තිපදවිය හැක. "ශෙෂඃ ප්‍රචිත ඉති" යන සූත්‍රයට වෘත්ති ලියන හලායුධයෝ චණ්ඩවෘෂ්ටිප්‍රපාතයෙන් මත්තෙහි රගණයන්ගෙන් සචිත අර්ණාදිදණ්ඩකවෘත්තයන්ට 'ප්‍රචිත' යනු ජාතිසංඥවකැයි කිහු. එහෙත් යගණාදීන් කරණලද දණ්ඩකයන්ට ද මේ සංඥව යෙදෙන බව ඔහු විසින් ම කියනලදී.

සියලු දණ්ඩකයන්ගේ ම යතිය පාදන්තයෙහි ය. තවත් දණ්ඩකයෝ ඇත්තාහ කීපයක ලක්‍ෂණ මෙහි දක්වනු-ලැබේ.

1. නගණ දෙකක, ගුරු දෙකක යන ක්‍රමයෙන් බඳනාලද්දේ 'සිංහවික්‍රාන්ත' නම්.
2. රගණයන්ගෙන් ම බඳනාලද්දේ 'මත්තමාතඞ්ගලීලාකර' නම්.
3. ලඝුවක, ගුරක යන ක්‍රමයෙන් බඳනාලද්දේ 'අනඞ්ගශෙඛර' නම්.
4. ගුරෙක, ලඝුවෙක යන ක්‍රමයෙන් බඳනාලද්දේ 'අශොකමඤ්ජරී' නම්.
5. සගණයන්ගෙන් ම බඳනාලද්දේ 'කුසුමස්තබක' නම්.
6. යගණයන්ගෙන් ම බඳනාලද්දේ 'සිංහවික්‍රීඩ' නම්.

මේ ආදීහු කවිප්‍රයොගානුසාරයෙන් දත යුත්තාහ. දණ්ඩකයෝ අකුරුසවිස්සෙන් මත්තෙහි වෙති. ඌන වූව හොත් යථොක්ත උක්තාදියෙහි ඇතුළත් වෙති.

"තදවයාතපරතස්තකාරෙණාපි කවිදණ්ඩකා දෘශ්‍යන්තෙ, එවමෙකොනසහස්‍රාක්‍ෂරවෘද්ධිභිර්වති දණ්ඩකං වෘත්තම්"යි පඤ්චිකාමූලයෙහි පැණෙන පාඨය තදන්‍යපුස්තකයෙක්හි නැති හෙයින් මෙහි මූලයෙහි නො යෙදීමු.

උක්තාවෙහි පටන් දණ්ඩකවෘත්ත අවසන් කොට හදුරණ ලද සූත්‍රයන්ගෙන් පැණෙන්නේ ඒ ඒ වෘත්තයන්ගේ එක ම පාදයක ලක්‍ෂණ පමණකි. එකී ලක්‍ෂණයන්ගෙන් බඳනාලද පාද සතරක් වූ විට ම පද්‍යය සම්පූර්ණ වනබව සැලකිය යුතු.

ශ්‍රී කෙදරභට්ටයන් විසින් රචනාකරණලද
වෘත්තරත්නාකරයෙහි තුන්වන සමවෘත්තාධ්‍යාය
මෙතෙකින් නිමි.

IV

# චතුර්ථෝ'ධ්‍යායඃ.

1. විෂමෙ යදි සෞ සලගා දලෙ
භෞ යුජි භාද්ගුරුකාවුපචිත්‍රම්.

2. භත්‍රයමොජගතං ගුරුණී වෙද්
යුජි ච නජෞ ජ්‍යයුතෞ ද්‍රුතමධ්‍යා.

IV

## චතුර්ථාධ්‍යාය.

සමවෘත්තයන් පවසා අර්ධසමවෘත්තයන් කියනුවෝ "විෂමෙ" යනාදිය ආරම්භ කරයි.

1. **දලෙ**= අර්ධයෙහි; **විෂමෙ**= විෂමපාදයෙහි; **යදි**= ඉදින්; **සෞ**= සගණයෝ දෙදෙනෙක් ද; **සලගාඃ**= සගණලඝු ගුරුහු ද වෙත් ද; **යුජි**= සමපාදයෙහි; **භෞ**= භගණයෝ දෙදෙනෙක් වෙත් ද; **භාත්**= (තුන්වන) භගණයා කෙරෙන්; **ගුරුකෞ**= ගුරුදෙදෙනෙක් වෙත් ද; **උපචිත්‍රම්**= ඒ වෘත්තය 'උපචිත්‍ර' නම්.

**පඃ**—අර්ධසම හෙයින් විතීයාර්ධය ද මෙසේ ම කට යුතු. එහෙයින් තෘතියපාදය පළමුවන පාදය මෙන් සගණතුණක් හා ලඝු ගුරු යන මොවුන්ගෙන් ද, චතුර්ථපාදය විතියපාදය මෙන් භගණ තුණකින් හා ගුරුදෙකකින් ද බන්ධනය කට යුතු.

'විෂමෙ' යනාදිය ම උක්ත ලක්ෂණයට ලක්ෂ්‍යයි. ගුරුලඝු වින්‍යාසය උක්තානුසාරයෙන් කළයුතු. මත්තෙහි ද මෙසේ මැයි.

2. **වෙද්**= ඉදින්; **ඔජගතම්**= විෂමපාදයට පැමිණි; **භත්‍රයම්**= භගණතුණක් වේ ද; **ගුරුණී**= (එයින් පර ව) ගුරුදෙදෙනෙක් වෙත් ද; **යුජි ච**= සමපාදයෙහි ද; **නජෞ**= නගණ-ජගණයෝ; **ජ්‍යයුතෞ**= ජගණ-යගණ යුක්ත වෙත් ද; **ද්‍රුතමධ්‍යා**= ඒ වෘත්තය 'ද්‍රුතමධ්‍යා' නම්

**පඃ**—1, 3 වන පාද භගණතුණකින් හා ගුරුදෙකකින් ද, 2, 4 වන පාද 'න-ජ-ජ-ය'ගණයන්ගෙන් ද බඳනාලද්දේ 'ද්‍රුතමධ්‍යා' වෘත්තයයි. මේ වෘත්තයෙහි වෛතාලීයප්‍රකරණයෙහි කී අපරාන්තිකාභෙදයන්ගෙන් **ආපාතලිකාපරාන්තිකා**වෙහි ලක්ෂණ ද, මාත්‍රාසමප්‍රකරණයෙහි කී **උපචිත්‍රා**ලක්ෂණ ද පැණේ. 'අපරාන්තිකා'යයි ඇතැම්හු කියත්. ඒ භ්‍රාන්තියි.

3. සයුගාත් සගුරූ විෂමෙ චෙද්
භාවිහ වෙගවතී යුජි භාද් ගෞ.

4. ඔජෙ තපරෞ ජරෞ ගුරුශ්චෙත්
මෙසෞ ජෙගෞ ග් භද්‍රවිරාඩ් භවෙදනොජෙ.

5. අසමෙ සජෞ සගුරුයුක්තෞ
කෙතුමතී සමෙ භරනගාද්ගඃ.

6. [1]සසජා විෂමෙ යදා ගුරුඃ.
සභරාඃ ස්‍යාල්ලලිතා සමෙ ලගෞ.

---

3. **චෙත්**= ඉදින්; **විෂමෙ**= විෂමපාදයෙහි; **සයුගාත්**= සගණ දෙකකින් පර ව; **සගුරූ**= සගණගුරු යන මොහු වෙත් ද; **ඉහ යුජි**= මේ සමපාදයෙහි; **භෞ**= භගණදෙදෙනෙක් වෙත් ද; **භාත්**= (තුන්වන) භගණයෙන් පර ව; **ගෞ**= ගුරුදෙදෙනෙක් වෙත් ද; **වෙගවතී**= 'වෙගවතී' නම් වෘත්තය වේ.

**ප**:—ප්‍රථමතෘතීයපාදයන් සගණතුණකින් හා ගුරකින් ද, ද්විතීයචතුර්ථපාදයන් භගණතුණකින් හා ගුරුදෙකකින් ද බන්ධනය කට යුතු. මේ ද **ආපාතලිකා**භෙදයක් මැයි.

4. **ඔජෙ**= විෂමපාදයෙහි; **චෙත්**= ඉදින්; **තපරෞ**= තගණයෙන් පර වූ; **ජරෞ**= ජගණ-රගණයෝ වෙත් ද; **ගුරුඃ**= අන්තයෙහි ගුරක් වේ ද; **අනොජෙ**= සමපාදයෙහි; **ම්සෞ**= මගණ සගණයෝ වෙත් ද; **ජ්ගෞ**= ජගණ, ගුරු යන මොහු වෙත් ද; **ග්**= ගුරක් වේ ද; **භද්‍රවිරාඩ් භවෙත්**= 'භද්‍රවිරාජ්' නම් වෘත්තය වේ.

**ප**:—විෂමපාද 'ත-ජ-ර'ගණයන්ගෙන් හා ගුරකින් ද, සමපාද 'ම-ස-ජ'ගණයන්ගෙන් හා ගුරුදෙකකින් ද බන්ධනය කට යුතු. මේ **ඖපච්ඡන්දසික**භෙදයකි.

5. **අසමෙ**= විෂමපාදයෙහි; **සජෞ**= සගණ-ජගණයෝ; **සගුරුයුක්තෞ**= සගණ-ගුරුයුක්ත වෙත් ද; **සමෙ**= සමපාදයෙහි; **භරනගාත්**= 'භ-ර-න'ගණ-ගුරු යනමෙයින් පර ව; **ගඃ**= ගුරක් වේ ද; **කෙතුමතී**= ඒ වෘත්තය 'කෙතුමතී' නමි.

**ප**:—විෂමපාදයන්හි 'ස-ජ-ස'ගණ හා ගුරක් ද, සමපාදයන්හි 'භ-ර-න'ගණ හා ගුරුදෙකක් ද විය යුතු.

6. **යදා**= යම්කලෙක්හි; **විෂමෙ**= විෂමපාදයෙහි; **සසජාඃ**= 'ස-ස-ජ'ගණයෝ වෙත් ද; **ගුරුඃ**= (අවසානයෙහි) ගුරක් වේ ද;

---

1. මේ සූත්‍රය පඤ්චිකාවෙහි පමණක් පැණේ.

7. ආඛ්‍යානිකී තෞ ජගුරූ ග ඔජෙ
ජතාවනොජෙ ජගුරූ ගුරූශෙචෙත්.

8. ජතෞ ජගෞ ගො විෂමෙ සමෙ චෙත්
තෞ ජෞගෞ ග එෂා විපරීතපූර්වා.

---

**සමෙ**= සමපාදයෙහි; **සභරාඃ**= 'ස-භ-ර'ගණයෝ වෙත් ද; **ලගෞ**= අන්තයෙහි ලඝුගුරූහු වෙත් ද; **ලලිතා ස්‍යාත්**= 'ලලිතා' නම් වෘත්තය වේ.

**ප:**—විෂමපාද 'ස-ස-ජ'ගණයන්ගෙන් හා ගුරකින් ද, සම පාද 'ස-භ-ර'ගණයන්ගෙන් හා ලඝුගුරූ දෙකකින් ද බන්ධනය කළයුතු. "අයුජොසිදි සෞ ජගෞ යුජොඃ-සභරා ගෞ යදි සුන්දරි තද" යනුවෙන් ජනෛශ්‍රමඤ්ජරියෙහි 'සුන්දරි' වෘත්තයයි කියනලද්දේ ලලිතාවට ය. මේ පිඩගලච්ඡන්දස්හි නො පැණේ. මේ වෛතාලීයභෙදයකි.

7. **ඔජෙ**= විෂමපාදයෙහි; **තෞ**= තගණදෙදෙනෙක් ද; **ජගුරූ**= ජගණය ගුරක යන මොහු ද වෙත් ද; **ගඃ**= (අන්තයෙහි) ගුරක් වේ ද; **අනොජෙ**- සමපාදයෙහි; **චෙත්**- ඉදින්; **ජතෞ**- ජගණ-තගණයෝ ද; **ජගුරූ**- ජගණගුරූහු ද වෙත් ද; **ගුරූඃ**- (අන්තයෙහි) ගුරක් වේ ද; **ආඛ්‍යානිකී**- (ඒ වෘත්තය) 'අඛ්‍යානිකී' නම්.

**ප:**—විෂමපාද 'ත-ත-ජ'ගණයන්ගෙන් හා ගුරූ දෙකකින් ද, සමපාද 'ජ-ත-ජ'ගණ හා ගුරූදෙකකින් ද යුක්ත විය යුතු. 'ආඛ්‍යානකී' 'ආඛ්‍යානකී' යයි ජනෛශ්‍රමඤ්ජරීමුද්‍රිතපඤ්චිකාදියෙහි පැණෙතුදු පිඩගලවචන මෙහි දී ගුරූ කළ යුතු ය.'වාතීංහාරිකා' යනු ද මීට ම නමකැයි පෛඞගලවෘත්තියෙහි කියනලදී.

8. **විෂමෙ**- විෂමපාදයෙහි; **ජතෞ**- ජගණ-තගණයෝ ය; **ජගෞ**- ජගණගුරූහු ය; **ගඃ**- ගුරක් ය යන මොහු වෙත් ද; **චෙත්**;- ඉදින්; **සමෙ**- සමපාදයෙහි; **තෞ**- තගණදෙදෙනෙක; **ජ්ගෞ**- ජගණ-ගුරූහුය; **ගඃ**- ගුරක් ය යන මොහු වෙත් ද; **එෂා**- මෝතොමෝ; **විපරීතපූර්වා**- 'විපරීත'යන්න පෙරටු කොට ඇති 'ආඛ්‍යානිකී' හෙවත් 'විපරීතාඛ්‍යානිකී' නම්.

**ප:**—76 වන පිටෙහි දැක්වූ උපජාතිප්‍රස්තාරයෙහි 'භද්‍රා' නාම යෙන් දක්වනලද්දේ මේ ආඛ්‍යානිකී ම ය. විපරීතාඛ්‍යානිකී'හංසී' නාමයෙන් දක්වනලදී. එසේ උපජාතිවිශෙෂයක් වතුදු මෙහි නැවත ද දක්වනලද්දේ විශෙෂනාමසමර්පණය පිණිසයි.

9. සයුගාත් සලඝු විෂමෙ ගුරුර්
යුජි නභෞ ච භරෞ හරිණප්ලුතා.

10. අයුජි නනරලා ගුරුඃ සමෙ
නජමපරවක්ත්‍රමිදං තතො ජරෞ.

11. අයුජි නයුගරෙඵතො යකාරො
යුජි ච නජෞ ජරගාශ්ච පුෂ්පිතාග්‍රා.

12. වදන්ත්‍යපරවක්ත්‍රාඛ්‍යං-වෛතාලීයං විපශ්චිතඃ,
පුෂ්පිතාග්‍රාභිධං කෙචි-දෞපච්ඡන්දසිකං තථා.

---

9. **විෂමෙ**- විෂමපාදයෙහි; **සයුගාත්**- සගණදෙකකින්; **සලඝු**- සගණලඝුහු වෙත් ද; **ගුරුඃ**- නැවත ගුරක් වේ ද; **යුජි**- යුක්පාදයෙහි; **නභෞ**- නගණ-භගණයෝ ද; **භරෞ ච**- භගණ -රගණයෝ ද වෙත් ද; **හරිණප්ලුතා**- ඒ වෘත්තය 'හරිණප්ලුතා' නම්.

**ප**:—විෂමපාද සගණතුණකින් හා ලඝු-ගුරුදෙකකින් ද' සමපාද 'න-භ-භ-ර'ගණයන්ගෙන් ද යුක්ත විය යුතු.

10 **අයුජි**- විෂමපාදයෙහි; **නනරලාඃ**- 'න-න-ර'ගණ-ලඝුහු වෙත් ද; **ගුරුඃ** (අන්තයෙහි) ගුරක් වේ ද; **සමෙ**- සමපාදයෙහි; **නජම්**- 'න-ජ'ගණදෙක වේ ද; **තතඃ**- ඉක්බිත්තෙන්; **ජරෞ**- ජගණ-රගණයෝ වෙත් ද; **ඉදම්**- මේ වෘත්තය; **අපරවක්ත්‍රම්**- **'අපරවක්ත්‍ර'** නම්.

**ප**:—සුගමයි. වෛතාලීය භෙදයකි.

11. **අයුජි**- විෂමපාදයෙහි; **නයුගරෙඵතඃ**- 'න-න-ර'ගණයන් ගෙන් පර ව; **යකාරඃ**- යගණය වේ ද; **යුජි ච**- සමපාදයෙහි ද; **නජෞ**- නගණජගණයෝ ද; **ජරගාඃ ච**- ජගණ රගණ ගුරුහු ද වෙත් ද; **පුෂ්පිතාග්‍රා**- ඒ වෘත්තය 'පුෂ්පිතාග්‍රා' නම්.

**ප**:—සුගමයි. ඖපච්ඡන්දසික භෙදයකි.

12. **කෙචිත් විපශ්චිතඃ**- ඇතැම් පණ්ඩිතයෝ; **අපරවක්ත්‍රාඛ්‍යම්**- 'අපරවක්ත්‍ර' නම් වෘත්තය; **වෛතාලීයම්**- 'වෛතාලීය' වෘත්ත යයි; **වදන්ති**- කියත්. **තථා**- එසේ ම; **පුෂ්පිතාග්‍රාභිධම්**- 'පුෂ්පිතාග්‍රා' නම් වෘත්තය; **ඖපච්ඡන්දසිකං වදන්ති**- 'ඖපච්ඡන්දසික' යයි කියත්.

**ප**:—මෙහි **"කෙචිත් විපශ්චිතඃ"** යනු වෘත්තිකාරහලායුධයන් සඳහා කියත්. "අස්‍ය (අපරවක්ත්‍රස්‍ය) වෛතාලීයාන්තර්ගතත්වෙ'පි

13. ස්‍යාදයුග්මකෙ රජෞ රජෞ සමෙ තු
ජරෞ ජරෞ ගුරුඃ යවාත් පරා මතීයම්.

**ඉති ශ්‍රීකෙදාරභට්ටවිරචිතෙ වෘත්තරත්නාකරෙ
අර්ධසමවෘත්තාධ්‍යායශ්චතුර්ථඃ.**

---

V

## පඤ්චමො'ධ්‍යායඃ.

---

1. මුඛපාදෙෂ්ටභිර්වර්ණෛඃ (8)
[1]පරෙ'සමාන් මකාරලයොඃ ක්‍රමාද්වෘද්ධාඃ, (12)
සතතං යස්‍ය විචිත්‍රෛඃ පාදෛඃ සම්පන්නසෞන්දර්‍යශ්‍රීං (16)
[2]තදභිහිතමමලධීභිඃ පදචතුරූර්ධ්වාභිධං වෘත්තම්. (20)

---

**විශෙෂසංඥාර්ථමිහොපන්‍යාසඃ"–"ඉයම් (පුෂ්පිතාග්‍රා) අපි ඖපච්ඡන්දසිකාන්තර්ගතා විශෙෂසංඥාඥාපනාර්ථමත්‍රොච්‍යතෙ" යනු ඔහු ම කීහ. එහෙයිනි. මීට මූල ද අපරාන්තිකා-උපචිත්‍රා-උපජාති ලක්‍ෂණයන්ගෙන් යුත් අර්ධසමවෘත්ත තිබිය දී මේ දෙක පමණක් වෙසෙසා දක්වීම මෙහි ලා නො යෙදේ.**

13 **අයුග්මකෙ**- විෂමපාදයෙහි; **රජෞ**- රගණ-ජගණයෝ ද; **රජෞ**- (නැවත) රගණ-ජගණයෝ ද වෙත් ද; **සමෙ තු**- සම පාදයෙහි වනාහි; **ජරෞ**- ජගණ-රගණදෙදෙනය; **ජරෞ**- (නැවත ද) ජගණ රගණදෙදෙනය; **ගුරුඃ**- ගුරක් ය යන මොහු වෙත් ද; **ඉයම්**- මෝ තොමෝ; **යවාත්**- යවශබ්දයා කෙරෙන්; **පරා**- පරවූ; **මතී**- මතී හෙවත් 'යවමතී' නමූ.

**ප**:—මෙහි අදහස පැහැදිලි ය. පෛඞ්ගලයෙහි 'ශිඛා-ඛඤ්ජා' යන අර්ධසමවෘත්ත දෙකක් ද දක්වනලදී. විපාත්ප්‍රකරණයෙහි දක්වනලද ශිඛාඛඤ්ජාවන් විරාවෘත්ත කළ කල්හි එකී වෘත්ත සම්පූර්ණ වේ.

'ලලිතා' නාමයෙන් යථොක්තලලිතාවෙන් අන්‍යවූ අර්ධසම වෘත්තයක් ද තදන්‍යඅර්ධසමයෝ ද ග්‍රන්ථාන්තරයෙහි දක්නා ලැබෙති.

ශ්‍රී කෙදාරභට්ටයන් විසින් රචනාකරණලද වෘත්තරත්නාකරයෙහි
**සතරවන අර්ධසමවෘත්තාධ්‍යාය මෙතෙකින් නිමි.**

---

V

### පඤ්චමාධ්‍යාය.

---

දැන් විෂමවෘත්තයන් කියනුවෝ "මුඛපාදෙ'ෂ්ටභිර්වර්ණෛඃ" යනාදීන් ආරම්භ කරත්.

1. **යස්‍ය**= යම් වෘත්තයක්හුගේ; **මුඛපාදඃ**= ප්‍රථමපාදය; **අෂ්ටභිඃ වර්ණෛඃ**= අකුරුඅටකින් යුක්ත වේ ද; **අස්මාත්**= මේ ප්‍රථමපාද

---

1. පරෙසස්මින්කාරලයොඃ ක්‍රමාද්වෘද්ධෛඃ. 2. තදුදිතමමලමතිභිඃ.

යෙන්; **පරෙ**= අතික් තුන් පාදයෝ; **මකරලඝශෙඃ**= අකුරු සතරින්; **ක්‍රමාත්**= පිළිවෙළින්; **වෘද්ධාඃ**= වැඩුනාහු වෙත් ද; **සතතම්**= නිරන්තරයෙන්; **විචිත්‍රෛඃ පාදෛඃ**= විසිතුරු පාදයන්ගෙන්; **සම්පන්නසෞන්දර්‍ය්‍යම්**= සිද්ධ කරණ ලද සොඳුරුබැව් ඇති; **තත් වෘත්තම්**= ඒ වෘත්තය; **පදචතුරූර්ධ්වාභිධම්**= 'පදචතුරූර්ධ්ව' නමැති; **අමලධීභිඃ**= නිර්මලබුද්ධීන් විසින්; **අභිහිතම්**= කියනලදී.

**ප**,—ප්‍රථමපාදය අකුරුඅටකින් ද, දෙවනපාදය දොළොසකින් ද, තෙවනපාදය සොළොසකින් ද, සිවුවනපාදය විස්සකින් ද යුක්ත වූයේ 'පදචතුරූර්ධ්ව' වෘත්තයි. 'වර්ණෛඃ"–"සම්පන්නසෞන්දර්‍ය්‍යම්" යන පදයන්ගෙන් මේ වෘත්තයෙහි ගුරුලුහු නියමයක් නැතිබවත්, එහෙත් ශ්‍රොතෘජනශ්‍රොත්‍රසෞඛ්‍යය පිණිස වර්ණයන්ගෙන් විසිතුරුබව කළයුතුය යනුත් හඟවයි. මෙකියනලද පාදයන් විපර්‍ය්‍යාසයෙන් යෙදීමෙන් භෙද සූවිස්සක් ලැබේ. ඒ සූවිස්ස මෙහි පහත දක්වනු ලැබේ.

| | 1 පා: | 2 පා: | 3 පා: | 4 පා: | | 1 පා: | 2 පා: | 3 පා: | 4 පා: |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 8 | 12 | 16 | 20 | 13 | 16 | 12 | 8 | 20 |
| 2 | 8 | 16 | 12 | 20 | 14 | 16 | 8 | 12 | 20 |
| 3 | 8 | 20 | 16 | 12 | 15 | 16 | 20 | 8 | 12 |
| 4 | 8 | 12 | 20 | 16 | 16 | 16 | 12 | 20 | 8 |
| 5 | 8 | 16 | 20 | 12 | 17 | 16 | 8 | 20 | 12 |
| 6 | 8 | 20 | 12 | 16 | 18 | 16 | 20 | 12 | 8 |
| 7 | 12 | 8 | 16 | 20 | 19 | 20 | 12 | 16 | 8 |
| 8 | 12 | 16 | 8 | 20 | 20 | 20 | 8 | 16 | 12 |
| 9 | 12 | 20 | 16 | 8 | 21 | 20 | 12 | 8 | 16 |
| 10 | 12 | 8 | 20 | 16 | 22 | 20 | 16 | 8 | 12 |
| 11 | 12 | 16 | 20 | 8 | 23 | 20 | 16 | 12 | 8 |
| 12 | 12 | 20 | 8 | 16 | 24 | 20 | 8 | 12 | 16 |

2. ප්‍රථමමුදිතවෘත්ත (8)
විරචිතවිෂමචරණභාජ්, (12)
ගුරුකයුගලනිධන ඉහ [1]සහිත ආඩා (16)
[2]ලඝුවිරචිතපදවිතතියතිරිති භවති පීඩඃ. (20)

මෙහි පෙළට සිටි කොටු සතරතුළ පිහිටි සඞ්ඛ්‍යා ලෙස අක්ෂර යොදා බැඳීමෙන් හෙද සූවිස්සක් ලැබෙන බව දත යුතු. ප්‍රථම පඞ්ක්තියට සූත්‍ර ශ්ලෝකය ම උදාහරණයි.

"ලෝභං ලම්භය විලයං (8)
ලාභාලාභාවුභෞ භාවය සමානෞ භව ධීරඃ, (16)
යත්නාද්ගුරුජනගෞරවමාචර (12)
යදි තවාසම්තනාවුෂ්මංශච ලොකෙ යශොවිශාලමාශාසත්‍යං
සත්‍යාත් (20)

යන ශ්ලෝකය දෙවන පඞ්ක්තියෙහි පිහිටි හෙදයට උදාහරණයි. පාදාන්තයෙහි යොදනලද අඞ්කයන්ගෙන් ඒ ඒ පාදයෙහි පිහිටි අක්ෂරසඞ්ඛ්‍යාව දතයුතුයි. මේ ශ්ලෝකය ම පාද උඩුයටි කොට යොදාලීමෙන් අනික් හෙදයන්ටද උදාහරණවශයෙන් යෙදිය හැක.

"ප්‍රතිපාදං චතුර්වෘද්ධ්‍යා පාදචතුරූධ්වම්" යනු සූත්‍රයි. පාදයක් පාසා අකුරු සතර සතර වැඩිවීමෙන් 'පාදචතුරූර්ධ්ව' නම් වේ යනු අර්ථයි.

2. ඉහ= මේ ඡන්දස්හි; විරචිතවිෂමචරණභාජි= කරණලද විෂමසඞ්ඛ්‍යකාක්ෂරයන් ඇති පාදයන් භජනය කරණ; ප්‍රථමම්= පළමු කොට; උදිතවෘත්තෙ= කියනලදවෘත්තය; ගුරුකයුගල නිධනෙ= ගුරුයුවලක් අවසන් කොට ඇතිකල්හි; ඉති= මෙසේ වූයේ; ලඝුවිරචිතපදවිතතියතිඃ= ලඝූන්ගෙන් රචනා කරණ ලද පදපඞ්ක්ති හා යති ඇත්තේ; ආඩා සහිතඃ පීඩඃ භවති= ආ (ඩ) යන්න සහිත 'පීඩ' හෙවත් 'ආපීඩ' නම් වේ.

පඃ—යථොක්තපදචතුරූර්ධ්වවෘත්තය ම ඒ ඒ පාදයන්හි අවසානඅක්ෂර දෙක ගුරු කොට යෙදීමෙන් 'ආපීඩ' නම් වෙයි යනු මෙහි භාවයි. පදචතුරූර්ධ්වයෙහි ගුරුලඝුනියමයක් නැති නමුදු මෙහි ගුරුලඝුනියමය කරණලදී. එහෙයින් පදචතුරූර්ධ්වයට මේ වෙනස් වේ. ප්‍රථමපාදයෙහි මූලඅකුරුසය ලුහු ද අනික්අකුරුදෙක ගුරු ද විය යුතු. සෙසු පාදයන්හි ද මූල යෙදෙන අකුරු දහය, තුදුස, අටලොස ලුහු ද, අවසානෙ දෙය

1. කලිත. 2. විඩෘතරුවිරපදවිතති-පදවිචෘති.

3. ප්‍රථමමිතරචරණසමුත්ථං (12)
ශ්‍රයති [1]ජගති ලක්‍ෂ්ම, (8)
ඉතරදිතර[2]ගදිතමපි ච යදි තුර්‍ය්‍යං (16)
චරණයුගලකමවිකෘතමපරමිති කලිකා සා (20)

---

කුරු ගුරු ද විය යුතු. අන්ත්‍යගුරු දෙක හැර සෙසුඅකුරු ලඝු ම විය යුතු බව "ලඝුවිරචිතපදවිතති" යන්නෙන් ද, "ගාවන්ත ආපීඩඃ" යන සූත්‍රයට ලියනලද "අන්ත ගුරුවයග්‍රහණාදත්‍ර ශේෂාණාං ලඝුත්වමභ්‍යනුඥාතං සූත්‍රකාරේණෙති මන්‍යාමහේ" යන වෘත්තියෙන් ද හැඟේ. මෙහි ද භෙද සුවිස්සකි. පිඞ්ගලයෝ "ආදෞ චෙත් ප්‍රත්‍යාපීඩඃ"යි සූත්‍රයක් හදුරා, පාදයන්ගේ ආදි යෙහි ගුරු දෙකක් ඇතියේ 'ප්‍රත්‍යාපීඩ'යයි කීහ. වෘත්තරත්නා කරයෙහි ඒ නො පැණේ. ඊට උදාහරණ මෙසේයි:—

"චිත්තං මම රමයති (8)
කාන්තං චනම්දමුපගිරිනදි, (12)
කූජනමධුකරකලරවකෘතජනධෘති (16)
පුංස්කොකිලමුඛරිතසුරභිකුසුමචිතතරුතති" (20)

ප්‍රත්‍යාපීඩයෙහි ද භෙද සුවිස්සකි. මේ ශ්ලෝකය ම පාද උචිත සේ යෙදීමෙන් ඒ සුවිස්සට ම උදාහරණවශයෙන් ගත හැක. ආද්‍යන්තදෙක්හිම ගුරුදෙකබැගින් ඇත්තේ ද 'ප්‍රත්‍යාපීඩ' ම වේ යයි "ප්‍රත්‍යාපීඩො ගාවාදෞ ච" යන සූතුරෙන් පවසයි. උදාහරණ චින්ත්‍යයි. 'උභයාපීඩ' යනු ද ඊට නම්.

3. **යදි**= ඉදින්; **ප්‍රථමං තුර්‍ය්‍යම්**= ප්‍රථමපාදය; **ඉතරචරණසමුත්ථම්**= අනික් දෙවනපාදයෙහි ජාත වූ; **ලක්‍ෂ්ම**= ලක්‍ෂණ; **ශ්‍රයති**= සෙවුනේ ද; **ඉතරත් තුර්‍ය්‍යම් අපි ච**= අනික්දෙවෙනිපාද යත්; **ඉතරගදිතම් ලක්‍ෂ්ම**= එයින් අන්‍යප්‍රථමපාදයට කියනලද ලක්‍ෂණ; **ශ්‍රයති**= සෙවුනේ ද; **අපරං චරණයුගලකම්**= අනික් තෙවෙනි සිවුවනපාදදෙක; **අවිකෘතකම්**= වෙනස් නොකරණ ලද ද; **ඉති**= මෙසේ වූ; **සඃ**= ඒ ආපීඩය තෙම; **ජගති**= ලොක යෙහි; **සා කලිකා**= ඒ (ප්‍රසිද්ධවූ) කලිකාවයි.

**ප**:—"**තුර්‍ය්‍යම්**" යන්නට සමහර පුස්තකයන්හි 'ද්විතීය' යන අර්ථය පැණේ. ප්‍රශස්තටීකාවන්හි "තුර්‍ය්‍යශබ්දේන ශ්ලෝක චතුර්ථාංශඃ පාද උච්‍යතෙ"යි ද "තුර්‍ය්‍යං චතුර්ථෝ'ංශඃ, පාද ඉත්‍යර්ථඃ"යි ද තුර්‍ය්‍යශබ්දය පාදපර්‍ය්‍යායවශයෙන් යෙදූහ. 'තුර්‍ය්‍ය' ශබ්දය ද්විතීය ශබ්දපර්‍ය්‍යාය නො කට හැකි හෙයින් දෙවන මතය යුක්තියුක්ත බව පෙණේ.

---

1. ස යදි. 2. ජනිත.

4. විගුරුයුතසකලචරණාන්තා (12)
මුඛචරණගතමනුභවති ච තෘතීයඃ, (16)
චරණ ඉහ හි ලක්ෂ්ම (8)
ප්‍රකෘතමපරමඛිලමපි යදි භවති ලවලී සා (20)

---

මේ කලිකාවගේ ප්‍රථමපාදයෙහි අක්ෂර දෙළොසකි. එයින් ප්‍රථමදශකය ලඝු ද, තදනන්තරද්විකය ගුරු ද වේ. ද්විතීයපාදයෙහි අකුරු අටකි. එයින් ප්‍රථමෂට්කය ලඝු ද, අනන්තරද්විකය ගුරු ද වේ. 'අතිස්' අඩිය ආපීඩයෙහි මෙනි. මීට පිඞ්ගලයෝ 'මඤ්ජරී' යයි කීහු. මේ වනාහි ආපීඩයෙහි භෙද සූවිස්සෙන් සප්තම භෙදයයි. පදචතුරූර්ධ්වයෙහි සත්වනභෙදය ද 'මඤ්ජරී' නම් වේ.

4. **තෘතීයඃ චරණඃ**= තුන්වන පාදය; **මුඛචරණගතම්**= ප්‍රථම පාදයට පැමිණි; **ලක්ෂ්ම**= ලක්ෂණ; **අනුභවති ච**=අනුභව කරු ද; **ඉහ හි**= මෙහි වනාහි; **යදි**= ඉදින්; **අපරම් අඛිලම් අපි**= අතික් සියලු පාදත්‍රය ම; **ප්‍රකෘතම්**= ප්‍රස්තුත වූ ලක්ෂණ;(**අනුභවති**= අනුභව කෙරේ ද;) **විගුරුයුතසකලචරණාන්තා**= ගුරුදෙකකින් යුත් සියලු පාදාන්ත ඇති; **සා**= ඕ තොමෝ; **ලවලී භවති**='ලවලී' නම් වේ.

**ප**:-ආපීඩයෙහි ප්‍රථමපාදය තෘතීයපාදයකොට යොදා-ප්‍රථම පාදය පෙර කී සේ ලඝුගුරු දෙළොසකින් ද, ද්විතීයපාදය සොළොසකින් ද, තෘතීයපාදය අටකින් ද, චතුර්ථපාදය විස්සකින් ද බඳනාලද්දේ 'ලවලී' නමි. මෙයින් "ප්‍රථමස්‍ය මඤ්ජරී ලවල්‍යමෘතධාරාඃ" යන සූත්‍රයට වෘත්ති ලියමින් "ප්‍රථමස්‍ය තෘතීයෙන විපර්‍ය්‍යාසෙ ලවලී"-ආපීඩයෙහි පළමුවන තෙවන පාද විපර්‍ය්‍යාස (මාරු)වීමෙන් 'ලවලී' වේ යයි කී හලායුධවචන ඛණ්ඩනය කළහ. හලායුධයන්ගේ මතයේ පරිදි 'ලවලී' වෘත්තය වනුයේ තෙළෙස්වන ආපීඩභෙදයයි.(පාදචතුරූර්ධ්වප්‍රස්තාරය 106 පිට බලනු) "ප්‍රථමපාදයාගේ විපර්‍ය්‍යාසයෙහි"යි පිඞ්ගලයන් කී මුත් අන්‍යපාදයන්ගේ විපර්‍ය්‍යාසයක් නො කී හෙයින් වෘත්තිකාර මතයට වඩා වෘත්තරත්නාකරමතය ප්‍රශස්ත යයි ප්‍රශස්තයෝ සම්මත කළහ. නමුත් වෘත්තිකාරමතය ද වර්ජනය කළ යුතු නො වේ. වෘත්තරත්නාකරයෙහි කියනලද 'ලවලී' වෘත්තය ආපීඩයෙහි අෂ්ටමභෙදයයි. පදචතුරූර්ධ්වපාද විපර්‍ය්‍යාස කිරීමෙන් ද ලවලීවෘත්තය ලැබේ.

'විගුරුයුත' යනාදිය වෘත්තපූරණය සඳහා කියනලදී, එයින් ද මූල දී කියනලද සාමාන්‍යලක්ෂණ ම ප්‍රකාශ වන හෙයිනි.

5. ප්‍රථමමධිවසති යදි තුයඞ්ං (12)
චරමචරණ[1] පදමවසිතිගුරුයුගමං, (16)
[2] නිඛිලමපරමුපරිතනසමමිහ ලලිතපාද (20)
ත්‍රිතයමමෘතධාරා. (8)

**ඉති පාදචතුරූර්ධ්වප්‍රකරණම්.**

---

5. **යදි**= ඉදින්; **ප්‍රථමං තුයඞ්ම්**= ප්‍රථමපාදය; **චරමචරණපදම්**= අනන්‍යවූ සතරවනපාදස්ථානයෙහි; **අධිවසති**= වෙසේ ද; **අපරම්**= අන්‍ය වූ; **නිඛිලම්**= සියලු; **ලලිතපාදත්‍රිතයම්**= ලීලොපෙත පාදතුණ; **උපරිතනසමම්**= ප්‍රාක්තනපාදත්‍රය හා සමාන ද; **අවසිතිගුරුයුගමා**= අවසානයෙහි ගුරුයුවලක් ඇති ඕ තොමෝ; **ඉහ**=මෙහි; **අමෘතධාරා**= 'අමෘතධාරා' නම්.

**ප**:—පළමුවනපාදය–ලඝුද්වශයක් ද අනන්තයෙහි ගුරුදෙකක් දූසි අකුරුදෙළොසකින් ද, දෙවෙනි පාදය එසේ ම අකුරු සොළොසකින් ද, තුන්වන පාදය අකුරුවිස්සකින් ද, සිවුවන පාදය අකුරු අටකින් ද බඳනාලද්දේ 'අමෘතධාරා' නම්. මේ වනාහි ආපීඩයෙහි එකොළොස්වන භෙදයයි. "ප්‍රථමස්‍ය චතුර්ථෙන විපයඞ්ාසෙ 'මෘතධාරා"– ප්‍රථමපාදචතුර්ථපාද විපයඞ්ාස (මාරු)වීමෙන් අමෘතධාරාවෘත්තය වේ යයි හලායුධයෝ කීහ. ඒ මතයේ අයුරු ආපීඩයෙහි එකුන්විසිවන භෙදය වේ. පාදචතුරූර්ධ්වයෙන් ද අමෘතධාරාවෘත්තය ලැබේ.

"ප්‍රථමස්‍ය විපයඞ්ාසෙ" යනාදි සූත්‍රයට 'ආපීඩ' ග්‍රහණය නිවෘත්ත යයි ද, එහෙයින් ලඝුඅක්ෂර අභ්‍යනුඥනයත් මඤ්ජයඞ්ාදියෙහි නො වේ යයි ද හලායුධයෝ කීහ. මෙසේ ඔහු මඤ්ජයඞ්ාදි සිද්ධියෙහි පාදචතුරූර්ධ්වය ම ප්‍රධාන කළහ. "ඇතැම්හු ආපීඩාදියෙහි පාදවිපයඞ්ාසයෙන් මඤ්ජයඞ්ාදිය කැමැති වෙතැයි කියමින් ආපීඩය අප්‍රධාන කළහ. කෙදර භට්ටයෝ ආපීඩය ම ප්‍රධාන කර ගත්හ.

**පාදචතුරූර්ධ්වප්‍රකරණය මෙතෙකින් සමාප්තයි.**

---

අනතුරු ව උද්ගතාප්‍රකරණය ආරම්භ කරණුවෝ "සජමාදිමෙ" යනාදිය කියත්.

---

1. පදමවසිතගුරුයුග්මම්. 2. අපරමඛිලමුපරිගතමිහලලිතපදයුක්තා නදිතයමමෘතධාරා.

1. සජමාදිමෙ සලඝුකෞ ච-නසජ[1] ගුරුකෙෂ්වථොද්ගතා,
ත්‍ර්‍යඞ්ඝ්‍රිගත භනජලා ගයුතාඃ-සජසා ජගෞ [2]චරණ
මෙකතඃ පඨේත්.

---

1. **ආදිමෙ**= ප්‍රථමපාදයෙහි; **සජම්**= සගණ-ජගණ දෙක ද; **සලඝුකෞ ච**= සගණය ද ලඝුවක් දැයි යන මොහු වෙත්. **අථ**= අනතුරු ව (දෙවනපාදයෙහි;) **නසජගුරුකෙෂු**= 'න-ස-ජ'ගණ හා ගුරු යන මොවුන් ඇතිකල්හි; **ත්‍ර්‍යඞ්ඝ්‍රිගත භනජලාඃ**= තුන්වනපාදයට පැමිණි 'භ-න-ජ'ගණය ලඝුය යන මොහු; **ගයුතාඃ**= (කෙළවර)ගුරක් හා යෙදුනාහු කට යුත්තාහ. **සජසාඃ**= (චතුර්ථ පාදයෙහි) 'ස-ජ-ස'ගණයෝ ය; **ජගෞ**= ජගණ=ගුරුය යන මොහු වෙත්. **චරණම්**= ප්‍රථමපාදය; **එකතඃ**= විතියපාදය හා එක් කොට; **පඨේත්**= අවිලම්බයෙන් කියන්නේ නම්; **උද්ගතා**= 'උද්ගතා' වෘත්තයයි.

**ප**:—"යත්‍ර සූත්‍රෙ ගකාරෙ ලකාරෙ වා ශ්‍රූයතෙ, තත්‍ර තෙනෛව වෘත්තස්‍ය පාදඃ පරිසමාප්‍යතෙ" යනු වෘත්ති හෙයින්- "ත්‍ර්‍යඞ්ඝ්‍රිගතභනජලාඃ ගයුතාඃ සජසාජගෞ" යන තන්හි "ගයුතාඃ" යි ගකාරය (ගුර) ශ්‍රූයමාණ බැවින් 'භ-න-ජ'ගණලඝු ගුරුන්ගෙන් තෘතීය පාදය අවසන් විය යුතුය. තුන්වනපාදය අවසන්වූවිට අනතුරුව තිබෙන 'සජස ජග්' යන මොහු චතුර්ථ පාදයට අයත්බව අනායාසයෙන් වැටහේ. උද්ගතා ප්‍රථමපාද යෙහි 'ස-ජ-ස'ගණ හා ලඝු යන මොහු ද, විතීයපාදයෙහි 'න-ස-ජ'ගණ හා ගුරු යන මොහු ද, තෘතීය පාදයෙහි 'භ-න-ජ' ගණ හා ලඝුගුරුහු ද, චතුර්ථපාදයෙහි'ස-ජ-ස-ජ' ගණගුරුහු ද වෙත්.

'චරණම්'යි එකවචනනිර්දේශයෙන් ප්‍රථම වූ එක්පාදයක් යන අර්ථය ලැබෙන බව "එකවචනනිර්දේශාත් ප්‍රථමමෙකචරණම්" යනාදීන් සඳුව වේ. "ප්‍රථමපාදං විතීයෙන සහාවිලම්බෙන පඨේත්" යන වෘත්තිවචනයෙන් ද "අත්‍යන්තායතිං න කුර්‍යාදිත්‍යර්ථඃ" යන ටීකාවචනයෙන් ද ප්‍රථමවිතියපාදයන් අතර යති නො තබා තුරිත ව පඨනය කළයුතුබව හැඟේ."විතිය තෘතීයපාද සන්ධිසමාසවශයෙන් එක් කොට"යි පඤ්චිකාවෙහි එල්බෙන්නෝ කියත්. යථොක්තවෘත්ති-ටීකාවචනයන්ට විරුද්ධ හෙයින් ඒ අර්ථය දූෂ්‍ය වේ.

---

1. ගුරුකෙෂ:. 2. චරමෙකතඃ.

2\. චරණත්‍රයං [1]භජති ලක්‍ෂම-යදි [2]සකලමුද්ගතාගතම්,
රෞ භගෞ භවති සෞරභකං-චරණෙ යදීහ
භවතස්තෘතීයකෙ.

3\. නයුගං සකාරයුගලඤ්ච-[3]භජති චරණං තෘතියකම්,
තදුදිතමුරුමතිභිර්ලලිතං-යදි ශෙෂමස්‍ය බලු පූර්තුල්‍යකම්.

ඉකාහ්‍යුද්ගතාප්‍රකරණම්.

'ත්‍රිපූරණාඞ්ඝ්‍රි'යි කිය යුතු තැන මධ්‍යපදය ලොප් කොට 'ත්‍ර්‍යඞ්ඝ්‍රි'යි ගත්හ. 'එකතඃ' යන තන්හි එකශබ්දය භාවප්‍රධානය. 'සාර්විභක්තිකස්තස්'යි කී හෙයින් 'තස්' ප්‍රත්‍යය තෘතීයාර්ථයෙහි ය. එකීභාවයෙන් යන අර්ථයි. නොහොත් 'එකතඃ' යනු 'ල්‍යප්' (ක්‍යප්) ප්‍රත්‍යය ලොපයෙහි පඤ්චමී ය. "ප්‍රථමං චිතීයෙන එකං විධාය පඨෙත්" යන අර්ථයි. 'විධාය' යන ල්‍යබන්තයාගේ ලොපයෙහි 'එකං' යන චිතීයාන්තය 'එකතඃ'යි විය. එවිට තස් ප්‍රත්‍යය පඤ්චම්‍යර්ථයෙහි ය.

2\. **ඉහ**= මෙහි; **තෘතියකෙ** චරණෙ= තුන්වන පාදයෙහි; **යදි**= ඉදින්; **රෞ**= රගණ-නගණයෝ දෙදෙන ද; **භගෞ**= භගණ ගුරු දෙදෙන ද; **භවතඃ**= වෙත් ද; **යදි**= ඉදින්; **චරණත්‍රයම්**= සෙසු පාද තුණ; **උද්ගතාගතම්**= උද්ගතාවට පැමිණි; **සකලං ලක්‍ෂම**= සියලු ලක්‍ෂණ; **භජති**= භජනය කරු ද; **සෞරභකං භවති**= 'සෞරභක' නම් වෘත්තය වේ.

**ප**:—සෞරභකයෙහි තෘතීයපාදය පමණක් උද්ගතාවට වෙනස් වේ. අතික් පළමුවන දෙවන සිවුවන පාදයෝ උද්ගතාවෙහි එකී පාදයන් මෙනි. තුන්වනපාදයෙහි රගණ-නගණ-භගණ ගුරු යන මොහු වෙති.

3\. **තෘතීයකං** චරණම්= තුන්වනපාදය තෙමේ; **නයුගම්**= නගණ දෙකක් ද; **සකාරයුගලඤ්ච**= සගණ දෙකක් ද; **භජති**= භජනය කරයි ද; **යදි**= ඉදින්; **අස්‍ය**=ඒ වෘත්තයාගේ; **ශෙෂං බලු**= සෙස්ස වනාහි; **පූර්තුල්‍යකම්**= පූර්ව වූ උද්ගතාව හා සම ද; **තත්**= ඒ වෘත්තය; **උරුමතිභිඃ**= මහාමතීන් විසින්; **ලලිතම්**= 'ලලිත' යයි; **උදිතම්**= කියනලදී.

**ප**:—ලලිතයෙහි ද තුන්වනපාදය පමණක් උද්ගතාවට වෙනස් වේ. එහි 'න-න-ස-ස'ගණයෝ වෙත්. සෙස්ස උද්ගතාවෙහි මෙනි.

1\. භවති. වුජති. 2. සකිල' 3. භවති චරණෙ තෘතීයකෙ.

1. මෞසෞ ජ්භෞ ගෞ ප්‍රථමාඞ්ඝ්‍රිරෙකතඃ පෘථගන්‍ය
තත්‍රිතයං සනජරගාස්තථා[1] නනෞ සඃ,
ත්‍රිනපරිකලිතජයෞ
ප්‍රචුපිතම්දමුදිතමුපස්ථිතපූර්වම්.

මතිහුගේ උරුත්වය විෂයබාහුල්‍යයෙන් වේ. නො එසේ නම් සද්‍රූලබුද්ධිත්වකථනයෙන් තිඝ්‍ර ම වන්නේ ය.

මෙසේ ම උද්ගතාවගේ ප්‍රථමතෘතියපාදවිපර්‍ය්‍යාසයෙහි 'මඤ්ජරී' නම් වෘත්තය වේ.

## උද්ගතාප්‍රකරණය මෙතෙකින් සමාප්තයි.

---

දැන් උපස්ථිතප්‍රචුපිතප්‍රකරණය කියත්·'මෞසෞ ජ්භෞ"යනාදීන්.

1. **මෞසෞ**= මගණ-සගණයෝ ද; **ජ්භෞ**= ජගණ-භගණයෝ ද; **ගෞ**= ගුරුදෙදෙනෙක් ද වෙති. **ප්‍රථමාඞ්ඝ්‍රිඃ**= ප්‍රථමපාදය; **එකතඃ**= හුදකලාවූයේ කිය යුත්තේ ය. (උද්ගතාවෙහි මෙන් ප්‍රථමවිතීයපාද එක් කොට නො කිය යුතුය යන අදහසි.) **අන්‍යත් ත්‍රිතයම්**= අනික් විතීයාදිපාද තුණ; **පෘථක්**=(ප්‍රථමපාද යෙන්) වෙන් කොට කිය යුත්තේ ය. **සනජරගාඃ**= (විතීයපාද යෙහි) 'ස-න-ජ-ර' ගණගුරුහු වෙති. **තථා**=එසේ ම (තෘතීයපාද යෙහි;) **නනෞ**= නගණ දෙදෙනෙක් ද; **සඃ**= සගණයක් ද යන මොහු වෙති. **ත්‍රිනපරිකලිතජයෞ**=(චතුර්ථපාදයෙහි) නගණ තුණක් සහිත ජගණයගණයෝ වෙති. **ඉදම්**= මේ වෘත්තය; **උපස්ථිතපූර්වම්**='උපස්ථිත' යන්න පෙරටු කොට ඇති;**ප්‍රචුපිතම්**= 'ප්‍රචුපිත' නමැයි හෙවත් 'උපස්ථිතප්‍රචුපිත' නමැයි; **උදිතම්**= කියනලදී.

**ප**:—"සනජරගාඃ නනෞ සඃ" යන්නෙන් විතීයතෘතීයපාද ලක්‍ෂණ කියනලදී. ගුරක් හෝ ලඝුවක් යම් තැනෙක්හි ඇසේ නම් එහි පාදාවසාන යයි කියනලදහෙයින් "සනජරගාඃ"යි ගුර අවසන් කොට ඇති ලක්‍ෂණ එක්පාදයක ය. හෙ ද ප්‍රථමපාද ලක්‍ෂණ පළමුවෙන් කියනලදහෙයින් විතීයපාදසම්බන්ධ ය. "න නෞ සඃ" යන්න ශ්ලෝකාර්ධාවසානයෙහි යොදනලද හෙයින් ද, "තෘතීයපාදව්‍යවස්ථා සකාරස්‍ය විභජ්‍ය පාඨලිඛිතාත්" යනු වෘත්ති හෙයින් සගණය වෙන් කොට යෙදීමෙන් ද සගණයෙන් මතු තවත් අක්‍ෂරයක්හු නැතිබව හැගේ. එහෙයින් ප්‍රථමපාදය 'ම-ස-ජ-භ'ගණ හා ගුරු දෙකකින් ද, විතීයපාදය 'ස-න-ජ-ර' ගණ-ගුරුන්ගෙන් ද, තෘතීයපාදය 'න-න-ස'ගණයන්ගෙන් ද, චතුර්ථපාදය 'න-න-න-ජ-ය'ගණයන්ගෙන් ද යුක්ත විය යුතු.

---

1. නනඃ.

2. නෞ පාදේ'ථ තෘතීයකෙ සනෞ නසයුක්තෞ
ප්‍රථමාඞ්ඝ්‍රිකෘත[1]යතිහ වර්ධමානම්,
ත්‍රිතයමපරමපි පූර්වසදෘශමිහ භවති
ප්‍රතතමතිභිරිති ගදිතං [2]ලඝු වෘත්තම්.

---

ප්‍රථමපාදය පමණක් විශ්‍රාම තැබීමෙන් හුදකලා කොට පඨනය කළයුතු. අනික් පාදතුන එක් කොට පඨනය කළයුතු. එහි පාදාන්තයක් පාසා විරාමය කට යුතු නො වේ. 'ශ්ලොකාර්ධෙ තු විශෙෂතඃ''යි කී යති ලක්ෂණ මෙහි ලා නො යෙදේ. මේ ඊට අපවාදයි. "එකතඃ" යනතන්හි 'තස්' ප්‍රත්‍යය ප්‍රථමාර්ථයෙහි ය.

2. **ඉහ තෘතීයකෙ පාදෙ**= මේ තුන්වන පාදයෙහි; **නෞ**= නගණයෝ දෙදෙනෙක් වෙත් ද; **අථ**= නැවැත; **සනෞ**= සගණ-නගණයෝ; **නසයුක්තෞ**= නගණ-සගණ යුක්ත වෙත් ද; **ඉහ**= මේ වෘත්තයෙහි; **අපරං ත්‍රිතයම් අපි**= අනික් (ප්‍රථමද්විතීයචතුර්ථ) පාද තුන ද; **පූර්වසදෘශං භවති**= පූර්වෝපස්ථිතප්‍රචුපිතපාදසමාන වේ ද; **ඉති**= මේ ප්‍රකාරයෙන්; **ලඝු**= සැහැල්ලු(සුන්දර)වූ; **ප්‍රථමාඞ්ඝ්‍රිකෘතයති**= ප්‍රථමපාදයෙහි කරණලදයති ඇති; **වෘත්තම්**= වෘත්තය; **වර්ධමානම් ඉති**= 'වර්ධමාන' නමැයි; **ප්‍රතතමතිභිඃ**= ප්‍රසිද්ධබුද්ධීන් විසින්; **ගදිතම්**= කියනලදී.

**ප**:—මෙහි තෘතීයපාදයෙහි ලක්ෂණ හැර සෙස්ස උපස්ථිත ප්‍රචුපිතයෙහි මෙනි. තෘතීයපාදයෙහි 'න - න - ස - න - න - ස' ගණයෝ වෙති.

"කෘතයතිඃ ප්‍රවර්ධමානම්" යනු ඇතැම්පොත්වල පෙණේ. "ප්‍රවර්ධමානම්" යන නපුංසකලිඞ්ගප්‍රථමාන්තයට විශෙෂණ වන හෙයින් "කෘතයති"යි නපුංසකලිඞ්ගික ව ම මුත් "කෘතයතිඃ"යි පුංලිඞ්ගික ව හෝ ස්ත්‍රීලිඞ්ගික ව නො සිටිය හැකි බැවින් ඒ දූෂ්‍ය වේ. 'ප්‍රවර්ධමාන' යයි ද ගන්නේ පෛඞ්ගලය නොදත් හෙයිනි. "වර්ධමානං නෞ සෙනෞ නෙසෞ" යනු පිඞ්ගලසූත්‍රයි. "කෘතයතිස්තු වර්ධමානම්"යි ඇතැම් සංස්කෘතටීකාකාරයෝ ගෙණ "කරණලද යතිහෙයින් ස්තුතිකරණුලබන"යි අර්ථ ද කීහ. "කෘතයතිස්තු" යනු 'කෘතයති' ශබ්දෝපපද "ෂ්ටු'ඤ්=ස්තුතෞ" යන ධාතුවෙන් කර්මකාරකයෙහි 'ක්විප්' ප්‍රත්‍යය වීමෙන් සිද්ධ යයි ද, "හ්‍රස්වස්‍ය පිති කෘති තුක්" යන්නෙන් වන තුගාගමය "ආගමජමනිත්‍යම්" යන න්‍යාය හෙයින් මෙහි නො වේ යයි ද, 'කෘතයතිඃ'යි පුංලිඞ්ගික හෝ ස්ත්‍රීලිඞ්ගික වූ පදයක් අනවශ්‍ය බැවින් "කෘතයතිඃ තු"

---

1. යතිස්තු වර්ධමානම්. 2. බලු.

3. අසම්භෙනව [1]තෘතීයකෙ යදා තජරාඃ සයුඃ.
ප්‍රථමෙ ච විරතිරාම්භං බ්‍රුවන්ති,
තච්ඡුද්ධවිරාට් පුරඃස්ථිතං
ත්‍රිතයමපරමපි පූර්වසමං ස්‍යාත්.

**ඉත්‍යුපස්ථිතප්‍රචුපිතප්‍රකරණම්.**

---

පද දෙකක් සේ නො සැලකිය යුතු යයි ද වෑබිදූරටයා කීහ. ඡන්දොභෙදය වනහෙයින් 'කෘතයති තු'යි ද යෙදිය නො හැක. කවිප්ප්‍රත්‍යය වූ විට තුගාගම ව සිද්ධ වූ 'සතුත්' යන්න ම මිස 'සතු' යන්නක් සංස්කෘතයෙහි නොලැබෙනහෙයින් ටීකාකාර යන්ගේ ඒ වචන ද පිළිගත නො හැක. 'ප්‍රවර්ධමාන' යනු මෙහි යෙදේ නම් ටීකාකාරයෝ එතරම් ප්‍රයත්නයක් නො කරති එහෙයින් "යතිභ" යන පාඨය ම මෙහි ලා ප්‍රශස්ත වේ.

3. **යදා**= යම්කලෙක්හි; **අසම්න් එව තෘතීයකෙ**= මේ (ප්‍රස්තුත උපස්ථිතප්‍රචුපිතයාගේ) තුන්වනපාදයෙහි ම; **තජරාඃ**= තගණ-ජගණ-රගණයෝ; **ස්‍යුඃ**= වන්නාහු ද; **ප්‍රථමෙ**= පළමුපාදයෙහි; **විරතිඃ ච**= යතියත් වේ ද; **අපරම්**= අනික්; **ත්‍රිතයම් අපි**= පළමු වන දෙවන සිවුවන පාදතුණත්; **පූර්වසමං ස්‍යාත්**= (ලක්ෂණ හෙයින්) පූර්වඋපස්ථිතප්‍රචුපිතයා හා සමාන ද; **තත්**= ඒ වෘත්තය; **ශුද්ධවිරාට්පුරඃස්ථිතම්**= 'ශුද්ධවිරාජ්' යන්න පූර්ව කොට ඇති; **ආර්ෂභම්**= 'ආර්ෂභ' නමැයි හෙවත් 'ශුද්ධවිරාඩාර්ෂභ'යයි; **බ්‍රුවන්ති**= කියති.

**ව**:—මෙහි ද උපස්ථිතප්‍රචුපිතයට වෙනස් වන්නේ තුන්වන පාදය පමණකි. තුන්වනපාදයෙහි 'ත-ජ-ර'ගණයෝ වෙති. සෙස්ස පෙර මෙති. "ආර්ෂභං බ්‍රුවන්ති තච්ඡුද්ධවිරාට් පුරඃස්ථිතම්"යි කියනලද්දේ වෘත්තප්‍රවෙශය සඳහායි. අන් අයුරකින් වෘත්තය නො සිඳ යෙදිය හැකි නො වේ. පෛඞ්ගලයෙහි 'ශුද්ධවිරාඩාර්ෂභ'යයි කියනලදී. සමහරු 'ශුද්ධවිරාඩාර්ෂභ, ආර්ෂභ' යයි වෘත්ත දෙකක් ගණිති. ප්‍රථමපාදයෙහි පමණක් යති ඇති කල්හි 'ආර්ෂභ'යයි ද, පාදයක් පාසා යති ඇතිකල්හි 'ශුද්ධවිරා ඩාර්ෂභ'යයි ද කියති. ජකාරයට ෂකාර ද, ෂකාරයට ඩකාර ද වීමෙන් 'විරාඩාර්ෂභ' විය. "අපදාන්තෙපි පදාන්තතා ශ්‍රයණීයා" යනු න්‍යායයි.

**උපස්ථිතප්‍රචුපිතප්‍රකරණය මෙතෙකින් සමාප්තයි.**

---

1. තෘතීයපාදකෙ.

1. [1]විෂමාක්‍ෂරපාදං වා පාදෛරසමං දශධම්මවත්,
[2]යච්ඡන්‍දෝ නොක්තමත්‍ර ගාථෙති තත් සූරිභිඃ ප්‍රෝක්තම්.

ඉති ශ්‍රී කෙදාරභට්ටවිරචිතෙ වෘත්තරත්නාකරෙ
පඤ්චමෝ'ධ්‍යායඃ.

1. **විෂමාක්‍ෂරපාදං වා**= සම නුවූ අක්‍ෂරයන්ගෙන් යුත් පාද ඇති හෝ; **දශධම්මවත්**= "දශධම්මං" යනාදිය මෙන්; **පාදෛඃ**= පාදයන්ගෙන්; **අසමම්**= අසම වූ හෝ; **යත් ඡන්‍දඃ**= යම් ඡන්‍දසක්; **අත්‍ර**= මෙහි; **න උක්තම්**= නො කියනලද ද; **තත්**= ඒ ඡන්‍දස; **ගාථා ඉති**= ගාථා යයි; **සූරිභිඃ**= පණ්ඩිතයන් විසින්; **ප්‍රෝක්තම්**= කියනලදී.

**පඃ**—(25-26 පිටු බලනු.) මෙහි නොකියනලද අඩුවැඩිවීම් ආදියෙන් සම නුවූ අකුරු ඇති පාදයන්ගෙන් යුත් ඡන්‍දසක් වේ නම් ඒ 'ගාථා' නම් වේ මේ කාරිකාව ම ඊට නිදශිනයි. මෙහි ප්‍රථමපාදය අකුරුඅටකින් යුක්ත ය. ද්විතියපාදයෙහි අකුරු දශයකි. තෘතියපාදයෙහි අකුරු සතකි. චතුර්ථපාදය අක්‍ෂර නවයකින් යුක්ත වේ. මෙබන්දක් මෙහි පෙර නො කියනලදී. පෙර කියනලද විෂමවෘත්තයෝ විශෙෂසංඥවන්ගෙන් නිර්දිෂ්ට හෙයින් ගාථා නො වෙති. ගුරුලඝුක්‍රමනියමයෙහි සමානත්වයක් නැතිබැවින් ද, සඞ්ඛ්‍යාසමානත්වයක් නැතිබැවින් ද විෂමාක්‍ෂරත්වය වේ.

"දශ ධම්මං න ජානන්ති"යනාදි භාරතයෙහි පැණෙන ගාථාව මෙන් සමානසඞ්ඛ්‍යාකඅක්‍ෂරයන්ගෙන් යුක්ත වුව ද පාදයන්ගෙන් අසම වූ පාදතුණකින්, පාදසයකින් යුක්ත වූවෝ ද ගාථා නම් වෙති. එබන්දෙහි පෙර කියනලද වෘත්තයන්හි මෙන් චිරවෘත්තවතුරවෘත්තත්ව නො ලැබේ.

"ශබ්දතො වා'ර්ථතො වා'පි මතාඃකාව්‍යාර්ථසූචනාං,
යත්‍රාෂ්ටභිර්වා දශභිරෂ්ටාදශභිරෙව වා;
ෂඩ්විංශත්‍යා පදෛර්වාපි සා [3]නාන්දී පරිකීර්තිතා"

යනුවෙන් කියනලද, නාටකයන්හි පැණෙන අටපද, දසපද, අටළොස්පද, සව්සිපද ඇති 'නාන්දී' යන නාමයෙන් සංස්කෘතයෙහි ප්‍රසිද්ධ සැහැලි ද 'ගාථා' වෙතැයි 'පාදෛරසමම්' යන්නෙන් ම කියනලදී.

මෙහි "යත් ඡන්‍දඃ" යන්න "විෂමාක්‍ෂරපාදම්" යන්නට විශෙෂණ නො කොට "යම් ඡන්‍දසක් මෙහි නො කියනලද නම් ඒ ද 'ගාථා' නමැ"යි අර්ථ ගත හැකි වේ. එවිට සමාර්ධසම

1. විෂමාක්‍ෂරපාදත්වාත් පාදෛරසමඤ්ජසං ධම්මවත්. 2. යච්ඡන්දසි. 3. නාන්දී.

VI
## නිෂේධා'ධ්‍යායඃ.

1. ප්‍රස්තාරෙ නෂ්ටමුද්දිෂ්ටමෙකද්ව්‍යාදිලගක්‍රියා,
සඞ්ඛ්‍යාතමධ්වයොගශ්ච ෂඩෙතෙ ප්‍රත්‍යයාඃ ස්මෘතාඃ.

විෂමප්‍රස්තාරයන්හි ලැබෙන විශෙෂනාමයෙන් යනා දක්වූ සමාක්ෂරාදිපාද ඇති වෘත්තයෝ ද 'ගාථා' වෙත්. පිඞ්ගලයෝ ද සසඤ්ඤාකාරයෙන් "අත්‍රානුක්තං ගාථා"යි සූත්‍ර කළහ. "අත්‍ර ශාස්ත්‍රෙ නාමොද්දෙශෙන යන්නොක්තං ඡන්දඃ ප්‍රයොගෙ ච දෘශ්‍ය තෙ, තත් ගාථෙති මන්තව්‍යම්"-මේ ඡන්දශාස්ත්‍රයෙහි නාමය උදෙසීමෙන් යම් ඡන්දසක් නො කියනලද නමුදු කාව්‍යප්‍රයොග යෙහි පැණේ නම්, ඒ 'ගාථා' යයි දතයුතු යයි හලායුධයෝ ඊට වෘත්ති කීහ. පුරාතනයන් අතර ප්‍රසිද්ධ වූවාහු නාමොද්දෙශයෙන් ඡන්දශාස්ත්‍රයෙහි කියනලදහ එසේ නො වූ, ප්‍රස්තාරසඞ්ඛ්‍යා යෙහි මහත්වහෙතුවෙන් එකක් පාසා නාමයන් උදෙසන්නට දුෂ්කර හෙයින් 'ගාථා' යයි සාමාන්‍යනාමයෙන් අනුක්තච්ඡන්දස් උදෙසනලදැයි විපස්ෂීකාරයන්ගේ අදහසයි. පිඞ්ගලයන් විසින් ගාථාසඞ්ඛ්‍යාවෙහි ලා ගිණූ වෘත්ත කෙදාරභට්ටයන් විසින් 'ගාථා' නාමයෙන් වෙන් කොට ඒ ඒ ඡන්දසෙහි දක්වනලදී. එයින් කිපයක් තෘතීයපරිච්ඡෙදයෙහි ඒ ඒ තන්හි දක්වා ඇත.

ඉදානීන්තනයන් විසින් විෂමාක්ෂරාදිපාද ඇති ගාථාරචනා කළ යුතු නො වේ. එසේ වුවොත් ඡන්දශාස්ත්‍රයෙන් අර්ථයක් නො මැතියි.

ශ්‍රී කෙදාරභට්ටයන් විසින් රචනාකරණලද වෘත්තරත්නාකරයෙහි
**පස්වන අධ්‍යාය මෙතෙකින් සමාප්තයි.**

---

VI
## ෂෂ්ඨාධ්‍යාය.

යථොක්තාකාරයෙන් සම-අර්ධසම-විෂමවෘත්තයන් දක්වා ඔවුන්ගේ උත්පත්ති දැක්වීම පිණිස ද, කවිප්‍රයොගයන්හි පැණෙන නමුදු මෙහි නොකියනලද වෘත්තයන්ගේ සද්භාවොපපත්තිය පිණිස ද ෂට්ප්‍රත්‍යය දක්වනුවෝ "ප්‍රස්තාරඃ" යනාදිය කියත්.

1. **ප්‍රස්තාරඃ**= ප්‍රස්තාරය ද; **නෂ්ටම්**= නෂ්ටය ද; **උද්දිෂ්ටම්**= උද්දිෂ්ටය ද; **එකද්ව්‍යාදිලගක්‍රියා**= එකද්ව්‍යාදිලගක්‍රියාව ද; **සඞ්ඛ්‍යා නම්**= සඞ්ඛ්‍යානය ද; **අධ්වයොගඃ ච**= අධ්වයොගය ද යන; **එතෙ**= මොහු; **ෂට් ප්‍රත්‍යයාඃ**=ෂට්ප්‍රත්‍යයයෝ යයි; **ස්මෘතාඃ**=දන්නාලදහ.

2. පාදෙ සර්වගුරාවාද්‍යල්ලඝුං න්‍යස්‍ය ගුරෝරධඃ,
යථෝපරි තථා ශෙෂං භූයඃ කුර්‍ය්‍යාදමුං විධිම්.

3. ඌනෙ දද්‍යාද්ගුරූනෙව යාවත් සර්වලඝුර්භවෙත්,
ප්‍රස්තාරෝ'යං සමාඛ්‍යාතශ්ඡන්දෝවිචිතිවෙදිභිඃ.

---

පː—"ප්‍රතීයතෙ සඞ්ඛ්‍යාදිකමෙභිරිති ප්‍රත්‍යයාඃ" යනු නිර්වචන හෙයින් සඞ්ඛ්‍යාදිය දැනගැණීමට උපකාරවන්නෝ 'ප්‍රත්‍යයයෝ' වෙත්.

I **'ප්‍රස්තාරය'** නම් ඡන්දස්හි වෘත්ත පැතිරවීමට උපකාර වන ප්‍රත්‍යයයි. ඡන්දසක ඇතිතාක් වෘත්තයන්ගේ ගුරුලඝුවින්‍යාසය මෙයින් උගන්වනු ලැබේ.

II **'නෂ්ටය'** නම් ගුරුලඝු නො පෙණී ගිය වෘත්තයකගේ ගුරුලඝුවින්‍යාසය දැන ගැණීමට උපකාර වන ප්‍රත්‍යයයි.

III **'උද්දිෂ්ටය'** නම් ගුරුලඝු පෙන්වා මේ වෘත්තය ප්‍රස්තාර යෙහි කතමස්ථානයෙහි ලැබෙන්නේ දැයි ඇසූවිට එය දැන ගන්නා ප්‍රත්‍යයයි.

IV **'එකද්‍ව්‍යාදිලගක්‍රියා'** නම් ඡන්දසෙහි ලැබෙන එකගුරු වෘත්ත, එකලඝුවෘත්ත, විගුරුවෘත්ත, විලඝුවෘත්ත යනාදීන් දැන ගැණීමට ඉවහල්වන ප්‍රත්‍යයයි.

V **'සඞ්ඛ්‍යානය'** නම් ඡන්දසක මුළු වෘත්තසඞ්ඛ්‍යාව ප්‍රස්තාර නො කොට ම දැන ගැණීමට උපකාර වන ප්‍රත්‍යයයි.

VI **'අධ්වයෝගය'** නම් ඡන්දසක් ප්‍රස්තාර කිරීමට වුවමනා භූමිප්‍රමාණය දැන ගැණීමට ඉවහල් වන ප්‍රත්‍යයයි.

මොවුන්ගේ විස්තරය මෙතැන් පටන් පළ වේ. මාත්‍රාප්‍රස්තා රාදිය කෙදරභට්ටයන් නො කී නමුත් හෙ ද අප විසින් දක්වනු ලැබේ.

2. **සර්වගුරෞ පාදෙ**= සර්වගුරුපාදයෙහි; **ආද්‍යාත් ගුරොඃ**= ආදි ගුරුහු කෙරෙන්; **අධඃ**= යට; **ලඝුම්**= ලඝුවක්; **න්‍යස්‍ය**= තබා (ඇද); **උපරි**= උඩපෙළෙහි; **යථා**= යම් සේ ද; **තථා**=(යට පෙළෙහි ගුරුලඝු) එසේ ම (ඇන්ද යුතු)ය. **භූයඃ**= නැවත (පඞ්ක්තීන්හි) ද; **අමුං විධිම්**= මේ විධිය; **කුර්‍ය්‍යාත්**= කරන්නේ ය.

3. **ඌනෙ**= ඌනස්ථානයෙහි; **ගුරූන් එව**= ගුර්‍වක්ෂරයන් ම; **දද්‍යාත්**= දෙන්නේ ය හෙවත් ලියන්නේය; **යාවත්**= යම්තාක්; **සර්වලඝුඃ**= සර්වලඝුපාදය; **භවෙත්**= වන්නේ ද; ("තාවත් අමුං විධිං කුර්‍ය්‍යාත්" යනු අධ්‍යාහාර කරණු) **තාවත්**= ඒ තාක්; **අමුං විධිම්**=

මේ විධිය; **කුණ්ඩිරාජ්=** කරන්නේය; **අයම්=** මේ ප්‍රත්‍යය; **ප්‍රස්තාරඃ=** ප්‍රස්තාර යයි; **ඡන්දෝවිච්ඡිතිවෙදිභිඃ=** ඡන්දශ්ශාස්ත්‍ර දන්නවුන් විසින්; **සමාඛ්‍යාතඃ=** කියනලදී.

---

## I සමවෘත්තප්‍රස්තාරය.

මේ ශ්ලෝක දෙකින් ප්‍රස්තාරය උගන්වනලදී. එලුසඳසෙහි

"ගුරු යට ලුහු කැරැ පෙරැ සේ මැ සෙස් අඳනේ,
ගුරින් පුරා උනුතැන් සව්ලුහුවිරිත් දක්වා"

යනුවෙන් කියනලද්දේ ද මේ මැයි. ප්‍රස්තාර කට යුතු ඡන්දසෙහි සර්වගුරුවෘත්තය පළමු කොට ලියා ගෙණ මුලට යෙදී තිබෙන ගුර යට ලඝුචිහ්නය යෙදිය යුතු. ඉතිරි තැන්හි මතු පෙළෙහි තිබෙන සේ ම ඇඳිය යුතු. ත්‍ර්‍යක්ෂරච්ඡන්දඃප්‍රස්තාරයෙහි (7 පිට) මුලට ⏑ ⏑ ⏑ යන සර්වගුරුවෘත්තය යෙදී තිබේ. දෙවනුව යෙදී තිබෙන්නේ – ⏑ ⏑ යන්නයි. නැවත ද මුලට තිබෙන ගුරුහු යට ලඝුව ඇඳ ශෙෂය පෙර සේම ඇඳි කල්හි "– ⏑" යන්න ලැබේ. ගුරට මුලින් ලඝුව තිබුනුහෙයින් ඒ ස්ථානය හිස් විය. ඒ හිස්වූ ස්ථානය ගුරකින් පිරවූ විට ⏑ – ⏑ යන්න ලැබේ. මෙහි මුලට තිබෙන ගුරුරෙඛාව ඌනස්ථානය පුරවනු සඳහා යොදනලදි. දෙවනුව තිබෙන ලඝුව ගුරුහු යට ලුහු කිරීමෙන් ලැබුනේය. ශෙෂය පෙරසේ කිරීමෙන් තුන්වන ගුර ලැබුනේ ය. සර්වලඝු වෘත්තය ලැබෙන තෙක් මෙසේ ම කට යුතු යි. සර්වලඝුවෘත්තය ලැබුනුවිට "ගුරු යට ලුහු කරණු" යි කළ නියමය කරන්නට ගුරක් නැතිහෙයින් ප්‍රස්තාරය එයින් නවති. ප්‍රස්තාරයෙහි දී සර්වගුරු වෘත්තය මුලට තබාගැණීමත් උඩපෙළෙහි ගුරුඅකුරු අතුරෙන් මුල ම තිබෙන ගුරුහු යටින් ලඝුව ලියන්නටත් ශෙෂය උඩ පෙළෙහි සේ ම අඳින්නටත් ඌනස්ථාන ගුරින් පුරවන්නටත් සිත්හි තබා ගතයුතු. 'ශෙෂය'යි කියනලද්දේ මුල ගුරුහු යටින් ලඝුව ඇඳගත්විට ඒ පෙළෙහි ලඝුවට අගින් ඉතිරිවන කොටසයි. එහි ඒ ලඟ ම උඩින් පෙළෙහි තිබෙන්නාක් මෙන් ගුරුලඝු ඇඳ ගත යුතුයි. තුන්වනපෙළෙහි ශෙෂය නම් දෙවනපෙළෙහි ඒ කොටසෙහි තිබෙන සේ යොදනු. ශෙෂයක් නැත් නම් ඒ ගැණ නො සොයනු. සෙසු තන්හි ද මෙසේයි. ඌනස්ථාන නම් මුලින් තිබුනු ගුරුඅකුර යට ලඝුරෙඛාව ඇඳිවිට ඒ ලඝුරෙඛාවට මුලින් රෙඛාවක් නැති ස්ථානයි. – – ⏑ මෙහි මුලට ම තිබෙන ගුර නම් තෙවෙනුව යෙදුනුගුරයි. ඒ යට ලඝුරෙඛාව ඇඳිවිට ඊට මුලින් ස්ථාන දෙකක් හිස් වේ. ඒ ස්ථාන දෙක ගුරුරෙඛාවන්ගෙන්

පුරවනු ලැබේ. එවිට ◡ ◡ – යන්න ලැබේ. සෙසු තන්හි ද මෙසේයි. චතුරක්‍ෂරච්ඡන්දස ප්‍රස්තාර කොට දක්වනු ලැබේ. එයින් ද විස්තර සිතා ගතයුතු.

| | |
|---|---|
| ◡ ◡ ◡ ◡ | 1 |
| — ◡ ◡ ◡ | 2 |
| ◡ — ◡ ◡ | 3 |
| — — ◡ ◡ | 4 |
| ◡ ◡ — ◡ | 5 |
| — ◡ — ◡ | 6 |
| ◡ — — ◡ | 7 |
| — — — ◡ | 8 |
| ◡ ◡ ◡ — | 9 |
| — ◡ ◡ — | 10 |
| ◡ — ◡ — | 11 |
| — — ◡ — | 12 |
| ◡ ◡ — — | 13 |
| — ◡ — — | 14 |
| ◡ — — — | 15 |
| — — — — | 16 |

අක්‍ෂර එකෙහි පටන් සවිස්ස දක්වා මෙසේ ම ප්‍රස්තාර කළහැකි වේ. වර්‍ණච්ඡන්දසෙහි ප්‍රස්තාරක්‍රමය සැමතන්හි මෙසේ මැයි. මේ දක්වනලද්දේ සමවෘත්තයන්ගේ ප්‍රස්තාරයයි.

---

## II අර්‍ධසමප්‍රස්තාරය.

"අර්‍ධසමස්‍ය ප්‍රස්තාරෙ'ර්‍ධප්‍රස්තාරඃ කාර්‍ය්‍යඃ"යි කී හෙයින් අර්‍ධසමවෘත්තයන්ගේ ප්‍රස්තාරය කරණ විට අර්‍ධයක් ම පාදයක් මෙන් සලකා යට දැක්වූ ලෙස ප්‍රස්තාර කට යුතු. එක්පාදයකට අකුරු දෙකක් ඇති ඡන්දසෙහි අර්‍ධයකට අකුරු සතර කි. එහෙයින් ඒ අර්‍ධය පාදයක් වශයෙන් ගත් විට සර්‍වගුරුවෘත්තය ◡ ◡ ◡ ◡ මෙසේ වේ. ප්‍රස්තාරය යට දක්වනලද චතුරක්‍ෂරච්ඡන්දඃප්‍රස්තාරය මෙනි. පාදයකට අකුරුතුණ බැගින් ඇති ඡන්දසෙහි අර්‍ධයකට අකුරුසයක් වේ. එහි සර්‍වගුරුවෘත්තය ◡ ◡ ◡ ◡ ◡ ◡ මෙසේ යොදා ගතයුතු. ප්‍රස්තාරයෙහි දී හෙද සූසැටක් ලැබෙන හෙයින් මෙහි එය ප්‍රස්තාර කොට දැක්වීම දුෂ්කරය. එහි හා අතික් ඡන්දස්හි ද අර්‍ධසමයන්ගේ ප්‍රස්තාරය යථොක්තක්‍රමයෙන් ම කට යුතු. පාදයකට අකුරුදෙකක් බැගින් ඇති අර්‍ධසමයන්ගේ ප්‍රස්තාරයෙහි ප්‍රථම හෙදය වූ ◡ ◡ ◡ ◡ යන්න සමවෘත්තයක් වේ. මේ අර්‍ධයක් හෙයින් අතික් අර්‍ධය ද මෙසේ ම වූ විට (1)◡◡(2)◡◡(3)◡◡ (4)◡◡ යන සමවෘත්තය ලැබේ. සොළොස්වන — — — — යන ලක්‍ෂණ ඇති වෘත්තය ද ව්‍යක්‍ෂරච්ඡන්දසෙහි ශුද්ධසමවෘත්තයෙකි. එසේ ම සවනවූ (1)—◡(2)—◡ යන්න ද, එකොළොස්වන (1)◡—(2)◡— යන්න ද ශුද්ධසමවෘත්තයි. "ප්‍රස්තුතභෙදකාරී විකල්පඃ ප්‍රස්තාරක්‍රමායාතො'පි වර්‍ජනීයඃ"යි කියනලදහෙයින් එකී ශුද්ධසමවෘත්ත හළ විට ශුද්ධ වූ අර්‍ධසමප්‍රස්තාරය සිද්ධ වේ. සෙස්සෙහි ද මෙසේ ම ශුද්ධසමවෘත්තයන් සොයා වර්‍ජනය කොට අර්‍ධසමප්‍රස්තාරය ශුද්ධ කර ගතයුතු. එහෙත් අත්හරිණු ලබන වෘත්තයන් ද සහිත ව ප්‍රස්තාරයෙහි සඞ්ඛ්‍යාව ගිණිය යුතුය. නො එසේ වුව අර්‍ධසමයන්ගේ නෂ්ටොද්දිෂ්ටයන්ට බාධා වේ. පාදයකට අකුරුදෙකබැගින් අර්‍ධයකට අකුරුසතරක් ඇති අර්‍ධසමයන්ගේ ප්‍රස්තාරයෙහි හෙද සොළොසක් වුවත් ශුද්ධඅර්‍ධසමවෘත්ත 2. 3. 4 5. 7. 8. 9. 10. 12. 13. 14. 16. යන අඞ්කස්ථානයන්හි සිටි දොළොස පමණකි.

## III විෂමවෘත්තප්‍රස්තාරය.

"පාදචතුෂ්ටයස්‍ය ප්‍රස්තාරඃ කාර්‍ය්‍යඃ"යි කී හෙයින් විෂම වෘත්තප්‍රස්තාරයෙහි දී පාද සතර ම එක් කොට එකපාදයක් වශයෙන් ගෙණ සර්වගුරුපාදය මුලට තබා පෙර කී සේ ගුරුලුහු යොදා ප්‍රස්තාර කට යුතු. පාදයක අකුරුදෙකබැගින් ඇති විෂම වෘත්තය ප්‍රස්තාර කරණවිට පාදසතරට අකුරු අටක්බැවින් ගුරු අකුරු අටක්ඇති සර්වගුරුපාදය මුලට ලියා ගත යුතු ඉන් පසු මූලගුරුහු යට ලඝුවක් ඇඳ ලඝුවෙන් අග ඉතිරි කොටස ප්‍රථම පාදයෙහි මෙන් ගුරුලුහු යොදා සම්පූර්ණ කළ යුතු. නැවත තුන්වන්පෙළෙහි ගුරුලුහු යොදනවිට දෙවෙනිපෙළෙහි විතීය ස්ථානයෙහි සිටි ගුරුහු කෙරෙන් යට ලඝුවක් ලියා ගෙණ එයින් අග ඉතිරිකොටස විතීයපඞ්ක්තියෙහි ඒ කොටස මෙන් ලියා ප්‍රථමාක්ෂරස්ථානය හිස් ව තිබෙනබැවින් එහි ගුරක් ලියා ගත යුතු. මේ ක්‍රමයෙන් සර්වලඝුවෘත්තය ලැබෙනතෙක් අෂ්ටාක්ෂරච්ඡන්දස ප්‍රස්තාර කරන්නාක් මෙන් වින්‍යාසය කරණු. පඞ්ක්ති දෙසියසපණසක් (256) ලැබෙනහෙයින් සියල්ල මෙහි වින්‍යාස කොට දක්වීම දුෂ්කර ය. මේ ද්ව්‍යක්ෂරපාදවිෂමවෘත්තයාගේ ප්‍රස්තාරයෙහි ලැබෙන දෙසියසපණසක් භේදයන් අතුරෙන් ප්‍රථමභේදය වූ (1)ᴗ ᴗ (2)ᴗ ᴗ (3)ᴗ ᴗ (4)ᴗ ᴗ යන්න ද, අටළොස්වන භේදය වූ (1)–ᴗ (2)ᴗ ᴗ (3)–ᴗ (4)ᴗ ᴗ යන්න ද, පන්තිස්වන (1)ᴗ – (2)ᴗ ᴗ (3)ᴗ – (4)ᴗ ᴗ යන්න ද, දෙපණස්වන (1)– – (2)ᴗ ᴗ (3)– – (4)ᴗ ᴗ යන්න ද, එකුන්සැත්තෑවන (1)ᴗ ᴗ (2)–ᴗ (3)ᴗ ᴗ (4)–ᴗ යන්න ද, එක්සියතුන්වන (1)ᴗ – (2)–ᴗ (3)ᴗ – (4)–ᴗ යන්න ද, එක්සියවිසිවන (1)– – (2)–ᴗ (3)– – (4)–ᴗ යන්න ද, එක්සියසත්තිස්වන (1)ᴗ ᴗ (2)ᴗ – (3)ᴗ ᴗ (4)ᴗ – යන්න ද, එක්සියසිවුපණස්වන (1)–ᴗ (2)ᴗ – (3)–ᴗ (4)ᴗ – යන්න ද, එක්සියඑක්සැත්තෑවන (1)ᴗ – (2)ᴗ – (3)ᴗ – (4)ᴗ – යන්න ද, එක්සියඅසූඅටවන (1)– – (2)ᴗ – (3)– – (4)ᴗ – යන්න ද, දෙසියපස්වන (1)ᴗ ᴗ (2)– – (3)ᴗ ᴗ (4)– – යන්න ද, දෙසියදෙවිසිවන (1)–ᴗ (2)– – (3)–ᴗ (4)– – යන්න ද, දෙසියඑකුන්සාළිස්වන (1)ᴗ – (2)– – (3)ᴗ – (4)– – යන්න ද, දෙසියසපණස්වන (1) – – (2) – – (3) – – (4) – – යන්න දැයි යන සොළොස ද්ව්‍යක්ෂරච්ඡන්දසෙහි ලැබෙන සමඅර්ධසමවෘත්ත හෙයින් විෂමවෘත්තසඞ්ඛ්‍යාවෙන් අත්හළ යුතු. එහෙත් ප්‍රස්තාර වෘත්තගණනාවෙහි ඔහු ද ගිණිය යුතුවෙත්. නෂ්ටොද්දිෂ්ටයන් නොවරදින පිණිසයි. එවිට ද්ව්‍යක්ෂරච්ඡන්දසෙහි ශුද්ධවිෂමවෘත්ත දෙසියසාළිසකි. ත්‍ර්‍යක්ෂරච්ඡන්දසෙහි විෂමවෘත්තප්‍රස්තාරය ද්වාදශාක්ෂරසමවෘත්තච්ඡන්දසෙහි ප්‍රස්තාරය මෙන් කොට ත්‍ර්‍යක්ෂරච්ඡන්දසෙහි ලැබෙන ශුද්ධසම-අර්ධසමවෘත්තයන් හැර ප්‍රස්තාරය ශුද්ධ කර ගත යුතු. සෙසු විෂමවෘත්තයන්හි ප්‍රස්තාරය ද මේ ක්‍රමයෙන් ම දත යුතු·

## IV ආර්‍යාප්‍රස්තාරය.

ආර්‍යාප්‍රස්තාරයෙහි ද අඩි දෙක ම එක් කොට එක් පාදයක් සේ තබා ගත යුතු. එහි දී ගුරු යට ලුහු නො ව ඒ ඒ ගණ ම යෙදිය යුතු. ආර්‍යාප්‍රස්තාරයෙහි දී මුලට යෙදිය යුතු පාදය මෙසේයි:—



මෙසේ තබා ගෙණ ප්‍රථමගණය යට දෙවෙනිවූ සගණය යොදා සෙස්ස පූර්වපාදය සේ කළයුතු. තුන්වන පඞ්ක්තියෙහි දී ප්‍රථමගණස්ථානය විෂම හෙයින් ජගණය නො යොදා භගණය යොදා සෙස්ස පෙර සේ ම යෙදිය යුතු. මේ ක්‍රමයෙන් සර්වලඝු වෘත්තය ලැබෙන තෙක් කළ යුතු වේ. භෙද කෙළගණනකි. ප්‍රස්තාර කොට දක්විම නො හැක. ක්‍රමය පමණක් දත ගත යුතුයි. ප්‍රස්තාරයෙහි අන්තයට ලැබෙන්නේ



මෙබඳු වෘත්තයකි මෙහි ප්‍රථමභෙදයෙහි ෂෂ්ඨස්ථානයන්හි ජගණ සර්වලඝුගණයන්ගෙන් එකක් ම යෙදෙන හෙයින් සර්වගුරුගණය නො යෙදේ. අන්ත ගුරුහුගේ විකල්පයක් නැතිහෙයින් සර්වලඝු පාදයේ දී පවා ලඝුවක් නො යෙදේ.

## V මාත්‍රාප්‍රස්තාරය.

මාත්‍රාප්‍රස්තාරයෙහි ද සර්වගුරුවෘත්තය මුලට තබා ගත යුතු. වර්ණවෘත්තප්‍රස්තාරයට වඩා එහි ලැබෙන වෙනස එලුසඳස්හි මෙසේ දක්වනලදී:—

"මත්පිරිහුනුවිරිත දනෙතෙ'නැනැ මතො'වැ අතින්,
මත්වැඩිවිරිත් දුට එහි මැ එ මැ මත සමනවි"

ෂණ්මාත්‍රච්ඡන්දසෙහි සර්වගුරුවෘත්තය ගුරුඅකුරුතුණකි. එහෙයින් ඒ ඡන්දස ප්‍රස්තාර කට යුතු කල්හි ⏑ ⏑ ⏑ මෙසේ ගුරු රෙඛා තුණක් මුලට යොදා ගත යුතු. වර්ණවෘත්තප්‍රස්තාරයෙහි මෙන් ම ප්‍රථමගුරුහු යට ලඝුවක් ලියා ශෙෂය උඩපෙළ සේ කළවිට –⏑ ⏑ යන්න ලැබේ. එහි මාත්‍රාවක් පිරිහී තිබෙනබව

පෙණේ. ෂණ්මාත්‍රවජ්ඡන්දස හෙයින් මාත්‍රා සයක් ම තිබිය යුතු හෙයින් ආදියෙහි වූ ලඝුවට මූලින් තවත් මාත්‍රාවක් (—) යොදා ගත යුතු. "මත්-අතින්"යි එලූවෙහි කියනලද්දේ එයයි. මාත්‍රා වක් එක් කළවිට – – ◡ ◡ යන්න ලැබේ. නැවත ආදියෙහි වූ ගුරුහු යට ලඝුව ලියා ශෙෂය පෙර සේ ලියූ කල – ◡ යන්න ලැබේ. මීට මුලින් ස්ථානදෙකක් හිස් ව තිබේ. "ගුරින් පුරා උනුතැන්"යි කරණලද නියමය පරිදි ඒ දෙපල ගුරින් පුරවත් නම ගිය විට මාත්‍රාවක් වැඩි වේ. එහෙයින් මූලින් යෙදිය යුතු මාත්‍රාංදෙක වූ ගුර එක් මාත්‍රාවක් කොට යෙදිය යුතු. එවිට – ◡ – ◡ තුන්වනපෙළ මෙසේ වේ. මෙහි පළමුවන ගුර යටින් ලඝුව ඇඳ ශෙෂය මෙසේ ම කොට ඌනස්ථානය ගුරින් පිරවූ විට ◡ – – ◡ යන්න ලැබේ. මේ ක්‍රමයෙන් සර්වලඝුවෘත්තය වූ – – – – – – යන්න ලැබෙන තෙක් ම ප්‍රස්තාර කරණු. සර්වගුරු වෘත්තයක් නොලැබෙන ත්‍රිමාත්‍රික – පඤ්චමාත්‍රික – සප්තමාත්‍රිකාදිවජ්ඡන්දස්හි ආදිලඝුවෘත්තය මූලට යොදා ගත යුතු. මෙහි ද ක්‍රමය පෙර සේ මැයි. අඩුවන මාත්‍රා පඞ්ක්තියෙහි මූලින් යෙදිය යුතු. ඌනස්ථාන ගුරින් පුරවනවිට මාත්‍රා වැඩි වුවොත් අඩු කොට සම සේ යෙදිය යුතු. චතුර්මාත්‍රප්‍රස්තාරය (9 පිටෙහි) යට දක්වා ඇත. මෙහි ද ඡන්දස් කිපයක් ප්‍රස්තාර කරණු ලැබේ. එයින් මාත්‍රාප්‍රස්තාරය පුහුණු කර ගත යුතු.

මාත්‍රා 6.

| | |
|---|---|
| ◡ ◡ ◡ | 1 |
| — — ◡ ◡ | 2 |
| — ◡ — ◡ | 3 |
| ◡ — — ◡ | 4 |
| — — — — ◡ | 5 |
| — ◡ ◡ — | 6 |
| ◡ — ◡ — | 7 |
| — — — ◡ — | 8 |
| ◡ ◡ — — | 9 |
| — — ◡ — — | 10 |
| — ◡ — — — | 11 |
| ◡ — — — — | 12 |
| — — — — — — | 13 |

මාත්‍රා 7.

| | |
|---|---|
| — ◡ ◡ ◡ | 1 |
| ◡ — ◡ ◡ | 2 |
| — — — ◡ ◡ | 3 |
| ◡ ◡ — ◡ | 4 |
| — — ◡ — ◡ | 5 |
| — ◡ — — ◡ | 6 |
| ◡ — — — ◡ | 7 |
| — — — — — ◡ | 8 |
| ◡ ◡ ◡ — | 9 |
| — — ◡ ◡ — | 10 |
| — ◡ — ◡ — | 11 |
| ◡ — — ◡ — | 12 |
| — — — — ◡ — | 13 |
| — ◡ ◡ — — | 14 |
| ◡ — ◡ — — | 15 |
| — — — ◡ — — | 16 |
| ◡ ◡ — — — | 17 |
| — — ◡ — — — | 18 |
| — ◡ — — — — | 19 |
| ◡ — — — — — | 20 |
| — — — — — — — | 21 |

ප්‍රස්තාරය මෙතෙකින් නිමි.

4. නෂ්ටස්‍ය යො භවෙදඞකස්තස්‍යාර්ධේ'ර්ධෙ සමෙ ච ලඃ,
විෂමෙ චෛකමාධාය තස්‍යා'ර්ධේ'ර්ධෙ ගුරුර්භවෙත්.

---

ප්‍රස්තාරප්‍රත්‍යය දක්වා දැන් නෂ්ට ප්‍රත්‍යය දක්වනුවෝ "නෂ්ටස්‍ය' යනාදීන් කියත්.

4. **නෂ්ටස්‍ය**= නෂ්ටවෘත්තයාගේ; **යඃ අඞකඃ භවෙත්**= යම් සඞ්ඛ්‍යාවක් වේ ද; **තස්‍ය**= ඒ අඞකයාගේ; **අර්ධේ අර්ධෙ**= අර්ධයක් අර්ධයක්; **සමෙ**= සම කල්හි; **ලඃ ච**= ලඝුවක් ද වේ. **විෂමෙ**= විෂම කල්හි; **එකම් ආධාය**= (අතින්) එකක් බහා හෙවත් එක් කොට' (ගත යුතු.), **තස්‍ය**=(එසේ එකක් එක් කොට ගත්) ඒ අඞකයාගේ; **අර්ධේ අර්ධෙ**= අර්ධයෙක්හි අර්ධයෙක්හි; **ගුරුඃ ච භවෙත්**= ගුරක් ද වන්නේය.

## I වර්ණවෘත්තනෂ්ටප්‍රත්‍යය.

**පඃ**—මෙපමණ අකුරුඇති ඡන්දස්හුගේ ප්‍රස්තාරයෙහි මේ වෘත්තයාගේ ගුරුලඝු කෙසේ දැයි සඞ්ඛ්‍යාවක් පෙන්වා විචාළවිට ඒ ප්‍රස්තාර නො කොට ගුරලඝුවින්‍යාසය දැන ගන්නා ක්‍රමය මෙයින් දක්වනලදී. මෙයින් ම ප්‍රස්තාරයෙහි ශුද්ධාශුද්ධභාවය දත හැකි වේ. කියනලද සඞ්ඛ්‍යාව අර්ධකළ (දෙකින් බෙදිය) හැකි නම් අර්ධ කොට ලඝුරේඛාවක් ලියා ගත යුතු. දෙකින් බෙදිය නො හැකි නම් එකක් එක් කොට බෙදා ගුරුරේඛාවක් ලියා ගත යුතු. නැවත ද දෙකින් බෙදා ලැබුනු ඵලය දෙකින් බෙදිය හැකි නම් බෙදා ලඝුවක් ද, බෙදිය නො හැකි නම් එකක් එකතු කොට බෙදා ගුරක් ද ලියා ගත යුතු වුවමනා අක්ෂරසඞ්ඛ්‍යාව සම්පූර්ණ වන තෙක් මෙසේ ම කරණු.

චතුරක්ෂරච්ඡන්දසෙහි එකොළොස්වන වෘත්තය කෙසේ ද?. එකොළොස දෙකින් බෙදිය නො හැකි බැවින් එකක් එක් කොට බෙදා 'ං' ගුරක් ලියා ගත යුතු. දෙකින් බෙදීමෙන් ලත් ඵලය සයක් වීය. එය දෙකින් බෙදිය හැකිහෙයින් බෙදා '—' ලඝු වක් ලියා ගත යුතු. සය දෙකින් බෙදීමෙන් ලැබුනු ඵලය තුණකි. එය දෙකෙන් බෙදිය නො හැකි බැවින් එකක් එකතු කොට බෙදා 'ං' ගුරක් ලියා ගත යුතු ඵලය වූ දෙක දෙකෙන් බෙදිය හැකි බැවින් '—' ලඝුවක් ලියා ගත යුතු. චතුරක්ෂරච්ඡන්දසෙහි වෘත්තයක ගුරුලඝු විචාළහෙයින් මින් මතු බෙදිය යුතු නො වේ. චතුරක්ෂරයට අධිකඅක්ෂර ඇති ඡන්දසක නම් දෙකින් බෙදා ලත් ඵලය එකක් වී නම් නො බෙදා ම වුවමනා අකුරු ගණන සම්පූර්ණ වන්නට ගුරු ලියා ගත යුතු. චතුරක්ෂරච්ඡන්දසෙහි එකොළොස්වන වෘත්තයෙහි 'ං – ං –' යන වසයෙන් ගුරු

ලඝු පිහිටා තිබෙන බව යථොක්තක්‍රමයෙන් පෙණේ. මෙසේ ම පඤ්චාක්ෂරෂඩක්ෂරාදීවූ ඡන්දස් ප්‍රස්තාර කොට නෂ්ටප්‍රත්‍යයෙන් ඒ ඒ වෘත්තයන්හි ගුරුලඝු සොයා නෂ්ටය ප්‍රගුණ කර ගත යුතු.

චතුර්දශාක්ෂරච්ඡන්දසෙහි දෙදස්නවසියතිස්තුන්වන වෘත්තයාගේ ගුරුලඝුවින්‍යාසය මෙසේ සොයනු.

```
    2933
       1
2 | 2934
    1467= ᴗ 1.
       1
2 | 1468
  2 | 734= ᴗ 2.
      367= – 3.
        1
2 | 368
2 | 184= ᴗ 4.
  2 | 92= – 5.
  2 | 46= – 6.
      23
       1

2 | 24
2 | 12= ᴗ 8.
  2 | 6= – 9.
      3= – 10.
      1
2 | 4
2 | 2= ᴗ 11.
    11= – 12.
2 | 2
    1= ᴗ 13. ᴗ 14.
```

| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ᴗ | ᴗ | – | ᴗ | – | – | – | ᴗ | – | – | ᴗ | – | ᴗ | ᴗ |

(වසන්තතිලකාවෘත්තය බලනු). ගුරුලඝු දැන ගත යුතු සෙසු වෘත්තයන්හි ද මේ ක්‍රමයෙන් දත යුතු.

## II අර්ධසමවෘත්තනෂ්ටප්‍රත්‍යය.

අර්ධසමවෘත්තයන්ගේ ගුරුලඝු නො පෙණී ගිය කල්හි යථොක්තක්‍රමයෙන් සංඛ්‍යාව බෙදීමෙන් අර්ධයක ම ගුරුලඝු සොයා ගතයුතු. ව්‍යක්ෂරපාද ඇති අර්ධසමප්‍රස්තාරයෙහි තෙළෙස් වන වෘත්තයෙහි ගුරුලඝු කෙසේ ද?.

```
   13+1
      1
2 | 14÷2= ᴗ 1
     7+1
      1
2 | 8÷2= ᴗ 2
2 | 4÷2= – 3
2 | 2÷2= – 4
    1
```

"ᴗ ᴗ – –" යන ක්‍රමයෙන් ගුරුලඝු යෙදෙනබව පෙණේ. ඒඅර්ධයකි. අනෙක් අර්ධයත් මේ ලෙසින් ගත්විට පද්‍යය සම්පූර්ණ වේ අර්ධසමප්‍රස්තාරය බලනු. මේ සංඛ්‍යාව ලැබෙන්නේ ශුද්ධසමවෘත්ත නො හළවිට ය. සමවෘත්තහළොත් (ᴗ ᴗ – –) දශමඅර්ධසමවෘත්තය වේ. අර්ධසමප්‍රස්තාරයෙහි දී ශුද්ධසමවෘත්ත ද සංඛ්‍යාවට ගිණිය යුතු බව යට කියනලදී.

## III විෂමවෘත්තනෂ්ටප්‍රත්‍යය.

විෂමවෘත්තයන්ගේ නෂ්ටය ද යථොක්තක්‍රම මැයි. පාද සතරම එක් කොට ප්‍රස්තාර කළහෙයින් පාදසතරෙහි ම ලක්ෂණ නෂ්ටයෙන් සෙවිය යුතු. ව්‍යක්ෂරපාදවිෂමවෘත්තප්‍රස්තාරයෙහි එක්සියදෙසැත්තෑවන වෘත්තයෙහි ගුරුලඝුවින්‍යාසය කෙසේ ද?

2 | 172÷2 = – 1
2 | 86÷2 = – 2
43+1
1
2 | 44÷2 = ⏑ 3
2 | 22÷2 = – 4
11+1
1
2 | 12÷2 = ⏑ 5
2 | 6÷2 = – 6
3+1
1
2 | 4÷2 = ⏑ 7
2 | 2÷2 = – 8
1

පාදසතරෙහි ම අකුරු අටක් බැවින් සතර පාදයෙහි ගුරුලඝු මෙසේයි:—

| 1.-පාදය | 2.-පාදය | 3.-පාදය | 4.-පාදය |
|---|---|---|---|
| — — | ⏑ — | ⏑ — | ⏑ — |
| 1. 2. | 3. 4. | 5. 6. | 7. 8. |

ව්‍යක්ෂරපාදවිෂමවෘත්තප්‍රස්තාරයෙහි එක්සියඑක්සැත්තෑවන අධිසමවෘත්තය යට දක්වා ඇත. එය හා මෙය ද ප්‍රස්තාරක්‍රමයෙන් සමකොට බලනු. IV ආර්‍යානෂ්ටප්‍රත්‍යය යට (32–34 පිටුවල) දක්වා ඇත.

## V මාත්‍රාවෘත්තනෂ්ටප්‍රත්‍යය.

මේ වනාහි යථොක්තක්‍රමයට වෙනස් වේ. පළමු කොට ගුරුලඝුවින්‍යාසය සොයා ගත යුතු වෘත්තය අයත් මාත්‍රාඡන්දසෙහි සර්වලඝුවෘත්තය ලියා ගත යුතු. පඤ්චමාත්‍රිකච්ඡන්දස නම් — — — — — මෙසේ ලියා ගත යුතු. ඉන් පසු මුල ලඝුහුගේ මතුවෙහි එකසඞ්ඛ්‍යාව (1) ලිය යුතු. දෙවෙනි ලඝුහුගේ මතුවෙහි ද්විසඞ්ඛ්‍යාව (2) ලියා ගත යුතු. ඒ දෙපෙළෙහි වූ අඞ්ක දෙක එක් කොට ත්‍රිසඞ්ඛ්‍යාව තුන්වන ලඝුහුගේ මතුවෙහි (3) ලියා ගත යුතු. ඒ දෙකත් තුණත් එක් කොට පඤ්චසඞ්ඛ්‍යාව සතර වැන්න මතුවෙහි (5) ලියනු. එසේ ම තුණත් පසත් එක් කොට අෂ්ටසඞ්ඛ්‍යාව පස්වැන්න මතුවෙහි (8) ලියයුතු. එවිට මෙසේ වේ:- ("1 2 3 5 8"). මීට අධිකමාත්‍රා ඇති ඡන්දසක් වුවත් සර්වලඝුවෘත්තය ලියා ගෙණ මේ පිළිවෙළින් මුලින් යෙදූනු සඞ්ඛ්‍යා දෙක එක් කොට ඉදිරියෙහි වූ ලඝුහු මතුවෙහි ලියා ගත යුතු. නෂ්ටවෘත්තයාගේ සඞ්ඛ්‍යාව ලඝුමතුවෙහි තිබෙන ඉතාවැඩි සඞ්ඛ්‍යාවෙන් (සඞ්ඛ්‍යානයෙන්) අඩු කරණු. පඤ්චමාත්‍රිකච්ඡන්දසෙහි සතරවන වෘත්තය සොයා ගත යුතු නම් ඒ සතර පස්

වැන්න මතුවෙහි වූ අටෙන් අඩු කරණු. එවිට සතරක් ලැබේ. ඒ සතරෙන් අඩු කළහැකි (මාත්‍රාමස්තකයෙහි පිහිටි) ඉතා වැඩි සඞ්ඛ්‍යාව නැවතත් අඩු කරණු. වැඩි ගණන නම් තුණයි. අඩු කළවිට එකක් ඉතිරි වීය. ඒ එකෙන් ද ප්‍රථමස්ථානයෙහි තිබෙන එක අඩුකළහැකි හෙයින් අඩු කරණු. මෙසේ අඩුවූ සඞ්ඛ්‍යාවන් යට පිහිටි මාත්‍රා ඒ ඉදිරියෙහි පිහිටි මාත්‍රාවන් සමග එකතු කොට ගුරු කරණු. මෙහි පළමුවන මාත්‍රාව උඩ සිටි අඞ්කය අඩුවූහෙයින් ඒ ඉදිරියෙහි සිටි දෙවනමාත්‍රාවත් එක් කොට (1+2) මෙසේ ගුරක් කරණු. තුන්වනමාත්‍රාව ලඟ පිහිටි සඞ්ඛ්‍යාව ද අඩුවූ හෙයින් තුන්වනමාත්‍රාවත් සතරවනමාත්‍රාවත් එක් කොට ගුරක් යොදනු. අතික්මාත්‍රාවන්ගේ විකාරයක් නොවේ. දැන් පඤ්චමාත්‍රිකච්ඡන්දසෙහි සතරවනවෘත්තය "◡ ◡ –" මෙසේ බව නෂ්ටවිධියෙන් පෙණේ. සප්තමාත්‍රච්ඡන්දසෙහි පස්වනවෘත්තයෙහි ගුරුලඝු කෙසේ ද?.

```
      +        +
1  2  3  5  8  13  21
—  —  —  —  —  —   —
      ◡          ◡
```

වෘත්තය මෙසේයි:- — — ◡ — ◡

```
21— 5
 5
16—13
13
 3—8
 3
 0
```

\+ මේලකුණලඟ තිබෙන අඞ්ක අඩුවූ හෙයින් තදධඃස්ථ මාත්‍රා ඉදිරියෙහි වූ මාත්‍රාවන් සමග එක් ව ගුරු වීය.

මාත්‍රා දෙලොසක් ඇති ඡන්දසෙහි හැත්තෑහත්වන වෘත්තය මෙසේ සොයනු.

```
+ + +                                  +
1.2.3.5.8.13.21.34.55.89.144.233
- - - - — — — — — — —
◡ ◡ ◡                                  ◡

233—77          4—3
 77             3
166—144         1—1
144             1
 12—8           0
  8
  4
```

ඒ වෘත්තය මෙසේයි:— "◡ ◡ ◡ – – – – – ◡". සෙසු තන්හි ද මේ ක්‍රමයෙන් ම නෂ්ටවෘත්තයන් සොයා ගත යුතු.

මාත්‍රානෂ්ටප්‍රත්‍යය මෙසේ උගන්වනලදි:—

"නෂ්ටෙ සඞ්ඃ කලාඃ කාය්‍යාඃ අඞ්කන්‍යාසස්තු පූර්වවත්,
පෘෂ්ටො'ඞ්කඃ ශෙෂඅඞ්කො ලොප්‍යඃ පරෙ'ප්‍යඞ්කොත්‍ර ලුප්‍යතෙ
යස්‍ය යස්‍ය භවෙල්ලොපඃ ව්‍යුත්ක්‍රමෙණ පුනඃ පුනඃ,
තදධො ගුරුතාමෙති පරයා කලයා සහ"

**නෂ්ටප්‍රත්‍යය මෙතෙකින් නිමි.**

5. උද්දිෂ්ටං ද්විගුණානාද්‍යාදුපර්‍යඞ්කාන් සමාලිඛෙත්,
[1]ලඝුස්ථා යෙ තු තත්‍රාඞ්කාස්තෛඃ සෛකෛර්මිශ්‍රිතෛර්
භවෙත්.

---

දූන් උද්දිෂ්ටප්‍රත්‍යය කියනු ලැබේ.

5. **ආද්‍යාත්**=(උදෙසනලදවෘත්තයාගේ) ප්‍රථමාක්ෂරයෙහි පටන්; **උපරි**= (අකුරු) මතුවෙහි; ('ආද්‍යාත්' යනු මෙහි ද අධ්‍යාහාර කරණු.) **ආද්‍යාත්**= ආදිවූ එකාඞ්කයෙහි පටන්; **ද්විගුණාන්**= දියුණු කරණලද හෙවත් දෙකින් ගුණ කරණලද; **අඞ්කාන්**= අඞ්කයන්; **සමාලිඛෙත්**= ලියන්නේය. **තත්‍ර**= එහි; **ලඝුස්ථාඃ**= ලඝු අකුරුමතුවෙහි සිටි; **යෙ තු අඞ්කාඃ**= යම් අඞ්කකෙනෙක් ඇද් ද; **මිශ්‍රිතෛඃ**= මිශ්‍ර කරණලද හෙවත් එකතු කරණලද; **සෛකෛඃ**= එකක් සහිත වූ; **තෛඃ**= ඒ ලඝුස්ථඅඞ්කයන් කරණ කොට ගෙණ; **උද්දිෂ්ටම්**= උද්දිෂ්ටවෘත්තය හෙවත් තත් සඞ්ඛ්‍යාව; **භවෙත්**=වන්නේය.

## 1 සමවෘත්තඋද්දිෂ්ටප්‍රත්‍යය.

**භා**:-වෘත්තයක ගුරුලඝු පෙන්වා මේ වෘත්තය ප්‍රස්තාරයෙහි කතමස්ථානයෙහි ලැබේ දැයි විචාළවිට ප්‍රස්තාර නො කොට එය දැන ගන්නා ක්‍රමය මෙහි දක්වනලදී. මෙයින් ද ප්‍රස්තාරයාගේ ශුද්ධාශුද්ධත්වය විවෙචනය කළහැක. ගුරුලඝු උදෙසා මෙබඳු වෘත්තය ප්‍රස්තාරයෙහි කතමවෘත්තය දැයි විචාළවිට ගුරුලඝු වින්‍යාසය කර ප්‍රථමාක්ෂරය (රේඛාව) මතුවෙහි එකාඞ්කය ලියනු. එය දෙකෙන් ගුණ කොට ලත් ඵලය වූ දෙක දෙවනඅක්ෂරය මතුවෙහි ලිය යුතු. එය නැවත දෙකෙන් වැඩි කොට ලත්ඵලය වූ සතර තුන්වනඅකුර මතුවෙහි ලිය යුතු. සතර දෙකෙන් ගුණ කොට ලත් ඵලය වූ අට සතරවනඅකුරමතුවෙහි ලිය යුතු. මෙසේ වෘත්තයෙහි අකුරු අවසන් වන තෙක් සඞ්ඛ්‍යා දෙකෙන් ගුණ කොට ලියා ලඝුඅක්ෂරයන් මතුවෙහි සිටි අඞ්ක සියල්ල එක් කොට තවත් එකක් ද එකතු කරණු. ලැබෙන ඓක්‍යය උද්දිෂ්ටවෘත්තයාගේ සඞ්ඛ්‍යාවයි. නිදර්ශන මෙසේයි:—

“භවති සඃ” යන වෘත්තය ප්‍රස්තාරයෙහි කතමවෘත්තය ද? එහි වින්‍යාසය හා සඞ්ඛ්‍යාස්ථාපනය මෙසේයි:- “1 2 4 8”. ලඝූන්ගේ මතුවෙහි සිටි අඞ්ක එක් කළවිට (1+2+4=7) සතක් ලැබේ. ඊට එකක් එකතු කළවිට අටක් ලැබේ. එහෙයින් චතුරක්ෂරච්ඡන්දසෙහි අෂ්ටමවෘත්තය බව පෙණේ. ප්‍රස්තාරය බලනු. වසන්තතිලකාව ප්‍රස්තාරයෙහි කතමවෘත්තය ද? එහි වින්‍යාසාදිය මෙසේයි:—

---

1. ලඝුස්ථානෙ තු යෙ'ඞ්කාඃ ස්‍යුඃ.

"1 2 4 8 16 32 64 128 256 512 1024 2048"
⏑ ⏑ — ⏑ — — — ◡ — — ◡ — ◡ ◡

2048<br>512<br>256<br>64<br>32<br>16<br>4<br>——<br>2932<br>1<br>——<br>2933

චතුර්දශාක්ෂරච්ඡන්දසෙහි දෙදහස්නවසියතිස්තුන්වන වෘත්තය වේ. නෂ්ටයෙන් ද මේ සඞ්ඛ්‍යාවෙහි ගුරුලඝු සෙවිය යුතු. මෙහි අග පිහිටි ගුරුඅකුරුමතුවෙහි සඞ්ඛ්‍යා නො යොදනලද්දේ කවරහෙයින් දැයි සිතිය යුතු. උද්දිෂ්ටය පිළිබඳ තවත් ක්‍රමයක් ද ඇති නමුත් මේ ම ප්‍රමාණහෙයින් ප්‍රපඤ්ච නො කරමු. අන්‍යවෘත්තයන්හි ද උද්දිෂ්ටය මෙසේයි.

II අර්ධසම III විෂමවෘත්තයන්ගේ උද්දිෂ්ටය ද යට කියන ලද ක්‍රමයන්ගෙන් ම යොග්‍ය සේ සිද්ධ කර ගත යුතු. සමවෘත්තඋද්දිෂ්ටයට කිනයින් අර්ධසමවෘත්තයන්හි අර්ධයක ලක්ෂණ ද, විෂමවෘත්ත නම් පාදසතරෙහි ම ලක්ෂණ ද සොයා ගත යුතු. IV ආර්‍යාවන්ගේ උද්දිෂ්ටය ද යට (35-36 පිටුවල) දක්වනලදී.

---

## V මාත්‍රාවෘත්තඋද්දිෂ්ටය.

උදෙසනලද වෘත්තයාගේ ගුරුලුහු ඇඳ ප්‍රථමමාත්‍රාව මතුවෙහි එක ලියනු. ද්විතීයමාත්‍රාව මතුවෙහි දෙක ද, තෘතීයමාත්‍රාව මතුවෙහි නෂ්ටයෙහි මෙන් තුණ ද, චතුර්ථමාත්‍රාව මතුවෙහි පස ද, පඤ්චමමාත්‍රාව මතුවෙහි අට ද, ලියා ගත යුතු. සෙසුතන්හි ද මෙසේයි. ගුරුඅකුරක මාත්‍රා දෙකක් ඇතිබැවින් අඞ්ක මිශ්‍ර නොවන පිණිස

1 3 8<br>⏑ ⏑ ⏑<br>2 5 13

යන වශයෙන් හිත සඞ්ඛ්‍යාව ගුරට උඩිනුත් අධිකසඞ්ඛ්‍යාව යටිනුත් ලියා ගත යුතු. මෙසේ කොට ගුරුඅකුරුමතුවෙහි සිටි අඞ්කයන් එක් කොට සඞ්ඛ්‍යානයෙන් අඩුකළවිට වෘත්තයාගේ සඞ්ඛ්‍යාව ලැබේ. ('සඞ්ඛ්‍යානය'නම් ඡන්දස ප්‍රස්තාර කළවිට ලැබෙන වෘත්තගණනයි. එකමාත්‍රච්ඡන්දසෙහි සඞ්ඛ්‍යානය එකකි. ද්විමාත්‍රිකයෙහි දෙකකි. ත්‍රිමාත්‍රිකයෙහි තුණකි. චතුර්මාත්‍රිකයෙහි පසකි. පඤ්චමාත්‍රිකයෙහි අටකි. ෂණ්මාත්‍රිකයෙහි තෙළෙසකි සප්තමාත්‍රිකයෙහි එක්විස්සකි. නෂ්ටයෙහි කිපරිද්දෙන් අඞ්ක එකතු කිරීමෙන් සඞ්ඛ්‍යානය සොයා ගත හැක.) – ⏑ – ⏑ – මේ වෘත්තය ප්‍රස්තාරයාගේ කතමස්ථානයෙහි ලැබේ ද?

1 2 5 8 21<br>— ⏑ — ⏑ —<br>3 13

6. වර්ණාන් වෘත්තභවාන් සෛකානෞත්තරාධර්‍ය්‍යතඃ ස්ථිතාන්,
එකාදි[1]ක්‍රමතශ්චෛතානුපර්‍ය්‍යුපරි නික්ෂිපෙත්.

---

ගුරුමතුවෙහි සිටි අඞ්ක: 8
2
10

අනතිමමාත්‍රාව ලඟ පෙණෙන අඞ්කය හෙවත් සඞ්ඛ්‍යානය 21
10
11

එකොළොස්වනවෘත්තයයි.

“මාත්‍රාසමකං නවමො ල්ගාන්තම්”යන්න ප්‍රස්තාරයෙහි කතම ස්ථානයෙහි ලැබේ ද? එහි වින්‍යාසය හා අඞ්ක පිහිටුවීමත් මෙසේ ය:—

1. 3. 8. 13. 21. 55. 89. 144. 377. 987.
◡ ◡ — — ◡ — — ◡ ◡ ◡
2. 5. 34. 233. 610. 1597.

| | |
|---|---|
| ගුරුන් මතුවෙහි සිටි අඞ්ක: 987 | සඞ්ඛ්‍යානය 1597 |
| 377 | ඓක්‍යය 1533 |
| 144 | 64. වෘත්තයාගේ අඞ්කයයි |
| 21 | |
| 3 | |
| 1 | |
| ඓක්‍යය 1533 | |

සෙස්සෙහි ද මේ ක්‍රමයෙන් උද්දිෂ්ටාඞ්කය සොයනු. මාත්‍රා උද්දිෂ්ටප්‍රත්‍යය මෙසේ උගන්වනලදී:—

“මාත්‍රායාං ප්‍රථමං සමෝ'ඞ්ක උපරි ස්ථාප්‍යො යුගායාං වයං
සංයුජ්‍යේකායුගෙ ත්‍රයං ච ත්‍රිකලාමූර්ධ්නි වයෙන ත්‍රයම්,
එකීකෘත්‍ය ච පඞ්ක්තිකං ජලනිධාවෙවං කෘතෙ ලුප්‍යතෙ
ශිෂ්ටෙ තද්ගුරුමූර්ධ්නිකාඞ්ක ඉහ වෙද්‍යුද්දිෂ්ටබොධස්තදා.”

### උද්දිෂ්ටප්‍රත්‍යය සමාප්තයි.

---

උද්දිෂ්ටප්‍රත්‍යයට අනතුරු ව එකද්‍ව්‍යාදිලගක්‍රියාව දක්වනුවෝ “වර්ණාන්” යනාදිය කියත්.

6. **වෘත්තභවාන්**= ඡන්දසෙහි වූ; **වර්ණාන්**= වර්ණයන් (වර්ණ සඞ්ඛ්‍යාතඅඞ්කයන්); **සෛකාන්**= එකක් සහිත වූවන්; **ඖත්තරාධර්‍ය්‍යතඃ**= උත්තරාධරත්වයෙන්; **ස්ථිතාන්**= සිටියවුන්;(‘කුයර්ත්’

---

1. ක්‍රමශඃ.

**7.** උපාන්ත්‍යතො නිවර්තේත [2]ත්‍යජන්නෙකෛකමූර්ධ්වතඃ,
උපර්‍ය්‍යාද්‍යාද්ගුරොරෙවමෙකද්ව්‍යාදිලගක්‍රියා.

---

යනු අධ්‍යාහාරයයි.) **කුර්‍ය්‍යාත්**= කරන්නේ ය. **එතාන්**= (මෙසේ පිහිටුවනලද) මේ වර්ණයන්; **එකාදික්‍රමතඃ**= එකය දෙකය යනාදි ක්‍රමයෙන්; **උපර්‍ය්‍යුපරි**= මතුමතු අඞ්කයෙහි; **නික්ෂිපෙත් ච**= බහාලන්නේය හෙවත් එකතු ද කරන්නේ ය.

7. **ඌර්ධ්වතඃ**= මුදුනෙන්; **එකෛකම්**= එකක් එකක්; **ත්‍යජන්**= හරිමින්; **උපාන්ත්‍යතඃ**= උපාන්ත්‍යයා (අන්තිම අඞ්කයට සමීපයා) කෙරෙන්; **නිවර්තේත**= නවතින්නේ ය. **එවම්**= මෙසේ (කල කල්හි); **උපරි**= මත්තෙහි; **ආද්‍යාත් ගුරොඃ**= ප්‍රථමගුරු (සර්වගුරු) වෘත්තයා පටන්; **එකද්ව්‍යාදිලගක්‍රියා**= එකලඝු, එකගුරු, විලඝු, විගුරු යනාදි වශයෙන් ලඝුගුරුන්ගේ ක්‍රියාව වේ.

**ප:**—ඡන්දසක ලැබෙන එකගුරුවෘත්ත-විගුරුවෘත්තාදීන් කොපමණ කොපමණ දැයි ප්‍රස්තාර නො කොට ම දැන ගැණීමට උපාය මෙයින් දක්වනලදී. එකගුර්වාදිවෘත්ත දැන ගැණීමට වුව මනා ඡන්දසෙහි අකුරුගණනට සරිලන එකාඞ්කයන් අධිකයකුත් සහිත ව පෙළට ලියා ගත යුතු. අකුරුසතරක්ඇති ඡන්දස නම් "1 1 1 1 1" මෙසේ එකාඞ්ක පසක් ලියා ගත යුතු වේ. එසේ ම ප්‍රථමාඞ්කයට කෙළින් යටිකුරුව ද අඞ්කපසක් ඇතිවන සේ ප්‍රථමාඞ්කය යටින් තවත් එකාඞ්කචතුෂ්කයක් ලියා ගත යුතු.

**1 1 1 1 1**
**1**
**1**
**1**
**1**

මෙසේ ලියූ විට ත්‍රිකෝණයක් සේ එකාඞ්ක පිහිටයි. දැන් මධ්‍යයෙහි හිස්තැන් පුරවනු. දෙවන පෙළෙහි දෙවනඉඞම හිස් හෙයින් ඊට මූලින්වූ එක උඩින් වූ එකාඞ්කය හා එකතු කොට ඓක්‍යය ලියනු. ඉන් පසු තුන්වනතැන හිස්හෙයින් ඊට මූලින් තිබෙනදෙක ඒ හිස්තැන මතුවෙහි තිබෙන එකාඞ්කය හා එක් කොට ඓක්‍යය වූ තුණ එහි ලිය යුතු. සතරවන තැන ද හිස් ව තිබෙනහෙයින් ඊට මූලින් තිබෙන තුණත් ඊට උඩින් තිබෙන එකත් එකතු කොට ඓක්‍යය වූ සතර එහි ලිය යුතු. "උඩින් එකක් හරිමින් උපාන්ත්‍යයා කෙරෙන් නැවතිය යුතු"යයි කීහෙයින් ප්‍රථම පඞ්ක්තියේ පස්වනඅඞ්කය එකතු නො කොට ඊට මූලින් තිබෙන සතරවන අඞ්කය ලඟ නැවැත්ත යුතු. එවිට දෙවෙනි පෙළ 1. 2. 3. 4. යන වශයෙන් යෙදේ. නැවත තුන්වනපෙළෙහි දෙවන ස්ථානය හිස්ව තිබෙන හෙයින් ඊට මූලින් තිබෙන එකාඞ්කයත් උඩින් තිබෙන දෙකත් එක් කොට ඓක්‍යය වූ

---

2. ත්‍යජෙදෙකෛකම්.

තුණ එහි ලිය යුතු. තුන්වන තැන ද හිස්ව තිබෙන හෙයින් ඊට මුලින් තිබෙන තුණත් උඩින් තිබෙන තුණත් එකතු කොට ඓක්‍යයවූ සය ලියා ගත යුතු. උඩින් එකක් හැර උපාන්ත්‍යයා කෙරෙන් නවතින්නට කිහෙයින් උඩපෙළෙහි සතර එකතු නො කොට නැවතිය යුතු. එවිට තුන්වනපෙළෙහි 1. 3. 6. යන වශයෙන් ලැබේ. සතරවන පෙළෙහි ද හිස්වූ දෙවන තැනට මුලින් තිබෙන එකත් උඩින් තිබෙන තුණත් එක් කොට ලියා එතැන උපාන්ත්‍යය හෙයින් එහි ම නැවැත්ත යුතු. මේ පඞ්ක්තීන්හි අන්තයෙහි පිහිටි 1. 4. 6. 4. 1. යන අඞ්කයන්ගෙන් වෘත්තසඞ්ඛ්‍යා දත හැක. යථෝක්ත පඞ්ක්ති ලියා ගන්නේ මෙසේයි:—

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 1 | 1 | 1 | 1 | 1 | සර්වගුරුවෘත්ත 1 | |
| 1 | 2 | 3 | 4 | | ඒකලඝුවෘත්ත 4 | ත්‍රිගුරුවෘත්ත. |
| 1 | 3 | 6 | | | ද්විලඝුවෘත්ත 6 | ද්විගුරුවෘත්ත. |
| 1 | 4 | | | | ත්‍රිලඝුවෘත්ත 4 | ඒකගුරුවෘත්ත. |
| 1 | | | | | සර්වලඝුවෘත්ත 1 | |
| | | | | | සඞ්ඛ්‍යාතය 6 | |

සර්වගුරු-ඒකලඝුවෘත්තාදිය ගත් සේ ම අන්තයෙහි පටන් සර්වලඝුවෘත්ත 1, ඒකගුරුවෘත්ත 4, ද්විගුරුවෘත්ත 6, ත්‍රිගුරුවෘත්ත 4, සර්වගුරුවෘත්ත 1, යන වශයෙන් ද යොදා කිය යුතු. මේ ප්‍රතිෂ්ඨා ඡන්දසෙහි ලගක්‍රියාවයි. මීට වැඩි අක්ෂරසඞ්ඛ්‍යාවක් ඇති ඡන්දසක වුවත් මේ ක්‍රමයෙන් ම ඒකලඝු ඒකගුරුවෘත්තාදිය සොයා ගත යුතුයි.

ෂඩක්ෂරගායත්‍රියෙහි ලගක්‍රියාව—

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | සර්වගුරු | වෘත්ත | 1 |
| 1 | 2 | 3 | 4 | 5 | 6 | | ඒකලඝු | ,, | 6 |
| 1 | 3 | 6 | 10 | 15 | | | ද්විලඝු | ,, | 15 |
| 1 | 4 | 10 | 20 | | | | ත්‍රිලඝු | ,, | 20 |
| 1 | 5 | 15 | | | | | චතුර්ලඝු | ,, | 15 |
| 1 | 6 | | | | | | පඤ්චලඝු | ,, | 6 |
| 1 | | | | | | | සර්වලඝු | ,, | 1 |
| | | | | | | | සඞ්ඛ්‍යාතය | | 64 |

(ඒකගුරු වෘත්තාදිය ද මෙසේම කියයුතු.)

**අන්‍යක්‍රමයක්:**—'ලීලාවතී'නම් ගණිතශාස්ත්‍රයෙහි ඡන්දස්හි ලඝක්‍රියාවට උපයෝගි වූ පහසු ක්‍රමයක්—

"ඒකාද්‍යෙකොත්තරා අඞ්කා ව්‍යස්තා භාජ්‍යාඃ ක්‍රමස්ථිතෛඃ,
පරඃ පූර්වේණ සංගුණ්‍යස්තත්පරස්තත්පරේණ ච.
ඒකද්විත්‍ර්‍යාදිභෙදාඃ ස්‍යුරිදං සාධාරණං ස්මෘතම්,
ඡන්දශ්චිත්‍යුත්තරෙ ඡන්දස්‍යුපයොගො'ස්ති තද්විදාම්."

යනුවෙන් දක්වනලදී.

**ඒ මෙසේයි:**— ලඝක්‍රියාව කළයුතු ඡන්දසෙහි අක්ෂරසඞ්ඛ්‍යාව යම්තාක් ද එපමණට 1. 2. 3. 4. යනාදිපිළිවෙළට අඞ්ක අනුලෝමයෙන් ලියා නැවත ඒ අඞ්ක මතු පිට ඒ අඞ්ක ම ප්‍රතිලෝමයෙන් යෙදිය යුතු. චතුරක්ෂරච්ඡන්දසෙහි ලඝක්‍රියාව නම් $\frac{4\ \ 3.\ \ 2\ \ 1}{1,\ 2.\ 3.\ 4}$ මෙසේ ලියා ගත යුතු. මෙහි යටපෙළෙහි මූලට තිබෙනඑකෙන් ඒ මතුවෙහි තිබෙනසතර ගුණ කොට එකට යටින් ලියා ගතයුතු නැවත ඒ සතර ඒ ඉදිරියෙහි තිබෙන තුණෙන් ගුණ කොට තුණට යටින් තිබෙනදෙකෙන් බෙදා ලැබුනු ඵලයවූ සය දෙකට යටින් ලියා ගත යුතු. ඒ සය තුණ ඉදිරියෙහි තිබෙන දෙකෙන් ගුණකොට ඵලය දෙකට යටින් තිබෙන තුණෙන් බෙදා ලැබුනු සතර තුණට යටින් ලියනු. ඒ සතර ම දෙක ඉදිරියෙහි තිබෙන එකෙන් ගුණ කොට එකට යටින් තිබෙන සතරෙන් බෙදා ලත් ඵලය වූ එක සතරට යටින් ලියා ගත යුතු. එවිට ගණන මෙසේයි:-

| | | | |
|---|---|---|---|
| 4. | 3. | 2. | 1 |
| 1. | 2. | 3. | 4 |
| 4. | 6. | 4. | 1 |

මෙහි ප්‍රථමාඞ්කයට මූලින් එකක් ලියා "1. 4. 6. 4. 1." මෙසේ ගණන සාදා සර්වගුරුවෘත්ත 1, එකගුරුවෘත්ත 4, ද්විගුරුවෘත්ත 6, ත්‍රිගුරුවෘත්ත 4, සර්වලඝුවෘත්ත 1, යන වශයෙන් වෘත්ත කිය යුතු. චතුරක්ෂරච්ඡන්දසෙහි එකගුරුවෘත්ත සතරක් නම් ත්‍රිලඝුවෘත්ත ද සතරක් ම වේ. අකුරු සතරෙන් එකක් ගුරක් වුවොත් අනික් අකුරු තුණ ලඝු වනු එකාන්ත හෙයිනි. ද්විගුරුවෘත්ත සයක් නම් ද්විලඝු වෘත්ත ද සයක් විය යුතු. ත්‍රිගුරුවෘත්ත සතර නම් එකලඝුවෘත්ත ද සතරකි. එසේ හෙයින් එකලඝ්වාදිවෘත්ත නොකිව ද දෝසක් නො වේ. මීට අධිකඅක්ෂරසඞ්ඛ්‍යාවක් ඇති ඡන්දසක වුවත් මේ ක්‍රමයෙන් ම ලඝක්‍රියාව කළහැක. නවාක්ෂර බෘහතීච්ඡන්දසෙහි ලඝක්‍රියාව මෙසේයි:—

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 9. | 8. | 7. | 6. | 5. | 4. | 3. | 2. | 1. |
| | 1. | 2 | 3. | 4. | 5. | 6. | 7. | 8. | 9. |
| (1) | 9. | 36. | 84. | 126. | 126. | 84. | 36. | 9. | 1. |

දශාක්ෂර පඞ්ක්තිච්ඡන්දසෙහි ලගක්‍රියාව මෙසේයි:—

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 10. | 9. | 8. | 7. | 6. | 5. | 4. | 3. | 2. | 1. |
| | 1. | 2. | 3. | 4. | 5. | 6. | 7. | 8. | 9. | 10. |
| (1) | 10. | 45. | 120. | 210. | 252. | 210. | 120. | 45. | 10. | 1. |

## වර්ණමෙරු ප්‍රස්තාරය.

ඒකාදිලගක්‍රියාව සඳහා පිඞ්ගලයන් විසින් "පරේපූර්ණමිති" යන සූත්‍රයෙන් මෙරුප්‍රස්තාරය දක්වනලදී. ඒ ද මෙහි දක්වනු ලැබේ. පළමුකොට මෙරුමස්තකය සඳහා චතුරශ්‍රකොෂ්ඨයක් ඇඳ ඊට යටින් එය මැදි කොට කොටු දෙකක් ඇති පෙළක් ද, ඊට ද යටින් කොටු තුණක් ද, ඒ තුණ යටින් කොටුසතරක් ද යන වසයෙන් පඞ්ක්ති සවිස්ස තෙක් නොහොත් ලගක්‍රියාව දතයුතු ඡන්දසට වැටහෙන තෙක් කොෂ්ඨපඞ්ක්ති ඇඳගතයුතු. ඉන්පසු මුදුනෙහි වූ කොටුවෙහි ඒකාඞ්කය ලියනු. එසේ ම සියලු පඞ්ක්ති වල මූල කොටුවලත් අගකොටුවලත් ඒකාඞ්ක ලියනු. මෙසේ ලියා ගත්විට තුන්වනපෙළෙහි මැදකොටුව හිස් වේ. ඊට උඩින් තිබෙන කොටුදෙකෙහි අඞ්කයන්ගේ ඓක්‍යය එහි ලියා සම්පූර්ණ කරණු. සතරවනපෙළෙහි ද දෙවනකොටුව හිස්ව තිබෙන හෙයින් ඊට උඩින් තිබෙන කොටුදෙකෙහි වූ සඞ්ඛ්‍යාවන්ගේ ඓක්‍යය එහි ලියනු. තුන්වනකොටුව ද ඊට උඩින් තිබෙන කොටුදෙකෙහි වූ සඞ්ඛ්‍යාවන්ගේ ඓක්‍යය ලියා පුරවනු. මෙසේ හැම කොටු ම ඊට උඩින් පිහිටි කොටුදෙකෙහි සඞ්ඛ්‍යාවන්ගේ ඓක්‍යයන්ගෙන් සම්පූර්ණ කරණු. එකී මෙරුප්‍රස්තාරය මෙහි පහත දක්වනු ලැබේ. (මෙරුමස්තකයෙහි වූ ඒකාඞ්කයෙන් කාර්‍ය්‍යයක් නො වේ.)

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | | | | | | | |
| 1 | 1 | | | | | | |
| 1 | 2 | 1 | | | | | |
| 1 | 3 | 3 | 1 | | | | |
| 1 | 4 | 6 | 4 | 1 | | | |
| 1 | 5 | 10 | 10 | 5 | 1 | | |
| 1 | 6 | 15 | 20 | 15 | 6 | 1 | |
| 1 | 7 | 21 | 35 | 35 | 21 | 7 | 1 |

(මෙසේ ම පඞ්ක්ති සවිස්ස තෙක් සම්පූර්ණ කළයුතුයි.)

මෙහි කොටු දෙකක් ඇති පඞ්ක්තියෙහි උක්තාවෙහි ලගක්‍රියාව ද, ත්‍රිකොෂ්ඨපඞ්ක්තියෙහි අත්‍යුක්තාවෙහි ලගක්‍රියාව ද, චතුෂ්කොෂ්ඨ පඞ්ක්තියෙහි මධ්‍යාවෙහි ලගක්‍රියාව ද, අනන්තර

පඞ්ක්තීන්හි ක්‍රමයෙන් තදනන්තරච්ඡන්දස්හි ලගක්‍රියා ද පැණේ. අෂ්ටකොෂ්ඨපඞ්ක්තියෙහි පැණෙන උෂ්ණික්ඡන්දසෙහි ලගක්‍රියාව මෙසේයි:— සර්වගුරුවෘත්ත 1, ෂඩ්ගුරු -7, පඤ්චගුරු -21, චතුර් ගුරු -35, ත්‍රිගුරු -35, ද්විගුරු -21, එකගුරු -7 සර්වලඝුවෘත්ත 1. සෙසු ඡන්දස්හි ද එකගුරුවෘත්තාදිය මේ ලෙසින් කියයුතු.

---

## II අර්ධසමලගක්‍රියාව.

පාදයක අක්ෂරසඞ්ඛ්‍යාව දෙකින් ගුණ කොට ලත් එලයට සමාන අකුරු ඇති ඡන්දසෙහි ලගක්‍රියාව සොයා එයින් සුදුසු සේ ප්‍රස්තාරයෙහි දී ලත් සමවෘත්තයන් හළවිට අර්ධසමයන්ගේ ශුද්ධලගක්‍රියාව ලැබේ. ද්‍ව්‍යක්ෂරපාද ඇති අර්ධසමවෘත්තයන්ගේ ලගක්‍රියාව මෙසේයි:- අර්ධයට අකුරුසතරකි, චතුරක්ෂරච්ඡන්ද සෙහි ලගක්‍රියාව1. 4. 6. 4. 1. යනුයි. මෙයින් ප්‍රථම-අන්ත්‍යවෘත්ත දෙක ශුද්ධසමවෘත්තහෙයින් හළයුතු. ද්‍ව්‍යක්ෂරපාද අර්ධසමප්‍රස්තාර යෙහි සවන එකොළොස්වන ද්විගුරුවෘත්තදෙක ද සමවෘත්ත බැවින් මෙහි වූ ද්විගුරුවෘත්තසඞ්ඛ්‍යාවෙන් හළයුතු. එවිට ද්‍ව්‍යක්ෂර පාදඇති අර්ධසමවෘත්ත-අර්ධයක එක්ගුරක්ඇති වෘත්ත සතරක් ද, ගුරුදෙකක්ඇති වෘත්තසතරක් ද, ගුරුතුණක් ඇති වෘත්ත සත. රක් දැයි දොළොසක් ලැබේ. සෙසු අර්ධසමවෘත්තයන්හි ද ක්‍රමය මේ මැයි. ග්‍රන්ථවිස්තාරභීතින් තවත් තවත් නිදර්ශන නො දක්වමු.

---

## III විෂමවෘත්තලගක්‍රියාව.

ද්‍ව්‍යක්ෂරපාදඇති විෂමවෘත්තයෙහි අකුරුඅටක් බැවින් අෂ්ටා ක්ෂරච්ඡන්දසෙහි ලගක්‍රියාව සොයා එයින් විෂමවෘත්ත ප්‍රස්තාර යෙහි පැණුනු සමාර්ධසමයන් හළවිට ශුද්ධවිෂමවෘත්තලගක්‍රියාව ලැබේ. අෂ්ටාක්ෂරච්ඡන්දසෙහි ලගක්‍රියාව 1. 8. 28. 56. 70. 56. 28. 8. 1. යන්නයි. මෙයින් ප්‍රථමාන්ත්‍යවෘත්තදෙක සමවෘත්ත හෙයින් හරිණුලැබේ. හළයුතු එකලඝුවෘත්තයක් විෂමප්‍රස්තාර යෙහි නො වීය. ද්විලඝුවෘත්ත සතරක් හළයුතු වේ. හළයුතු ත්‍රිලඝුවෘත්තයක් ද නො මැතියි. චතුර්ලඝුවෘත්ත සයක් හළයුතු. හළයුතු පඤ්චලඝුවෘත්ත ද නැත. ෂඩ්ලඝුවෘත්තසතරක් හළයුතු. සප්තලඝුවෘත්තයන්ගෙන් ද හළයුත්තෙක් නැති. මෙසේ සමාර්ධ සමයන් හළවිට 8. 24. 56. 64. 56. 24. 8. යන ශුද්ධවිෂමවෘත්තලග ක්‍රියාව ලැබේ. සෙස්සෙහි ද ක්‍රමය මේ මැයි. විස්තාරභීරුත්ව යෙන් අන්‍යනිදර්ශන නො දක්වමු. උක්තක්‍රමාවලම්බී ව චින්ත නය කට යුතු.

## IV මාත්‍රාවෘත්තලගක්‍රියාව.

### මාත්‍රාමේරුව.

මාත්‍රාච්ඡන්දසුන්ගේ ලගක්‍රියා දැන ගැණීමට මේරුප්‍රස්තාරය කළයුතු. මේරුසාධනයෙහි දී පළමු කොට එක් කොෂ්ඨයක්, ලියා ඒ යට පෙළට කොටු දෙකබැගින් ඇති පඞ්ක්ති දෙකක් ද, ඉන් යට කොටුතුණ බැගින් ඇති පඞ්ක්තිදෙකක් ද, ඉනුත් යට කොටුසතර බැගින් ඇති පඞ්ක්තිදෙකක් දැයි යන වශයෙන් එක එක අධික කොට වුවමනා ගණනක් කොෂ්ඨ පඞ්ක්ති ලියා ගත යුතු මෙසේ කොටු ඇඳ මුදුනෙහි වූ කොටුවෙහිත් පඞ්ක්තීන්හි අන්තයෙහි පිහිටි කොටුවලත් එකාඞ්කය යෙදිය යුතු. යුගමපඞ්ක්තීන්ගෙන් ප්‍රථමපඞ්ක්තිවල ප්‍රථමකොටුවල එකාඞ්කය ම යොදනු. හිස්ව තිබෙන යුගමපඞ්ක්තීන්ගෙන් විතීයපඞ්ක්තීන්හි ප්‍රථමකොෂ්ඨවල 2. 3. 4. 5. යනාදී පිළිවෙළින් අඞ්ක යොදා සම්පූර්ණ කළයුතු. මෙසේ කොට කොෂ්ඨයන්හි මතු දක්වනඅයුරු අඞ්ක යෙදිය යුතු. විතීයපඞ්ක්තිවයෙහි පිරවිය යුතු කොටුවක් නැත. තෘතීයපඞ්ක්තිවයෙහි මධ්‍යකොෂ්ඨවය පිරවිය යුතු. එයි නුදු ප්‍රථමපඞ්ක්තියෙහි මධ්‍යකොෂ්ඨය පළමුකොට පිරවිය යුතු හෙයින් ඒකොටුවට උඩින් වූ මූලකොටුවෙහි අඞ්කයත්, අගින් වූ කොටුව මතුවෙහි පිහිටි කොටුවෙහි අඞ්කයත් (2×I=3) එක් කොට ඓක්‍යය පිරවිය යුතු කොටුවෙහි ලියනු. දැන් ඊට යටින් තිබෙන කොටුව ද පිරවිය යුතුහෙයින් එහි තිබෙන තුණත් තුණ තිබෙන කොටුවට උඩපෙළෙහි අගින් තිබෙන කොටුවෙහි වූ එකත් එකතු කොට ඓක්‍යය (4) තුණට යටින් පිරවිය යුතු කොටුවේහි ලිය යුතු.

නිදර්ශනයක්:—




මෙහි 5–6 අඞ්ක දරණ කොටු පිරවිය යුතු කල්හි 3–2 අඞ්ක දරණ කොටුවල තිබෙන සඞ්ඛ්‍යා එකතු කොට ඓක්‍යය 5 අඞ්කය දරණ හිස් කොටුවෙහි ලියා ගතයුතු. 6 අඞ්කය දරණ කොටුව ද පිරවිය යුතුහෙයින් ඊට උඩින් තිබෙන 5 අඞ්කය දරණ කොටුවෙහි වූ සඞ්ඛ්‍යාවත් එය ඉදිරියෙහි වූ 4 අඞ්කය දරණ කොටුවෙහි වූ සඞ්ඛ්‍යාවත් එකතු කොට ඓක්‍යය හිස් ව තිබෙන 6 අඞ්කය දරණ කොටුවෙහි යොදනු. මේ ක්‍රමයෙන් ම අතික් කොෂ්ඨ ද සම්පූර්ණ කළයුතු. යට දක්වනුලබන මාත්‍රාමේරුව බලා ප්‍රගුණ කර ගත යුතු.

8. ලගක්‍රියාඞ්කසන්දොහෙ භවෙත්සඞ්ඛ්‍යා විමිශ්‍රිතෙ,
උද්දිෂ්ටාඞ්කසමාහාරඃ සෛකො වා ජනයෙදිමාම්.

| | | | | |
|---|---|---|---|---|
| 1 | | | | |
| 1 | 1 | | | |
| 2 | 1 | | | |
| 1 | 3 | 1 | | |
| 3 | 4 | 1 | | |
| 1 | 6 | 5 | 1 | |
| 4 | 10 | 6 | 1 | |
| 1 | 10 | 15 | 7 | 1 |
| 5 | 20 | 21 | 8 | 1 |

(වුවමනා ඡන්දස තෙක් මෙසේ ම සඞ්ඛ්‍යා යෙදිය යුතු.)

මෙහි මුදුනෙහි වූ කොටුවෙහි පැණෙනුයේ එකමාත්‍රාච්ඡන්දසෙහි එකලඝුවෘත්තයයි. ඊලඟපෙළෙහි ද්විමාත්‍රාච්ඡන්දසෙහි එකගුරුවෘත්තය ද සර්වලඝුවෘත්තය ද පැණෙයි. තුන්වනපෙළෙහි එකගුරුවෘත්ත දෙක ද සර්වලඝුවෘත්තය ද පැණේ. 1. 3. 5. 7. 9. යනාදි විෂමමාත්‍රාච්ඡන්දස්හි සර්වගුරුවෘත්තයක් නො ලැබේ. සතරවනපෙළෙහි චතුර්මාත්‍රාච්ඡන්දසෙහි සර්වගුරුවෘත්ත එකක් ද, එකගුරුවෘත්ත තුණක් ද, සර්වලඝුවෘත්ත එකක් ද පැණේ. සෙසු ඡන්දස්හි ද මේ ක්‍රම මැයි. සර්වලඝු, එකලඝු, ද්විලඝුආදිවශයෙන් ලඝු ප්‍රධාන කොට කියනවිට පඞ්ක්තීන්හි අන්තයෙහි පටන් කිය යුතු. මෙහි දක්වනලද්දේ නවමාත්‍රාච්ඡන්දසෙහි ලගක්‍රියාව තෙක් ය. ඊට අධික මාත්‍රා ඇති ඡන්දස්හි ද මේ ක්‍රමයෙන් ලග ක්‍රියාව සොයා ගත යුතු. ආර්‍යාවන්හි ලගක්‍රියාව දක්වීම දුෂ්කරය. ගණවිකල්පවශයෙන් ම නෂ්ටොද්දිෂ්ට ද යොදනලදී. ආර්‍යාවන්ට අයත් මාත්‍රාසඞ්ඛ්‍යාව ඇති ඡන්දසෙහි ලගක්‍රියාවෙන් ආර්‍යාවන්හි ලගක්‍රියාව වේ යයි ආචාර්‍යමතයක් පවතී. මාත්‍රා මෙරුව උස් කිරීමෙන් ම ඒ ද කළයුතු.

**එකමාත්‍රාදිලගක්‍රියාව සමාප්තයි.**

---

8. **ලගක්‍රියා+අඞ්කසන්දොහෙ**= (යථොක්තඑකමාත්‍රාදි) ලගක්‍රියාවගේ අඞ්කසමූහය; **විමිශ්‍රිතෙ**= මිශ්‍ර (එකතු) කළකල්හි; **සඞ්ඛ්‍යා භවෙත්**= (ඡන්දසෙහි) වෘත්තසඞ්ඛ්‍යාතය වේ. **සෛකඃ**= එකක් සහිත වූ; **උද්දිෂ්ට+අඞ්කසමාහාරඃ වා**= උද්දිෂ්ටයෙහි වූ අඞ්කයන්ගේ එක් කිරීම හෝ; **ඉමාම්**= මේ වෘත්තසඞ්ඛ්‍යාව; **ජනයෙත්**= උපදවන්නේ ය.

9. සඞ්ඛ්‍යෙව ද්විගුණෛකොනා සද්භිරධ්වා ප්‍රකීර්තිතඃ,
වෘත්තස්‍යාඞ්ගුලිකී ව්‍යාප්තිරධඃ කුර්‍ය්‍යාත්තථාඞ්ගුලිම්.

ඉති ශ්‍රී කෙදාරභට්ටවිරචිතෙ වෘත්තරත්නාකරාඛ්‍යෙ
ඡන්දසි ෂට්ප්‍රත්‍යයවිධානො නාම
ෂෂ්ඨෝ'ධ්‍යායඃ.

---

**පරිකථා:—**

ලඝුගුරුක්‍රියාවගේ සඞ්ඛ්‍යා සියල්ල එකතු කළ විට, ඡන්දස ප්‍රස්තාර කළ කල්හි ලැබෙන වෘත්තයන්ගේ සඞ්ඛ්‍යාව දත හැක.

උද්දිෂ්ටයෙහි දී ලියා ගණුලබන අඞ්ක අධික එකක් සමග එකතුකළකල්හි ද සඞ්ඛ්‍යානය ලැබේ "භවති සඃ" යන්න කී වන වෘත්තය දැයි දැන ගණු පිණිස උද්දිෂ්ටප්‍රත්‍යය කරණ ලදී. එහි දී "භවති සඃ" යන්න මතුවෙහි 1. 2. 4 8. යන පිළිවෙළින් අඞ්ක යොදනලදී. ඒ අඞ්කයන්ගේ ඓක්‍යය පසළොසයි. ඊට තවත් එකක් එකතු කිරීමෙන් චතුරක්‍ෂරච්ඡන්දසෙහි වෘත්තසඞ්ඛ්‍යාව ලැබේ. සමවිෂමයන්හි ද මේ ක්‍රම මැයි. මාත්‍රාච්ඡන්දස්හි දී මෙහි දෙවනුව කී ක්‍රමය නො යෙදේ. මාත්‍රාච්ඡන්දසෙහි නෂ්ට–උද්දිෂ්ටාඞ්කයන්ගෙන් සඞ්ඛ්‍යානය ලැබෙන පරිදි යට දක්වනලදී.

9. **ද්විගුණා**= දෙකින් ගුණ කරණලද; **ඒකොනා**= එකක් අඩු වූ; **සඞ්ඛ්‍යා එව**= සඞ්ඛ්‍යාව ම; **අධ්වා**= (ප්‍රස්තාරය පැතිරෙණ) මාර්‍ගප්‍රමාණ යයි; **සද්භිඃ**= පණ්ඩිතයන් විසින්; **ප්‍රකීර්තිතඃ**= කියනලදී. **වෘත්තස්‍ය**= වෘත්තයාගේ; **ව්‍යාප්තිඃ**= ව්‍යාප්තිය; **ආඞ්ගුලිකී**= අඟලක් පමණ වෙයි. **තථා**= එසේ; **අධඃ**= (වෘත්තයාගේ) යට; **අඞ්ගුලිම්**= අඟලක්; **කුර්‍ය්‍යාත්**= කරන්නේය.

**පරිකථා:—**

මේ ඡන්දශ්ශාස්ත්‍රය තිපදවනලද්දේ වත්මන්හි මෙන් කඩදාසි පෑන්ආදි ලිපිද්‍රව්‍ය සුලභ කාලයක නො වේ. එකල්හි භූමිය ම (මැලිපිළම)ඡන්දශ්ශාස්ත්‍රඥයන්ගේ ගල්ලෑල්ලත් කඩදාසියත් විය. කාෂ්ඨඛණ්ඩය ම ගල්කූර නොහොත් පෑන හෝ පැන්සලය විය. ගුරුලඝුරෙඛාවන් ලිවීමට එක් රෙඛාවට අඟලබැගින් වූවමනා විය. පඞ්ක්තීන්ගේ අසඞ්කරත්‍වය සඳහා අතර ද අඟලක් ඉඩ තබන ලදී. මේ අඞ්ගුලිප්‍රමාණනියමය කරණලද්දේ එහෙයිනි. මේ කාලයෙහි අඞ්ගුලප්‍රමාණ කඩදාසියක ගුරුලඝුවිශ්‍යාරාශියක් ම ලියමු. අඟලක් අතර තබන්නේ උද්දිෂ්ටසඞ්ඛ්‍යා ලිවීමට යයි ඇතැම් ටීකාකාරයෝ කිහ. ප්‍රස්තාරයෙහි දී උද්දිෂ්ටසඞ්ඛ්‍යා

වංශෙ'භූත් කශ්‍යපස්‍ය ප්‍රකටගුණගණඃ ශෛවසිද්ධාන්තවෙත්තා
විප්‍රඃ පව්‍යෙකනාමා විමලතරමතිර්වේදතත්ත්වාවබොධෙ,
කෙදරස්තස්‍ය සූනුඃ ශිවචරණයුගාරාධනෛකාග්‍රචිත්ත—
ශ්ඡන්දස්තෙනාභිරාමං ප්‍රවිරචිතමිදං වෘත්තරත්නාකරාඛ්‍යම්.

---

ලෙඛනයක් නො ලැබෙන හෙයින් ඒ ගතයුතු නො වේ. ඡන්ද සෙහි සඞ්ඛ්‍යානය දෙකින් ගුණ කොට එකක් අඩුකළවිට ඡන්දස ප්‍රස්තාර කිරීමට වුවමනා භූමියෙහි ආයාමය ලැබේ. මධ්‍යාඡ්ඡන්ද සෙහි සඞ්ඛ්‍යානය අටකි. එය දෙකෙන් ගුණ කොට එකක් අඩු කළවිට පසළොසක් ලැබේ. මධ්‍යාඡ්ඡන්දස ප්‍රස්තාර කිරීමට දිගින් එපමණ වුවමනා කොරේ පෘථුලත්වය ද අක්ෂරසඞ්ඛ්‍යාව දෙකින් ගුණ කොට එකක් අඩු කළවිට ලැබේ.මධ්‍යාව ත්‍ර්‍යක්ෂරපරිමිත ය තුණ දෙකෙන් ගුණ කොට එකක් හළවිට ලැබෙන පස මධ්‍යා ඡන්දස ප්‍රස්තාර කිරීමට වුවමනා පළලය.

ශ්‍රී කෙදරභට්ටයන් විසින් රචනාකරණලද
වෘත්තරත්නාකර නම්වූ ඡන්දස්හි ෂට්ප්‍රත්‍යයවිධාන නම්වූ
**සවන අධ්‍යාය මෙතෙකින් සමාපතයි.**

---

දැන් ග්‍රන්ථපරිසමාප්තියෙන් තිර්ව්‍යූඪ වූ ප්‍රතිඥභාර ඇති ශ්‍රී කෙදරභට්ට තෙමේ ස්වවංශොක්ති-පිත්‍රාදිස්තොත්‍රපූර්වක කොට ග්‍රන්ථපරිසමාප්තිය දක්වනුවෝ "වංශෙ'භූත්" යනාදීන් උදන් අනයි.

**කශ්‍යපස්‍ය**= මහරුසිකසුප්හුගේ; **වංශෙ**= පරපුරෙහි; **ප්‍රකට ගුණගණඃ**= පසිඳුගුණරුස්ඇති; **ශෛවසිද්ධාන්තවෙත්තා**= සිව දෙවි කොට ඇති සිදත් හෙවත් සිවආගම දන්නාවූ; **වෙදතත් ත්වාවබොධෙ**= වෙදයන්ගේ තත්ත්වාවබොධයෙහි; **විමලතර මතිඃ**= ඉතා පිරිසිදු මති ඇති; **පව්‍යෙකනාමා**= 'පව්‍යෙක' යන නම් ඇති; **විප්‍රඃ**= බමුණෙක්; **අභූත්**= වූයේ ය. **ශිවචරණයුග+ආරා ධන+එකාග්‍රචිත්තඃ**= මෙහෙසුරුසරණයුවලඇරුයුමෙහි එකග සිත්ඇති; **කෙදරඃ**= කෙදරතෙමේ;**තස්‍ය සූනුඃ**= ඔහුගේ පුතා ය. **තෙන**= ඒ කෙදර විසින්; **අභිරාමම්**= අබිරම්වූ; **වෘත්තරත්නා කරාඛ්‍යම්**= 'විරිත්රුවනාර' නම්වූ; **ඉදං ඡන්දඃ**= මේ සඳස; **ප්‍රවිර චිතම්**= කරණලදී.

**වෘත්තරත්නාකරසරලාව්‍යාඛ්‍යාව**
**මෙතෙකින් සමාපතයි.**

# කර්තෘසන්දර්ශනම්.

---

1. ලඞ්කායා දක්ෂිණාශායාං තිම්පග්‍රාමසුවිශ්‍රුතඃ,
විහාරෝ'ස්ත්‍යභීතාමඞ්ග්‍රි රජෝභිශ්ශුඞතාමිතඃ.

2. යත්‍රා'වාත්සීන්මහාස්වාමී ශ්‍රීරාහුල ඉති ශ්‍රුතඃ,
පඤ්චිකාකර්තුරාචාර්‍ය්‍යෝ වෘත්තරත්නාකරස්‍ය තු.

3. විහාරස්‍යා'ස්‍ය නාම්නෛව භික්ෂුවංශෝ'ස්ති පූජිතඃ,
ශ්‍රීලඞ්කායාමිහ **ශ්‍යාමනිකායෝ** යේන රාජතේ.

4. තදන්වයේ මහාස්වාමී බභූව **ශ්‍රීසුමඞ්ගලඃ**,
පිටකත්‍රයවාගීශ ආචාර්‍ය්‍යෝ විදුෂාං වරඃ.

5. යේන **විද්‍යෝදයං** විද්‍යාමන්දිරං සුන්දරං මුදා,
සුප්‍රතිෂ්ඨාපිතං ලෝකශාසනෝදයහේතවේ.

6. කෘතා යේන ච ලඞ්කායං සාලඞ්කාරා විදුෂ්මතී,
දයාශීලාදයෝ නිත්‍යං ගුණා යත්‍ර විරේජිරේ.

7. මතිර්මූර්ත්තිමතීවාසීද් යමේත්‍ය යතිනාම්පතිම්,
සිතා කීර්ත්තිර්‍යශීතෙයශීස්‍ය ගීයතේ ගීතකීර්ත්තිභිඃ.

8. රතෝ යස්මිත්‍යතෞ ලෝක උපශ්ලෝකයතේ ගුණාන්,
අඞ්කුර ඉව යශ්චා'භූද් බුද්ධභාවස්‍ය භාවිතඃ.

9. තදනන්තරමේවා'ස්‍ය ශිෂ්‍යෝ විද්‍යෝදයාධිපඃ,
**ශ්‍රීඥානේශ්වරනාමා'භූද්** යතීශඃ පුණ්‍යපිණ්ඩවත්.

10. සනාථා'භූද්‍යමාශ්‍රිත්‍ය ලක්ෂ්මීරපි සරස්වතී,
ගුරුශුක්‍රෞ පරාජිග්‍යේ මත්‍යා නේතා යතිස්තු යඃ.

11. ආදිවිද්‍යෝදයාධීශ යතීශස්‍ය මහාමතේඃ,
ශිෂ්‍යෝ'ස්ති **තිලකාරාමේ** "හිකාඩු" ග්‍රාමභූෂණේ.

12. **ප්‍රේමරතන** ඉති ඛ්‍යාතෝ යතීශඃ සාධුවත්සලඃ,
ශීලවාන්ධර්මශාස්ත්‍රඥඃ ශාස්තෘශාසනතත්පරඃ.

13. තයෝර්‍යතීශයෝරඞ්ග්‍රි කමලභ්‍රමරායිතඃ,
ශිෂ්‍යඃ **සෝරත**නාමා'සෞ වාලුකාවෘතිග්‍රාමජඃ.

14. ස්වගීතස්‍ය **කුමාරශ්‍රීවර්ධනාඛ්‍ය**ජනමතඃ,
**ශ්‍රීසුමඞ්ගලශිෂ්‍යස්‍ය** භිෂජෝ භිෂජාං ගුරෝඃ.

15. විඛ්‍යාතේ'**මරසිංහාඛ්‍ය** වංශේ ශුද්ධේ සුජන්මනඃ,
තත්පත්න්‍යාශ්ච සුශීලායාඃ සද්ධර්මාසක්තචේතසඃ.

16. පුත්‍රාඃ පවිත්‍රචාරිත්‍රාඃ පණ්ඩිතොපාධිමාපනවාන්,
විද්‍යෝදයමහාවිද්‍යාලයොපාචාර්‍ය්‍යතාං ගතඃ.

17. අද්‍ය විද්‍යෝදයාධීශාදාචාර්‍ය්‍යාදපි විත්තමණෙඃ,
ශ්‍රීරත්නසාරවිඛ්‍යාතාච් ශ්‍රීසුමඞ්ගලසංඥිතඃ.

18. ශාසනාභ්‍යුදයාසක්තාච්ඡාස්ත්‍රපාරමුපෙයුෂඃ,
සඞ්ඝනෙතුරනෙකෙෂාං ගුණානාමාකරාදිව.

19. ලබ්ධවිද්‍යො යතිශ්‍රෙෂ්ඨො'ස්ති ච්ඡන්දොජිඥාසුතුෂ්ටයෙ,
තෙනෙයං විහිතා ව්‍යාඛ්‍යා සරලාඛ්‍යා ස්වභාෂයා.

20. සෙයං ගූඪමතී ව්‍යක්තා සරලත්වාත්තදාහ්වයා,
විවෘතිර්විවෘතාශෙෂගූඪාර්ථා'පි සුවිස්තරා.

21. දුර්ව්‍යාඛ්‍යාදූෂිතං වෘත්තරත්නාකරමිති ශ්‍රුතම්,
ඡන්දොවිදො ධිනොත්‍යෙවච්ඡන්දශ්ශාස්ත්‍රං විවෘණ්වතී.

22. ඊර්ෂ්‍යාපිශාචචාපල්‍යභාජො යෙ'න්‍යගුණද්විෂඃ,
රමන්තාමිහ තෙ'ප්‍යස්‍යා අවද්‍යෙක්ෂණතත්පරාඃ.

23. බුද්ධ එව ජගත්‍යෙකො'නවද්‍යො විශ්වවිද් භවෙත්,
සාවද්‍යාඃ සෙමා වයං සර්වේ තදෙතත් සමර්‍ය්‍යතාම්බුධෛඃ.

24. විද්වත්සද්මනි තත්‍රෛව විද්‍යෝදයසුවිශ්‍රුතෙ,
උපප්‍රධාන ආචාර්‍ය්‍යො යතිශ්‍රෙෂ්ඨො'ස්ති ගුණප්‍රියඃ.

25 ප්‍රියරත්නාහ්වයෙනෙත ගෙලාකපණ්ඩිතීරියං කෘතා,
ව්‍යාඛ්‍යායාඃ සරලාඛ්‍යායාඃ කෘතිඃ සංශොධනාත්මිකා.

සිද්ධිරස්තු.

## ග්‍රන්ථාගත පාරිභාෂිකශබ්දයන්ගේ අකාරාදි
# අනුක්‍රමණිකාව.

(ශබ්දය පැමිණෙන පිටෙහි අඞ්කය ශබ්දයට අනතුරුව දක්වනුලැබේ )


අචලධෘති 56
අතිකෘති 27. 97.
අතිජගතී 26. 85.
අතිධෘති 26. 93.
අතිරුචිරා 66. 85.
අතිරේඛා 89.
අතිශක්වරී 26. 88.
අත්‍යෂ්ටි 26. 90
අත්‍යුක්තා 26. 67.
අද්‍රිතනයා 96.
අධ්වයොග 138.
අනඞ්ගක්‍රීඩා 65.
අනඞ්ගශෙඛර 100.
අනුගීති 45.
අනුෂ්ටුභ් 4. 26. 70.
අනොජ 23.
අන්‍යදක්ෂිණාන්තිකා 52.
අපරවක්ත්‍ර 104.
අපරාජිතා 87.
අපරාන්තිකා 51.
අපවාහ 97.
අභිනවතාමරස 84.
අමෘතධාරා 110.
අයුගම 23.
අයුජ් 23.
අර්ණ 98.
අර්ණව 26. 98.
අර්ධසම 23.
අර්ධාපාතලිකා 52.
අලසා 93.
අලොලා 88.
අවිතථ 91.
අශොකමඤ්ජරී 100.
අශ්වලලිත 96.
අෂ්ටි 26. 90.
අසම්බාධා 86.
ආකෘති 26. 95.
ආඛ්‍යානිකී 103.
ආපාතලිකා 49.
ආපාතලිකාපරාන්තිකා 101.
ආපාතලිකොපච්ඡන්දසිකා 52.
ආපීඩ 107.
ආරම 99.
ආර්චී 4.
ආර්ද්‍රා 76.
ආර්යා 28.
ආර්යාගීති 44.
ආෂිභ 115.
ආර්ෂී 4.
ආසුරී 4.
ඉන්ද්‍රවදනා 88.
ඉන්ද්‍රවජ්‍රා 75.
ඉන්ද්‍රවංශ 77. 80.
උක්තා 26. 66.
උජ්ජ්වලා 83.
උත්කෘති 27. 97.
උත්තරාන්තිකා 52.
උදීච්‍යවෘත්ති 50.

උද්ගතා 111.
උද්ගීති 43.
උද්ධුම 99.
උද්දිෂ්ටප්‍රත්‍යය 35. 128.
උද්ධර්ෂිණී 87.
උපගීති 43.
උපචිත්‍ර 101.
උපචිත්‍රා 58.
උපජාති 76.
උපස්ථිත 80. 86.
උපස්ථිතප්‍රචුපිත 113.
උපස්ථිතා 75.
උපේන්ද්‍රවජ්‍රා 75.
උභයාපීඩ 108.
උෂ්ණික් 4. 26. 70.
ඍද්ධි 76.
ඍෂභගජවිලසිත 90.
එකරූප 80.
එකාද්‍යාදිලගක්‍රියා 103.
එලා 9.8
ඕජ 23.
ඖපච්ඡන්දසික 48. 102.
කනකප්‍රභා 86.
කන්‍යා 67.
කලිකා 108.
කාන්තෝත්පීඩා 83.
කාසාර 99.
කීර්ති 76.
කුටිලගති 85.
කුඩ්මලදන්තී 79.
කුමාරලලිතා 70. 73.
කුමාරී 88.
කුසුමවිචිත්‍රා 81.
කුසුමස්තබක 100.
කුසුමිතලතාවේල්ලිතා 92.
කෘති 26. 93.
කේතුමතී 102.
කේදාර 99.
කෝශා 67.
කෝකිලක 92.
ක්‍රම 13.
ක්‍රෞඤ්චපද 97.
ක්ෂමා 85.
ඛඤ්ජා 64. 105.
ගණ 6.
ගණච්ඡන්දස් 4.
ගාථා 25. 116.
ගායත්‍රී 4. 26. 69.
ගීති 42.
ගීත්‍යාර්‍යා 57.
ගෝවින්ද 99.
ගෞරී 84. 86.
ගෞරීගාථා 81.
ග්. 10.
චඤ්චරීකාවලී 86.
චඤ්චලාක්ෂිකා 81.
චණ්ඩවෘෂ්ටිප්‍රපාත 98.
චන්ද්‍රලේඛා 86. 90.
චන්ද්‍රවර්ත්මන් 80.
චන්ද්‍රාවතී 89.
චන්ද්‍රිකා 46. 79. 86.
චපලාර්‍යා 38.
චපලාවක්ත්‍ර 54.
චම්පකමාලා 74.
චාරුගීති 46.
චාරුහාසිනී 58.
චිත්‍රපද 71. 73.
චිත්‍රා 58.
චූලිකා 66.
ඡන්දස් 4.
ජගතී 4. 26. 80.
ජඝනචපලා 40.
ජඝනවිපුලා 41.
ජලධරමාලා 83.
ජලෝද්ධතගති 81.
ජාති 23.

ජායා 76.
ජීමූත 99.
ජ්‍යොතිස් 65.
තත 85.
තත්කුටක 91.
තනුමධ්‍යා 69.
තන්වී 96.
තවිපුලා 56.
තාමරස 84.
තොටක 80
ත්‍රිෂ්ටුභ් 4. 26. 75.
ත්වරිතගති 75.
දක්ෂිණාන්තිකා 49.
දණ්ඩක 98.
දීපකමාලා 75.
දෛවී 4.
දෙධක 77.
ද්‍රුතපද 85.
ද්‍රුතමධ්‍යා 101.
ද්‍රුතවිලම්බිත 81.
ද්විඛණ්ඩක 64.
ද්විපාද් 64.
ධෘති 26. 92.
නදී 69. 88.
නන්ද 99.
නන්දී (නාන්දී) 116.
නර්කුටක 91.
නර්දටක 91.
නවමාලිනී 83.
නවිපුලා 56.
නෂ්ටප්‍රත්‍යය 32.124.
නාගරක 71.
නාරාචක 93.
නාරාචිකා 71.
නාරී 67.
නීහාර 99.
පඞ්ක්ති 4. 26. 79 73.
පඤ්චකමාලා 74.
පඤ්චචාමර 84.
පණව 74.
පථ්‍යාර්‍යා 37.
පථ්‍යාවක්ත්‍ර 64.
පදචතුරූර්ධ්ව 106.
පාද 15.
පාදාකුලක 58.
පුට 81.
පෘථ්වී 79. 90.
ප්‍රකෘති 26. 95.
ප්‍රගීති 45.
ප්‍රචිත 99.
ප්‍රතිෂ්ඨා 26. 67.
ප්‍රත්‍යාපීඩ 108.
ප්‍රබොධිතා 86.
ප්‍රභද්‍රක 89. 95.
ප්‍රභා 84.
ප්‍රමදා 46. 88.
ප්‍රමදානන 94.
ප්‍රමාණිකා 72.
ප්‍රමිතාක්ෂරා 83.
ප්‍රමුදිතවදනා 81. 84.
ප්‍රවර්ධමාන 114.
ප්‍රවෘත්තක 51.
ප්‍රස්තාර 117.
ප්‍රහරණ කලිකා 87.
ප්‍රහර්ෂිණී 85.
ප්‍රාච්‍යවෘත්ති 50.
ප්‍රාජාපත්‍යා 4.
ප්‍රියංවදා 82.
ප්‍රීති 68.
ප්‍රේමා 76.
බාලා 76.
බුද්ධි 76.
බෘහතී 4. 26. 73.
බ්‍රාහ්මී 4.

භද්‍රක 96.
භද්‍රවිරාජ් 102·
භද්‍රා . 76. 103.
භද්‍රිකා 79.
භවිපුලා 55.
·භුජගශිශුභෘ(සෘ)තා 73.
භුජඞ්ගප්‍රයාත 82.
භුජඞ්ගවිජෘම්භිත 97.
භ්‍රමරවිලසිත 78.
·මඤ්ජරී' 88. 109
මඤ්ජුගීති 45.
මඤ්ජුභාෂිණී 86.
මණිගුණනිකර 89.
මණිමාලා 82.
මණිරාග 75.
මත්තමයූර 86.
මත්තමාතඞ්ගලීලාකර 100.
මත්තවිලාසිනී 95.
මත්තා 74.
මත්තාක්‍රීඩා 96.
මත්තේභවික්‍රීඩිත 94.
මදලේඛා 70.
මධු 70.
මධුමති 70.
මධුමාධවී 88.
මධ්‍යක්ෂාමා 88.
මධ්‍යා 26. 67.
මනෝරමා 74.
මන්ථරා 113.
මන්ද 68.
මන්දකිනී 81.
මන්දාක්‍රාන්තා 91.
මන්දර 99.
මයූරගති 96.
මයූරසාරිණී 74.
මහාවිපුලා 41.
මාකන්ද 99.
මාණවක 71.
මාණවකාක්‍රීඩිතක 71.
මාත්‍රාච්ඡන්දස් 4.
මාත්‍රාසමක 57. 63.
මායා 76.
මාලතී 84.
මාලා 76. 89.
මාලිනී 69. 89.
මුකුල 69.
මුඛචපලා 39.
මුඛවිපුලා 41.
මෘගී 67.
මේඝවිතාන 74.
මේඝවිස්ඵූර්ජිතා 93.
මෞක්තිකමාලා 79.
මෞක්තිකදාමන් 82.
යති 16.
යවමතී 05.
යාජුෂී 4.
යුග්ම 23.
යුග්මවිපුලා 55.
යුජ් 23.
රථෝද්ධතා 78.
රමණී 69.
රවිපුලා 56.
රාමා 76.
ඊතිකා 94.
රුක්මවතී 74.
රුචිරා 85.
රූපවතී 74.
ලක්ෂ්මී 88.
ලලනා 84.
ලලිත 84. 112.
ලලිතපද 84.
ලලිතා 46. 82. 103.
ලවලී 109.
ලාසිනී 68.
ලීලාකර 99.
ල් 10.

වක්ත්‍ර 52.
වරතනු 84.
වරසුන්දරී 88.
වර්ධමාන 114.
වල්ගුගති 46.
වසන්තතිලකා 2. 87
වසුමතී 70.
වාජිවාහන 96.
වාණිනී 90.
වාණී 76.
වාතෝර්මී 77.
වානවාසිකා 58.
වාතීංහාරිකා 103.
විකෘති 27. 95.
විගීති 46.
විතාන 72.
විද්‍යුත් 86.
විද්‍යුන්මාල 71.
විද්‍යුල්ලේඛා 96.
විපරීතපථ්‍යාවක්ත්‍ර 54.
විපරීතාඛ්‍යානිකී 103.
විපුලාර්‍යා 37. 41.
විබුධප්‍රියා 92.
විශ්ලෝක 58.
විෂම 23.
විස්තාර 99.
විස්මිතා 93.
වෘත්ත 23. 94.
වෘත්තා 79.
වේගවතී 102.
වෛකුණ්ඨ 99.
වෛතාලීය 46.
වෛතිකා 79.
වෛශ්වදේවී 83.
වංශපත්‍රපතිත 91.
වංශස්තනිත 80.
වංශස්ථ 77. 80.
වංශස්ථවිල 80.
ව්‍රීඩා 68.
ව්‍යාල 99.
ශක්වරී 26. 86.
ශඞ්ඛ 99.
ශශිකලා 88.
ශශිවදනා 6[illegible].
ශාලා 76.
ශාලිනී 77.
ශිඛරිණී 90.
ශිඛා 63. 10[illegible].
ශුද්ධවිරාට් 73.
ශුද්ධවිරාඩෘෂභ 115.
ශ්‍යෙනිකා 79.
ශ්‍රී 67. 78.
සඞ්කෘති 27. 96.
සඞ්ඛ්‍යානප්‍රත්‍යය 137.
සඞ්ග්‍රාම [illegible]9.
සතී 68.
සත්කාර 99.
සන්දෙහ 49.
සම 23.
සමවෘත්ත 23.
සමානිකා 71.
සමෘද්ධි 68.
සාධාර 99.
සානන්ද 99.
සාම්නී 4.
සාර 99.
සාවිත්‍රී 69.
සිංහවික්‍රාන්ත 100.
සිංහවික්‍රීඩ 100.
සිංහවික්‍රීඩිත 93.
සිංහෝන්නතා 87.
සුගීති 45.
සුනන්දිනී 86.
සුන්දරී 103.
සුපවිත්‍ර 88.
සුප්‍රතිෂ්ඨා 26. 68.

| | | | |
|---|---|---|---|
| සුභද්‍රිකා | 79. | ස්කන්ධා | 45. |
| සුමති | 68. | ස්ත්‍රී | 67. 78. |
| සුමුඛී | 68. 77. | ස්‍රග්ධරා | 95. |
| සුරම | 99. | ස්‍රග්විණී | 82. |
| සුවදනා | 94. | ස්‍රජ් | 89. |
| සොත්ථාණ | 99. | ස්වාගතා | 78. |
| සොමකුල | 69. | හරනර්තකා | 92. |
| සෞම්‍යා | 65. | හරිණප්ලුතා | 104. |
| සෞරභක | 112. | හරිණී | 91. |
| සංගීති | 45. | හලමුඛී | 73. |
| සංස්කාර | 99. | හංසරුත | 71. |
| සංහාර | 99. | හංසී | 75. 103. |


**සරලව්‍යාඛ්‍යා සහිත වෘත්තරත්නාකරය**
**සමාප්තයි.**



